


★

# දිනමිණ


The Dinamina | 1909 ඇරැඹි ශ්‍රී ලංකාවේ ජාතික පුවත්පත | தினமின

ශ්‍රී බුද්ධ වර්ෂ 2564ක් වූ අධි වප් පුර දොළොස්වක ලත් සඳු දින | කාණ්ඩය 111 | පත්‍රය 243 | පිටු 36 | මිල රු.30 | web: www.dinamina.lk | ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කළ පුවත් පතකි | 2020 සැප්තැම්බර් 28 සඳුදා


කාලගුණයේ ඩිජිටල් දොරටුව අද පත්‍රය සමඟ




# ධීවර ගැටලු විසඳන්න

# තමිල්නාඩු මහ ඇමැති සමඟ සාකච්ඡාවක් දෙන්න

## අගමැති මහින්ද මෝදිගෙන් ඉල්ලයි



ඉන්දු ලංකා ධීවර ගැටලුව පිළිබඳ ස්ථිරසාර විසඳුමකට එළැඹීමට අවශ්‍ය සාකච්ඡා පැවැත්වීමට මෙරට ධීවර ඇමැති ඩග්ලස් දේවානන්දා මහතාට තමිල්නාඩු ප්‍රාන්තයේ මහ ඇමැතිවරයා සමඟ සාකච්ඡාවකට අවස්ථාව ලබා දෙන්නැයි අගමැති මහින්ද රාජපක්ෂ මහතා ඉන්දීය අගමැති නරේන්ද්‍ර මෝදි මහතාගෙන් ඉල්ලා සිටී.

විශේෂයෙන් ඉන්දීය ධීවරයන් ශ්‍රී ලංකා මුහුදු තීරයට අනවසරයෙන් ඇතුළු වී ට්‍රෝලර් යාත්‍රා මඟින් මසුන් ඇල්ලීම නිසා ඇති වී තිබෙන ගැටලුවලට ස්ථිර විසඳුමක් ලබා ගැනීමේ අරමුණෙන් අගමැතිවරයා මේ ඉල්ලීම කර තිබේ.

ශ්‍රී ලංකා අගමැතිවරයා මේ ඉල්ලීම කරනු ලැබුවේ පෙරේදා (26) ඉන්දීය අගමැති නරේන්ද්‍ර මෝදි සමඟ වීඩියෝ තාක්ෂණය ඔස්සේ ද්විපාර්ශ්වික සමුළුවකට එක්වෙමිනි.

පසුගිය මැතිවරණයෙන් මහින්ද රාජපක්ෂ මහතා නායකත්වය දුන් පක්ෂය ලබා ගත් විශාල ජයග්‍රහණය, ඉන්දියානු මහ මැතිවරණයේ දී භාරතීය ජනතා පක්ෂය නියෝජනය කරමින් තමා ලැබූ ජයග්‍රහණය හා සමාන වන හෙයින් ඉන්දියාව හා ශ්‍රී ලංකාව අතර මහගු සහයෝගීතාවකට එම මැතිවරණ ජයග්‍රහණ ඉවහල් වනු ඇති බවට තමා විශ්වාස කරන බව ඉන්දීය අගමැති නරේන්ද්‍ර මෝදි මහතා මෙහිදී පවසයි.

මැතිවරණ ජයග්‍රහණයෙන් පසු ඉන්දියාව - ශ්‍රී ලංකාව අතර නව පරිච්ඡේදයක් ආරම්භ කිරීමට අවස්ථාවක් උදා වී ඇති බවත්, ඒ පිළිබඳ දෙරටේ ජනතාව නව බලාපොරොත්තුවකින් හා අපේක්ෂාවන්ගෙන් අප දෙස බලා සිටින බවත් අගමැති මෝදි මහතා කීවේය.

පිට 06

# කොරෝනා පාලනයෙන් ලෝකෙන්ම දෙවැනි තැන ශ්‍රී ලංකාවට

## පළමු ස්ථානය චීනයට

බුද්ධිකා ඉඹුලාන

චීන පර්යේෂණ ආයතනයක් සිදු කළ සමීක්ෂණයකට අනුව කොවිඩ් - 19 ගෝලීය වසංගතය පාලනයෙන් ශ්‍රී ලංකාව ලොව දෙවැනි ස්ථානයට පත්ව තිබේ. චීන මූල්‍ය බුද්ධි ආයතනයක් වන "යීකායි" පර්යේෂණ ආයතනය සිදු කළ සමීක්ෂණයකට අනුව කොවිඩ් - 19 ගෝලීය වසංගතය වැළැක්වීමේ ක්‍රියාමාර්ග, ආර්ථිකය ප්‍රකෘතිමත් කිරීම සහ ජාත්‍යන්තර සහයෝගීතාව සැලකූ විට ශ්‍රී ලංකාව ලොව දෙවැනි ස්ථානයට පත්ව ඇත.

පිට 06

# එජාපයට නැති වුණ ජනතා විශ්වාසය යළි දිනා ගන්නවා



පිට 06



අගමැති මහින්ද රාජපක්ෂ සහ ඉන්දීය අගමැති නරේන්ද්‍ර මෝදි මහත්වරු අතර වීඩියෝ තාක්ෂණය ඔස්සේ ද්විපාර්ශ්වික සමුළුවක් පෙරේදා (26) පැවැත්විණි. අගමැතිවරයා සමඟ විදේශ සබඳතා ඇමැති දිනේෂ් ගුණවර්ධන හා ධීවර ඇමැති ඩග්ලස් දේවානන්දා මහත්වරු ද මේ අවස්ථාවට එක්ව සිටි අයුරු.

## එක්නැලිගොඩ සිද්ධියට ගෝඨාභය හවුල් කිවුවොත්

# කෝටි 6ක් දී ඔස්ට්‍රේලියාවට හෝ නවසීලන්තයට යවනවා කිවුවා

යුද හමුදා බුද්ධි අංශ කෝප්‍රල්ගේ බිරිය ජනපති කොමිසමේදී කියයි පිට 06

# 20 භයානකයි



20 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන පනත් කෙටුම්පත ඉතා භයානක බව හිටපු ජනාධිපතිනි චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මහත්මිය පවසයි.

පිට 06

# පාස්කුදා ප්‍රහාරය ගැන මට තොරතුරු ලැබුණේ නම් ප්‍රහාරකයන් කොටු කරගන්න තිබුණා

සුභාෂිණී සේනානායක



ඉස්ලාම් අන්තවාදීන්ගේ ප්‍රහාරයක් සිදු වන බවට තමා දැනුවත් වූයේ නම් කොළඹ සීල් ඕෆ් කරමින් පීඩාකාරී ආක්‍රමණයක් සිදු කර ප්‍රහාරකයන් කොටු කර ගැනීමට ඉඩ තිබූ බව පොලිස් විශේෂ කාර්යය බළකායේ හිටපු අණදෙන නිලධාරි එම්. ආර්. ලතීෆ් මහතා පෙරේදා(26) පාස්කු ප්‍රහාරය පිළිබඳ සොයා බැලීමට පත් කළ ජනාධිපති කොමිසම හමුවේ පැවැසීය. පිට 06

# තෙල් නැවක 17කට කොරෝනා

කොළඹදී නැවට නැංග පිරිස පවුල්වල උදවිය නිරෝධායනයට පිට 06

# සම්පන්දන් අසනීපෙන්

## පක්ෂයේ වැඩ අතරමඟ



උතුරු පළාත් විශේෂ රසුල දිල්හාර ගමගේ

දෙමළ ජාතික සන්ධානයේ නායක ආර්. සම්පන්දන් මහතා හදිසියේම යළිත් අසනීප වීම හේතුවෙන් එම පක්ෂයේ මාධ්‍ය ප්‍රකාශකවරයකු පත් කිරීම ඇතුළු තීරණ කිහිපයක් ගැනීම තාවකාලිකව නවතා දැමීමට පියවර ගෙන තිබේ. පිට 06

# වැඩි මිලට පොල් විකුණන වෙළෙඳුන් සොයා වැටලීම් අරඹනවා

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ සභාපති පිට 06

# නිශාන්ත සිල්වා සිටින රට සොයා වහාම වාර්තා කරන්න

කොමිසම CID යට නියෝග කරයි

සුභාෂිණී සේනානායක

පොලිස් දෙපාර්තමේන්තුවේ මංකොල්ල හා මිනීමැරුම් විමර්ශන අංශයේ හිටපු ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක නිශාන්ත සිල්වා මහතා කුමන රටක කුමන ප්‍රදේශයක සිටින්නේද යන්න විමසා වහාම කොමිසමට වාර්තා කරන ලෙස දේශපාලන පලිගැනීම් පිළිබඳ සොයා බැලීමට පත් කළ කොමිසමේ සභාපති විශ්‍රාමික ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු උපාලි අබේරත්න මහතා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයාට පෙරේදා (26) නියෝග කළේය. පිට 06

# කොවිඩ් 19 මරණ මිලියනය ඉක්මවයි

ලොව පුරා සිදුවූ කොවිඩ්-19 මරණ සංඛ්‍යාව මිලියනය ඉක්මවා ගොස් තිබේ. ඒ අනුව මේ වනවිට වාර්තා වන කොවිඩ් 19 මරණ ගණන 1,000,195කි. පිට 06

# 20ට මුස්ලිම් කොංග්‍රසයත් එරෙහි වෙයි

අසේල කුරුළුවංශ

විසිවැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට එරෙහිව ශ්‍රී ලංකා මුස්ලිම් කොංග්‍රසය අද (28) ශ්‍රේෂ්ඨාධිකරණයට පෙත්සමක් ගොනු කරන බව එහි නායක, පාර්ලිමේන්තු මන්ත්‍රී රවුෆ් හකීම් මහතා පවසයි.

මේ ව්‍යවස්ථා සංශෝධනයේ අඩුපාඩු රැසක් තිබෙන බවත් ඒවා නිවැරදි කර ගැනීම සඳහා සංශෝධන ඉදිරිපත් කිරීමේ අවස්ථාව ඇති බව ආණ්ඩුව පැවසුවත් ප්‍රායෝගිකව එය සිදු නොවන බවත් ඒ මහතා කීය. පිට 06

# ජනපති කොමිසම හමුවට එන්නැයි විජයකලා මහේෂ්වරන්ට නියෝග

සුභාෂිණී සේනානායක

චුන්නාකම් පොලිස් ස්ථානයට අනුයුක්තව සේවය කරමින් සිට මේ වනවිට බන්ධනාගාරගතව සිටින පොලිස් කොස්තාපල් ඥානලිංගම් මයුරන් මහතා සිදු කළ පැමිණිල්ලට අදාළව හිටපු රාජ්‍ය ඇමැතිනි විජයකලා මහේෂ්වරන් මහත්මියට ලබන ඔක්තෝම්බර් මස 03 වනදා කොමිසම හමුවේ පෙනී සිටින ලෙස දේශපාලන පලිගැනීම් පිළිබඳ සොයා බැලීමට පත් කළ ජනාධිපති කොමිසම පෙරේදා (26) නියෝග කළේය. පිට 06




◆ 2015 ආණ්ඩුවේදි තමන්ව නොමරා මැරුවා කියලා හිටපු ජනාධිපති මෛත්‍රී කියනවා බං ...

● අපි නම් මැරී මැරී ඉපදුණා...




# ජනපති ගෝඨාභයගේ පාලන සමයේ සියලු ජනතා අභිලාෂ ඉටු කරනවා

## ▶ ඇමැති ජොන්ස්ටන් ප්‍රනාන්දු

**ගම්පොල - සුරංග දිල්හාන්**

වැඩකරන රටක් නැවත බිහි කරනවා යැයි දුන් පොරොන්දු ඉටුකරමින් ගෝඨාභය ජනාධිපතිතුමාගේ පාලන සමය තුළ දැවැන්ත සංවර්ධනයක් ඇති කර ජනතා අභිලාෂ ඉටුකරනවා යැයි මහාමාර්ග සංවර්ධන ඇමැති ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා ගම්පොළදී පැවසීය.

අතුරු මාර්ග කිලෝ මීටර් ලක්ෂයක් කාපට් කිරීමේ වැඩසටහන යටතේ ගම්පොළ ආසනයේ දොළුව ලියන්දෙනිය මාර්ගය හා පේරාදෙණිය දෙල්තොට මාර්ගය කාපට් කිරීම අරඹමින් දොළුව ප්‍රදේශයේ පැවැති උත්සවයකදී අමාත්‍යවරයා මෙසේ සඳහන් කළේය.

මෙහිදී කිලෝ මීටර් 52 ක් වූ දෙල්තොට මාර්ගය සඳහා රුපියල් මිලියන 3015 ක් හා දොළුව ලියන්දෙනිය මාර්ගය සඳහා රුපියල් මිලියන 45 ක් වෙන් කර තිබුණි.

දීර්ඝ කාලයක් සංවර්ධනය නොකිරීමෙන් ඉතා දුෂ්කර මාර්ගයක් බවට පත්ව තිබූ දෙල්තොට මාර්ගය කාපට් කිරීමට ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා පොරොන්දු වී තිබුණේ පහුගිය මැතිවරණවලදීය.

මෙහිදී වැඩිදුරටත් අදහස් දැක්වූ ඇමැතිවරයා මෙසේ ද පැවැසීය.

ග්‍රාමීය කුඹුරු ආශ්‍රිත වැව් හා වාරිමාර්ග සංවර්ධන රාජ්‍ය අමාත්‍ය අනුරාධ ජයරත්න මහතාගේ ඉල්ලීමකට අනුව ගම්පොළ ආසනයේ මාර්ග සංවර්ධන වැඩ ආරම්භ කිරීම සඳහා මහාමාර්ග අමාත්‍යවරයා පැමිණ සිටියේය.

ගම්වල ජනතාව 19 ගැන කතා කරන්නෙ නෑ. ඒ අය ඉල්ලන්නෙ පාරවල් ටික හදලා දෙන්න කියායි. ඒ වගේම ඒ අය 19 කියාගෙන ගෝඨාභය ජනාධිපතිතුමාට බලය දෙන්න එපා කීවෙත් නෑ කීවේ රට හදන්න කියායි.

විපක්ෂයේ කල්ලිවල ඉල්ලීම නිසා සමහර පක්ෂවලට මන්ත්‍රීවරයෙක්වත් නැතිව ඒ පක්ෂ දියාරු වෙලා ගියා.

සෞභාග්‍යයේ දැක්ම අනුව වැඩකරන රටක් හදනවා කීවා. ආර්ථිකය දියුණු කරනවා කීවා. විනය ඇති කරනවා කීවා. දූෂණය නැති කරනවා කීවා. ඒ වගේම මත් උවදුරින් මේ රට මුදාගන්නවා කීවා. මේවා අකුරට ඉටුකරන ජනාධිපති කෙනෙක් හා අගමැතිවරයෙක් ඉන්න ආණ්ඩුවක් ජනතාව බිහිකරලා තියෙනවා. ඒ හොඳ සුසංයෝගය ජනතා අභිලාෂ ඉටුවීමේ අවස්ථාවක් කියලා අප විශ්වාසය කරනවා.





දකුණු පළාත් ආණ්ඩුකාර විලී ගමගේ මහතාගේ මඟ පෙන්වීම යටතේ දකුණු පළාත් සභාව සංවිධාන කළ දකුණු පළාත් ජංගම මහජන සේවය සහ කර්මාන්ත හා වෙළෙඳ ප්‍රදර්ශනයට සමගාමීව මුද්‍රණය කළ දක්ෂිණාභිමානී පුවත් අතිරේකය එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගමේ සභාපති ජනාධිපති නීතිඥ ඩබ්ලිව්. දයාරත්න මහතා දකුණු පළාත් ආණ්ඩුකාර විලී ගමගේ මහතාට පිළි ගැන්වීම හම්බන්තොට දෙබරවැව ජාතික පාසල් ක්‍රීඩාංගණයේදී 26 දා සිදු කෙරුණු අවස්ථාව.

ලේක් හවුස් ආයතනයේ නිලධාරීන් ඇතුළු පිරිසක් මීට එක්ව සිටියහ.

**ඡායා රූපය - සූරියවැව විශේෂ නුවන් ජයසේකර**

# විස්සෙන් ස්වාධීන මැතිවරණ කොමිසම බලාත්මක කළා

## ▶ මන්ත්‍රී ඩිලාන් පෙරේරා

**අමෝදා ජයමහ**

විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය හරහා ස්වාධීන මැතිවරණ කොමිෂන් සභා බලාත්මක කර ඇති බව පාර්ලිමේන්තු මන්ත්‍රී ඩිලාන් පෙරේරා මහතා පැවසීය.

ඒ මහතා මේ බව පැවසුවේ ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ කාර්යාලයේ දී පසුගිය දා (25) පැවති මධ්‍ය හමුවේ දී ය.

එම අවස්ථාවේ දී අදහස් දැක් වූ පාර්ලිමේන්තු මන්ත්‍රී ඩිලාන් පෙරේරා මහතා මෙසේ ද කීය.

මේ දිනවල කවුරුත් කතා කරන විසිවන ව්‍යවස්ථා සංශෝධනය හරහා ආණ්ඩුව ස්වාධීන කොමිෂන් සභා අහෝසි කිරීමට උත්සාහ ගන්නා බවට වැරදි මතයක සමාජ ගත වෙමින් තිබෙනවා. පැවති කොමිෂන් සභා දෙකක් මෙම විසිවන ව්‍යස්ථා සංශෝධනයට ඇතුළත් වී නෑ. එහි දී විගණන කොමිෂන් සභා සම්බන්ධව නැවත නිවැරදිව තර්ක කර, සැලකිල්ලට ගෙන කාරක සභා අවස්ථාවේ දී ඒ පිළිබඳ නැවත සාකච්ඡා කර තීරණයක් ගන්න පුළුවන්. විසිවන සංශෝධනය ගෙන එන් නැතිව දහනව වැනි



ව්‍යවස්ථා සංශෝධනය දිගටම තබා ගත්තා නම් විගණන කොමිෂන් සභාව ප්‍රතිසම්පාදනය පමණක් නොව මුළු කොමිෂන් සභා සියල්ලක්ම අපට පත් කරන්න වන්නේ නෑ. මේ විසි වැනි ආණ්ඩුක්‍රම සංශෝධනය හරහා ස්වාධීන කොමිෂන් සභා අකර්මන්‍ය වීමට තිබූ අවස්ථාවන් නැති කළා. දහනව වැනි ආණ්ක්‍රම සංශෝධනය යටතේ ස්වාධීන කොමිෂන් සභා පත් කරන්නේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවයි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ පත් කරන ආකාරය පිළිබඳ දැක්වෙන්නේ, දහනව වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනට යටතේ 41 ආ (1) යටතේයි. ඒ අනුව කොමිෂන් සභා සමාජිකයන් දහයක් ඉන්නවා. ඒ දහදෙනා පත් වූ පසු අනෙක් ස්වාධීන කොමිෂන් සභාවන්හි නිලධාරීන් පත් වෙනවා. දහනව වන ව්‍යවස්ථා සංශෝධනයට අනුව කොමිෂන් සභා සමාජිකයන් දහය වනුයේ, අගමැතිවරයා, කතානායකවරයා, පාර්ලිමේන්තුවේ විපක්ෂ නියෝජනය කරන පක්ෂයේ නායකවරයා එමෙන්ම ජනාධිපතිවරයා පත් කළ යුතු එක් පාර්ලිමේන්තු මන්ත්‍රීවයකු, අගමැතිවරයාගේ සහ විපක්ෂ නායකවරයාගේ යන දෙදෙනාගේම කැමැත්ත ඇතිව තවත් පුද්ගයන් පස්දෙනකු පත් කරනවා.

අගමැතිවරයාගේ සහ විපක්ෂ නායකවරයාගේ එකගත්වයෙන් පස් දෙනකු පත් කිරීම ලේසී වන්නේ නෑ. එවැනි ගැටලු සිදුවුවහොත් දහනව වන ව්‍යවස්ථා සංශෝධනය නමට පමණක් පොතේ සඳහන් වන ව්‍යවස්ථා සංශෝධනයක් බවට පත් වෙනවා.ඒ හේතුවෙන් කිසදු කොමිෂන් සභාවක් පත් කරන්න වන්නේ නෑ. මැතිවරණ කොමිෂන් සභාවක් පත් කරන්න බැරි වෙනවා. ඒ හරහා මැතිවරණ තබන්න බැරි වෙනවා. ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු පත් කරන්න වන්නේ නෑ. අභියාචන විනිසුරු පත් කරන්න වන්නේ නෑ. මේ සියල්ලක්ම සිදු කරන්න බැරි වෙනවා. විසිවන සංශෝධනය හරහා දහනව වන ව්‍යවස්ථා සංශෝධනය නමට පොතක තිබෙන්නට ඉඩ නො තබා ප්‍රායෝගික ලෙස කොමිෂන් සභා පත් කිරීමේ දී ඇති වීමට තිබු ගැටලුවලට පිළියම් ලබා දීමක් සිදු කළා. ඒ අනුවබ විසි වැනි සංශෝධනය හරහා ඉහත පත්වීම් සිදු කරනුයේ ව්‍යවස්ථාදායක සභාවෙන් නොව පාර්ලිමේන්තු සභාව හරහායි.

බැසිල් රාජපක්ෂ මහතා සභාපතිත්වය දරන කමිටුව ගෙවතු වගාව නඟාසිටුවීමට විසි ලක්ෂයක් ඉක්මවා යමින් ගෙවතු වගාව ව්‍යාපත්ත කිරීමට කටයුතු කර තිබෙනවා. එය ඉතාමත් ගුණාත්මක අදහසක් කියා කියන්න කැමතියි.

**හිටපු නියෝජ්‍ය අමාත්‍ය රෝහණ දිසානායක මහතා** - විසිවන ව්‍යවස්ථා සංශෝධනය පිළිබඳ විපක්ෂය මේ වන විට විශාල තැති ගැන්මකින් සිටිනවා. ඔවුන් ඒ අකාරයෙන් හැසිරීම පිළිබඳ පිළිකුලක් තිබෙනවා. දහනව වන ව්‍යවස්ථා සංශෝධනයක් හරහා රටේ ආර්ථික කොඳුනාරටිය විනාශ කළා. පසුගිය අවුරුදු පහ කිසිදු සංවර්ධනයක් සිදු නොවූ රට දිනෙන් දින පහළට ඇද දැමූ අඳුරු යුගයක්. පසුගිය දිනවල ඇතැම් පිරිස් අවජාතක විස්වෙනි සංශෝධනයක් බව පවසමින් බෝඩ් කැලී එල්ලන් ඉන්නවා දැක්කා.පැහැදිලිවම අවජාතක ව්‍යවස්ථා සංශෝධනය දහනව වැනි ව්‍යවස්ථා සංශෝධනයයි. එය අහෝසි කිරීමට අප දැන් කටයුතු කරමින් සිටිනවා.

මහනුවර දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී නීතිඥ උදය කිරිඳිගොඩ මහතා ද මෙම මාධ්‍ය හමුවට සහභාගී විය.

# කාකි නිල ඇඳුමෙන් මිනිස්කම උතුරයි

## පොඩි පුතු සමඟ අතරමං වූ මවකට රැකියාවක් සොයා දීලා



**ප්‍රාර්ථනා ලියනගේ - හිනිඳුම සමූහ**

රැකියාවක් ලබාදෙන බවට දුරකතන මාර්ගයෙන් පොරොන්දු වී කාන්තාවක් ගාල්ලට කැඳවා ඇය කුඩා දරුවාද සමග අතරමංවී සිටියදී ගාල්ල බස් නැවතුම්පොලේ සේවය කරන නියාමක මහතෙකු දරුවා සහ මව ගාල්ල බස්නැවතුම්පොළ භාර ස්ථානාධිපති විමල් ජයසේකර මහතා වෙත බාරදී තිබේ.

ඇය සැමියාගෙන් වෙන් වී ඇති අතර, දරුවා හදාගෙන ජීවත්වීමට විදියක් නැති හෙයින් මෙසේ පැමිණ ඇත. රස්සාවක් දෙන්න මාමා කෙනෙක් ගාල්ලට එන්න කීවා. එයාදැන් කතා කරන්නෙ නැහැ. අතේ තිබූ සල්ලිවලින් ආවේ. මොනවා කරන්නද තේරෙන්නෙ නැහැ. අනේ මගෙ දරුවයි මායි..... යන්වෙන් කයමින් හඬා වැළපී ඇත.

පොලිස් සැරයන් විමල් ජයසේකර මහතා ඔහු දන්නා හඳුනන ව්‍යාපාරිකයකු මඟින් ඇයට රැකියාවක් ලබා දී, දරුවා පිළිබඳව සොයා බලා සහාය වන්නට උපකාර කර තිබේ.

# නිවාස අධිකාරියේ සියලු කාර්යාල ලහි ලහියේ වැඩට

**උපාලි කරුණාරත්න**

නිවාස සංවර්ධන අධිකාරියට අයත් කාර්යාල 25ම කාර්යක්ෂම කිරීම සඳහා වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කරන බව එහි සභාපති රේණුක පෙරේරා මහතා පැවසීය.

නාරාහේන්පිට නිවාස සංවර්ධන අධිකාරී කාර්යාලයේ සේවය කළ ස්ථාන මාරු ලබා දුන් කලමණාකාරවරිය සහ දේපළ අංශයේ කලමණාකරු වෙනුවට නව නිලධාරීන් පත් කළ බවද ප්‍රකාශ කළ සභාපතිවරයා කාර්යක්ෂමතාවය වැඩිකර ගැනීම සඳහා වැඩ සටහන් රැසක් දියත් කරන බවද කීය.


SINCE 1978 42nd OBSERVER MOBITEL SCHOOL CRICKETER OF THE YEAR 2020
Recognizing talent, inspiring greatness.
Sri Lanka Telecom Mobitel ඔබ සමගයි. සැමදා.

**42 වන ඔබ්සවර් - මොබිටෙල්**

**වඩාත් ජනප්‍රියතම පාසල් ක්‍රිකට් ක්‍රීඩකයා / ක්‍රීඩිකාව - 2020**

ඔබේ ජනප්‍රියතම පාසල් ක්‍රිකට් ක්‍රීඩකයාට / ක්‍රීඩිකාවට මනාපය පළ කර ඔහුව / ඇයව වසරේ ඔබ්සවර් - මොබිටෙල් වඩාත් ජනප්‍රියතම පාසල් ක්‍රිකට් ක්‍රීඩකයා / ක්‍රීඩිකාව කිරුළ දක්වා රැගෙන යන්න.

☐ **වඩාත්ම ජනප්‍රියතම පාසල් ක්‍රිකට් ක්‍රීඩකයා 2020**

ශ්‍රී ලංකා පාසල් ක්‍රිකට් සංගමය මගින් පවත්වනු ලබන 2019/2020 වයස අවු. 19 න් පහළ "පළමු, දෙවන සහ තෙවන කාණ්ඩ" අන්තර් පාඨශාලයීය තරඟාවලීන්හි දී තරග වදින ක්‍රිකට් ක්‍රීඩකයින්, මනාප ලැබීමට සුදුසු වේ.

☐ **වඩාත් ජනප්‍රියතම පාසල් ක්‍රිකට් ක්‍රීඩිකාව 2020**

ශ්‍රී ලංකා පාසල් ක්‍රිකට් සංගමය මගින් පවත්වනු ලබන 2019/20 වයස අවු. 19 න් පහළ "සමස්ත ලංකා අංශයේ" අන්තර් පාඨශාලයීය තරඟාවලීන්හි දී තරග වදින ක්‍රිකට් ක්‍රීඩිකාවන් මනාප ලැබීමට සුදුසු වේ.

ඔබේ ක්‍රීඩකයා : ............
අංශය: පළමු කාණ්ඩය ☐ දෙවන කාණ්ඩය ☐ තෙවන කාණ්ඩය ☐
සමස්ත ලංකා ක්‍රීඩිකාව: ............
(එක් කූපනයක් එක් ක්‍රීඩකයෙකුට / ක්‍රීඩිකාවකට පමණක් වලංගු වේ)
පාසල : ............
ඔබේ නම : ............
ලිපිනය : ............
ජංගම දුරකථන අංකය : ............

SUNDAY OBSERVER

vote.schoolcricketer.lk වෙත පිවිසීමෙන්ද ඔබගේ මනාපය ප්‍රකාශ කළ හැක.

**කූපන්පත් එවා සතිපතා ත්‍යාග දිනාගන්න.**

**ප්‍රථම ත්‍යාගය** : Mobitel 4G Wi-Fi router **දෙවන ත්‍යාගය** : රු. 2,500/-
**තෙවන ත්‍යාගය** : රු. 1,500/- **හතරවන ත්‍යාගය** : රු. 1,000/-

42 වන ජනප්‍රියතම පාසල් ක්‍රිකට් ක්‍රීඩකයා / ක්‍රීඩිකාව නම් කිරීමේ තරඟාවලිය දැන් ආරම්භ කර ඇත. සම්පූර්ණ කරනලද ඉහත කූපනය ක්‍රීඩා සංස්කාරක, සන්ඩේ ඔබ්සවර්, ලේක්හවුස්, කොළඹ 10 වෙත තැපැල් කරන්න.

**කොන්දේසි :**

1) එක් කූපනයක් එක් ක්‍රීඩකයෙකුට / ක්‍රීඩිකාවකට පමණක් වලංගු වේ.
2) ලේක්හවුස් හෝ මොබිටෙල් ආයතනයේ සේවක / සේවිකාවන්ගේ දූ දරුවන්ට තරගයට සහභාගි විය නොහැක.
3) ජයග්‍රහණය කරනු ලබන අයට මුදල් / කුසලාන හා සහතිකපත් හිමි වේ. සෑම කූපනයකම එක් ක්‍රීඩකයෙකු පමණක් නම් කළ හැකි අතර, එය එක් තරඟ වාරයක් සඳහා පමණක් වලංගු වේ. තරඟාවලියේ අවසාන තීරණය සන්ඩේ ඔබ්සවර් ක්‍රීඩා සංස්කාරක සතු වේ.

**දිනය** 2020-10-03 **අංකය** 30







## පෙමට පිටුපෑවාට උරණ වී

# පෙම්වතිය පැහැරගෙන ගිය පෙම්වතා ඇය ඉදිරියේම ගෙල කපා ගනී

**ඩබ්ලිව්.පී. ධර්මසේන - මාතර සමූහ**

තම ආදරයට පිටුපෑ පෙම්වතිය පැහැරගෙන ගොස් "සැබෑ ආදරය මෙයයි" පවසමින් පෙරේදා (26) මාතර කිරළකැලේදී පෙම්වතිය ඉදිරියේ පෙම්වතා ගෙල කපා ගෙන තිබේ.

පෞද්ගලික රෝහලක සේවය කරන 23 හැවිරිදි පෙම්වතිය මාතර, පඹුරන ප්‍රදේශයේ පෞද්ගලික පන්තියකට ගොස් එමින් සිටියදී පෙම්වතා විසින් පිහියක් පෙන්වා ත්‍රිරෝද රථයකට ඇද දමාගෙන මාතර කිරළකැලේට ගෙන යනු ලැබ ඇති අතර එහිදී මෙසේ ඇය ඉදිරියේ පිහියකින් ගෙල කපාගෙන ඇත. මෙම පෙම්වතා මාතර, හිත්තැටිය ප්‍රදේශයේ පදිංචි 25 හැවිරිදි අයෙකි.

සිද්ධියට අදාළ තරුණියට මෙම සැකකාර තරුණයා මීට වසරකට පෙර හමු වී තිබේ. කෙසේ වෙතත් දැනට මාස කිහිපයකට පෙර තරුණිය මෙම සම්බන්ධයට තිත තබා ඇති අතර, එයින් කෝපයට පත්ව සිටි පෙමවතා මිතුරකුගේ ත්‍රිරෝද රථයක් ඉල්ලාගෙන පෙරේදා (26) දහවල් 11.30ට පමණ පන්තිය නිම වී තවත් මිතුරියන් දෙදෙනකු සමඟ නිවස බලා යමින් සිටි තරුණිය පැහැරගෙන ගොස් තිබේ. සිද්ධිය දුටු පිරිස වාහන දෙකකින් සහ යතුරු පැදිවලින් ඔවුන් පසුපස හඹා යන අවස්ථාවේ යතුරුපැදියකින් ගමන් කරමින් සිටි රථවාහන අංශයේ පොලිස් නිලධාරීන් ඔවුන් පසුපස හඹා ගොස් තිබුණි. පොලීසිය සහ පිරිස එම ස්ථානයට එන විට සැකකරු පෙම්වතියට පිහියක් පෙන්වමින් "මේක තමයි සැබෑ ආදරය" කියමින් ඔහුගේ වම් අත වාර දහයකට වැඩි ප්‍රමාණයක් පිහියෙන් කපාගෙන ගෙල ද පිහියෙන් කපාගෙන ඇත.

ලේ පෙරාගෙන වියරුවෙන් සිටි පෙම්වතාගෙන් පෙම්වතියට ජීවිත හානියක් වේය යන සැකය නිසා පොලිස් නිලධාරීන් උපක්‍රමශීලීව තරුණිය පොලිස් නිලධාරීන්ගේ ආරක්ෂාව යටතට ගෙන සැකකරු සහ ඔහු පැමිණි ත්‍රිරෝද රථය අත්අඩංගුවට ගෙන තිබුණි. තුවාල ලත් සැකකරු පොලිස් රැකවල් මත මාතර මහ රෝහලට ඇතුළත් කෙරිණි.

# හිරේ ඉන්න සැමියාට හෙරොයින් ගෙනා බිරිය අල්ලයි

**බුද්ධිකා ඉඹුලාන**

මීගමුව බන්ධනාගාරයේ සිටින සිරකරුවකු බැලීමට පැමිණි කාන්තාවක් එම රැඳවූවාට ලබා දීමට ගෙන ආ ඇඳුම් පාර්සලයේ සඟවා තිබූ කුඩා ප්‍රමාණයේ හෙරොයින් පැකට්ටුවක් සොයා ගැනීමට එම බන්ධනාගාර නිලධාරින් සමත් වී තිබේ.

අදාළ සිරකරුගේ බිරිඳ බව කියන මෙම කාන්තාව ගෙන ආ ඇඳුම් පාර්සලයේ තිබූ කලිසමක වාටියේ ඉතා සූක්ෂ්ම ලෙස මෙම හෙරොයින් පැකට්ටුව සඟවා තිබී ඇත.

රැඳවූවන් බැලීමට එන අමුත්තන් පරීක්ෂා කරන ස්ථානයේදී බන්ධනාගාර නිලධාරින් මෙම කාන්තාව හා ඇය රැගෙන ආ භාණ්ඩ පරීක්ෂා කර ඇති අතර, ඇගේ ගමන් මලු දෙවැනි වරටත් පරීක්ෂා කිරීමේදී කලිසම් වාටියේ තිබී මෙම මත්ද්‍රව්‍ය බන්ධනාගාර නිලධාරින් විසින් සොයා ගැනිණි.

සැකකාර කාන්තාව සහ මත්ද්‍රව්‍ය මීගමුව පොලීසියට ඉදිරි පරීක්ෂණ සඳහා භාර දී තිබේ.

# ගංජා එක්ක කැලණියේදී 6ක් අත්අඩංගුවට

**උපාලි කරුණාරත්න**

ගංජා කිලෝ 40ක් සමඟ පුද්ගලයන් හය දෙනකු කැලණිය කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යාංශයේ නිලධාරීන්ගේ අත්අඩංගුවට පත් විය.

මීට පෙර ගංජා සමඟ අත්අඩංගුවට ගත් සැකකරුවකුගෙන් සිදු කරන ලද ප්‍රශ්න කිරීම්වලදී අනාවරණය කර ගත් තොරතුරු මත පෙරේදා (26) සිදු කළ වැටලීමක දී මෙම පිරිස අත්අඩංගුවට ගෙන තිබේ. අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 26 - 47 වයස්වල පසුවන වත්තල, ගුණසිංහපුර හා කැලණිය ප්‍රදේශවල පදිංචිකරුවන් වන අතර, ඔවුන් සතුව තිබී විවිධ ප්‍රමාණයෙන් යුත් ගංජා පාර්සල්, ගංජා ප්‍රවාහනය සඳහා යොදා ගත් ජීප් රථයක් හා ත්‍රිරෝද රථයක් ද සොයා ගෙන ඇත.

### ශ්‍රීකාන්තගේ ශ්‍රී දූපත



• චන්ද්‍රිකා කියනව බං, මෛත්‍රී නිදහස් පක්ෂය කෑලි කෑලිවලට කැඩුව කියල!

• ඉතින් සර්, ඒජාපෙට කියල වෙනසක් කළෙත් නෑනෙ!

## 16 හැවිරිදි දැරිය ඝාතනය ගැන

# මවගේ අනියම් සැමියාගෙන් පාපොච්චාරණයක්

**සම්පත් ප්‍රියනන්දන - බලන්ගොඩ විශේෂ**

බලන්ගොඩ, ඕලුගංතොට, බණ්ඩාරවත්ත ප්‍රදේශයේ දී වයස අවුරුදු 16ක දැරියක් ගෙල සිර කර අභිරහස් ලෙස ඝාතනය කිරීමේ සිද්ධියට සම්බන්ධ ප්‍රධාන සැකකරු පෙරේදා (26) රක්වාන ප්‍රදේශයේදී අත්අඩංගුවට ගත් බව පොලීසිය පැවසීය.

රක්වාන, බටලන්ද, උක්වත්ත ප්‍රදේශයේ පදිංචි 43 හැවිරිදි සේදු ඉල්ලාම් නමැති පුද්ගලයකු මෙලෙස අත්අඩංගුවට ගෙන ඇත. තමන් ඝාතනයට ලක්වූ දැරියගේ මවගේ අනියම් සැමියා බවට ඔහු පොලීසියට පාපොච්චාරණයක් කරමින් පවසා තිබේ. තමන් එම දැරියගේ මව සමඟ මාස අටක කාලයක් අනියම් සබඳතාවක් පවත්වාගෙන යන බවත් ඊට දුවගෙන් බාධා පවතින බවට මව පැවසූ බවත් ඒ හේතුවෙන් දැරියගේ ගෙළ රෙදි පටියකින් සිර කර ඝාතනය කළ බවත් ඔහුගෙන් කළ මූලික ප්‍රශ්න කිරීම්වලදී අනාවරණය කර ගෙන තිබේ.

ඝාතනයට ලක්ව ඇත්තේ, කේ. ලෝෂණී නමැති බණ්ඩාරවත්ත ප්‍රදේශයේ පදිංචිව සිටි දැරියකි. සැකකරු බලන්ගොඩ මහෙස්ත්‍රාත්වරයා හමුවට ඉදිපත් කිරීමට නියමිතව තිබුණි.

# මත්වන්න ක්‍රම නැතිව වැලිකඩ සිටි සිරකරු එල්ලී මරුට

**බුද්ධිකා ඉඹුලාන**

මත්ද්‍රව්‍ය වැරදි සම්බන්ධයෙන් දෙමසක සිර දඬුවම් නියමව වැලිකඩ බන්ධනාගාරයේ අයි. සිර මැදිරියේ රඳවා සිටි සිරකරුවකු සිකුරාදා (25) එම සිර මැදිරියේම බාල්කයේ එල්ලී දිවි නසාගෙන තිබේ. ඔහු ඇඳ සිටි ජම්පරයෙන්ම එල්ලී මියගොස් සිටි මෙම සිරකරු බන්ධනාගාරය තුළ මත්ද්‍රව්‍ය නොමැති වීම නිසා පසුගිය දින කිහිපයේම අසහනකාරී තත්ත්වයකින් සිර මැදිරිය තුළ කල් ගෙවූ බව වාර්තා වේ. මියගොස් ඇති සිරකරු පෑලියගොඩ ප්‍රදේශයේ පදිංචිව සිටි 26 හැවිරිදි අයෙකි.

# දින 22ක සිඟිත්තිය එක්ක අම්මයි තාත්තයි හොරකමේ ගිහින්

## අහුවෙද්දි ළඟ හෙරොයිනුත් තිබිලා



**මිහිර විජේසේකර - මාරවිල සමූහ**

දින 22ක් වූ තම කුලුඳුල් දරු සිඟිත්තිය අතැතිව යතුරු පැදියෙන් ගොස් මංකොල්ලකෑම්, මත්ද්‍රව්‍ය ජාවාරම් ඇතුළු සොරකම් රැසක් සිදු කරන තරුණ යුවළක් වෙන්නප්පුව පොලීසිය විසින් පසුගියදා (25) අත්අඩංගුවට ගැනිණි.

සිඟිති දැරිය ද සමඟ පැමිණි මෙම යුවළ ඉකුත් 22 වැනිදා දංකොටුව නගරයේ බස් රථයක් පැමිණෙන තුරු රැඳී සිටි කාන්තාවක් රවටා ඇය යතුරු පැදියේ නංවාගෙන පාළු ප්‍රදේශයකට රැගෙන ගොස් ඇය පැළැඳ සිටි රන් මාලය, කරාබු සහ ඇය සතුව තිබූ මුදල් පැහැරගෙන පලා ගොස් තිබේ. මේ සම්බන්ධව එම කාන්තාව වෙන්නප්පුව පොලීසියට පැමිණිලි කිරීමෙන් පසු සිදු කළ විමර්ශනවන් අනතුරුව වෙන්නප්පුව සිරිගම්පල ප්‍රදේශයේ දී ඔවුන් අත්අඩංගුවට ගෙන ඇත.

හෙරොයින් මත් කුඩු ග්‍රෑම් 2යි මිලිග්‍රෑම් 310ක්, කොල්ලකන ලද රුපියල් 92,500ක් වටිනා රන් ආභරණ, යතුරු පැදි 2ක් සහ රූපවාහිනී යන්ත්‍රයක් ඔවුන් සතුව තිබී පොලිස් භාරයට ගෙන තිබේ. මෙම යුවළ වෙන්නප්පුව සිරිගම්පල ප්‍රදේශයේ පදිංචි අය වන අතර, ඔවුන් මාරවිල දිසා අධිකරණයට ඉදිරිපත් කිරීමට නියමිතව තිබුණි.

### ඇ නැ ත්ත

පොල් මිල වැඩි වෙලා පිළියම් යොදන — වලූ
උපරිම ගණන හැත්තෑවක් කරන — වලූ
දැන් පොල් ඇමති ගස් නැඟ පොල් කඩන — වලූ
පොල්වල දිග පළල මැන මැන ගණින — වලූ!

බඩු මිල කළු කඩේ තවමත් එහෙම — මලූ
මිල පාලනේ නෑහුන ලෙස සිටින — වලූ
වතුරෙන් හොද්ද බොර කරගෙන ගගහ — තලූ
මිල බහින කල් ඉවසාගෙන ඉදිමු — කලූ!

රටේමුල්ලේ මුදන්නායක

### ගිනිකාශ්

නිදහස් පක්ෂෙ දැමුවා යැයි වළට — ඇද
හැම පැත්තෙන්ම පැමිණෙන චෝදනා — මැද
සිතමින් මෛත්‍රී නංවයි සිනා — මද
යූඇන්පියත් වළ දැම්මේ වෙන — කවුද ?

ගැස්මන් හෝනා



දිනමිණ
The Dinamina
1909 ඇරැඹි ශ්‍රී ලංකාවේ ජාතික පුවත්පත
35, ඩී. ආර්. විජයවර්ධන මාවත,
ලේක්හවුස්, කොළඹ.
දුරකතන - 2429429, 2331181, 2421181
ෆැක්ස් - 2429240
(කර්තෘ මණ්ඩලයට පමණයි)
2449069 (පොදු)
ඊ මේල් - editor.dinamina@lakehouse.lk
දැන්වීම් කළමනාකරු - 2429341
2020 සැප්තැම්බර් 28 සඳුදා

## ඉන්දු සයුරේ කලණ මිතුරෝ!

ඉන්දු - ලංකා සබඳතාවල අලුත් පරිච්ඡේදයක් ආරම්භ වී ඇත. අගමැති මෝදි හා අගමැති මහින්ද අතර පෙරේදා පැවැති සාකච්ඡාවෙන් ද ඒ බව තහවුරු වෙයි. නායකයන්ගේ අරමුණ වී ඇත්තේ පැවැති සම්මුති හා වැඩසටහන් සමාලෝචනය කරමින් ශක්තිමත් ප්‍රවේශයක් ඔස්සේ ඒවා ඉදිරියට ගෙන යෑම බව පැහැදිලිය. දෙරටේ දේශපාලනික හා ආර්ථික සබඳතා වගකීමකින් යුතුව නව ජවයකින් යුතුව ක්‍රියාවට නැංවීමක් හැටියට ද මේ තත්ත්වය විග්‍රහ කළ හැකිය. නායකයන් එය වටහා ගෙන තිබීම ඉතා වැදගත්ය. ශ්‍රී ලංකාවට ඉන්දියාව අතහැර සාර්ථක ඉදිරි ගමනක් සැලැසුම් කිරීම අපහසුය. ඉන්දියාවට ද ශ්‍රී ලංකාව අතහැර සාර්ථක ඉදිරි ගමනක් සැලසුම් කිරීම අපහසුය. මේ බව අවබෝධ කරගත් නායකයන් සිටින කල දෙරටම අවුලකින් තොරව කලාපීය කටයුතු කරගෙන යා හැකිය.

ඉහත සාකච්ඡාවේ දී සංවාදයට ගත් කරුණු සම්පිණ්ඩනය කළහොත්; දේශපාලන, ආර්ථික හා සංස්කෘතික සහයෝගීතාව පෙරමුණට එයි. ඒ සමාන වැදගත්කමකින් යුතු බලය බෙදීම හා සාගර කලාපය සහයෝගයෙන් භාවිත කිරීම දෙවනුවට එයි. දෙරටේම නායකයන් තම පුරවැසියන් කෙරෙහි වගකීමකින් ක්‍රියා කළ යුතුය. ජනතාවට ලබා දී ඇති පොරොන්දු ඉටුකිරීමට දේශපාලන නායකයෝ බැඳී සිටිති. එමෙන්ම රටවල් අතර පවත්නා මිත්‍රත්වය, සම්මුති ආරක්ෂා කළ යුතුය. මේ සඳහා අතිශය වගකීමකින් කටයුතු කිරීමට නායකයන්ට සිදුවී ඇත. එය බුද්ධියෙන්, පළපුරුද්දෙන් හා රාජ්‍ය තාන්ත්‍රික පරිණතභාවයකින් හසුරුවා ගත යුතුව තිබේ. එය මැනැවින් ඉටු කර ගැනීමට දෙරටේ වත්මන් නායකයන් සමත්වන බව පෙනී යයි.

ඉන්දියාවේ ප්‍රකට ආර්ථික විශේෂඥයෙක් වරක් පෙන්වා දුන්නේ ශ්‍රී ලංකාව ඉන්දියාව ආර්ථික ඉලක්කයක් කොට ආර්ථිකය හසුරුවා ගැනීම ඉතා වැදගත් බවය. එහි ඇත්ත කතාව වන්නේ ඉන්දියාව වැනි අතිශය විශාල වෙළෙඳපොළක් අල්ලා ගැනීමේ හැකියාව ශ්‍රී ලංකාවට ඇති බවය. අපේ කුළු බඩු සියල්ල ඉන්දියාවට අලෙවි කළ හැකිය. දේශීය නිෂ්පාදන පමණක් නොවඃ නිමි ඇඳුම් පවා ඉන්දියාවට අලෙවි කළ හැකිය. තවත් ආර්ථික විශේෂඥයකුගේ මතයට අනුව ශ්‍රී ලංකාවට ආර්ථික වශයෙන් ශීඝ්‍ර දියුණුවක් ලද හැකි ප්‍රධාන මාර්ග දෙකක් තිබේ. එක; ඉන්දීය වෙළෙඳපොළට ප්‍රවේශ වීමය. දෙක; අපේ සාගර කලාපයෙන් උපරිම ප්‍රයෝජන ගෙන ධීවර කර්මාන්තය හා නාවුක කටයුතු දියුණු කිරීමය.

ඉහත මාර්ග දෙකම නිසි ලෙස කළමනාකරණයකට ලක් කිරීමට අප තවම සමත්වී නැත. ධීවර කර්මාන්තය පවතින්නේ දුර්වල මට්ටමකය. වරාය කටයුතු යම් සාර්ථකත්වයක් ලබාගෙන ඇති මුත් නාවුක කටයුතු පවතින්නේ ආරම්භක මට්ටමේය. ජනාධිපතිවරයා ද මෑතක දී මේ සම්බන්ධයෙන් සාකච්ඡාවක් පවත්වා අදාළ අංශවලට උපදෙස් ලබාදී ඇත. මෙහිදී ද ඉන්දියාව සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම අත්‍යවශ්‍ය සාධකයෙකි. ඉන්දියාව සතු සුවිශාල වෙළෙඳපොළ ගැන තවම අප වටහා ගෙන නැත. පසුගිය කාලය තුළ ක්‍රියාත්මක වූ අසාර්ථක වැඩසටහන් නිසා වර්ධනය වෙමින් පැවැති අපනයන වෙළෙඳාම පහතට ඇද වැටිණි. ඉන්දියාවට නිර්යාත කළ භාණ්ඩ ගණනාවක වෙළෙඳාම පහළ බැස්සේය. ඇතැම් නිර්යාත නවතා දමන්නට සිදු විය. නැවත අප ඒ වෙළෙඳාම කරා යා යුතුය.

ඉන්දියාවට හා ශ්‍රී ලංකාවට ස්වකීය සාගර කලාපය සහයෝගයෙන් භාවිත කළ හැකිය යන්නට අදාළ අපූරු සිද්ධියක් වාර්තා කළ හැකිය. ඒ නිව් ඩයමන්ඩ් තෙල් නෞකාව අනතුරට පත්වූ අවස්ථාවය. නැවේ ගින්න නිවා දැමීමට ද සාගර කලාපයට සිදුවිය හැකිව තිබූ බැවින් පාරිසරික විනාශය ද වළක්වා ගැනීමට දෙරටේ ආරක්ෂක අංශ ක්‍රියා කළහ. එය සාර්ථක මෙහෙයුමක් වූ අතර ගින්න මුළුමනින්ම නිමා දැමීමටත්, සාගරයට සිදුවිය හැකිව තිබූ අනතුර වළක්වා ගැනීමටත් හැකි විය. එය නාවුක ඉතිහාසයට එකතු වන වැදගත් සිද්ධියක් සේ සැලකිය හැකිය. ශ්‍රී ලංකාවට මෙන්ම ඉන්දියාවට ද මේ සිද්ධියේ ගෞරවය හිමි වෙයි. ස්වකීය සාගර කලාපයන් පිළිබඳ අවධානයකින් පසුවීම මෙන්ම එම කටයුතුවලදී සහයෝගයෙන් ක්‍රියා කිරීම ද ඉතා වැදගත්ය.

ඉන්දු - ලංකා සහයෝගයට දීර්ඝ ඉතිහාසයක් තිබේ. එම සහයෝගය හා මිත්‍රත්වය ගොඩනැගෙන්නේ ශක්තිමත් මූලයන් සමගය. සාංස්කෘතික සබඳතාත් ඒ අතර මුල් තැනක් ගනී. ඉන්දියාව සාංස්කෘතික වශයෙන් ගතහොත් ශ්‍රී ලංකාවේ මුල් භූමිය ලෙස ද සැලැකීමෙහි වරදක් නැත. මේ බව අමතක කළ නායකයන් රාජ්‍ය පාලනයට සම්බන්ධ වූ සෑම අවස්ථාවකම පාහේ රාජ්‍යයන් දෙක අතර හොඳ හිත පළුදුවී තිබේ. ශ්‍රී ලංකාව සෑමවිටම ඉන්දියාව සමඟ සාර්ථක සම්බන්ධතා පවත්වා ඇත්තේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ප්‍රමුඛ ආණ්ඩු පැවැති කාලවලදී බව ඉතිහාසය නිරීක්ෂණය කරන විට පෙනී යයි. වත්මන් ආණ්ඩුව ද ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ප්‍රතිපත්ති ඉදිරියට ගෙන යන බව පෙනෙයි. ඒ අනුව ඉන්දු - ලංකා සබඳතා ද ශක්තිමත් වී ඇත.

ශ්‍රී ලංකාවේ බෞද්ධ සංස්කෘතියේ ප්‍රවර්ධන කටයුතු සඳහා ඩොලර් දසලක්ෂ පහළොවක් ලබාදීමට ඉන්දීය රජය පොරොන්දු වී ඇත. එය දෙරටේ මිත්‍රත්වය තහවුරු කරන සංකේතයක් සේ දැක්විය හැකිය. ඉන්දියාව කොවිඩ් - 19 වසංගතය හමුවේ බලවත් දුෂ්කරතාවකට මුහුණ දී ඇති අතර ශ්‍රී ලංකාව එය සාර්ථකව මර්දනය කර තිබේ. අගමැති මහින්ද මෙහිදී පෙන්වා දුන්නේ අපේ අත්දැකීම් ඉන්දියාවට වැදගත් වන බවය. ඒ අනුව අත්දැකීම් හුවමාරුවට වැඩසටහන් ක්‍රියාත්මක වීමට නියමිතය. දෙරටේ ධීවරයන්ගේ ගැටලු වරින් - වර සාකච්ඡාවට ගැනෙන අතර ඊට තිරසාර විසැඳුමක් සඳහා සැලැසුම් සකස් කළ යුතු බව අගමැති මෝදිගේ අදහස වී තිබේ. දෙරටේ ධීවරයන්ගේ ගැටලු විසැඳිය හැක්කේ සාකච්ඡා මාර්ගයෙන් පමණි.

අගමැතිවරුන්ගේ සාකච්ඡාව දේශපාලනික වශයෙන් ඉතා වැදගත්ය. මේ සාකච්ඡාවේ දී රාජ්‍ය නායකයන් දෙදෙනාම වගකීමකින් යුතුව සිය අදහස් පළකර තිබේ.

### දිල්රුගෙ සීපද

| | |
|---|---|
| හොද්දට දමන ලුණු ටික ගානකට | මැනේ |
| බත් හැලියේ වතුර අතැඟිලි තුඩට | දැනේ |
| පොල් ගෙඩියෙත් තරම බැලුවම ඇහැට | පෙනේ |
| තරමට වඩා ගණනයි ප්‍රශ්නයක් | වුණේ |



# ඇත්තටම සහල් හිඟද ?



ආචාර්ය
ආර්.එම් .හේරත්
අධ්‍යක්ෂ, සමාජ ආර්ථික හා සැලසුම් මධ්‍යස්ථානය,
කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

රටේ ආර්ථිකය පණ ගන්වන බොහෝ ක්ෂේත්‍ර ඇති මුත් ජනතාවගේ කුසගින්න නිවන කෘෂිකර්මාන්තය තරම් සුවිශේෂී කාර්යයක් තවත් නොමැති තරම්ය. මේ නිසා ගොවිතැනට පණ පොවන කතාබහක් යළිත් ඇරඹීමට දැන් දැන් කාලය එළඹ තිබේ. මේ යෝජනාවට උපස්තම්භක වූ ආසන්නතම හේතුපාඨය මතු කළේ සහල්ය. සහල් මාෆියාවක් ගැන කාලයෙන් කාලයට මතු වන විවාදාපන්න අදහස් උදහස් කොපමණ මුත් ඊට පිළියමක් සොයන ක්‍රමවේදයක් මේ වනතුරු කරළියට පැමිණ නැත.

ශ්‍රී ලාංකේය ජනතාවගෙන් සියයට හැත්තෑපහක්ම ගොවිතැන් කරති. ඒ අතරින් රටට අවශ්‍ය සහල් ටික නිපදවා ගැනීමට තම වෘත්තිය වී ගොවිතැන කර ගත් පිරිසක් ද සිටිති. යල මහ දෙකන්නයේම සරුසාර අස්වනුවලින් අටු කොටු පිරෙන මුත් සහල් ගැන අසන්නට ලැබෙන්නේ කොපමණ ආහාර ඇතිමුත් මන්දපෝෂණයෙන් පෙළෙන්නාක් වැනි කතාවකි.

සහල් මාෆියාව සහ සහල් හිඟය අතර සබඳතාවක් නැතුවාම නොවේ. එය තිරයෙන් පිටුපස සිදු වන ක්‍රියාදාමයකි. නමුත් සහල් හිඟයක් ඇති වීමට බලපාන අවශේෂ කාරණා සමුදායක් ද පවතී. එමෙන්ම පිටරටින් සහල් ආනයනය කර ජනතාවගේ කුසගිනි නිවීමේ නිහීන ප්‍රතිපත්තියකින් ඔබබට ගිය හැකි විසඳුම් ද අප සතුව තිබේ. වී ගොවියා නව පන්නරයකින් පෙළගැසී ඇති මෙවන් මෙහොතක සහල් හිඟයක් ගැන කතා කිරීම තරම් නොවේ. එසේ නම් රටේ සහල් අවශ්‍යතාව සහ එය ප්‍රමාණවත් පරිදි සකසුරුවම් කරගැනීමේ වැඩපිළිවෙළකට අවතීර්ණ වීමේ කාලීන අවශ්‍යතාව හඳුනාගෙන ඊට පිළියම් යෙදීම වහා වහා සිදු විය යුත්තකි.

මහින්ද චින්තන ජාතික ප්‍රතිපත්ති ප්‍රකාශනය යටතේ 2005 වසරේ පෙහොර සහනාධාර වැඩසටහන ගොවි ප්‍රජාව වී ගොවිතැනින් ඉවත් වීමට ගත් මානසිකත්වය වැට කඩොළු අහුරා ඔවුන් කෘෂිකර්මාන්තයට නව ප්‍රබෝධයකින් එළි බැසීමට හේතු වුණු සාරගර්භ වැඩසටහනකි. ඉන් පසු ඇතැම් ආණ්ඩුවල ප්‍රතිපත්ති හේතුවෙන් පොහොර සහනාධාරයේ කප්පාදු වීම්, පොහොර හිඟය ආදී බාධාවන්ට ගොවීන්ට අත්විඳින්නට සිදු වූ මුත් නැවතත් ජනාධිපති මහින්ද රාජපක්ෂ රජයකින් වී අලෙවි මණ්ඩලයට පණ පොවා රටේ ගොවි ප්‍රජාවගේ අස්වනු තරගකාරීත්වයකින් මිලදී ගෙන එයට සැබෑ වටිනාකමක් දීමේ කාර්යයට එක් විය. මේ වන විට විවිධ පසු බැසීම් මධ්‍යයේ වුවත් 2019-20 මාස් කන්නයේ වී මිලදී ගැනීමේ ජාතික වැඩපිළිවෙළේ ගොවියා අපේක්ෂා කළ වෙනස්කම් රැසක් සිදු විය. වී කිලෝවක් සඳහා රුපියල් 50.00ක සහතික මිලක් නියම වීම ගොවියා ලැබූ මහත් ජයග්‍රහණයකි. වී කිලෝවක් රුපියල් 36.00ට දෝලනය කරමින් ගොවියාත් රටේ වී ගබඩා ටිකත් පැත්තකට දමා තිබුණු සංස්කෘතියට යළි ධනාත්මක වෙනසක් ඇති වීමට මෙම සහතික මිල ක්‍රමය හේතු විය. එමෙන්ම රජයේ මැදිහත් වීමෙන් වී මිලදී ගැනීමේ ක්‍රියාවලියක් එදා මෙදා තුර සිදු වුයේ නම් ඒ අතරින් වඩාත් තරගකාරීව පෞද්ගලික අංශය වී මිලදී ගැනීමට ඉදිරිපත් වු ප්‍රථම අවස්ථාව ද ඉකුත් මාස් කන්නයේ සිදු විය. ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතාගේ රජයෙන් මේ සඳහා පරිසරය සකස් කර දුන්නේ ගොවි ජනතාවගේ සාධාරණ ඉල්ලීම් කිහිපයක ප්‍රතිඵලයක් වශයෙනි.

ඉකුත් මාස් කන්නයේ වී මිලදී ගැනීමේ ක්‍රියාවලියේ දී පෞද්ගලික අංශය රජයේ සහතික මිල වු රුපියල් 50.00 ඉක්මවු මිලකට වී මිලදී ගෙන තම වී සංචිතය වැඩි කර ගැනීමට කටයුතු කරන ලදී. එය රජය අපේක්ෂා කළ තරගකාරීත්වයක් මුත් එක් පැත්තකින් රජයේ වී ගබඩාවලට ලැබිය යුතු වී සංචිතය නොලැබෙන්නට හේතුවක් ද විය. ගොවියා වැඩි මිල ඇති තැනට තම අස්වනු ටික විකුණා ලාභ ලැබීම ධනාත්මක කරුණක් වු මුත් රජයේ වී සංචිතය ශක්තිමත් නොවීම අද මතු වී තිබෙන සහල් හිඟය යැයි පෙනෙන කාරණයට යම් ආකාරයකින් බලපා ඇති බැව් අපට ලැබී ඇති තොරතුරු හා දත්ත ඇසුරින් තහවුරු වී තිබේ.

සහල් හිඟයක් කියූ පමණින් එහි අර්ථය විකෘති වී ඇති සෙයකි. කෘෂිකර්ම දෙපාර්තමේන්තුව සතුව ඇති දත්ත හා සංඛ්‍යා ලේඛන අනුව සහල් හිඟයක් මතු වීමට කිසිදු සාධාරණ හේතුවක් නැත. වී ගොවියා නිෂ්පාදනය කළ අස්වැන්න රජය සතු වුවත් පෞද්ගලික අංශය සතුව පැවතියත් ගැටලුවක් නැත. සහල් හිඟයක් ඇති වන්නේ ප්‍රමාණවත් වී අස්වැන්නක් ලැබී නොමැති නම් ය. මිනිස් පරිභෝජනයට අවශ්‍ය සහල්, සත්ව ආහාර සඳහා අවශ්‍ය සහල් සහ සහල් පිටි ආශ්‍රිත නිෂ්පාදන සඳහා අවශ්‍ය ප්‍රමාණය ගත් විට වසරකට අපේ අවශ්‍යතාව සහල් මෙට්‍රික් ටොන් මිලියන 2.4කි. 2019-20 මාස් කන්නයේ පමණක් සහල් මෙට්‍රික් ටොන් මිලියන 3.08ක් ලබී ඇත. 2020 මාස් කන්නයේ මෙට්‍රික් ටොන් මිලියන 1.84ක් ලැබී ඇත. මෙම වී සංචිතයෙන් ලැබෙන සහල් ප්‍රමාණය මාස් කන්නයේ මෙ.ටො. මිලියන 1.93 ක් සහ යල කන්නයේ 1.13කි. මුළු ප්‍රමාණය මෙ.ටො. මිලියන 3.06කි. මෙම දත්ත කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ සංඛ්‍යා ලේඛන වන මුත් සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව පෙන්වන ඔවුන්ගේ දත්ත ද මීට සමපාතය. ඒ අනුව බලන විට රටේ වාර්ෂික අවශ්‍යතාවට සරිලන සහ එම අවශ්‍යතාව ඉක්මවා ගිය සහල් ප්‍රමාණයක් අප සතුව ඇත. මෙම ප්‍රමාණය රජයේ ගබඩාවල ම තිබිය යුතුය යන නියතියක් නැත. පෞද්ගලික අංශය ද තම සංචිත ගබඩා කර තබා ගන්නේ රටේ සහල් අවශ්‍යතාවට සැපයුමක් ලබා දීමට ය. ඒ අනුව බලන විට සහල් හිඟයක් ඇති වීමට කිසිදු හේතුවක් නැත. නමුත් වෙළෙඳපොළේ කලින් කලට වගේම මේ වනවිටත් සහල්වල හිඟයක් පවතී. ඊට හේතුව බෙදා හැරීම සහ නිකුත් කිරීමේ ක්‍රියාවලියේ ගැටලුවකි.



**සහල් මාෆියාව සහ සහල් හිඟය අතර සබඳතාවක් නැතුවාම නොවේ. පිටරටින් සහල් ආනයනය කර ජනතාවගේ කුසගිනි නිවීමේ නිහීන ප්‍රතිපත්තියකින් ඔබබට ගිය හැකි විසඳුම් ද අප සතුව තිබේ. වී ගොවියා නව පන්නරයකින් පෙළගැසී ඇති මෙවන් මෙහොතක සහල් හිඟයක් ගැන කතාකිරීම තරම් නොවේ.**

සහල් බෙදා හැරීම සහ නිකුත් කිරිම දැවැන්ත ක්‍රියාදාමයකි. එය විධිමත්ව විනිවිදව සිදු නොවුණහොත් අර්බුදයක් ඇතිවීම අනිවාර්ය ය. අද සිදු ව ඇත්තේ එයයි. මේ වන විට ඉකුත් කන්න දෙකෙන්ම ලැබුණු වී අස්වැන්නෙන් වැඩි ප්‍රමාණයක් ඇත්තේ පෞද්ගලික අංශය සතුවයි. වී අලෙවි මණ්ඩලයට අපේක්ෂා කළ සංචිතය පියවා ගැනිමට නොහැකි විය. මේ නිසා මේ වන විට පෞද්ගලික අංශය තමන් සතු සංචිත රඳවා සහල් මිල වැඩි කර ගැනීමේ අරමුණක නිරතවන බවක් දක්නට ලැබෙයි. කෙසේ වෙතත් මේ ප්‍රශ්නය ට කාලෝචිත විසැඳුමක් දීමේ වගකීම රජය දරමින් ආණ්ඩුව විශේෂ නිවේදනයකින් දන්වා ඇත්තේ පෞද්ගලික අංශය තමන් සතු සහල් සංචිත වෙළෙඳපොළට ඉදිරිපත් නොකරන්නේ නම් පිටරටින් සහල් මෙට්‍රික්ටොන් ලක්ෂයක් ආනයනය කිරීමට කටයුතු කරන බවයි. රජයේ මෙම ස්ථාවරය ක්‍රියාත්මක කළහොත් පෞද්ගලික අංශයේ ඒකාධිකාරයට මරු පහරක් වනු ඇත. මක් නිසා ද 2020-21 මාස් කන්නයේ වී අස්වනු ජනවාරි මාසයේ වෙළෙඳපොළට ලැබෙන බැවින් සහල් මිල පහත යාම නොවැළැක්විය හැකි නිසාය.

රජය හැරුණු කොට ලංකාවේ සහල් සංචිතය හසුරුවන්නේ මහ පරිමාණයේ සහල් මෝල් හිමියන් කිහිප දෙනෙකි. කලින් කලට මේ සුළු පිරිස තම ආධිපත්‍යය පෙන්වීමට ප්‍රයත්න දරති. බෙදා හැරීම සහ නිකුත් කිරීම ඔවුහු සිය අභිමතය අනුව සිදු කරති . මේ නිසා වෙළෙඳපොළේ සහල් හිඟයක් නිර්මාණය වෙයි. මේ තත්ත්වය දිගින් දිගටම සිදු වු දෙයකි. එම ක්‍රියාවලිය නවත්වා රජය සහල් නිෂ්පාදනයේ ප්‍රමුඛයා නොව තීරකයා වීමට වැඩපිළිවෙළක් සකස් කර ගත යුතුය. පෞද්ගලික අංශය සහල් සඟවා තබන්නේ නම් ඒ මොහොතේ වෙළෙඳපොළට නිකුත් කිරීමට ස්ථාවර සහල් සංචිතයක් රජය සතුව තිබිය යුතුය. ඒ සඳහා වී අලෙවි මණ්ඩලයෙන් රජයේ ගබඩාවලට මිලදී ගත යුතු ප්‍රශස්ථ ප්‍රමාණය නිවැරැදිව හඳුනා ගෙන එය සුරක්ෂිතව ගබඩා කර ගැනීමට වගා බලා ගත යුතුය.

මේ මොහොතේ පුද්ගලික අංශයේ හැසිරීම හඳුනාගත යුතුය. මාස් කන්නයේ වී මිලදී ගැනීමේ දී රජයේ සහතික මිල රුපියල් 50.00 ඉක්මවා රුපියල් 60.00 ට වී කිලෝවක් මිලදී ගැනිමට පෞද්ගලික අංශය කටයුතු කරන ලදී. එම මිලට ගත් වී සහල් කර රුපියල් 98.00 ට සහල් කිලෝවක් නිකුත් කිරීම ඔවුන්ට පාඩුවකි. මෙය පාඩුව පියවා ගැනීමට ඔවුන් දරන උත්සාහයකි.

ඒ කෙසේ වෙතත් සහල් වෙළෙඳපොළ යාන්ත්‍රණය සුළු පිරිසක් වූ මහා පරිමාණ මෝල් හිමියන් අතට පත්වීම වැළැක්වීමට නම් ක්‍රමෝපායන් කිහිපයක් ක්‍රියාවට නැංවිය යුතුය. එහි ප්‍රබලතම සාධකය සුළු හා මධ්‍ය පරිමාණ සහල් මෝල් හිමියන් දිරි ගන්වා ඔවුන් ශක්තිමත් කිරීමයි. එය තරමක් අභියෝගාත්මක ය. අද මෙම පිරිස සතුව පවතින තාක්ෂණික මෙවලම් සීමිත ය. මහා පරිමාණ මෝල් හිමියන් තම නිෂ්පාදන පාරිභෝගිකයාට පහසු සහ ඔවුන් තෘප්තිමත් කරන ආකාරයට වෙළෙඳපොළට ඉදිරිපත් කරයි. අද පාරිභෝගිකයා ගල් වැලි ඉවත් කළ සහල් සොයා යති. සුළු පරිමාණ මෝල් හිමියාට මේ අවශ්‍යතාව සපුරා දීමට නොහැකි නම් එම යාන්ත්‍රණය දියාරු වනු ඇත. මේ නිසා රජයේ මැදිහත් වීමෙන් මෙම පිරිස ඉහළට ඔසවා තැබීමට කටයුතු කළ යුතුව ඇත.

සහල් නිෂ්පාදන කර්මාන්තය නමැති දම්වැලේ තවත් එක් ශක්තිමත් පුරුකක් ලෙස වී ගබඩා කරන පාර්ශ්වය ද සිටී. ඔවුන් ද තම ගබඩාවල වී රඳවා ගෙන සිටින්නේ නම් එය ද වෙළෙඳපොළට එන සහල් ප්‍රමාණය උච්චාවචනය වීමට බලපායි. 2018-19 මාස් කන්නයෙන් පසුව ද මෙවැනි ම ව්‍යාජ සහල් හිඟයක් මවා පාන ලදී. එහිදී ද රජය සහල් පිටරටින් ගෙන්වන බවට නිවේදනය කළ අවස්ථාවේ සහල් මෝල් හිමියන් මෙන්ම වී ගබඩාකරුවන් ද සිය සංචිත වෙළෙඳපොළට මුදා හරින ලදී.

කෙසේ වෙතත් සහල් වෙළෙඳපොළ ශක්තිමත් කිරීමට නම් තවත් අත්‍යවශ්‍යයෙන්ම සිදු විය යුත්තක් තිබේ. එනම් රට තුළ නිෂ්පාදනය වන වී ප්‍රමාණය මෙන්ම සහල් පිළිබඳව ද නිවැරැදි දත්ත ගබඩාවක් පවත්වා ගෙන යාමයි. එහි රටේ වී සංචිත තිබෙන්නේ කා ළඟද කොපමණ තිබේද යන්න ආදි සත්‍ය තොරතුරු රජය සතු විය යුතුය. එමෙන් ම විවෘත ආර්ථිකයට පෙර සන්තකයේ තබා ගත හැකි සහල් ප්‍රමාණයේ සීමාවක් දක්වා තිබුණ ද දැන් එවැනි සීමාවන් පැනවීම උගහට කරුණකි. එයට එකම පිළියම මීට පෙර සඳහන් රජය සතු ස්ථාවර සහල් සංචිතයයි.

සහල් වෙළෙඳපොළේ ඒකාධිකාරය බිඳීම සඳහා සහල් නිෂ්පාදන ක්‍රියාවලිය විමධ්‍යගත කිරීම තවදුරටත් කළ හැකියි. ඒ සඳහා ගොවීන්ට ද එම කාර්යයයේ වගකීමෙන් කොටසක් පැවරිය සුදුසුය. සහල් ගම්මාන වැඩසටහන මීට පෙර ක්‍රියාත්මක වුණු ග්‍රාමීය මට්ටමින් සහල් නිපදවීම දිරි ගැන්වීමේ සාර්ථක වෑයමකි. නමුත් අද මෙය ප්‍රශස්ථ මට්ටමින් ක්‍රියාත්මක නැත. එය නැවත ක්‍රියාත්මක කළ හැකි නම් ග්‍රාමීය මට්ටමේ පාරිභෝගික අවශ්‍යතාව ගමෙන් ම සපුරා දීමට හැකියාව ලැබෙයි.

කෙසේ වෙතත් මේ මොහොතේ සහල් ආනයනය විශාල වියදමක් දැරීමට සිදු වන කාර්යයකි. මේ මොහොතේ ලෝක වෙළෙඳපොළ සහ විශේෂයෙන් අපි සහල් ආනයනය කරන ඉන්දියාවේ තත්ත්වය සැලකිල්ලට ගත යුතුය. කොවිඩ් අර්බුදයත් සමග ඉන්දියාවේ සහල් වෙළෙඳපොළ කඩා වැටී ඇත. ඩොලරයේ අගය ඉහළ යාමෙන් සහල් ආනයනය ජාතික ආර්ථිකයට සෘජුව බලපානු ඇත. මේ කරුණු සියල්ල සම්පිණ්ඩනය කිරීමේ දී දේශීය සහල් වෙළෙඳපොළේ තීරකයා බවට රජය පත් වෙමින් පෞද්ගලික අංශයෙන් සහල් වෙළෙඳපොළ ශක්තිමත් කිරීමට උපරිම දයකත්වය ලබා ගැනීම ප්‍රායෝගිකය.




සකුන්තලා ජයසිංහ



# පොඩි මිනිසාට ළං වූ ප්‍රගතිශීලී මිනිසා

## පෙරේදා දිනට යෙදී තිබූ බණ්ඩාරනායක ශ්‍රීමතාණන්ගේ 61 වෙනි ගුණ සැමරුම නිමිත්තෙනි







'ආසියාවේ රිදී සීනුව' යැයි විරුදාවලි ලද ඇස්.ඩබ්ලිව්.ආර්.ඩී බණ්ඩාරනායක මහතා, ලංකාවේ සිව්වැනි අග්‍රාමාත්‍යවරයා ය. සඟ, වෙද, ගුරු, ගොවි, කම්කරු යන පංච මහා බලවේග එක් කරමින්, පොදුජන යුගයක් නිර්මාණය කිරීමට වෙහෙසුණු ඔහු, සාහසිකයෙකුගේ වෙඩි පහරකින් ඝාතනයවී, මේ මස 26 වැනිදාට වසර 61ක් සම්පූර්ණ විය. මේ ලිපිය ඒ නිමිත්තෙනි.

එස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක යනු, මෙරට සිටි තවත් අගමැතිවරයකු නොවේ. ඔහු රට පාලනය කළේ අවුරුදු තුනකට මදක් වැඩි කාලයක් පමණි. රාජ්‍ය පාලනයේදී අවුරුදු තුන හමාරක් යනු එහෙ බලා මෙහෙ බලද්දී නිමා වෙන තරමේ කෙටි කාලයකි. එහෙත්, බණ්ඩාරනායක කියූ විට ඔහු රට පාලනය කළ කාලය සීමිත වුව ද, ඔහු මෙරට තුළ සිදු කළ සමාජ, දේශපාලන සහ ආර්ථික පෙරළිය දැවැන්තය.

සොලමන් ඩයස් බණ්ඩාරනායක මහතා, සිප්සතර උගත්තේ ගල්කිස්ස ශාන්ත තෝමස් විදුහලෙනි. උසස් අධ්‍යාපන කටයුතු සඳහා ඔක්ස්ෆර්ඩ් විශ්වවිද්‍යාලයට ඇතුළත් වූ එතුමා, 1925 වසරේ දී නැවත ලංකාවට සපැමිණියේ, සිය උසස් අධ්‍යාපන කටයුතු නිම කිරීමෙන් අනතුරුවය. ඔහු සිය ජීවන වෘත්තිය ආරම්භ කරන ලදුයේ, නීතිඥවරයකු ලෙසිනි. එහෙත්, දේශපාලනය පිළිබඳ ඔහු සිත ඇතිවූ ඇල්ම නිසා, කෙටි කලකින්ම දේශපාලනයට ප්‍රවිෂ්ට වීමට තීරණය කළේය. 1926 වසර වනවිට ඔහු ලංකා ජාතික සංගමයේ ලේකම්වරයා බවට පත් විය. එම වසරේදීම, ජාති හිතෛෂී පක්ෂයේ සභාපතිවරයා ලෙස ද ඔහු තේරී පත් විය. එම වසරේදීම ඔහු කොළඹ නාගරික මැතිවරණයෙන් ක්‍රියාකාරී දේශපාලනයට ප්‍රවිෂ්ට වූයේය. මරදාන කොට්ඨාසය සඳහා තරග කළ බණ්ඩාරනායක මහතා, කම්කරු පක්ෂයේ නායකයා වූ ඒ.ඊ ගුණසිංහයන්ට එරෙහිව සිය දේශපාලන සටන මෙහෙය විය. කෙටි කලකින්ම දුගී දුප්පත් ජනතාවගේ සිත දිනා ගැනීමට සමත් වූ බණ්ඩාරනායක මහතා, මැතිවරණයෙන් ඒ.ඊ.ගුණසිංහයන්ට වඩා වැඩි ඡන්ද 615ක් ලබා ගනිමින් ජයග්‍රහණය කළේය.

1931 වසරේදී හඳුන්වාදුන් ඩොනමෝර් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය මඟින් ලාංකිකයන්ට සර්වජන ඡන්ද බලය හිමි වූ අතර, රාජ්‍ය මන්ත්‍රණ සභාව සඳහා නියෝජිතයන් තෝරා ගැනීමට පැවැත්වූ මැතිවරණයෙන් වේයන්ගොඩ ආසනය සඳහා තරග වැදුණු බණ්ඩාරනායක මහතා, නිතරග ජයක් ලැබීමට තරම් භාග්‍යවන්ත විය. 1931 වසරේ දෙසැම්බර් 18වැනිදා ලංකා ජාතික සභාවේ සභාපති ධුරයට පත්වුණු, මේ ප්‍රගතිශීලී මිනිසා, මේ වකවානුව වනවිට එම තනතුර වෙනුවෙන් පත්වූ ළාබාලතම පුද්ගලයා බවට පත් විය. ඒ අනුව, ප්‍රථම රාජ්‍ය මන්ත්‍රණ සභාව තුළ ක්‍රියාකාරී භූමිකාවක් ඉටුකිරීමට ඔහුට හැකියාව ලැබිණි. මෙතුමා, ව්‍යවස්ථාදායක සභාව තුළ වඩාත් ප්‍රගතිශීලී භූමිකාවක් ඉටුකළ පුද්ගලයකු ලෙස ප්‍රකටය. රාජ්‍ය මන්ත්‍රණ සභා කථානායක වැටුප රුපියල් 1800 සිට රුපියල දක්වා අඩු කළ යුතු බවට ද ඔහු යෝජනා ඉදිරිපත් කළේය.

භේද බින්නවී සිටි සිංහල ජාතිය සමගි කර, ජාතිමාමකත්වය වර්ධනය කර, ජාතික නිදහස් අරගලයට සවියක් ලබාදීමට එතුමා තුළ පැවැතියේ මහත්ම කැපවීමකි. අනතුරුව 1936 වසරේදී රාජ්‍ය මන්ත්‍රණ සභා මැතිවරණයෙන් නැවතත් වේයන්ගොඩ අසුන නිතරගයෙන් ජයග්‍රහණය කිරීමට බණ්ඩාරනායකයන්ට හැකියාව ලැබිණි.

ඔහු, පොඩි මිනිහාට ළෙංගතු නායකයකු විය. එදා සමහරු බණ්ඩාරනායකයන් හඳුන්වා ඇත්තේ 'දුප්පතාගේ අද්වකාත්' යන ආරූඪ නාමයෙනි. එයට හේතුවී ඇත්තේ, සියනෑ කෝරළයේ රදල පවුලක ඉපදුණු බණ්ඩාරනායක මහමුහන්දිරම්ගේ පුත්‍රරත්නය වුව ද, ඔහු පොදු මිනිසුන් ගැන ආදරයෙන් බැලීමය.

ඔහු ආරම්භයේ සිටම ජාතිකවාදී දේශපාලන මතයට නැඹුරුව කටයුතු කළ අතර, සිංහල මහා සභාව බණ්ඩාරනායක මහතාගේ දේශපාලන සංවිධානය ය. එක්සත් ජාතික පක්ෂය නම් සියලු ජාති එක් කළ මහා පක්ෂය නිර්මාණය වන විට, ඔහු එහි සාමාජිකයකු බවට පත් වේ. 1947 මහ මැතිවරණයේදී ජනතා වරම් ලබන බණ්ඩාරනායක මහතා, ඩී. එස්. සේනානායක ආණ්ඩුවේ පළාත් පාලන ඇමැතිවරයා ලෙස පත්ව, විශාල සේවයක් ඉටුකරනු ලබයි. ගමේ ආණ්ඩු බවට පත්ව තිබූ ගම් කාර්ය සභා, නගර සභා සහ සුළු නගර සභා, ජනතාවට වඩාත් සමීප ආයතන බවට පත් කිරීම බණ්ඩාරනායක දර්ශනයේ මූලිකාංගය විය. එක්සත් ජාතික පක්ෂය සමඟ දීර්ඝකාලීනව කටයුතු කරද්දී, බණ්ඩාරනායක මහතා වටහා ගත් එක් කරුණක් වූයේ, එක්සත් ජාතික පක්ෂය තුළ සිටිමින් තම දර්ශනය සහ ප්‍රතිපත්ති නිසි ලෙස ක්‍රියාත්මක කළ නොහැකි බවයි. එහි ප්‍රතිඵලය වූයේ, 1951 වර්ෂයේදී බණ්ඩාරනායක මහතා

**බණ්ඩාරනායක මහතා කෙරෙහි එල්ලවන චෝදනාවක් බවට පත්ව ඇත්තේ සිංහල භාෂාව රාජ්‍ය භාෂාව කිරීම නිසා මෙරට ඉංග්‍රීසි අධ්‍යාපනය අඩාල වූ බවට දක්වන චෝදනාවයි. අනෙක් චෝදනාව වන්නේ, මේ නිසා දෙමළ භාෂාව වහරන්නන්ට බලවත් අසාධාරණයක් වූ බවය. එහෙත් මූලිකව සිංහල භාෂාව රාජ්‍ය භාෂාව වීම නිසා මෙරට එක් කණ්ඩායමකට පමණක් ඉහළ ඉගෙනීමට තිබූ වරප්‍රසාදය වෙනුවට, බහුතරයක් වූ පොදු ජනතාවගේ දරුවන්ට උසස් අධ්‍යාපන වරම් හිමි විය. එහි ප්‍රතිඵලය වූයේ, දුර බැහැර ගැමි දරුවන්ට ද ඉහළ පරිපාලන තනතුරු ඇතුළු ප්‍රබල තැන්වලට යාමට පහසුකම් සැලසීමයි. එදා මාර්ටින් වික්‍රමසිංහයන් සඳහන් කළ අයුරින් මෙරට බමුණු කුලයේ බිඳ වැටීම ඇරැඹුණේ, බණ්ඩාරනායක නිසාය.**

රනායකයන් ප්‍රමුඛ මේ පිරිසයි. එහි ආරම්භය වූයේ, නව දේශපාලන පක්ෂයක් ලෙස ශ්‍රී ලංකා නිදහස් පක්ෂය බිහි කිරීමයි. එම පක්ෂය කෙරෙහි රට තුළ විශාල උනන්දුවක් ඇති වූ අතර, මෙතෙක් එජාප ය දෙසට නැඹුරුව කටයුතු කළ සමාජයේ සැලකිය යුතු පිරිස් මෙන්ම, සමසමාජ, කොමියුනිස්ට් දේශපාලනය කළ පිරිස් ද නව පක්ෂයට එක් විය. පක්ෂය පිහිටුවා කෙටි කාලයකදී හදිසි මහ මැතිවරණයක් 1952 දී පැවති අතර, එහිදී බණ්ඩාරනායක ප්‍රමුඛ ශ්‍රීලනිපයට අපේක්ෂා කළ ආකාරයේ විස්මිත ප්‍රතිඵලයක් ලබා ගැනීමට නොහැකි විය. එම මැතිවරණයේදී බණ්ඩාරනායකගේ පක්ෂය ට දිනා ගැනීමට හැකි වූයේ ආසන අටක් පමණි. ඒ ප්‍රතිඵලය සමඟ සමාජයේ බොහෝ අය කියූ කරුණක් වූයේ 'බණ්ඩ ඉවරයි..නිකං අමාරුවෙ වැටුණා' යන කරුණය. එයට හේතු වූයේ, එම මැතිවරණයෙන් එජාපය විශාල ජයක් ලැබීමය. එය එසේ වුව ද, බණ්ඩාරනායක තම ප්‍රතිපත්ති සහ දර්ශනය අත් නොහැර දිගටම කටයුතු කළේය.

ක්‍රමයෙන් ගම් මට්ටමට යමින් සෙසු වමේ පක්ෂ සමඟ සාකච්ඡා කරමින්, තම දේශපාලනය ක්‍රියාත්මක කළේය.

කෙමෙන් සමාජය තුළ බණ්ඩාරනායක දර්ශනය ගැන පැහැදීමක් ඇති විය. අනෙක් පසින් සමාජය තුළින් මතුව, දේශීයත්වය සහ අපේකම යන සංකල්පයට නායකත්වය ලබා දීමට ඔහුට හැකි විය. 1956 එළැඹුණි. 1952 දී ලජ්ජාශීලී පරාජයක් වැළඳගත් බණ්ඩාරනායකට වාරය උදා විය. එජාපයේ මහ බල කණු පමණක් නොව, ජේ. ආර්. ජයවර්ධන වැනි අති දැවැන්තයන් බණ්ඩාරනායක රැල්ලට ගසාගෙන ගියේ, මුහුදු රැල්ලට හසු වූ පොල් කෝම්බ මෙනි. කවියන්, වෙදමහත්වරුන්, රාජ්‍ය සේවකයන් පමණක් නොව, ඇම්. ඒ. තේමිස් නමැති තැපැල් පියුම් මහතාට ද පාර්ලිමේන්තු වරම් ලැබුණේ බණ්ඩාරනායක නායකත්වය දැරූ මහජන එක්සත් පෙරමුණෙනි. මහජන එක්සත් පෙරමුණ යනු ශ්‍රීලනිපය සහ ප්‍රගතිශීලී සෙසු පක්ෂ එක්ව තැනූ දේශපාලන සන්ධානයකි. බණ්ඩාරනායක මහතා 1956 පෙරළියෙන් අගමැති වූ පසු, එතෙක් සුද්දන් සතුව තිබූ රාජ්‍ය සම්පත් රැසක් ජන සතු කිරීම සිදු කෙරුණි. බස් ජනසතුව නිසා ලංගම නම් මහා පොදුජන ප්‍රවාහන සේවය ආරම්භ විය. දේශීයත්වය කෙරෙහි උනන්දුව ඉහළ නැගුණි. මෙරට දේශපාලනයට, අලුත් පාරක් විවර විය. මේ මාර්ගය බණ්ඩාරනායක මහතා මිය ගිය ද, නොනැසී පැවතීම විස්මිතය. බණ්ඩාරනායක දර්ශනය ඔහුගෙන් පසු බණ්ඩාරනායක මැතිනිය විසින් පෙරට රැගෙන ගිය අතර, බණ්ඩාරනායකවරුන් කළ සේවය අපමණය. සේවක අර්ථසාධක අරමුදල ඇරැඹීම හේතුවෙන්, අද වනවිටත් පුද්ගලික අංශයේ සේවය කරන ලක්ෂ හැටකට කිට්ටු පිරිසගේ අනාගතය සුරක්ෂිත වෙයි.

බණ්ඩාරනායක මහතා කෙරෙහි එල්ලවන චෝදනාවක් බවට පත්ව ඇත්තේ සිංහල භාෂාව රාජ්‍ය භාෂාව කිරීම නිසා මෙරට ඉංග්‍රීසි අධ්‍යාපනය අඩාල වූ බවට දක්වන චෝදනාවයි. අනෙක් චෝදනාව වන්නේ, මේ නිසා දෙමළ භාෂාව වහරන්නන්ට බලවත් අසාධාරණයක් වූ බවය. එහෙත් මූලිකව සිංහල භාෂාව රාජ්‍ය භාෂාව වීම නිසා මෙරට එක් කණ්ඩායමකට පමණක් ඉහළ ඉගෙනීමට තිබූ වරප්‍රසාදය වෙනුවට, බහුතරයක් වූ පොදු ජනතාවගේ දරුවන්ට උසස් අධ්‍යාපන වරම් හිමි විය. එහි ප්‍රතිඵලය වූයේ, දුර බැහැර ගැමි දරුවන්ට ද ඉහළ පරිපාලන තනතුරු ඇතුළු ප්‍රබල තැන්වලට යාමට පහසුකම් සැලසීමයි. එදා මාර්ටින් වික්‍රමසිංහයන් සඳහන් කළ අයුරින් මෙරට බමුණු කුලයේ බිඳවැටීම ඇරැඹුණේ, බණ්ඩාරනායක නිසාය. බමුණු කුලයෙන් පැමිණි බණ්ඩාරනායක මහතා මේ තීන්දුව ගැනීම සුවිශේෂය. සමහරු බණ්ඩාරනායක මහතා ජාතිවාදියකු ලෙස ලඝු කිරීමට උත්සාහ කළත්, ඔහු සියලු ජාතීන්ට සමාන අවස්ථා මෙන්ම, සමාන බලයක් ලැබිය යුතුය යන අදහස දැරීය. එය, බණ්ඩාරනායක - චෙල්වනායගම් ගිවිසුම් මගින් ඔහු සියල්ලන්ටම සාධාරණය ඉටු කිරීමට ප්‍රයත්න දැරූ බවට ලැබෙන හොඳම සාක්ෂියයි. එදා බණ්ඩාරනායකයන්ට ජාතීන් අතර ගැටලුවට විසැඳුමක් ලබාදීමට සෙසු පාර්ශ්ව ඉඩ දුන්නා නම්, පසු කාලීනව ඇති වූ යුදමය තත්ත්වය ඇති නොවීමට ඉඩ තිබුණි.

දැඩි පාලකයකු නොවූ නමුදු ප්‍රජාතන්ත්‍රවාදීයකු වූ බණ්ඩාරනායක ගත් තවත් හොඳ තීරණයක් වූයේ, එතෙක් බටහිරට වඩාත් බර වූ විදෙස් පිළිවෙත වෙනුවට, චීනය, සෝවියට් දේශය වැනි වාම කඳවුර සමඟ ද සබඳතා ගොඩනගා ගැනීමය. එනිසා අප රටට ලෝකයේ මැදහත් රටක් ලෙස විශාල පිළිගැනීමක් ඇති වුණි. එහි ප්‍රතිඵලය වූයේ, මෙරට කඳවුරු දෙකෙන්ම ඔහුට සහයෝගය ලැබීමය. බණ්ඩාරනායක මහතාගේ මරණයෙන් පසුද ඔහු ඇති කළ සමබර විදෙස් පිළිවෙත අප රටට ඉමහත් වාසි ගෙන දුනි. බණ්ඩාරනායක මහතා හුදු අගමැතිවරයකු පමණක් නොව, රට නව යුගයකට ගෙන යා හැකි දර්ශනයක් ඇති කළ නායකයා ලෙස ද හඳුන්වා දිය හැකිය. කෙටි කාලයක් මෙරට අගමැතිකම් කළ බණ්ඩාරනායක මහතා, මෙරට දේශපාලනයේ පරිවර්තනීය ලක්ෂයක් යැයි කීම ඔහුට දක්වන ගරුත්වයකි. බණ්ඩාරනායක දර්ශනය, ශ්‍රීලනිපය ගැන රටට ඇත්තේ මහත් ගෞරවයකි.

**උදිත ගුණවර්ධන**

# ව්‍යවසායකත්ව ශ්‍රී ලංකාවක් ගොඩ නඟමු



**මහින්ද සාලිය**
සභාපති
ප්‍රාදේශීය සංවර්ධන බැංකුව

අශ්වයකුගේ වේගයෙන් මුදල් හම්බ කර, බූරුවකු ලෙස වියදම් කළහොත්, ඉන් පලක් නැතැයි ව්‍යවසායක ප්‍රජාවට වටහා දෙන RDB පුනර්ජීවන ණය වැඩසටහන සහ ව්‍යවසායක ප්‍රජාව දැනුවත් කිරීමේ නව වැඩපිළිවෙළ මේ දිනවල රට පුරා සාර්ථකව ක්‍රියාත්මක කෙරේ. කොවිඩ් 19 ගෝලීය වසංගතය, ඉකුත් වසරේ පාස්කු ඉරිදා ප්‍රහාරය, ගංවතුර නියං සහ අනෙකුත් ස්වාභාවික විපත් සහ පැවැති දුර්වල ආර්ථික කළමනාකාරීත්වය යනාදිය හේතුවෙන් බිඳ වැටුණු ව්‍යාපාර බලගැන්වීම සඳහා ණය මුදල් ප්‍රදානය කිරීම ද මේ යටතේ සිදු වේ.

මෙහිදී නව ව්‍යවසායකයකු බිහි කිරීමට අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන මෙන්ම, ඊට එහා ගිය සේවා සහ දැනුම ව්‍යවසායක පරපුරට පිරිනැමීම සිදු කෙරේ. ජනපතිඳුන්ගේ 'සෞභාග්‍යයේ දැක්ම' ප්‍රතිපත්ති මාලාව යථාර්ථයක් බවට පත් කර ගැනීමට නම්, අනිවාර්යයෙන්ම ශ්‍රී ලාංකේය පුරවැසියා සාර්ථක ව්‍යවසායකයන් බවට පරිවර්තනය කර ගත යුතුම වේ. මේ අරමුණ පෙරදැරිව අප බැංකුව රට පුරා පළාත්, දිස්ත්‍රික් සහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටම දක්වා වූ කුඩාම ඒකකය කරා පිවිස, ව්‍යවසායකත්වය ගොඩනැගීමට ජාතියට මඟ කියා දෙමින් සිටියි.

මෙහිදී නව ව්‍යවසායකයකු වීමට බලාපොරොත්තුවෙන් අප සමඟ එක්වන ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ පමණක් නොව, මහා පරිමාණ ව්‍යවසායකයකුට හෝ තවත් ඉදිරියට යාමට මාර්ගෝපදේශ ලබාදීම සිදු කෙරේ. අප මුලින් කිව්වාක් මෙන් නව ව්‍යවසායකයකු බිහි කිරීමට මූල්‍ය ප්‍රතිපාදන පමණක් තිබීම ප්‍රමාණවත් වන්නේ නැත. මූල්‍ය ප්‍රතිපාදන ඉතා වැදගත් සාධකයක් වන අතර, සාර්ථක ව්‍යවසායකයකු ගොඩනැඟීමට නම් අනිවාර්යයෙන්ම යමෙකු තුළ තිබිය යුතු ගුණාංග ගණනාවක් වේ. ඒවා එකින් එක පැහැදිලි කර දෙමින්, නව ව්‍යවසායකත්වයක් රට තුළ ගොඩනැඟීමට අපි පියවර ගනිමින් සිටිමු. සාර්ථක ව්‍යවසායකයකු සතුව ඉදිරි දැක්මක් තිබිය යුතුමය. තමන්ගේ ව්‍යාපාරය කුඩාවට හෝ මහා පරිමාණයෙන් හෝ ඇරැඹිය ද, ඉදිරි දැක්මක් සහිත තිරසාර වැඩපිළිවෙළක් නොතිබෙන්නේ නම් එය සාර්ථකව ඉදිරියට නොයනු ඇත.

කුඩා ව්‍යවසායිකාවක ලෙස කංකුන්, මුකුණුවැන්න, ගොටුකොළ ආදී පළා වර්ග අලෙවි කරන කාන්තාවක ගෙන බලමු. ඇය වෙළෙඳ පොළේ පළා වර්ග විකුණන කාන්තාවන් අතර එක් කෙනකු වන්නට පුළුවන. එහෙත් ඇය "පළා විකුණන වෙළෙන්දියකට" වඩා "ව්‍යවසායිකාවක" වනුයේ වෙනත් ගති ගුණ ප්‍රගුණ කිරීම මඟිනි. සෑම පළා විකුණන කාන්තාවක් අතරම ව්‍යවසායක කාන්තාවක මතුවන ගුණාංග අප හඳුනාගත යුතුය.

ඉතා පිරිසුදු, එමෙන්ම නැවුම් පළා වර්ග අලෙවි කරන කාන්තාවක කෙරෙහි භාණ්ඩ මිලදී ගන්නා පාරිභෝගිකයා නිතැතින්ම ඇදී එනු ඇත. තමාගේ ඇඳුම පැළඳුම, තම පාරිභෝගිකයාගේ සිත ආකර්ෂණය කර ගන්නා අයුරින් සකස් කරගෙන ඇති කාන්තාවක හැඳින්වීමට "ව්‍යාපාරික කාන්තාවකට" වඩා "ව්‍යවසායක කාන්තාවක" යැයි යන යෙදුම යෝග්‍යයයි. ඇය අන් පළා විකුණන කාන්තාවන්ගෙන් වෙනස් වනුයේ මේ පිරිසුදු ඇඳුම, කතාබහ සහ හැසිරෙන ආකාරයෙනි.

මෙයම සුළු හා මධ්‍ය පරිමාණ, මහා පරිමාණ ව්‍යාපාර කරන්නන්ට පවා ගළපා ගත හැකි තත්ත්වයකි. ඒ පිළිබඳ අප කරුණු කියා දෙන්නෙමු. තමන් කරන ව්‍යාපාරයේ හෝ සේවාවේ ප්‍රමාණය කුමක් වුවත්, එය වඩාත් පාරිභෝගික සිත් ඇදගන්නා සුළු අයුරින් ඉටුකිරීමේ ප්‍රමාණය අනුව සාර්ථක හෝ අසාර්ථක වනු ඇත. පුංචියට කළ ද, මහා පරිමාණයෙන් කළ ද, සේවාව හෝ ව්‍යාපාරය හෝ පාරිභෝගික ආකර්ෂණය දිනා නොගන්නේ නම්, ඉන් අත්වන ප්‍රතිඵලය සර්ව සම්පූර්ණ නොවනු ඇත.

නව සාර්ථක ව්‍යවසායකයකු බවට පත් වීමට අනිවාර්යයෙන්ම ඉවසීම ප්‍රගුණ කළ යුතුය. එක දවසෙන් මහා පරිමාණ ව්‍යාපාර ගොඩනැගෙන්නේ නැත. ඒවා ඉතා ක්‍රමිකව, කාලානුරූපව වර්ධනය වනු අප දැක ඇත. සාර්ථක ව්‍යවසායකයකු නම්, එක දවසෙන් සියල්ල ජය ගැනීමට සිහින නොදැකිය යුතුය. ක්‍රම ක්‍රමයෙන් ජයග්‍රහණය අත්පත් කර ගැනීමට අධිෂ්ඨානශීලීව, කෙතරම් බාධක, අභියෝග ඇති වුවත්, ඒවායින් නොසැළී ඉදිරියට යාමට ඉවසිලිවන්තව ක්‍රියා කළ යුතුය.

අප රටේ ජනගහනයෙන් 52% ක් කාන්තාවෝ වෙති. මේ කාන්තාවන් අතරින් සාර්ථක ව්‍යවසායක කාන්තා පරපුරක් බිහි කර ගැනීමට අප පියවර ගත යුතුය. ඒ අනුව යමින් ඉතා කුඩාවට ව්‍යාපාර ඇරැඹීමට පියවර තබන පුංචි අංකුර බඳු ව්‍යවසායිකාවන් තෝරාගෙන, ඔවුන්ට නිවැරදි මඟ පෙන්වා දීම බැංකු පද්ධතියේ වගකීමය. බැංකු නිලධාරීහු වශයෙන් අංකුර ව්‍යවසායිකාවන් හඳුනාගෙන, ඔවුන්ට මූල්‍ය ප්‍රතිපාදන ලබා දීමට අමතරව, වඩාත් විශ්වසනීය ගනුදෙනුකාර සේවාවක් ඉටු කිරීමට මූල්‍ය විනය ඉගැන්විය යුතුය. කුඩා කණ්ඩායම් ලෙස ඉතිරි කිරීමේ පුරුද්ද, සකසුරුවම පිළිබඳ කියා දිය යුතුය. මෙය ප්‍රායෝගිකව ක්‍රියාවට නංවා, ජාතික ඉතුරුම් ප්‍රමාණය ඉහළ නංවා ගත යුතුය. ඊට අමතරව, ඉතුරුම් ආයෝජනය ලෙස නැවත ඔවුන්ට පිරිනැමීමේදී අවධානමක් දැරීම කළ යුතුය.

ඕනෑම සාර්ථක කාන්තා ව්‍යවසායිකාවක බිහි වී තිබෙනුයේ මුළුතැන් ගෙයිනි; කුස්සියෙනි. මුළුතැන්ගෙහි සකසුරුවම මනාව ප්‍රගුණ කරන කාන්තාවක, යම් ව්‍යාපාරික කටයුත්තක්, සේවාවක් ආරම්භ කළ හොත්, ඒ ලද පන්නරය තුළ ඉතා සාර්ථකව ඉහළට ගමන් කරන බවට විවාදයක් නැත. මීට අමතරව තමන් හා තම ගෙවත්ත අවට පවතින සම්පත් මැනවින් කළමනාකරණය කර ගනිමින්, ඒවාට නව තාක්ෂණය හා දැනුම යොදා ගනිමින්, අලුතින් සිතා ව්‍යාපාරික කටයුතු කරන අරමුණින් නවෝත්පාදන නිපැයුම් කිරීමට අප පෙළඹවිය යුතුය. කොස්, පොල්, දෙල් හා වෙනත් ශාක සියල්ලෙහි සියලු අංගෝපාංග මනාව ප්‍රයෝජනයට ගනිමින්, නව ආකාරයක නිපැයුම් කර, වෙළෙඳ පොළ ජය ගැනීමට ඕනෑ තරම් ඉඩ කඩ, අප සමාජයේ පවතී. මේවා පිළිබඳ අන් අය සිතන ආකාරයට වෙනස් අයුරින්, වෙනස් ඇසකින් දැක, වෙනස් මනසකින් සිතා කටයුතු කිරීමට ඔබට හැකි නම්, ඔබ සාර්ථක ව්‍යවසායකයකු වනු ඇත. ලෝකයේ දියුණු රටවල ජනගහන යෙන් වැඩි ප්‍රතිශතයක් ව්‍යවසායකයෝ වෙති. ආසියානු කලාපයේ මැලේසියාවේ මේ ප්‍රතිශතය 20% කි. තායිලන්තයේ 17% කි. බංග්ලාදේශයේ පවා 18% ව්‍යවසායකත්ව ජනගහනයක් ජීවත් වෙති. ශ්‍රී ලංකාවේ ව්‍යවසායකත්ව ජනගහනය 3%ක් තරම් වේ. එසේ නම් අප කළ යුත්තේ, වහාම රටේ ජනගහනයෙන් බහුතරයක් නව ව්‍යවසායකයන් ලෙස ගොඩනැඟීමට පියවර ගැනීමය. ඒ සඳහා මේ වනවිට මෙරට විශාලතම සංවර්ධන බැංකුව ලෙස RDB බැංකුව මුල පුරා තිබේ.

යම් ව්‍යාපාරයක් එක එල්ලේම සාර්ථක වේවා යැයි ප්‍රාර්ථනා කළ පමණින් එය සිදු වන්නේ නැත. එම ප්‍රාර්ථනා ද සිතෙහි තබා, ඉතාමත්ම කැපවීමෙන්, අඩු පිරිවැයක් දරා, ගුණාත්මක, ප්‍රමිතිගත, ඉතා උසස් භාණ්ඩ හා සේවා නිෂ්පාදනය කිරීමට ව්‍යවසායකයන් පුරුදු කළ යුතුය. එලෙස ඉතා ගුණාත්මක භාණ්ඩ හා සේවා නිෂ්පාදනය කරන්නේ නම්, පාරිභෝගිකයන් ඒ තුළට වැඩි වැඩියෙන් එක්කර ගැනීමට අපහසු නොවේ. මේවා නව ව්‍යවසායක පරපුරක් බිහි කිරීමට අමුතුවෙන් කිව යුතු කරුණු නොවේ යැයි කෙනකුට සිතෙන්නට පුළුවන. එනමුත් මේ පුංචි පුංචි ක්‍රියාමාර්ග ඉතා ගැඹුරට කල්පනා කර බලා ක්‍රියාවට නැංවීම තුළ, ලොව දැවැන්ත ව්‍යවසායක ආයතන බිහිවී ඇති බව ලෝකය, ලෝක වෙළෙඳාම, ලෝකයේ ප්‍රබල වෙළෙඳ නාම පිළිබඳ සොයා බලන්නකුට දැකිය හැකි කරුණකි. ඉතා දුෂ්කර සහ අභියෝගාත්මක ගමන් මඟක් ඔස්සේ ගමන් කර සාර්ථක ව්‍යවසායකයකු රටට බිහි වන්නේ නම්, ඒ තුළින් පුංචිම ඒකකය වන පවුල, ගම, ප්‍රදේශය, පළාත, සමස්ත රට, අනතුරුව ලෝකය පවා ජය ගැනීමට අපට හැකිවනු නො අනුමානය.

**ජයසිරි මුණසිංහ**

| ගොවිසෙත | සුපිරි වාසනා | ලග්න වාසනාව | කෝටිපති කප්රුක | සංවර්ධන වාසනාව | ජයෝදා | ශනිදා වාසනාව | සුපර් බෝල් | ජාතික සම්පත | අද කෝටිපති | වාසනා සම්පත | දරු දිරි සම්පත |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 2020 - 09 - 27 | 2020 - 09 - 21 | 2020 - 09 - 08 | 2020 - 09 - 27 | 2020 - 07 - 31 | 2020 - 09- 09 | 2020 - 09 - 09 | 2020 - 09- 27 | 2020 - 09-02 | 2020 - 09 - 09 | 2020 - 09 - 07 | 2020 - 07 - 30 |
| දිනුම් වාරය - 2553 | දිනුම් වාරය - 1537 | දිනුම් වාරය - 2916 | දිනුම් වාරය - 630 | දිනුම් වාරය - 354 | දිනුම් වාරය - 1688 | දිනුම් වාරය - 3366 | දිනුම් වාරය - 1228 | දිනුම් වාරය - 1051 | දිනුම් වාරය - 1036 | දිනුම් වාරය - 1611 | දිනුම් වාරය - 013 |
| 14 38 55 73 | 01 33 37 57 | 21 37 45 59 | 11 21 45 64 | 22 23 40 | 07 31 35 43 | 31 34 60 64 | 11 27 35 42 | 6 4 8 3 9 6 | 07 12 39 48 | 10 11 37 57 | 04 12 33 63 |
| අක්ෂරය P | සුපිරි අංකය -01 | ලග්නය-මිතුන විශේෂිත අංක රු 500 ත්‍යාග සඳහා-9609 | ඉංග්‍රීසි අක්ෂරය- E | දෛව අංකය - 02 අක්ෂරය- L | අක්ෂරය-A | අක්ෂරය - D | අක්ෂරය - Q විශේෂ අංකය -5767 | අක්ෂරය -K | අක්ෂරය - K රු 500 ත්‍යාග සඳහා-2169 රු 100 ත්‍යාග සඳහා-786 | අක්ෂරය - Z | අක්ෂරය - U |

## එක්නැලිගොඩ සිද්ධියට ගෝඨාභය හවුල් කිවුවොත්

# කෝටි 6කේ දී ඔස්ට්‍රේලියාවට හෝ නවසීලන්තයට යවනවා කිවුවා

## යුද හමුදා බුද්ධි අංශයේ කෝප්‍රල්ගේ බිරිය ජනපති කොමිසමේදී කියයි

**රෝෂන් තුෂාර**

මාධ්‍යවේදී ප්‍රගීත් එක්නැලිගොඩ මහතා පැහැරගෙන ගොස් අතුරුදන් කිරීමේ සිද්ධියට ගෝඨාභය රාජපක්ෂගේ නම ප්‍රකාශ කළහොත්, රුපියල් කෝටි 6ක මුදල් සහ ඔස්ට්‍රේලියාවට හෝ නවසීලන්තයට ගොස් පදිංචි-වීමට අවස්ථාව උදා කර දෙන බව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ විමර්ශන නිලධාරීන් තමාට ප්‍රකාශ කළේ යැයි දේශපාලන පළි ගැනීම් පිළිබඳ විමර්ශනය කිරීමේ ජනාධිපති කොමිසමේ සාක්ෂි දුන් ත්‍රස්ත විරෝධී ජාතික ව්‍යාපාරයේ ක්‍රියාකාරී සාමාජික, යුද හමුදා බුද්ධි අංශයේ කෝප්‍රල් එස්. කේ. උළුගෙදර මහතාගේ බිරිය වන සුදර්ශනී මහේෂිකා මහත්මිය පසුගිය දා (25) පැවසුවාය.

ජනපති ගෝඨාභය මහතාගේ නම ප්‍රකාශ කරන ලෙසට මහේෂිකා මහත්මියට බලපෑම් කළ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ වග-උත්තරකාර පොලිස් පරීක්ෂකවරයා හඳුනා ගනිමින් කොමිසම හමුවේ එම සාක්ෂි දුන්නාය.

මාධ්‍යවේදී ප්‍රගීත් එක්නැලිගොඩ මහතා පැහැරගෙන ගොස් අතුරුදන් කිරීමේ සිද්ධියට අදාළව බොරු සාක්ෂි සකසා දේශපාලන පළි ගැනීම් කළ බවට සඳහන් කරමින් යුද හමුදා බුද්ධි අංශයේ කෝප්‍රල් එස්. කේ. උළුගෙදර මහතා පැවරූ පැමිණිල්ලේ සාක්ෂි ලබාදෙමින් එසේ පැවසුවාය.

කොමිසමේ සභාපති හිටපු ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු උපාලි අබේරත්න මහතා ඇතුළු ත්‍රිපුද්ගල විනිසුරු මඩුල්ල හමුවේ මේ සාක්ෂි දුන්නාය.

මහේෂිකා මහත්මිය මෙසේද පැවසුවාය.

මගේ ආත්ම ගෞරවය උකසට තබා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේ-න්තුවේ උප පොලිස් පරීක්ෂක ප්‍රේමතිලක ඇතුළු නිලධාරීන් අසත්‍ය ප්‍රකාශ සටහන් කර ගැනීමට කටයුතු කළා. අපරාධ පරීක්ෂණ දෙපාර්ත-මේන්තුවේ නොහැකියාව වසා ගැනීමට විමර්ශන නිලධාරීන් උත්සාහ කළා.

2017. 01. 20 දින සී. අයි. ඩී. උප පොලිස් පරීක්ෂක ප්‍රේමතිලක ප්‍රමුඛ නිලධාරීන් හයදෙනකු අලුයම 2ට පමණ නිවෙසට පැමිණ ස්වාමියා භාවිත කළ බව කියන දුරකතනයක් පිළිබඳ තර්ජනාත්මකව විමසුවා.

" ඔයාගේ මහත්තයා හරිම අහිංසකයි. හැබැයි මිනිහට කියන්න කියන දේට එකඟ වෙන්න කියලා. තනිකරම ගෝඨාභය රාජපක්ෂ තමයි මේ නාට්‍ය අධ්‍යක්ෂණය කරලා තියෙන්නේ. නළුවෝ දාන්න විතරයි තියෙන්නේ. ඔයාගේ මහත්තයට තියෙන්නේ චූටි චරිතයක් කරන්න.".

රාත්‍රී ඇඳුමෙන් සැරසී සිටීම නිසා මම අපහසුතාවට පත් වුණා. එම ඇඳුම මාරු කර ගැනීමට ප්‍රේමතිලක නමැත්තා ඉඩ දුන්නේ නැහැ. ප්‍රගීත් එක්නැලිගොඩ මහතා පැහැරගෙන ගොස් අතුරුදන් කිරීමේ සිද්ධියට ගෝඨාභය රාජපක්ෂගේ නම ප්‍රකාශ කළහොත්, රුපියල් කෝටි 6ක මුදල් සහ ඔස්ට්‍රේලියාවට හෝ නවසීලන්තයට ගොස් පදිංචි වීමට අවස්ථාව උදා කර දෙන බවද ප්‍රකාශ කළා.

අසත්‍ය ප්‍රකාශ කිරීමට නොහැකි බව උප පොලිස් පරීක්ෂක ප්‍රේමති-ලක නමැත්තාට ප්‍රකාශ කළා. එහිදී තර්ජනය කර " බණ්ඩා ඉන්න විදිය බලන්න. රන් බණ්ඩාගේ බිරියට මොළේ තියනවා. තමුසේ හරි පණ්ඩි-තයි යනුවෙන් පවසමින් කොළයකට අත්සන් ලබාගෙන නිවෙසින් පිටව ගියා. මගේ සැමියා යුද හමුදා බුද්ධි අංශ නිලධාරියෙක්. කිසිදු දිනෙක යුද හමුදා නිල ඇඳුමින් සැරසී නිවෙසට පැමිණ නැහැ.

එහෙත් එක් දිනකදී සී. අයි. ඩී. යේ ප්‍රේමතිලක නැමැත්තා මගේ මහ-ත්තයව නිල ඇඳුමෙන් මාර්ගය දිගේ අපරාධකරුවකු රැගෙන එන ආකා-රයට ඇද ගෙන ආවා. සාක්ෂිකාරිය හැඟුම්බර වෙයි.

එම අවස්ථාවේ ප්‍රේමතිලක යන අය "සැමියා යුනිෆෝම් එකෙන් ඉන්නවා ෆොටෝ එකක් ගහලා තියා ගනින්. ආයෙත් දකින්න වෙයිද දන්නෙ නැහැ. මුන් ලයිසන් ගත්ත චණ්ඩි. මූං මාර බුද්ධි අංශ තමයි. මූං මන්ද බුද්ධි අංශයේ. දැන ගනින් ආයෙත් අවුරුදු විස්සකට විසි පහකට මහින්දගේ ආණ්ඩුව එන්නේ නැති බව පිළිගනින්". යනුවෙන් පහර දීමට තැත් කරමින් තර්ජනාත්මකව ප්‍රකාශ කළා. සිදුවූ මේ අසාධාරණය පිළි-බඳ 2017 දී මානව හිමිකම් කමිෂන් සභාව මෙන්ම පොලිස්පතිතුමාගේ සහන මැදිරියට පැමිණිලි ඉදිරිපත් කළා. ඔවුන් ඒ පිළිබඳ නොසලකා හැරියා.

මෙහිදී බන්ධනාගාරගතව සිටින වගඋත්තරකාර ප්‍රේමතිලක මහතා හඳුනාගත හැකි දැයි කොමිසමේ සභාපතිවරයා සාක්ෂිකාරියගෙන් විමසා සිටියේය.

තමන් පීඩාවට පත් කළ නිලධාරීන් කිසිදා අමතක නොවන බව මහේ-ෂිකා මහත්මිය සාක්ෂි දෙමින් පැවසුවාය.

## ප්‍රවීණ මාධ්‍යවේදී මහිලාල්ගේ අවසන් කටයුතු අද



ප්‍රවීණ මාධ්‍යවේදී මහිලාල් . එම් .සෙනෙවි-රත්න මහතා අභාවප්‍රාප්ත විය.

අභාවප්‍රාප්ත වන විට 65 වැනි වියෙහි පසු වූ මහිලාල් එම්. සෙනෙවිරත්න මහතා කොළඹ රාජකීය විදුහලේ ආදි සිසුවෙකි .

එක්සත් ජාතික පක්ෂයේ නිල පුවත්පත වන සියරට පත්‍රයේ කර්තෘවරයා ලෙස මාධ්‍ය ජීවිතය ඇරැඹූ සෙනෙවිරත්න මහතා වත්මන් විපක්ෂ නායක සජිත් ප්‍රේමදාස මහතා නිවාස අමාත්‍ය ලෙස සිටියදී සහ ඊට පෙර ඔහුගේ මාධ්‍ය ලේකම්වරයා ලෙස වසර දහයකට වැඩි කලක් කටයුතු කළේය .

මහිලාල් .එම්. සෙනවිරත්න මහතා හොඳම මාධ්‍ය ලේකම්වරයා ලෙස 'මාස්කෝ' සම්මානයෙන් ද පිදුම් ලබා තිබේ .

සෙනවිරත්න මහතාගේ දේහය අංක 400 බී, නව නුවර පාර තලං-ගම කොස්වත්ත ලිපිනයේ පිහිටි මහින්ද පනාගොඩ සහ සමාගමේ මල් ශාලාවේ තැන්පත් කර ඇති අතර, අවසන් කටයුතු අද (28) සවස 4ට තලංගම පොදු සුසාන භූමියේ දී සිදු කෙරෙයි.

## සමාජ සේවිකාවගේ අවසන් කටයුතු අද

ප්‍රකට සමාජ සේවිකාවක් වූ ප්‍රේමා හෙලපිටගේ (81) මහත්මිය අභා-වප්‍රාප්ත වූවාය.

දේහය කටුගස්තොට ගොහාගොඩ අංක 621 දරන නිවසේ තැන්පත්කර තිබෙන අතර අවසන් කටයුතු අද (28) පස්වරු 6ට යටිවාවාල පොදු සුසාන භූමියේදී සිදු කිරීමට නියමිතය.

# වැඩි මිලට පොල් විකුණන වෙළෙඳුන් සොයා වැටලීම් අරඹනවා

## පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ සභාපති

**සුභාෂිණී සේනානායක සහ මානෙල් පුෂ්ප කුමාරි**

අති විශේෂ ගැසට් පත්‍රයක් නිකුත් කරමින් පොල් සඳහා උපරිම සිල්ලර මිලක් නියම කිරීමෙන් අනතුරුව පොල් වැඩි මිලට විකු-ණන වෙළෙඳුන් සොයා වැටලීම් ආරම්භ කරන බව පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ සභාපති විශ්‍රාමික මේජර් ජෙනරාල් ශාන්ත දිසානායක මහතා ඊයේ දිනමිණට ප්‍රකාශ කළේය.

ගැසට් පත්‍රය නිකුත් කිරීමෙන් අනතුරුව ඊයේ (27) සහ පෙරේදා දිවයින පුරා වෙළෙඳුන් දැනුවත් කිරීමට පියවර ගත් බවත් පොල් ගෙඩියේ වට ප්‍රමාණය අනුව මිල නියම නොකරමින් පොල් අළෙවිකරන්නන් සොයා වැටලීම් සිදු කරන බවත් ඒ මහතා කියා සිටියේය.

පොල් ගෙඩියේ වට ප්‍රමාණය අනුව මිල නියම කරනු ලැබූ අතර එම වට ප්‍රමාණය සකස් කරගැනිම අසීරු කටයුත්තක් නොවන බව කියා සිටි සභාපතිවරයා එම මිල ගණන්වලට පොල් අළෙවි නොකරන්නේ නම් අධිකාරියේ අංක 1977 දුරකතන ඇමැතු-මක් ලබා දෙමින් විස්තර දන්වන ලෙසද පාරිභෝගිකයන්ගෙන් ඉල්ලා සිටියේය. පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පොල් ගෙඩියක් අලෙවි කළ හැකි උපරිම මිලක් දක්වමින් ඉකුත් (25) ගැසට් නිවේදනයක් නිකුත් කළ අතර වට ප්‍රමාණය අඟල් 13ට වැඩි පොල් ගෙඩියක් අලෙවි කළ හැකි උපරිම සිල්ලර මිල රුපි-යල් 70කි.

වට ප්‍රමාණය අඟල් 12 - 13 අතර වන පොල් ගෙඩියක උපරිම සිල්ලර මිල රුපියල් 65ක් වන අතර වට ප්‍රමාණය අඟල් 12ට අඩු පොල් ගෙඩියක් අලෙවි කළ හැක්කේ, රුපියල් 60කට පමණය.

අදාළ නිවේදනයේ දැක්වෙන්නේ, උපරිම මිලට වඩා ඉහළ මිල-කට අලෙවි කිරීම, අලෙවිය පිණිස තැබීම හෝ අලෙවිය සඳහා ප්‍රදර්ශනය කිරීම හෝ සිදුනොකළ යුතු බවය.

# තෙල් නැවක 17කට කොරෝනා

## කොළඹදී නැවට නැග්ග පිරිස පවුල්වල උදවිය නිරෝදායනයට

**අසේල කුරුළුවංශ**

කොළඹ වරායට පැමිණ ත්‍රිකුණාමලය වරාය වෙත ගමන් ගනිමින් තිබූ තෙල් නැවේ කාර්ය මණ්ඩලයේ දාහත්දෙනකුට කොවිඩ්-19 අසාදිත බව තහවුරු වීමෙන් පසු එම නැවට කොළඹ වරායේදී රාජකාරි සඳහා ඇතුළු වූ ශ්‍රී ලාංකික නිලධාරීන් පිරිසක් සහ ඔවුන්ගේ පවුල්වල උදවිය නිරෝධානයට යොමුකළ බව යුද හමුදාපති ලුතිනන් ජනරාල් ශවේන්ද්‍ර සිල්වා මහතා පවසයි. නැවේ කාර්මණ්ලය කොවිඩ්-19 පළමු පරීක්ෂණයට යොමුකළ අවස්ථාවේ ඔවුන්ට වෛරසය ආසාධනය වී තිබෙන බව තහ-වුරුව තිබෙන බවත් අදාළ නැවට කොළඹ වරායේදී ඇතුළු වූ ශ්‍රී ලාංකිකයින් පස් දෙනෙකු ඔවුන්ගේ පවුල් වල සාමාජිකයින් සමඟ සබඳතා පවත්වා තිබෙන බැවින් ඒ අය නිරෝධායනයට යොමුකළ බවත් ඒ මහතා කීය.

ලෝක සංචාරක දිනය නිමිත්තෙන් ඊයේ (27) මහනුවර කැන්ඩි සිටි සෙන්ටර් හිදී පැවැති උත්සවයකට සහභාගි වීමට පැමිණි අවස්ථාවේ මාධ්‍ය හමුවේ අදහස් දක්වමින් යුද හමුදාපතිවරයා මේබව ප්‍රකාශ කළේය.

නාවික පයිලට්වරු දෙදෙනෙකු,වෛද්‍යවරයෙකු ඇතුළු පස් දෙනෙකුගේ සහ ඔවුන්ගේ පවුල් වල සාමාජිකයින් මෙලෙස නිරෝධායනයට යොමු කළ බවද හෙතෙම පැවසුවේය.

මෙරටට පැමිණි රුසියානු ගුවන් යානයක කාර්යමණ්ඩල සාමාජිකයෙකුට කොවිඩ්-19 අසාධනය වී තිබෙන බවට පළමු පරීක්ෂාවෙන් තහවුරු වුවත් දෙවන පී.සී.ආර් පරීක්ෂණයෙන් එවැනි තත්ත්වයක් පෙන්නුම් නොකළ බවත් ඔහු රටින් පිටත්කර හැරීමට පියවර ගත් බවත් කී යුද හමුදාපතිවරයා එම යානයේ පැමිණි 84 දෙනෙකු පී.සී.ආර් පරීක්ෂණ සිදුකර නිරෝධායනයට යොමුකර තිබෙන බවද අවධාරණය කළේය.

විදේශ රටවල සිට මෙරටට පැමිණෙන ඇතැම් අය කරනු ඉල්ලීම මත ඔවුන්ව මුදල් ගෙවීමේ පදනම මත හෝටල් වල නිරෝධායනයට යොමුකරන බවත් එලෙස යොමු කරන අයට ආහාර සැපයීමේදී නොයෙක් අඩුපාඩු ඇතැම් හෝටල් මගින් සිදුකරන බවට චෝදනා එල්ලවන බවත් ඒ මහතා කීය.

සංචාරක කර්මාන්තය බිඳ වැටී ආර්ථික ගැටලු වලට හෝටල් හිමියන් මුහුණ දී සිටින අවස්ථාවක නිරෝධායනයට ලක්වන පිරිස් මගින් යම් මුදලක් උපයා ගැනීමට අවස්ථාව රජය ඔවුන්ට ලබාදී තිබෙන බවත් ඒ සඳහා රජය නියමකර තිබෙන කොන්දේසි කඩ නොකර අදාළ සේවය නිසිලෙස ලබාදෙන ලෙස තමන් හෝටල් හිමියන් ගෙන් ඉල්ලා සිටින බවත් හෙතෙම අවධාරණය කළේය.

කොවිඩ් වසංගතය පාලනය කිරීමේදී අප වෙනත් කිසිදු රට-කට දෙවැනි නොවන ආකාරයට එය සිදුකර තිබෙන බවද ඒ මහතා කීය.

# එජාපයට නැති වුණ ජනතා විශ්වාසය යළි දිනා ගන්නවා - රුවන් විජයවර්ධන

**ශිරෝමි අබයසිංහ**

එක්සත් ජාතික පක්ෂයට අහිමි වී ගිය ජනතා විශ්වාසය යළි දිනා ගැනීමට කටයුතු කරන බව පක්ෂයේ ප්‍රතිසංවිධාන කටයුතු මාතරදී පෙරේදා (26) ආරම්භ කරමින් එහි නියෝජ්‍ය නායක රුවන් විජයවර්ධන මහතා සඳහන් කළේය.

පාලන බලය තිබියදී පාක්ෂිකයන්ගේ ප්‍රශ්න සොයා නොබැලීම නිසා කලකිරුණු පාක්ෂි-කයන් පක්ෂයෙන් ඈත් වූ බවත් නැවතත් ඔවුන් ළං කර ගෙන පක්ෂය යළි නගා සිටු-වීමට කටයුතු කරන බවත් ඒ මහතා පැවසීය.

පක්ෂයේ ප්‍රතිසංවිධාන කටයුතු ආරම්භ කරමින් මාතර ආසනයේ නව පක්ෂ කාර්යා-ලයක් විවෘත කිරීමේ අවස්ථාවට සහභාගි වූ විජයවර්ධන මහතා මාතර මන්තීන්ද පිරිවෙන් විහාරස්ථානය, දෙවිනුවර රාජමහා විහාර-ස්ථානය සහ වැව්රුකන්නල බුදු රජමහ විහා-රස්ථානය වෙත ගොස් මහා සංඝරත්නයේ ආශිර්වාදය ලබා ගත් අතර, උපුල්වන් ශ්‍රී රජ-මහා විෂ්ණු දේවාල වෙත ගොස් දේවාශිර්වා-දය ලබා ගත්තේය.

එහිදී අදහස් දක්වමින් ඒ මහතා මෙසේද කීය.

පක්ෂයේ ප්‍රතිසංවිධාන කටයුතු මාතරින් ආරම්භ කළා. හිටපු සියලු මන්ත්‍රීවරුන්, ආසන සංවිධායකවරුන්, පළාත් පාලන නියෝජිත-යන් සහ පාක්ෂිකයන් හමුවී සාකච්ඡා කළා. එකම අරමුණකින් නැවතත් ශක්තිමත්ව පක්ෂය ඉදිරියට ගෙන යනවා.

අප සැමදාම කටයුතු කළේ සංඝයා වහ-න්සේලාගේ අවවාද අනුශාසනා මතයි. අප ඉදිරියටත් මහා නායක හිමිවරුන් ඇතුළු සංඝරත්නයේ ආශීර්වාදය ලබා ගෙන කටයුතු කරනවා.

අපේ පාක්ෂිකයන් අපට අහිමි වී නැහැ. පසුගිය කාලයේ අප පාක්ෂිකයන්ගේ ප්‍රශ්නව-ලට මැදිහත් වුණේ නැහැ. ඔවුනගෙන් සමාව ඉල්ලීමට මා මෙය අවස්ථාවක් කර ගන්නවා. කළ කිරීම මත ඔවුන් පසුගිය මහ මැතිව-රණයේ දී ඡන්දය ප්‍රකාශ කිරීමෙන් වැළකී සිටියා. අප නැවත ඔවුන්ගේ විශ්වාසය දිනා ගත යුතු වෙනවා. අපෙන් වූ වැරදි ඉදිරියේදී නොවන ආකාරයට පාක්ෂිකයින් ද ආරක්ෂා කර ගනිමින් අප අලුත් ගමනක් යනවා.

## ලක්ෂ 20ක විදෙස් දුම්වැටි සමඟ ව්‍යාපාරිකයෙක් අත්අඩංගුවට

රුපියල් ලක්ෂ 20ක් පමණ වටිනා විදේශීය නිෂ්පාදිත දුම්වැටි තොගයක් තම නිවෙසෙහි සඟවා ගෙන සිටි මීගමුව ප්‍රදේශයේ පදිංචි ව්‍යාපාරිකයකු මීගමුව සුරාබදු දෙපාර්තමේන්තු නිලධාරීන් පිරිසක් සිදු කළ වැටලීමකදී අත්අඩංගුවට ගෙන තිබේ.

මොහු මීගමුව පෙරියමුල්ල ප්‍රදේශයේ පදිංචි 65 හැවිරිදි ව්‍යාපාරි-කයෙකි.

මොහු මේ විදේශීය නිෂ්පාදිත දුම්වැටි 30,000ක තොගය වෙනත් ව්‍යාපාරිකයකුගෙන් ලබා ගෙන අලෙවි කිරීම සඳහා සූදානම් කර තිබි-යදී සුරාබදු නිලධාරීන් වෙත ලද තොරතුරක් මත මේ අත්අඩංගුවට ගැනීම සිදු කර තිබුණි.

මේ වන විට ව්‍යාපාරිකයා සහ ඔහු සන්තකයෙහි තිබූ දුම්වැටි තොගය වැඩි දුර විමර්ශන කටයුතු සඳහා ගම්පහ නියෝජ්‍ය සුරාබදු කාර්යාලය වෙත යොමු කර තිබේ.

01 වැනි පිටුවෙන්...

## 20 භයානකයි..

ඇය මේ බව පැවසුවේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ, නිර්මාතෘ දිවංගත එස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක මහතාගේ 61 වැනි ගුණ සමරු උත්සවයට පෙරේදා (26) එක්වෙමිනි. ගම්පහ හොරගොල්ල බණ්ඩාර-නායක සමාධිය අසල දී මේ උත්සවය පැවැත්විණි.

එම අවස්ථාවේ දී මාධ්‍යවේදීන් ශ්‍රී ලංකා නිදහස් පක්ෂය සම්බන්ධ-යෙන් නැඟූ ප්‍රශ්නවලට පිළිතුරු දෙමින් හිටපු ජනාධිපතිනි චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මහත්මිය පැවසුවේ, ශ්‍රී ලංකා නිදහස් පක්ෂ සිය පවුලේ බූදලයක් ලෙස නොසලකන බවය.

පොදු ජනතාවගේ නායකයකුට පක්ෂය දුන් නමුත් ඔහු නිසි ලෙස කටයුතු නොකළ බවත් එම නායකයා පක්ෂය කැලි කැලිවලට ඉරා දැමූ බවත් හිටපු ජනාධිපතිනිය පැවසුවාය.

## පාස්කුදා ප්‍රහාරය..

රථවාහන අංශය දැනුවත් කරමින් වාහන ආරක්ෂාව යොදවා හදිසි මුරපලවල් ඇති කරමින් බොහෝ දේ සිදු කළ හැකිව තිබූ බව පෙන්වා දුන් ඒ මහතා එවැනි විශේෂ අවස්ථාවක offencive offence පීඩාකාරී ආක්‍රමණයක් සිදු කළ හැකිව තිබූ බව කොමිසම හමුවේ කියා සිටියේය. ඒ වනවිටත් මඩකළපුවේ ටෙස්ට් රන් එකක පිපුරුමක් සිදුව තිබුණා. අවා-සනාවට අප්‍රේල් 20 ලද බුද්ධි තොරතුර විශේෂ ආරක්ෂක බළකාය සමඟ බෙදා ගත්තේ නැහැ යැයිද ඒ මහතා කියා සිටියේය.

සහරාන් හෂීම් සම්බන්ධයෙන් මට වැඩි විස්තර ලැබුණේ පාස්කු ප්‍රහා-රයෙන් පසුවයි. ආරක්ෂක මණ්ඩල රැස්වීමට එන ලෙස මට ප්‍රහාරයෙන් පසුව දැන්වීමක් ලැබුණා. එහිදී අන්තවාදීන් 98ක් හඳුනාගෙන සිටින බවත් එහි ජමීල් සාජිත් මව්ලවි, මිල්හාන් ඇතුළු ත්‍රස්ත ප්‍රහාරකයන්ගේ නම් හයක්ද ඇතුළත්වී තිබුණා. මේ ලැයිස්තුව කා සමඟ ද හුවමාරු කරගෙන තිබුනේ. මම එහිදී කිව්වා දැන් හරි එක්වී මේ අය අත්අඩංගුවට ගමු කියලා යැයිද ලතීෆ් මහතා විමසූ පැනයකට පිළිතුරු ලබා දෙමින් කියා සිටියේය.

## ජනපති කොමිසමට..

කොමිසමේ සභාපති විනිසුරු හිටපු ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු උපාලි අබේරත්න මහතා මෙම නියෝගය සිදු කළේ බන්ධනාගාරගතව සිටින මයුරන් මහතා සිදු කළ පැමිණිල්ලක් කැඳවූ අවස්ථාවේදීය.

පෙරේදා (26) විජයකලා මහේෂ්වරන් මහත්මිය කොමිසම හමුවේ පෙනී සිටියාය.

මෙම සිද්ධියට අදාළව වගඋත්තරකරුවන් ලෙස හිටපු රාජ්‍ය ඇමැතිනි විජයකලා මහේෂ්වරන්, යාපනය දිස්ත්‍රික්කයේ දේශපාලනඥයකු වන සර්වනාදන් යන අයවළුන් නම් කර ඇත.

පොලිස් කොස්තාපල් මයුරන් මහතා 2011 වසරේ චුන්නාකම් පොලිස් වසමේ සිදු වූ මංකොල්ලකෑමක් සම්බන්ධයෙන් අත්අඩංගුවට ගනු ලැබූ සැකකරුවකු ඉන් මිදී පලා යාම සම්බන්ධයෙන් චෝදනා ලැබ සිටින මයු-රන් මහතා 2016දී මල්ලාකම් මහේස්ත්‍රාත් අධිකරණය විසින් වසර 10ක සිර දඬුවම් නියම කර ඇති අතර බන්ධනාගාර නිලධාරීන්ගේ විශේෂ ආරක්ෂාව යටතේ ඔහු දේශපාලන කොමිසම වෙත රැගෙන විත් තිබුණි.

එහිදී තමාට එලෙස සිර දඬුවම් නියම කිරීමට දේශපාලන බලපෑමක් සිදු වූ බවත් හිටපු රාජ්‍ය ඇමැතිනි විජයකලා මහේෂ්වරන් මහත්මිය සහ එවකට මල්ලාකම් අධිකරණයේ කටයුතු කළ මහේස්ත්‍රාත්වරයා අතර දේශපාලන සබඳතාවක් පැවැති බවත් මයුරන් මහතා කොමිසම හමුවේ සාක්ෂි ලබා දෙමින් කියා සිටියේය.

එහිදී විජයකලා මහත්මිය වෙනුවෙන් පෙනී සිටි නීතිඥවරයා සාක්ෂි-කරු වන මයුරන් මහතාගෙන් ඒ සම්බන්ධයෙන් සාක්ෂි ඇද්දැයි විමසා සිටි අතර එහිදි මයුරන් මහතා කියා සිටියේ මේ වනවිටත් ඒ සම්බන්ධ-යෙන් වන සාක්ෂි කොමිසම වෙත ඉදිරිපත් කර ඇති බවය.

එමෙන්ම පෙරේදා කොමිසම හමුවේ හිටපු විදේශ අමාත්‍ය මංගල සම-රවීර මහතා ද පෙනී සිටි අතර මාධ්‍යවේදී ප්‍රගීත් එක්නැලිගොඩ අතුරුදන් කිරීම සම්බන්ධයෙන් යුද හමුදා බුද්ධි අධ්‍යක්ෂ කර්නල් ශම්මි කුමාරරත්න මහතා සිදු කළ පැමිණිල්ලකට අදාළවය.

## නිශාන්ත සිල්වා..

සභාපතිවරයා මෙම නියෝගය කළේ දේශපාලන පලිගැනීම් සම්බන්ධ සිද්ධීන් ගණනාවකට වග උත්තරකරුවකු කර සිටින නිශාන්ත සිල්වා මහතාට තවත් රටක දේශපාලන රැකවරණ ලබා ගැනීමට නීතියේ ප්‍රති-පාදන නැති බව කියමිනි.

ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ප්‍රකාරවත් විදේශ සම්මුතීන්ට අනුවත් මෙලෙස දේශපාලන සරණාගතභාවය ලබා ගැනීමට නිශාන්ත සිල්වා මහතාට නොහැකි බව පෙන්වා දුන් සභාපතිවරයා නිශාන්ත සිල්වා මහතා රටින් බැහැරව ඇති බව අනාවරනය කර ඇති බැවින් වහාම ඒ ගැන සොයා බලා වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස නියෝග කර සිටියේය.

මෙම සිද්ධියට අදාළව හිටපු අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ශානි අබේසේකර, නිශාන්ත ද සිල්වා, රුවන් පෙතියාගොඩ යන අයවළුන් නම් කර ඇති අතර කොමිසමේ වාදනය වූ සීඩී තැටියකට අදා-ළව හිටපු අමාත්‍ය රන්ජන් රාමනායක, හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී හිරු-ණිකා ප්‍රේමචන්ද්‍ර මහත්ම මහත්මීන්ද නම් කර ඇත.

කොමිසමේ සභාපතිවරයා මෙම නියෝගය සිදු කරනු ලැබුයේ හිටපු හමුදා බුද්ධි අධ්‍යක්ෂ විශ්‍රාමික මේජර් ජෙනරාල් අමල් කරුණාසේකර මහතා කොමිසමට සිදු කළ පැමිණිල්ලක් කැඳවූ අවස්ථාවේදීය.

## ධීවර ගැටලු...

අගමැති නරේන්ද්‍ර මෝදි හා අගමැති මහින්ද රාජපක්ෂ මහත්වරුන් අග-මැති ධුරවලට පත්වීමෙන් පසු වීඩියෝ තාක්ෂණය ඔස්සේ සිදු කළ පළමු ද්විපා-ර්ශ්වික සාකච්ඡාව මෙය වන අතර, මේ ද්විපාර්ශ්වික සාකච්ඡාව ආරම්භ කර-මින් ඉන්දීය අගමැතිවරයා ප්‍රකාශ කර සිටියේ ශ්‍රී ලංකාවේ නව අගමැතිවරයාට සුබ පැතුම් එක් කරන බවයි.

අගමැති නරේන්ද්‍ර මෝදි මහතා ශ්‍රී ලංකා අගමැති මහින්ද රාජපක්ෂ මහතා සමග පුළුල් සාකච්ඡාවක් පැවැත් වූ අතර, මෙහිදී ද්විපාර්ශ්වික සබඳතා පිළි-බඳ හා දෙරටේ ප්‍රධාන ක්ෂේත්‍රයන්හි සහයෝගීතාව තවදුරටත් පුළුල් කිරීම කෙරෙහි අවධානය යොමු කළේය.

ශ්‍රී ලංකාවේ හා ඉන්දියාවේ ආරක්ෂක ක්ෂේත්‍රය, වෙළෙඳ සබඳතා අතර සහ-යෝගීතාව තවදුරටත් වර්ධනය කිරීමේ මාර්ග මෙන්ම ප්‍රධාන ක්ෂේත්‍ර කිහිප-යක පවත්නා සහයෝගීතාව පුළුල් කිරීම වැනි කාරණා ගණනාවක් පිළිබඳ ද නායකයෝ දෙදෙනා සාකච්ඡා කළහ.

වීඩියෝ තාක්ෂණය ඔස්සේ සිදු කළ ද්විපාර්ශ්වීය සාකච්ඡාව ආරම්භ කර-මින් ඉන්දීය අගමැති නරේන්ද්‍ර මෝදි මහතා මෙසේ පැවැසීය.

“ මම මේ සමුළුවට ඔබව ආදර-යෙන් පිළිගන්නවා. හැමදාම වගේ ඔබව ඉන්දියාවේ අපි ආදරයෙන් පිළිගන්නවා. භාරතයට පැමිණෙන ලෙස මම ඔබට හැමදාම ආරාධනා කරනවා. මේ සම්මුඛ සාකච්ඡාව මෙලෙස සිදු කිරීම පිළිබඳ මා හට ඉතා සතුටුයි. මේ සාකච්ඡාව සඳහා මගේ ආරාධනාව පිළිගැනීම පිළිබඳ ඔබට මම ස්තුතිවන්ත වෙනවා. නව අගමැති ධුරයට පත්වීම සම්බන්ධ-යෙන් ද මම ඔබට මේ අවස්ථාවේ සුබ පැතුම් එක් කරනවා. ඒ වගේම පාර්ලි-මේන්තුවේ මෙවැනි ජනවරමක් ලබා ගැනීම පිළිබඳ මම ඔබට සුබ පැතුම් එක් කරනවා. මේ මැතිවරණ ජයග්‍රහණය මඟින් ජනතාව ඔබ ගැන තිබූ විශ්වාසය තවදුරටත් පෙන්නුම් කරනවා.

ඔබ ලබා ගත් මේ ජයග්‍රහණය ඉන්දි-යාව හා ශ්‍රී ලංකාව අතර සහයෝගීතාව වර්ධනය කර ගැනීමට විශාල අවස්ථා-වක්. අපි දෙදෙනාගේම දෙරටේ ජනතා-වට අලුත් සිහිනයකින්, උද්යෝගයකින් අපි දෙස බලන් ඉන්නවා. අපිට හැම පාර්ශ්වයකින්ම ප්‍රගතියක් ඔස්සේ ඉදිරි-යට ගමන් කළ හැකියි. අධ්‍යාපනය, කෘෂි කර්මාන්තය, වෙළෙඳාම වගේම තවත් ක්ෂේත්‍ර ගණනාවක් යටතේ අපට ඉදිරි-යට යා හැකියි. ඔබගේ ආණ්ඩුව මූලික ආර්ථික ව්‍යාපෘති ඉදිරියට පවත්වා-ගෙන යෑමට කටයුතු කරයි කියලා මම විශ්වාස කරනවා. දෙරට අතර පවතින සහයෝගීතාව තවදුරටත් වර්ධනය කර ගනිමින් කටයුතු කිරීමට අපි බලාපො-රොත්තු වෙනවා.

මෙහිදී අගමැති මහින්ද රාජපක්ෂ මහතා ද මෙසේ පැවැසීය.

“ මේ සමුළුවට ආරාධනා කිරීම ගැන සතුටු වෙනවා. ඒ වගේම අගමැතිවරයා වශයෙන් පත්වුණාට පසු මේ මම සහ-භාගී වන පළමු සමුළුවයි.

අප එකිනෙකා මුහුණට මුහුණ හමු නොවුණත් අපි අතර ඇති සුහදත්වය, මිත්‍රත්වය, සහෝදරත්වයේ බැඳීම ඒ ආකාරයෙන්ම පවතින බව මම කියන්න ඕන. ලෝකයම මුහුණපා සිටින කෝවිඩ්-19 අර්බුදය ආරම්භ වුණ අව-ස්ථාවේදීම ඉන්දියාව අසල්වැසි රටවල් වෙනුවෙන්, ඒ රටවල ජනතාවගේ ආර-ක්ෂාව වෙනුවෙන් කටයුතු කළ ආකාරය ගැන අපේ ප්‍රශංසාව හිමිවෙනවා.

සාර්ක් රටවල ප්‍රධාන රට වශයෙන් කලාපයේ නායකයන් සියලු දෙනා සමග ඉන්දියාව මේ ආකාරයටම තමන්ගේ අදහස් හුවමාරු කර ගත්තා.

ජනාධිපතිවරණය වගේම මහ මැති-වරණයේදීත් ශ්‍රී ලංකාවේ රජයට විශාල ජනවරමක් ලැබුණා. ඒ අනුව සියලු ජාතීන්ට සමගියෙන්, සහයෝගයෙන් කටයුතු කරන්න අවශ්‍ය පසුබිම අපි හද-නවා. අපට ලැබුණ ජනවරම අනුව අපි කොවිඩ් 19 වසංගතය ජය ගැනීම සඳහා ක්‍රියා කළ ආකාරය පිළිබඳ රටේ තිබෙන ප්‍රසාදය පිළිබිඹු වන බව මම කියන්න ඕනේ. ඉතා අසීරු අවස්ථාවක වුවත් අපි ශ්‍රී ලංකාවේ ජනතාවගේ ප්‍රජාතන්ත්‍රවාදී අයිතිවාසිකම්වලට මුල්තැන දීලා කට-යුතු කළ බව කියන්න ඕනේ.

ඒ වගේම කෙතරම් දුෂ්කර තත්ත්ව-යක් ආවත් අපේ පොදු ජනතාවගේ ආර්ථිකය, සෞඛ්‍ය, අධ්‍යාපනය වගේ අත්‍යවශ්‍ය දේවල් හැකි උපරිම ආකා-රයෙන් සපුරාලන්න කටයුතු කරලා තියෙනවා. ඒ වගේම කොවිඩ් වයිරස තත්ත්වය හමුවේ අඩු ආදායම්ලාභී පවු-ල්වලට, විශ්‍රාමිකයන් සහ ආබාධිත-යන්ට, දෛනිකව වැටුප් ලබන්නන්ට සහ ගොවීන්ට මූල්‍ය සහාය දුන්නා.

විදෙස්ගත ශ්‍රී ලාංකිකයන් නැවත ශ්‍රී ලංකාවට ගෙන්වා ගැනීම සහ එම ක්‍රියාවලිය සම්බන්ධීකරණය කරමින් කළමනාකරණය කළා.

කොවිඩ් වයිරස තත්ත්වය පාලනය කිරීම සඳහා ශ්‍රී ලංකාව ගත් ක්‍රියාමාර්ග ලෝක සෞඛ්‍ය සංවිධානයේ ප්‍රශංසාවට ලක් වුණා.

ජාත්‍යන්තර මුහුදු මාර්ගවලට සමීපව පිහිටා තිබීම නිසා මතු වන ආරක්ෂක, සුරක්ෂිතතා සහ දේශසීමා සම්බන්ධ තර්ජනවලට විසඳුම් ලබාදීමේ දී අප රටවල් සමීපව කටයුතු කිරීමත් අව-ශ්‍යයි. නිව් ඩයමන්ඩ් තෙල් නෞකාවේ ගින්න නිවීමට සාමූහිකව ගත් ක්‍රියා-මාර්ග මඟින් පෙනී යන්නේ දෙරට අතර සබඳතා තවදුරටත් වර්ධනය කර ගැනීම දෙරටටම ප්‍රයෝජනවත් බවයි.

කොවිඩ් 19 ගෝලීය වසංගතය නිසා සිදුවූ ආර්ථික කඩාවැටීම හමුවේ ඉන්දි-යාවේ වෙළෙඳපොළ සඳහා භාණ්ඩ සැපයීමේදී ශ්‍රී ලංකාවේ නිෂ්පාදන අංශ-වලට වැඩි අවස්ථාවක් ලබාදීම සුදුසු බව මගේ හැඟීමයි. මෙය දෙරටේම ආර්ථික වර්ධනය සඳහා යෝග්‍යයි.

ආගමික, සංස්කෘතික සමානකම් ඇති අප දෙරට අතර පවතින නොබිඳි මිත්‍ර-ත්වය ඒ අයුරින්ම පවත්වා ගෙන යෑම-ටත් අප මූලිකත්වය දෙනවා.

අපට ඉන්දියාවත් ශ්‍රී ලංකාවත් අතර තිබෙන ඓතිහාසික සම්බන්ධතාව වගේම අපේ ශ්‍රේෂ්ඨ ශිෂ්ටාචාරවලින් උරුම වුණු ඉවසීම, සංයමය, කැපවීම, පදනම් කරගෙන මේ සියලු අභියෝග ජයගන්න පුළුවන් කියලා විශ්වාස කර-නවා.

## සම්පන්දන් අසනීපෙන්..

වෛද්‍ය උපදෙස් මත දෙමළ ජාතික සන්ධානයේ නායකයාට විවේකීව දින කිහිපයක් ප්‍රතිකාර ගැනීමට සිදුව ඇති නිසා පක්ෂයේ ඉදිරි කටයුතු මෙහෙයවීම තාවකා-ලිකව මාවෙයි සේනාධිරාජා මන්ත්‍රී-වරයා වෙත භාර දී තිබේ.

දෙමළ ජාතික සන්ධානය විසින් පසුගිය මාසයේ අගදී කොළඹදී පවත්වන ලද විශේෂ සාකච්ඡාවේදී ගන්නා ලද තීරණ ක්‍රියාත්මක කිරීම මේ සතියට නියමිතව තිබුණි.

ඒ අතර ප්‍රධාන තැනක් ගෙන තිබුණේ දෙමළ ජාතික සන්ධානය සඳහා ප්‍රකාශකවරයකු පත් කිරීම හා ජාතික සංවිධායකවරයකු පත් කිරීමය. ඒ සඳහා පසුගිය 22දා තවත් සාකච්ඡාවක් කොළඹදී පැවැත්වීමට නියමිතව තිබූ නමුත් සම්පන්දන් මන්ත්‍රීවරයා හදිසියේම අසනීපවීම හේතුවෙන් එම සාකච්ඡාව එදින අත්හිටුවා මේ සතියේදී පැවැත්වීමට තීරණය කොට තිබුණි.

## කොරෝනා පාලනයෙන්..

කොරෝනා වයිරසයට එරෙහිව සටන් කිරීමේදී ශ්‍රී ලංකාවට ලැබූ ඉහළම ශ්‍රේණිගත කිරීම මෙය වෙයි. රටවල් 108ක් යොදා ගෙන සිදුකර ඇති මේ සමීක්ෂණයෙන් කොවිඩ් - 19 ගෝලීය වසංගතයට සාර්ථක ලෙස මුහුණ දුන් රටවල් අතර දර්ශකයේ පළමු ස්ථානය සමස්ත ලකුණු 68.1 ක් ලබා ගනිමින් චීනය හිමි කර ගෙන ඇත.

එම සමීක්ෂණය අනුව කොවිඩ් සාර්ථක පාලනය කිරීමට සමත්වූ ප්‍රමුඛ රටවල් 10 සහ හිමිවූ ලකුණු වන්නේ චීනය ( 68.1), ශ්‍රී ලංකාව ( 59.2), ඝානාව - (58.8) දකුණු කොරියාව -( 57.6) මියන්මාරය -( 56.3) ඔස්ට්‍රේලියාව -( 55.6) තායිලන්තය -( 55.4) නවසීලන්තය -( 55.1) වියට්නාමය -( 54.0) කාම්බෝජය - (53.7) යි. කොවිඩ් වසංගතයෙන් දරුණු අයුරින් බැට කන බ්‍රසීලය හා එක්සත් ජනපදය යන රටවල් දෙක මේ ශ්‍රේණිගත පිළිවෙළින් 89 වැනි සහ 98 වැනි ස්ථානවල සිටී.

## 20ට මුස්ලිම්..

මහනුවර මඩවල මදීනා විදුහලේ පැවැති උත්සවයකින් අනතුරුව පෙරේදා (26) මාධ්‍ය හමුවේ අදහස් දක්වමින් හකීම් මහතා මේ බව ප්‍රකාශ කළේය.

ජේ. ආර්. ජයවර්ධන මහතා 1978 දී ව්‍යවස්ථාව හඳුන්වා දෙන අව-ස්ථාවේ විධායක ජනපතිවරයාට තිබූ බලතල යළි එලෙසින්ම ලබා-දීම ප්‍රජාතන්ත්‍රවාදයට හානි කර බවත් මේ නිසා මුස්ලිම් කොංග්‍රසය ශ්‍රේෂ්ඨාධිකරණයේ පෙත්සමක් ගොනු කිරීමට තීරණය කළ බවත් හකීම් මහතා පැවසුවේය.

විසිවැනි ව්‍යවස්ථා සංශෝධනයේ ඇතුළත් යම් යම් කරුණු සම්මත කිරීම සඳහා ජනමත විචාරණයකට යා යුතුද නැද්ද යන්න පිළිබඳ පෙත්සම මගින් ශ්‍රේෂ්ඨාධිකරණයෙන් ඉල්ලා සිටින බවත් එහි තීන්දුව ලැබුණු පසු මෙය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කෙරෙණු ඇති බවත් හෙතෙම අවධාරණය කළේය.

## කොවිඩ් 19..

මේ වනවිට ලොව පුරා වර්තා වන කොවිඩ් 19 ආසාදිතයින් සංඛ්‍යාව 33,175,823කි. කොරෝනා මරණ 209,236 සිදුවී ඇමෙරිකා එක්සත් ජනපදය පෙරමුණේ පසුවෙයි. මරණ 141,441ක් වාර්තාවූ බ්‍රසීලය පසුවන්නේ දෙවන ස්ථාන-යේයි. ඉන්දියාව තුන්වන ස්ථානයේ පසුවන අතර මරණ 94,971ක් එරටින් මේ වනවිට වාර්තා වී තිබේ.









## ගමින්-ගමට, ගෙන්-ගෙට ගොස්

# බාල-තරුණ-මහලු සැමගේ දුක සැප සොයන නිරිඳාණෝ!



### ජනපති ගම සමඟ පිළිසඳරක් වැඩසටහනට රටම සූදානමින්

ගමින් ගමට යමින් ජනතාව මුණ ගැසී ඔවුන් මුහුණ පා සිටින ගැටලු සෘජුව හදුනාගෙන නොපමාව විසඳුම් ලබාදීම සඳහා ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතාගේ උපදෙසින් ආරම්භ කළ "ජනපති ගම සමග පිළිසඳරක් "සාකච්ඡා මණ්ඩපය බදුල්ල හල්දුම්මුල්ලේ දී පසුගිය 25 වැනි දා ආරම්භ කෙරිණි. එහිදී ජනතාව තමන්ගේ ගැටලු සෘජුවම ජනාධිපතිවරයාට ඉදිරිපත් කළහ. හල්දුම්මුල්ල ගම්මානය බදුල්ල දිස්ත්‍රික්කයේ දුෂ්කරතම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ලෙසත් වෙලංවිට හල්දුම්මුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ දුෂ්කරතම ගම්මානය ලෙසත් සැලකේ. ජනපති ගම සමග පිළිසඳර සාකච්ඡා මණ්ඩපයේ පළමු හමුව හපුතලේ, වෙලංවිට, අක්කර 100 ගම්මානයේ කුමාරතැන්න විද්‍යාලයේ දී පැවැත්විණි. මෙම සාකච්ඡා මණ්ඩලපයෙන් අනතුරුව ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා ප්‍රදේශයේ නිවෙස් කිහිපයකට ද ගොස් තොරතුරු විමසීය.





ඉන්දීය අග්‍රාමාත්‍ය නරේන්ද්‍ර මෝදි මහතා සමඟ සාකච්ඡා කර උතුරේ ධීවරයන්ගේ ගැටලු සඳහා කඩිනම් විසඳුම් ලබා දෙන බව අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මහතා උතුරේ ධීවර නියෝජිතයන්ට පැවසීය.

ධීවර ඇමැති ඩග්ලස් දේවානන්දා, රාජ්‍ය ඇමැති කංචන විජේසේකර මහත්වරුන් උතුරේ ධීවර සංගම් නියෝජිතයන් සහ ධීවර අමාත්‍යංශ උසස් නිලධාරීන් අරලියගහ මන්දිරයේදී අග්‍රාමාත්‍යතුමන් සමඟ පැවති සාකච්ඡාවේදී මේ බැව් අනාවරණය කර තිබේ.

මෙහිදී ධීවර ඇමැතිවරයා අග්‍රාමාත්‍යතුමන් වෙත කරුණු පැහැදිලි කරමින් පෙන්වා දී ඇත්තේ ඉන්දීය ධීවරයන් මෙරට මුහුදු සීමාවට අනවසරයෙන් ඇතුළු වී මසුන් ඇල්ලීම නිසා උතුරේ ධීවරයන් ගැටලු රැසකට මුහුණ පා ඇති බවයි.

කොවිඩ් - 19 වසංගතය ඉන්දියාව තුළ උග්‍රවීමත් සමඟ ඉන්දීය ධීවර යාත්‍රා ශ්‍රීලංකා මුහුදු තීරයට පැමිණීම වැඩි වී ඇති බවත් ඔවුන් එසේ පැමිණ අපේ ධීවරයන්ගේ මත්ස්‍ය සම්පත කොල්ල කෑම නිසා උතුරේ ධීවරයන් ඉතා අසරණ තත්ත්වයකට පත් වී ඇති බවත් මෙහිදී ඇමැතිවරයා අග්‍රාමාත්‍ය තුමන්ට පැහැදිලි කර තිබේ.

උත්ගතව ඇති මෙම තත්ත්වය නිසා තමන්ට ඉන්දීය ධීවරයන්ගේ විවිධ තාඩන පීඩනවලට මුහුණ පෑමට සිදුවන බවද මෙහිදී උතුරේ ධීවර සංගම් නියෝජිතයන් අග්‍රාමාත්‍යතුමන්ට පෙන්වා දී ඇත.





## ඉන්දීය අගමැති මෝදි සමඟ කතා කර

# උතුරේ ධීවර ගැටලුවලට කඩිනම් විසඳුම් ලබා දෙනවා

### අගමැති ධීවර නියෝජිතයන්ට කියයි

ධීවර ඇමතිවරයා ප්‍රමුඛ ධීවර නියෝජිතයන්ට කරුණු දැක්වූ අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මහතා පවසා ඇත්තේ ඉන්දීය අගමැති නරේන්ද්‍ර මෝදී මහතා සමග සාකච්ඡා කර කඩිනමින්මෙම ධීවර ගැටලුවලට ස්ථිර විසඳුමක් ලබා දෙන බවයි. එමෙන්ම අනවසරයෙන් ශ්‍රී ලංකා මුහුදු තීරයට ඇතුළු වන ඉන්දීය ධීවරයන් අත්අඩංගුවට ගෙන නීතිය ක්‍රියාත්මක කරන්නැයි අග්‍රාමාත්‍යතුමන් ශ්‍රීලංකා නාවික හමුදාවට මෙහිදී උපදෙස් දුන්නේය.

කිලිනොච්චි, ඉරනමඩු වැව් ආශ්‍රිතව නිත්‍යානුකූලව ධීවර රැකියාවේ යෙදෙන ධීවරයන්, තහනම් පන්න භාවිතා කරන ධීවරයන් නිසා මුහුණ දෙන ගැටලුවලට විසඳුමක් ලෙස නීතිවිරෝධී ධීවර කටයුතුවල යෙදෙන්නන්ට එරෙහිව නීතිය තදින්ම ක්‍රියාත්මක කරන ලෙස අග්‍රාමාතුමන් පොලීසියට උපදෙස් ලබා දුන්නේය.

මෙම සාකච්ඡාවට පාර්ලිමේන්තු මන්ත්‍රී අංගජන් රාමනාදන්, අග්‍රාමාත්‍ය ලේකම් ගාමිණී සෙනරත්, ධීවර අමාත්‍යංශයේ ලේකම් ආර්.එම්.ඉන්දු රත්නායක, ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් ප්‍රසන්න ගිනිගේ, වැඩ බලන පොලිස්පති සී.ඩී. වික්‍රමරත්න, නාවික හමුදා මෙහෙයුම් අධ්‍යක්ෂ රියර් අද්මිරාල් වයි.එන්. ජයරත්න මහත්ම මහත්මීන් සහ රාජ්‍ය නිලධාරීන්, උතුරේ ධීවර සමිති නියෝජිතයෝ රැසක් මෙම අවස්ථාවට එක්ව සිටියහ.

# කොවිඩ්වලට මුහුණ දෙමින් සංචාරක කර්මාන්තයේ අභියෝග ජය ගන්න පෙළ ගැසෙමු

### සංචාරක දින පණිවිඩයෙන් අගමැති කියයි



කොවිඩ් -19 තත්ත්වයට මුහුණ දෙමින් සංචාරක කර්මාන්තයේ අභියෝග ජය ගැනීමට රටක් ලෙස පෙළ ගැසෙමු යැයි අගමැති මහින්ද රාජපක්ෂ මහතා අන්තර්ජාතික සංචාරක දිනය වෙනුවෙන් පණිවිඩයක් නිකුත් කරමින් කියා සිටියි.

සංචාරක කර්මාන්තයේ ඉදිරි ගමන් මඟ නව මාවතක් ඔස්සේ යොමුව ඇති යුගයක ජාත්‍යන්තර සංචාරක දිනයට සුබ පැතුම් පණිවිඩයක් නිකුත් කිරීමට ලැබීම පිළිබඳ සතුටට පත් වෙන බව ඊයේ (27) ට යෙදී තිබුණු සංචාරක දිනය වෙනුවෙන් නිකුත් කර ඇති එම පණිවිඩයේ දක්වා ඇත.

එහි වැඩි දුරටත් මෙසේ ද සඳහන් කර තිබේ.

සංචාරක කර්මාන්තයේ වැදගත්කම ලොවට විදහා දැක්වීම සඳහා එක්සත් ජාතීන්ගේ ලෝක සංචාරක සංවිධානය ප්‍රථමවරට ලෝක සංචාරක දිනය පවත්වන ලද්දේ 1980 දීය. එතැන් සිට අද දක්වා සෑම වසරකම සැප්තැම්බර් 27 වැනි දින ලෝක සංචාරක දිනය සමරයි.

ලෝක ප්‍රජාව තුළ සංචාරක ව්‍යාපාරයේ භූමිකාව පිළිබඳ දැනුම්වත් කිරීම සහ ලෝකය පුරා සමාජ සංස්කෘතික දේශපාලනික සහ ආර්ථික වටිනාකම් වලට සංචාරක කර්මාන්තයේ බලපෑම නිරූපණය කිරීමේ අරමුණින් සමරන ජගත් සංචාරක දිනය පෞඩ ඉතිහාසයකට හා සංස්කෘතියකට උරුමකම් කියන අප වැනි රටකට කදිම අවස්ථා නිර්මාණය කරයි.

අතීතයේ පටන්ම විදේශීය ආකර්ෂණය නොමදව දිනා ගත් රටක් වන ශ්‍රී ලංකාවේ පවතින ස්වාභාවික පිහිටීම, යහපත් දේශගුණික තත්ත්වය අධ්‍යාත්මික සුවය හා සරල ජීවිතය, සොබාව සෞන්දර්යෙන් ලබන වින්දනය, විවේකය, ඓතිහාසික වටිනාකම මෙන්ම සොබාව සෞන්දර්යේ පවතින අපූර්වත්වය සුවහසක් ලෝකවාසී සංචාරකයන් ශ්‍රී ලංකාවට ඇදී ඒමට ප්‍රමුඛතම සාධකයකි.

සොබාව සෞන්දර්යය මෙන්ම ආගන්තුක සත්කාරයෙන් අනූන රටක් ලෙස අපට ලොව හමුවේ ඇත්තේ සාඩම්බර අභිමානයකි.

වත්මන් ලෝකය දෙස බලන විට ලෝක ආර්ථිකයට සෘජු බලපෑමක් සංචාරක කර්මාන්තය මඟින් එල්ල වන බව පැහැදිලිය. මෙය ශ්‍රී ලංකාවට ද පොදු වූ කරුණකි. කොවිඩ්-19 වසංගත තත්ත්වය හමුවේ ශ්‍රී ලංකාවේ පමණක් නොව මුළු ලෝකයේම සංචාරක කර්මාන්තයට සිදු වූ බලපෑම අතිමහත්ය. එම තත්ත්වය තේරුම් ගනිමින් සංචාරක කර්මාන්තය ආශ්‍රිත ප්‍රවර්ධනයන් තුළින් රටේ ආර්ථිකය කෙරෙහි සංචාරක කර්මාන්තයෙන් ලැබෙන දායකත්වය ඉහළ නැංවීමට අප රජයක් ලෙස කටයුතු සැලසුම් කර ඇති බව මෙවර සංචාරක දිනයේදී ප්‍රකාශ කිරීමට කැමැත්තෙමි.

### මහනුවර කඩා වැටුණු තට්ටු ගොඩනැගිල්ල

# අනුමත කළ දෙමහල් සැලැස්මට අත්තිවාරම් දමා පස්මහලක් හදලා

## මධ්‍යම ආණ්ඩුකාර නීතිඥ ලලිත් යූ ගමගේ

**අසේල කුරුළුවංශ**

මහනුවර කඩා වැටුණු තට්ටු ගොඩනැගිල්ල සඳහා මහනුවර මහ නගර සභාව මගින් 2016 වසරේ දී අනුකූලතා සහතිකය නිකුත් කිරීමෙන් පසු එහි හිමිකරු එයට තවත් අමතර තට්ටුවක් එක්කර තිබෙන බව පරීක්ෂණ මගින් හෙළිවී ඇතැයි මධ්‍යම පළාත් ආණ්ඩුකාර නීතිඥ ලලිත් යූ ගමගේ මහතා පවසයි.

මෙම ගොඩනැගිල්ල සඳහා මූලික සැලසුම 2006 වසරේ ඉදිරිපත්කර තිබෙන්නේ තට්ටු දෙකක ගොඩනැගිල්ලක් සඳහා බවත් එම අවස්ථාවේ බිම් කැබලි සැලැස්ම නගර සභාව මගින් අනුමතකර තිබෙන්නේ මාර්ගයේ සිට මීටර 08 ක රක්ෂිත කොටසක් තැබිය යුතු බවට කොන්දේසියක් මත බවත් ඒ මහතා කීය.

ගොඩනැගිල්ල කඩා වැටෙන අවස්ථාවේ පැවැති තත්ත්වය සැලකීමේදී හිමිකරු එම කොන්දේසිය උල්ලංඝනය කර තිබෙන බවක් පෙනෙන්නට තිබෙන්නේ යැයිද හෙතෙම අවධාරණය කළේය.

අදාළ ගොඩනැගිල්ලේ හිමිකරු ඉන් පසුව 2010 දී තට්ටු තුනක් සඳහාද 2014 දී තට්ටු හතරක් සඳහාද සැලසුම් ඉදිරිපත්කර තිබෙන බවත් ඒ සියල්ල නගර සභාව මගින් අනුමත කර තිබෙන බවත් ආණ්ඩුකාරවරයා කීය.

දැනට තිබෙන තත්ත්වය අනුව මෙම ගොඩනැගිල්ලට ඉදිකිරීමට අවසර දුන් සියලු ආයතන වගකිව යුතු තත්ත්වයක් පෙනෙන්නට තිබෙන බවත් මෙය නූල් බෝලයක් මෙන් පැටලී තිබෙන බවත් ගමගේ මහතා පැවසුවේය.



මුල් තට්ටු දෙක ඉදිකිරීම සඳහා අවසර ලබාගත් අවස්ථාවේ අත්තිවාරම ඊට සරිලන ලෙස දැම්මේද නැතහොත් පසුව ඉදිකිරීමට අපේක්ෂා කළ මහල්වලට ගැලපෙන ලෙස දැම්මේද යන්න සම්බන්ධව සොයා බැලීමට පරීක්ෂණයක් පැවැත්වෙන බවද හෙතෙම අවධාරණය කළේය.

මහනුවර මහ නගර සභාව මගින් මෙම ගොඩනැගිල්ල ඉදිකිරීමට අදාළව අනුමත කළ සැලසුම් තුනම වරලත් ඉංජිනේරුවරයකු විසින් අනුමතකර තිබෙන බවත් අනුකූලතා සහතික නිකුත් කිරීමට යන නිලධාරීන් එහි මතුපිට පෙනුම සැලසුමට අනුකූල නිසා අදාළ සහතිකය නිකුත්කර තිබෙන බවත් ඒ මහතා කීය.

**ඉදිකිරීමට අවසර දුන් සියලු ආයතන සිදුවූ ව්‍යසනයට වගකිව යුතුයි**

ගොඩනැගිල්ලට ඉදිකිරීමට යොදාගත් අමුද්‍රව්‍යවල ප්‍රමිතිය සොයා බැලීමට තාක්ෂණ නිලධාරීන්ට අවකාශයක් නොමැති නිසා ඔවුන් අදාළ සහතිකය නිකුත්කර තිබෙන බවද හෙතෙම අවධාරණය කළේය.

# එංගලන්තයෙන් ගෙනා කුණු එංගලන්තයටම

**නිමල් රාජපක්ෂ සහ සුභාෂිණී සේනානායක**

පසු ගිය කාලයේ මහත් ආන්දෝලනයකට ලක්වූ අන්තර්ජාතික නීති රීති උල්ලංඝනය කරමින් ශ්‍රී ලංකාවට ආනයනය කරන ලද අපද්‍රව්‍ය බහාලුම් 21ක් එංගලන්තය බලා ප්‍රතිනැව්ගත කිරීම පෙරේදා (26) සවස 05. 15ට ශ්‍රී ලංකා රේගුව මගින් සිදු කර ඇත.

2017 දෙසැම්බර් වන විට එංගලන්තයෙන් නීති විරෝධී ලෙස ශ්‍රී ලංකාවට එවන ලද අපද්‍රව්‍ය බහාලුම් 263ක් ශ්‍රී ලංකාව තුළ තිබුණි. ඉන් බහාලුම් 21 ක් කොළඹ වරායෙන් SEAMAX NORWALK, (V/039R) දරන නැවට පටවා එංගලන්තයට යැවීමට පියවර ගත් බව රේගු මාධ්‍ය ප්‍රකාශක අතිරේක රේගු අධ්‍යක්ෂ ජෙනරාල් සුනිල් ජයරත්න මහතා පැවසුවේය.

දැනට අපද්‍රව්‍ය බහාලුම් 242ක් සඳහා අධිකරණය ඉදිරියේ නඩු කටයුතු විභාග වෙමින් පවතී. මින් බහාලුම් 112ක් කොළඹ වරාය තුළ පවතී. එසේම වාණිජ කේන්ද්‍ර යටතේ ( hub operation) බහාලුම් 130ක් කටුනායක ආයෝජන කලාපය වෙත නිෂ්කාශනය කරගෙන ගොස් තිබෙන අතර, ඒවා එහි පවතී.

රේගු නීතිය උල්ලංඝනය කරමින් ගෙනැවිත් තිබූ මේ අපද්‍රව්‍ය බහාලුම්වල නිවාසවලින් ඉවතලූ දෑ මෙන්ම නාගරික අපද්‍රව්‍ය ද පැවතුණි. මේවා එංගලන්තයෙන් පිටත්වීමට පෙර ශ්‍රී ලංකාවෙන් අවසර ගත යුතුව පැවතුනද එසේ කර නොතිබුණි. එසේම ශ්‍රී ලංකාව හා එංගලන්තය යන දෙරටම පාර්ශ්වකරුවන් වන අන්තර්ජාතික සම්මුතියක් වන බාසල් සම්මුතිය යටතේද මෙවැනි ඒවා එවීමට පෙර ආනයනය කරන රටින් පූර්ව අවසර ගැනීම කොන්දේසියකි. මෙහිදී මේ කොන්දේසිය කඩවී තිබුණි.

මේ ප්‍රතිනැව්ගත කිරීම සඳහා මධ්‍යම පරිසර අධිකාරිය, ශ්‍රී ලංකාවේ එංගලන්ත මහ කොමසාරිස් කාර්යාලය හා විදේශ අමාත්‍යාංශය විශාල මෙහෙවරක් කොට ඇත. මේ ප්‍රතිනැව්ගත කිරීම මෙතෙක් දකුණු ආසියා කලාපයේ සිදුවූ මේ ආකාරයේ ප්‍රථම අවස්ථාව ලෙස ද වාර්තා වේ.

එසේම මේ කටයුත්තට නීතිපතිවරයා, පරමාණු බලශක්ති අධිකාරිය, වෛද්‍ය පර්යේෂණ ආයතනය, සෞඛ්‍යය අමාත්‍යාංශය, වරාය පර්යන්තය හා නැව් සමාගම් ද උපකාර කර ඇත.

තවද මේ කාර්ය සඳහා හිටපු රේගු අධ්‍යක්ෂ ජනරාල් පී. එස්. එම්. චාල්ස්, වර්තමාන රේගු අධ්‍යක්ෂ ජනරාල් විශ්‍රාමික මේජර් ජනරාල් විජිත් රවිප්‍රිය යන මහත්වරු හා විවිධ තරාතිරම්වල රේගු නිලධාරීන් විශාල පිරිසක් මේ කටයුතු සඳහා දායකත්වය සපයා ඇතැයි ද සුනිල් ජයරත්න මහතා පැවසුවේය.

## සහස්පුර සුජීවා කුඩුත් එක්ක කොටු වෙයි

**චන්ද්‍රිකා පෙරේරා**

කලක් තිස්සේ මත්කුඩු ජාවාරමේ යෙදී සිටි "සහස්පුර සුජීවා" බොරැල්ල සහස්පුර දී හෙරොයින් ග්‍රෑම් 02ක් සහ මිලිග්‍රෑම් 700ක් සමඟ පෙරේදා (26) පොලීසිය මඟින් අත්අඩංගුවට ගෙන තිබේ.

මයිකල් අන්තෝනි සුජීවනී නොහොත් සුජීවා නමැති 37 හැවිරිදි මේ කාන්තාව සහස්පුර ප්‍රදේශයේ පදිංචි තැනැත්තියක් බව පොලීසිය පැවසීය.

මේ අතර පෙරේදා (26) උදෑසන 6 සිට ඊයේ (27) උදෑසන 5 දක්වා බස්නාහිර පළාතේ සිදු කළ මත්ද්‍රව්‍ය වැටලීම්වල දී නීති විරෝධී මත්ද්‍රව්‍ය සහ මත්පැන් සමඟ පුද්ගලයන් 484 දෙනකු අත්අඩංගුවට ගෙන තිබේ. එහිදී හෙරොයින් ග්‍රෑම් 328ක්, ගංජා කිලෝග්‍රෑම් 47ක්, අයිස් ග්‍රෑම් 67ක් ඇතුළු මත්ද්‍රව්‍ය තොගයක් පොලිස් භාරයට ගෙන ඇත.

## ඌව වෙල්ලස්ස සරසවිය ඔක්තෝබර් 5 යළි ඇරැඹේ

**සොරණාතොට සමූහ සී. ගමගේ**

තාවකාලිකව වසා දමා තිබූ ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ සියලු පීඨවල දෙවැනි සහ තෙවැනි වසරවල සිසුන්ගේ අධ්‍යයන කටයුතු ඔක්තෝබර් මස 5වැනි සඳුදා දින ආරම්භ කරන බව ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ උපකුලපති මහාචාර්ය ජයන්ත ලාල් රත්නසේකර මහතා පවසයි.

ඒ අනුව තෙවැනි වසරේ සිසුන් ඔක්තෝම්බර් මස 4වැනි ඉරිදා දින පස්වරු 6. 00ට පෙර සිය නේවාසිකාගාරවලට වාර්තා කළ යුතු යැයි හෙතෙම වැඩිදුරටත් සඳහන් කළේය.

## රොහාගේ මරණය සැමරූ තිදෙනෙක් අත්අඩංගුවට

**චන්ද්‍රිකා පෙරේරා**

පොලිස් වෙඩි පහරින් ඉකුත් දා මිය ගිය රත්මලානේ රොහාගේ මරණයට සතුට පළ කරමින් දෙහිවල ගල්කිස්ස නගර සභා පොදු සුසාන භූමියේ දී සැමරුම් උත්සවයක් පැවැත්වීමට සූදානම් වූ කාන්තාවක් ඇතුළු පුද්ගලයන් තිදෙනකු පෙරේදා (26) අත්අඩංගුවට ගෙන තිබේ.

නගර සභා පොදු සුසාන භූමියේ දී සැමරුම් උත්සවයක් පැවැත්වීමට සූදානම් වූ කාන්තාවක් ඇතුළු පුද්ගලයන් තිදෙනකු පෙරේදා (26) පොලිසිය අත්අඩංගුවට ගෙන තිබේ.

සිද්ධිය සම්බන්ධයෙන් අත්අඩංගුවට ගෙන ඇත්තේ, කුඩු අංජු සහ මේ වන විට මිය ගොස් ඇති ලංසියාගේ බාල සහෝදරිය, කුඩු අංජු සමඟ වට්ස්ඇප් සබඳතා පැවැත් වූ පුද්ගලයකු සහ මල් ඉසීමට එක්ව සිටි පුද්ගලයකු බව පොලිසිය පැවසීය.

කුඩු අංජු "රොහාගේ මරණය පිළිබඳ" සතුට සමරණ ලෙස ෆේස්බුක් වෙත ද සටහන් කර තිබී ඇත.

"කුඩු අංජුගේ" සහෝදරයා වූ මීට ඉහත ඝාතනයට ලක්ව ඇති "ලංසියාගේ" සිරුර වළ දමා ඇත්තේ දෙහිවල ගල්කිස්ස පොදු සුසාන භූමියේ වන අතර, එම සුසාන භූමියේ ලංසියාගේ මිනී වළ මත මේ සැමරුම් උත්සවය පැවැත්වීමට සංවිධාන කර තිබී ඇත. ඒ අනුව ලංසියාගේ මෘත ශරීරය වළ දමා තිබෙන සොහොන් කොතට ඉහළින් ඩ්‍රෝන යානා මගින් මල් ඉස රොහාගේ මරණයට සතුට පළ කිරීමේ උත්සවය පැවැත්වීමට මොවුහු සූදානමින් සිට ඇති බව පොලිසිය කීය.

## ලක්ෂ 120ක ගංජා අල්ලයි

**චන්ද්‍රිකා පෙරේරා සහ රාගම සමූහ**

ලක්ෂ 120ක් පමණ වටිනා කේරළ ගංජා කිලෝග්‍රෑම් 40යි මිලිග්‍රෑම් 700ක් සඟවාගෙන සිටි පුද්ගලයන් 6ක්, පෑලියගොඩ මත්ස්‍ය වෙළෙඳ සංකීර්ණය අසලදී පෙරේදා (26) දහවල් පොලිසිය අත්අඩංගුවට ගෙන ඇත.

සැකකරුවන් ගංජා ප්‍රවාහනය කිරීමට යොදා ගත් ජීප් රථයක් හා ත්‍රීරෝද රථයක් පොලිසිය සැකකරුවන් සමඟ අත්අඩංගුවට ගෙන තිබේ.

සැකකරුවන් වත්තල, ගුණසිංහපුර සහ කැලණිය ප්‍රදේශවල පදිංචි අවුරුදු 26ත් 47ත් අතර වයස්වල පසුවන්නන් වෙති. කැලණිය කොට්ඨාස අපරාධ විමර්ශන ඒකකයේ නිලධාරීන් මීට පෙර ගංජා සන්තකයේ තබාගෙන සිටි සැකකරුවකු අත්අඩංගුවට ගෙන ඇති අතර, එම සැකකරු හෙළි කළ තොරතුරු මත මේ වැටලීම සිදු කර ඇත. සැකකරුවන් සහ ගංජා තොගය අලුත්කඩේ මහේස්ත්‍රාත් අධිකරණය හමුවට ඉදිරිපත් කිරීමට නියමිතය.

## ආබාධිතයන්ට රියැදුරු බලපත්‍ර දීම ගැන රජයේ අවධානය යොමුව තිබෙනවා

### රාජ්‍ය ඇමැති දිලුම් අමුණුගම

**අසේල කුරුළුවංශ හා මධ්‍යම පළාත් සමූහ**

රිය පැදවීම සඳහා ආබාධිත තත්ත්වය බාධාවක් නොව අයට රියදුරු බලපත්‍ර දීමේ ක්‍රමවේදයක් කඩිනමින් සකස්කරන බව වාහන නියාමනය, බස් රථ ප්‍රවාහන සේවා හා දුම්රිය මැදිරි හා මෝටර් රථ කර්මාන්ත රාජ්‍ය ඇමැති දිලුම් අමුණුගම මහතා පවසයි.

ආබාධිත තත්ත්වයන් යටතේ වුවද ඔටෝ ගියර් පද්ධති සහිත වාහන පැදවීමේ හැකියාව බොහෝ පිරිසකට තිබෙන බවත් ඔවුන්ට වාණිජ නොවන (Nom Commercial) කාණ්ඩය යටතේ රියැදුරු බලපත්‍රයක් දීම කෙරෙහි අවධානය යොමුව තිබෙන බවත් ඒ මහතා කීය.

රජයේ සේවකයන්ට මහින්ද රාජපක්ෂ මහතා ජනපති සමයේ දුන් යතුරු පැදිවල අයිතිය ඔවුන්ගේ නමට පැවරීම සඳහා මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තුමේන්තුව විසින් අරම්භකර තිබෙන වැඩසටහන් මාලාවේ දෙවැන්න පෙරේදා (26) මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේදී පැවැත්විණි. එම අවස්ථාවට සහභාගි වීමෙන් අනතුරුව මාධ්‍ය හමුවේ අදහස් දක්වමින් රාජ්‍ය ඇමැතිවරයා මේ බව ප්‍රකාශ කළේය. මහනුවර දිස්ත්‍රික්කයේ යතුරු පැදි ලබාගත් 8000 කට මෙහිදී එම යතුරු පැදිවල හිමිකම ඔවුන් වෙත දීම සිදුකෙරුණි.

වම් පාදයම අහිමිව තිබෙන අයකුට වුවත් ඔටෝ ගියර් පද්ධතියක් ඇති වාහනයක් පැදවිය හැකි බවත් එවැනි අයට වාණිජ නොවන කාණ්ඩය යටතේ රියදුරු බලපත්‍රයක් නිකුත් කරත්දී වෘත්තීය වශයෙන් රිය පැදවීමේ නිරතව සිටින අයට වාණිජ (Commercial) කාණ්ඩය යටතේ රියදුරු බලපත්‍රයක් දෙන බවත් හෙතෙම පැවසුවේය.

කිසිදු ආබාධයක් නොමැතිව මනා සෞඛ්‍ය තත්ත්වයෙන් පසුවන අයකු රියදුරු වෘත්තියේ නිරතව නොසිටියත් ඔහුට හෝ ඇයට වාණිජ කාණ්ඩයට අයත් රියදුරු බලපත්‍රයක් ලබා ගැනීමේ හැකියාව තිබෙන බවද රාජ්‍ය ඇමැතිවරයා කීය.

කන්ටේරයක් පදවන අයකුට රියදුරු බලපත්‍රය දීමේදී පැවතිය යුතු සෞඛ්‍ය මට්ටම, කුඩා කාර් රථයක් පදවන අයටද එලෙසින්ම අවශ්‍ය නොවන බවත්, ඒනිසා පවතින ක්‍රමය සංශෝධනය වියයුතු බවත් ඒ හෙතෙම අවධාරණය කළේය.

වාහන ලියාපදිංචිය හා පැවරීම ලබන වසර ආරම්භ වීමට පෙර දිස්ත්‍රික් ලේකම් කාර්යාල මගින් කර ගැනීම හැකි ආකාරයට පහසුකම් වැඩිදියුණු කරන බවත් ඉන් පසු එය ක්‍රමානුකූලව ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටම දක්වා ගෙනඑන බවත් අමුණුගම මහතා කීය.

මේ වන විට අදාළ පහසුකම ඇත්තේ දිස්ත්‍රික්ක පහක පමණක් බවත් ලබන වසර මුල වන විට මෙරට සියලු දිස්ත්‍රික් ලේකම්කාර්යාල මගින් වාහන ලියාපදිංචිය හා පැවරීම කරගත හැකිවනු ඇති බවත් ඒ මහතා පැවසුවේය.

මෙම අවස්ථාවට මෝටර් ප්‍රවාහන කොමසාරිස් ජනරාල් නීතිඥ සුමිත් අලහකෝන්,මහනුවර දිස්ත්‍රික් ලේකම් තිස්ස කරුණාරත්න යන මහත්වරුද සහභාගි වූහ.

## ඛනිජ තෙල් සංස්ථාවේ බිලියන 600ක ණය පියවන සැලැස්මක් ගෙනෙයි

**උපාලි කරුණාරත්න**

ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ එකතු වූ සමස්ථ ණය මහා භාණ්ඩාගාරයට බරක් නොවී වසර 09ක් තුළ සම්පූර්ණයෙන් ගෙවා දැමීම සඳහා සැලැස්මක් සකස් කර ඇති බව එහි සභාපති සුමිත් විජේසිංහ මහතා පැවසීය.

සුමිත් විජේසිංහ මහතා මේ අදහස් පළ කළේ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ ඉදිරි වැඩ පිළිවෙළ පිළිබඳ දිනමිණ කළ විමසීමකදීය. රාජ්‍ය බැංකුවලට රුපියල් බිලියන 600ක ණයක් පවතින බවද පැවසූ සභාපතිවරයා රාජ්‍ය ආයතන ගණනාවකින් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට මුදල් ලැබීමට තිබෙන බවද කීය. ඉදිරි වසර නවය තුළ සංස්ථාවේ ක්‍රියාකාරීත්වයේදී සිදුවන අලාභ අවම කර ගැනීමට කටයුතු කරන බවද සුමිත් විජේසිංහ මහතා ප්‍රකාශ කළේය.

## ලේක්හවුස් අනුග්‍රහයෙන් 'යොවුන් පහන් ටැඹ' සාහිත්‍ය වැඩමුළුව මාතලේ දී පැවැත්වෙයි

යොවුන් පහන් ටැඹ සාමූහිකය, ලේක්හවුස් ආයතනයේ 'දිනමිණ' පුවත්පත සමග සෑම සෙනසුරාදාවකම නිකුත්වන යොවුන් ජනතා අතිරේකය සහ ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව එක්ව සංවිධාන කළ 'යොවුන් පහන් ටැඹ' පසුගිය සෙනසුරාදා දවස පුරා මාතලේ මහත්මා ගාන්ධි ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේදී පැවැත්විණි. මහතලා සාහිත්‍ය උලෙළෙහි එක් අංගයක් ලෙස පැවැති මෙම සාහිත්‍ය වැඩමුළුවෙහි ප්‍රධාන දේශනය පවත්වනු ලැබුවේ ප්‍රවීණ සාහිත්‍යධර රත්න ශ්‍රී විජේසිංහයන් විසිනි.

ප්‍රවීණ මාධ්‍යවේදී ධර්මසිරි ගමගේ මහතා විසින් ආරම්භ කළ යොවුන් ජනතා පුවත්පත හරහා සාහිත්‍යකරණයට යොමු වූ නිර්මාණකරුවන් එකමුතුව යොවුන් පහන්ටැඹ සාමූහිකය විසින් මෙම වැඩමුළුව සඳහා විශේෂ අංග රැසක් සංවිධානය කර තිබුණි.

චිත්‍ර කලාව, ඡායාරූප කලාව, ගීත නිර්මාණකරණය, කවි නිර්මාණය සහ සාහිත්‍ය රසාස්වාදනය යන අංග යටතේ නව නිර්මාණකරුවන් මෙම වැඩමුළුව හරහා දැනුම්වත් කරන ලදී. මෙම වැඩමුළුව සඳහා නවක නිර්මාණකරුවන් දෙසීයකට ආසන්න පිරිසක් දායකවූ අතර ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව පූර්ණ අනුග්‍රාහක දායකත්වය සපයන ලදී.

## 20න් මැතිවරණ කොමිසමේ සාමාජික සංඛ්‍යාව ඉහළට

**මැද කොළඹ සමූහ - ආරියරත්න ගනේගොඩ**

20 වැනි සංශෝධනය පාර්ලිමේන්තුවේ සම්මත වන දිනයේ දී කමිටු අවස්ථාවේ දී සිදු කළ යුතු වෙනස්කම් අතරට මැතිවරණ කොමිසම පිළිබඳවද අවධානය යොමු වී තිබේ.

මැතිවරණ කොමිසමේ දැනට සිටින සංඛ්‍යාව තුනකි. එය පහ දක්වා ඉහළ දැමීම කෙරෙහි රජයේ අවධානය යොමු වී ඇති බව ද කියයි. මැතිවරණ කොමිසමේ දැනට ඇති සන පූර්ණය තුනකි. මුළු සාමාජිකයන් තුනක් වීම නිසා ඉකුත් මහ මැතිවරණයේ දී තීන්දු තීරණ ගැනීමේ දී කොමිසම අපහසුතාවට පත් වූ අවස්ථා ගණනාවක් පිළිබඳ මේ වන විටත් වාර්තා වී තිබේ. මැතිවරණ කොමිසමේ සාමාජික සංඛ්‍යාව පස් දෙනකු දක්වා ඉහළ දැමුව හොත් සන පූර්ණය තුනක් ලෙස සංශෝධනය වනු ඇති බව රජයේ ආරංචි මාර්ග සඳහන් කරයි.

## සංචාරක ව්‍යාපාරය පළාත් මට්ටමින් දියුණු කරනවා

### සංචාරක ඇමැති ප්‍රසන්න රණතුංග

**අසේල කුරුළුවංශ, එස්.කේ. සමරනායක හා මධ්‍යම පළාත් සමූහ**

වසර 2025 වන විට සංචාරකයන් මිලියන හතක් මෙරටට ගෙන්වා ගැනීමටත්, ඒ ඔස්සේ ඩොලර් බිලියන 10 ක ආදායමක් ලබා ගැනීමටත් සැලසුම්කර තිබුණත් කොවිඩ් - 19 වසංගත තත්ත්වයත් සමඟ ඊට බාධා එල්ල වූ බවත් එම අභියෝග ජයගෙන අදාළ ඉලක්ක සපුරා ගැනීම සඳහා වන බලාපොරොත්තු අත්හැර නොමැති බවත් සංචාරක අමාත්‍ය ප්‍රසන්න රණතුංග මහතා පවසයි.

කොවිඩ් -19 වයිරසය සාර්ථකව පාලනය කළ රටවල් අතර ශ්‍රී ලංකාව ප්‍රමුඛ ස්ථානයේ පසුවන බවත් සෞඛ්‍ය අංශ උපදෙස් අනුව ඉදිරියේදී ගුවන් තොටුපොළ විවෘත කිරීමත් සමඟ සංචාරකයන් විශාල ලෙස මෙරටට ඇදී එනු ඇති බවත් ඒ මහතා කීය.

මහනුවර කැන්ඩි සිටි සෙන්ටර් හිදී ඊයේ (27) පැවැති ලෝක සංචාරක දින උත්සවයේ ප්‍රධාන ආරාධිතයන් ලෙස සහභාගි වෙමින් ඇමැතිවරයා මේ බව ප්‍රකාශ කළේය.



ලෝක සංචාරක දින මෙරට සැමරුම් උත්සවය පැවැත්වීමට මහනුවර කැන්ඩි සිටි සෙන්ටර් ආයතනය ලබාදුන් තුසිත විජයසේන මහතාට ප්‍රසන්න රණතුංග ඇමැතිවරයා සමරු තිළිණයක් ලබාදුන් අයුරු.

ඡායාරූපය - සුනිල් ගුණවර්ධන - කුණ්ඩසාලේ සමූහ.

මධ්‍යම පළාත් කර්මාන්ත අමාත්‍යශයේ මෙහෙයවීමෙන් මහනුවර කැන්ඩි සිටි සෙන්ටර් හිදී පැවැති මහනුවර, මාතලේ හා නුවරඑළිය දිස්ත්‍රික් සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන්ගේ නිර්මාණ ඇතුළත් ප්‍රදර්ශනයට සමගාමීව ලෝක සංචාරක දින සැමරුම් උත්සවය එහිදී පැවැත්වීමට සංචාරක අමාත්‍යාංශය හා මධ්‍යම පළාත් සභාව කටයුතුකර තිබිණි. මෙවර ලෝක සංචාරක දිනයට සමගාමීව මෙරට පවත්වන උත්සවයේ තේමාව සංචාරක කර්මාන්තය හා ග්‍රාමීය සංවර්ධනය ලෙස නම් කර ඇත.

සංචාරක ඇමැතිවරයා ලෙස තමන් පත් වූ පසු පළාත් ආණ්ඩුකාරවරු සහ පළාත් සභාවන්හි සංචාරක අංශයට සම්බන්ධ නිලධාරීන් කැඳවා සාකච්ඡා කර පළාත් මට්ටමින් සංචාරක ක්ෂේත්‍රය දියුණු කිරීම සඳහා ගත යුතු ක්‍රියාමාර්ග සාකච්ඡා කළ බවත්, ඒ අනුව ලෝක සංචාරක දින මෙරට සැමරුම් උත්සවය මෙවර මධ්‍යම පළාතට ලබාදුන් බවත් කී ඒ මහතා ලබන වසරේදී තවත් පළාතක මෙම උත්සවය පවත්වන බවද අවධාරණය කළේය.

පාස්කු ප්‍රහාරයෙන් පසු කඩා වැටුණු මෙරට සංචාරක කර්මාන්තය එම තත්ත්වයෙන් මිදී හිස එසවීමට උත්සාහ ගන්නා අවස්ථාවේ කොවිඩ් - 19 වසංගත බලපෑම නිසා, යළිත් මෙම ක්ෂේත්‍රය අර්බුදයට ලක්වූ බවත් මේ නිසා ආදායම් මාර්ග අවහිර වී විවිධ දුෂ්කරතාවලට මුහුණ දීමට සංචාරක ක්ෂේත්‍රයට සම්බන්ධව කටයුතු කළ සැමට සිදුවූ බවත් රණතුංග මහතා පැවසුවේය.

මෙම පිරිසට සහන දීමට තමන් කැබිනට් මණ්ඩලයට පත්‍රිකාවක් ඉදිරිපත් කළ බවත් එහි අඩංගු ඇතැම් කරුණු මේ වන විට ඉටුකර තිබෙන අතර තවත් කරුණු සාකච්ඡා මට්ටමේ පවතින බවත් කී ඇමැතිවරයා සංචාරක ක්ෂේත්‍රයට සම්බන්ධව කටයුතු කරන අයගෙ වටිනාකම රජය හොඳින් දන්නා බවද අවධාරණය කළේය.

සංචාරක ක්ෂේත්‍රය යනු හෝටල් හා එම ක්‍රියාවලියට සෘජුව සම්බන්ධ අය පමණක් නොවන බවත් එය ඉතා පුළුල් ක්ෂේත්‍රයක් බවත් කී රණතුංග මහතා මාලු වෙළෙන්දා, ත්‍රිරෝද රථ රියදුරා, තැඹිලි වෙළෙන්දා පවා මෙම ක්ෂේත්‍රයට සම්බන්ධව යැයිද පැවසුවේය.

සංචාරක ක්ෂේත්‍රය යම් අර්බුදයකට ලක්වන විට මේ සියලු දෙනාට එහි බලපෑම එල්ල වන බවත් මොවුන් සියලු දෙනාගේ ආර්ථිකය මේ හා ගැටගැසී තිබෙන බවත් ඒ මහතා ප්‍රකාශ කළේය.



ගම්පහ දිසා බාලදක්ෂ සංගමයේ නව දිසා කොමසාරිස්වරයා ලෙස පත් වූ ජනක සුගත් පෙරේරා මහතා ඊට අදාළ පත්වීම් ලිපිය ප්‍රධාන කොමසාරිස් මේජර් ජෙනරාල් මිලින්ද පීරිස් මහතා අතින් ලබාගත් අයුරු. නියෝජ්‍ය ප්‍රධාන කොමසාරිස් ජනප්‍රිත් ප්‍රනාන්දු මහතාද මෙහි සිටී.

මීරිගම ඩී.එස් සේනානායක විද්‍යාලයේ අධ්‍යාපනය ලබා ඇති ඒ මහතා ගම්පහ දිසා බාලදක්ෂ සංගමයේ තනතුරු රැසක් හොබවා තිබේ.

## නිව් ඩයමන්ඩ් වන්දි මුදල දෙන්න සමාගමේ එකඟතාව පළ කරයි

**කුමුදු හෙට්ටිආරච්චි**

මෙරට මුහුදු සීමාවේදී ගිනි ගෙන අනතුරට ලක්වූ එම්. ටී. නිව් ඩයමන්ඩ් නෞකාව අයත් සමාගමෙන් ඉල්ලා තිබූ රුපියල් ලක්ෂ 4420ක සම්පූර්ණ වන්දි මුදල ඉතා ඉක්මනින් ලබාදීමට එම සමාගම එකඟතාව පළ කර ඇති බව නීතිපතිවරයාගේ සම්බන්ධීකරණ නිලධාරිණී රජයේ නීතිඥ නිශාරා ජයරත්න මෙනෙවිය පැවසුවාය.

මේ සම්බන්ධයෙන් නෞකාවේ හිමිකාර සමාගමේ නීතීඥවරුන් නීතිපතිවරයාට දැනුම් දී ඇති බව නිශාරා ජයරත්න මෙනෙවිය වැඩිදුරටත් සඳහන් කළාය.

මූලික වන්දි ගෙවීමක් ලෙස මීට පෙර නීතිපතිවරයා විසින් රුපියල් මිලියන 340ක ඇස්තමේන්තුවක් ඉදිරිපත් කළ අතර, පසුව අවසන් ඇස්තමේන්තුව ලෙස පසුගියදා තවත් මිලියන සියයක්ද ඇතුළත්ව රුපියල් මිලියන 442ක වන්දි මුදලක් ඉල්ලා නැව අයත් ග්‍රීක ජාතික සමාගමේ හිමිකරුවන්ගේ නීතිඥවරුන් වෙත හිමිකම් ඉල්ලුමක් නීතිපතිවරයා විසින් ඉදිරිපත් කර තිබුණි.

නීතිපතිවරයා විසින් පසුගිය 16 වැනිදා නැවේ ගින්න නිවීමට දැක්වූ සහායට හා ඊට අදාළ කටයුතු සඳහා වූ හිමිකම් ඉල්ලුමක් නැව අයත් ග්‍රීක ජාතික සමාගමේ නීතිඥවරුන් වෙත ඉදිරිපත්කර තිබුණි.

ඊට ප්‍රතිචාර ලෙස රුපියල් මිලියන 340 මුල් ඉල්ලුම් හානි පූර්ණය ගෙවීමට නැව අයත් සමාගමේ හිමිකරුවන් එකඟතාව එළකරමින් නීතිපතිවරයා වෙත පසුගිය (24) දැනුම් දීමක් සිදුකර තිබුණි.

නාවික හමුදාව, ගුවන් හමුදාව, ශ්‍රී ලංකා වරාය අධිකාරිය, කොළඹ ඩොක්යාඩ් සමාගම, මීපා ආයතනය (සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය ) හා වෙරළ ආරක්ෂණ දෙපාර්තමේන්තුව යන සියලු පාර්ශ්වයන් නෞකාවේ ගින්න නිවීම සඳහා දැරූ වියදම් එලෙස ගණනය කර ඇත.

මේ අතර එම නෞකාවේ ගින්න හේතුවෙන් සමුද්‍රීය පරිසරයට සිදුව ඇති හානිය පිළිබඳ වාර්තාව ද පසුගිය (24) නීතිපතිවරයා වෙත භාරදී තිබුණි.

මීපා ආයතනයේ මූලිකත්වයෙන් දිවයිනේ ප්‍රධාන විශ්වවිද්‍යාල 05ක් හා නාරා ආයතනයේ හා මීපා ආයතනයේ විශේෂඥයන් විසින් පිළියෙළ කළ එම අතුරු වාර්තාව ද නැව අයත් ග්‍රීක සමාගමේ හිමිකරුවන් වෙත පසුගිය (24) ඉදිරිපත් කළ බව නීතිපතිවරයාගේ සම්බන්ධීකරණ නිලධාරිණී රජයේ නීතිඥ නිශාරා ජයරත්න මෙනෙවිය වැඩිදුරටත් පැවසුවාය.

ඒ සම්බන්ධයෙන් වාර්තා ලැබීමෙන් පසු සමුද්‍රීය පරිසර හානිය සම්බන්ධයෙන් වූ අලාභ තක්සේරුව නීතිපතිවරයා වෙත ලද පසුව එය නැවේ අයිතිකරුවන්ට හා අදාළ පාර්ශ්වයන් වෙත ගෙවීම් සඳහා ඉදිරිපත් කරන බවද නිශාරා ජයරත්න මෙනෙවිය පැවසුවාය.

අදාළ නිර්දේශ ලැබීමෙන් පසුව නිව් ඩයමන්ඩ් නෞකාව ශ්‍රී ලංකා නාවික හමුදාවේ අධීක්ෂණය හා ආරක්ෂාව යටතේ නාවික සැතපුම් 200 වන අනන්‍ය ආර්ථික සමුද්‍රයෙන් පිටතට සුරක්ෂිතව යාත්‍රා කරවීමට ද කටයුතු සූදානම් කර ඇති බව නීතිපතිවරයාගේ සම්බන්ධීකරණ නිලධාරිණිය පැවසුවාය.

## මැතිසබේ ආසන 2ක් තවමත් හිස්

**මැදකොළඹ සමූහ - ආරියරත්න ගනේගොඩ**

පාර්ලිමේන්තුවේ දැනට හිස්ව තිබෙන මන්ත්‍රී ධූර දෙක පිරවීම පිළිබඳ විටින් විට විවිධ අදහස් හා යෝජනා ඉදිරිපත් වුවද මේවනතෙක් කිසිවෙක් ඒ සඳහා පත්ව නැත.

අපේ ජනබල පක්ෂයේ මන්ත්‍රී ධූරයට එම පක්ෂයේ නායක වැල්ලේ සමන් පත් වීමටත් ඔහු පත් වූ පසුව ඉල්ලා අස්වී ගලගොඩඅත්තේ ඥානසාර හිමියන්ට මන්ත්‍රී අසුන ලබා දීමට එම පක්ෂයේ මධ්‍යම කාරක සභාව ඉකුත් දිනක යෝජනා සම්මත කරගනු ලැබීය.

මධ්‍යම කාරක සභාවේ යෝජනාව මැතිවරණ කොමිසමට යැවීමට ද එම පක්ෂය තීරණය කළේය. නීතිමය පියවරක් ඔස්සේ ගැටලුව විසඳා ගන්නා ලෙසත් ඒ අනුව ඒ පක්ෂයේ මන්ත්‍රී ධූරය පිරවීමට තවත් මාස කිහිපයක් ගතවනු ඇති බවද පැවැසේ.

මේ අතර එක්සත් ජාතික පක්ෂයේ දැනට හිස්ව පවතින එකම මන්ත්‍රී ධූරයට එජාප නායක රනිල් වික්‍රමසිංහ මහතා ඉදිරි කාලයේදීවත් භාර නොගන්නා බව දිනමිණට දැන ගැනීමට ලැබී තිබේ. මුලදී එම පක්ෂය තීන්දු කර තිබුණේ එජාපයේ ජ්‍යෝෂ්ඨතම දේශපාලනඥයකු වන හිටපු කතානායකවරයකු වන ජෝශප් මයිකල් පෙරේරා මහතාය. ඊට අමතරව ජෝන් අමරතුංග, එජාප මහ ලේකම් නීතිඥ අකිල කාරියවසම් පත් කරන බවට විවිධ ආරංචි මාර්ග පැතිර යමින් පවතියි.

එක්සත් ජාතික පක්ෂය නායකත්වය මේ දිනවල වැඩි අවධානයක් යොමු කර ඇත්තේ මන්ත්‍රී ධූරය සම්බන්ධයෙන් නොවේ.

**විසි වන ව්‍යවස්ථා සංශෝධනය පිළිබඳ සහ රටේ දේශපාලන තත්ත්වය පිළිබඳ සමෘද්ධි, ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා, ව්‍යාපාර සංවර්ධන හා ඌන උපයෝජන රාජ්‍ය සම්පත් සංවර්ධන රාජ්‍ය අමාත්‍ය ශෙහාන් සේමසිංහ සහ සමගි ජනබලවේගය නියෝජනය කරනු ලබන පාර්ලිමේන්තු මන්ත්‍රී නලින් බණ්ඩාර යන මහත්වරුන් සමඟ දිනමිණ කළ සාකච්ඡාවකි මේ**

# රට දියාරු කරවන ව්‍යවස්ථා අහෝසි කර ගන්න කැප වෙනවා

## රාජ්‍ය අමාත්‍ය ශෙහාන් සේමසිංහ

**● ආණ්ඩුව පසුගිය මැතිවරණවලදී බලය ඉල්ලුවේ අලුත් ව්‍යවස්ථාවක් ගෙන ඒමටයි. එහෙත් ආණ්ඩුව උත්සාහ කරන්නේ නැවතත් දහ අට සංශෝධනය බලාත්මක කිරීමටයි. ඒ ගැන විපක්ෂයෙන් ආණ්ඩුවට චෝදනා එල්ල වෙනවා .?**

අපි අලුත් ව්‍යවස්ථාවක් ගෙන ඒමට පෙර අන්තර් කාලීනවයි විසිවන සංශෝධනය ගෙන එන්නේ. අපි මුලින්ම විසිවන සංශෝධනය ගෙන ආවත් නව ව්‍යවස්ථාවක් ඇති කිරීමේ වැඩපිළිවෙළ අපි කඩිනම්ව ඉදිරිපත් කරනවා.

අපි ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුවක් විදිහට ජන මතයට හිස නමා වැඩ කරන්නේ. අපිට තුනෙන් දෙකක බලයක් ලැබී තිබුණ ද සියල්ලන් ගේ අදහස් අප සලකා බලනවා.

**● විවිධ පාර්ශ්ව නව සංශෝධනවලට විරෝධය පළ කරනවා. එවන් තත්ත්වයක් තුළ ව්‍යවස්ථා සංශෝධන කඩිනම් කිරීමට හේතුව කුමක් ද.?**

අපට ජනවරමක් ලැබී තියෙනවා රට අස්ථාවර කරන විකාර රූපී දහනව වන ව්‍යවස්ථා සංශෝධනය අහෝසි කිරීමට. කටයුතු කිරීමේ වරදක් නැහැ. මෙම සංශෝධනය දිගටම පවත්වා ගෙන ගියොත් තමයි රටට අවැඩක් වෙන්නේ. රට ස්ථාවරව ඉස්සරහට අරන් යන්න ඕනෑ නම් අනිවාර්යෙන්ම දහනවවන සංශෝධනය වෙනස් වෙන්න ඕනෑ. අපට අවශ්‍ය වෙලා තියෙන්නේ වැඩ කළ හැකි රටක්. ඒ සඳහා ජනාධිපතිතුමාට අගමැතිතුමාට විශාල අවශ්‍යතාවක් තියෙනවා. ඒ සඳහා අවශ්‍ය පසුබිම සකස් කළ යුතුයි. විසිවන සංශෝධනයෙන් සිදු වන්නේ රට වැඩ කිරීමට අවශ්‍ය තත්ත්වය නිර්මාණය වීමයි.

**● අද විපක්ෂය පාර්ශ්වයෙන් නැගෙන තවත් ප්‍රධාන තර්කයක් වන්නේ විසිවන සංශෝධනය ඇති කිරීම එක් කණ්ඩායමකට බලය ඒකරාශී කර ගැනීමට ගන්නා ප්‍රයත්නයක් බවයි. ඒ තර්කය ගැන ඔබේ අදහස කුමක්ද.?**

විසිවන ව්‍යවස්ථා සංශෝධනයට චෝදනා එල්ල කරන අය දහනවවන සංශෝධනය ඇති කළේම රාජපක්ෂවරු ඉලක්ක කර ගෙනයි.ඒ විදිහේ සංශෝධනයක් ඇති කළ අය තමයි අද මේ විදිහේ තර්ක ඇති කරන්නේ. අපට අවශ්‍යව තිබෙන්නේ පුද්ගලික පරමාර්ථ ඇතිව වැඩ කිරීම නොවෙයි. රට දියාරු කරන ව්‍යවස්ථා සංශෝධනය අහෝසි කිරීමයි. මේ වෙද්දි අපට පැහැදිලිවන තවත් කරුණක් තමයි පසුගිය ආණ්ඩු කාලයේ දී 19 වන ව්‍යවස්ථා සංශෝධනය නිසා රටේ ආරක්ෂාව වැනි වැදගත් අංශ රැසක් කඩා වැටුණු බව.

**● එදා සිටි මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිවරයා සහ රනිල් වික්‍රමසිංහ මහතා අතර ගැටුම් ඇති වීමට ප්‍රධාන හේතුවක් වුණා. පසුගිය ආණ්ඩු කාලයේ ලබා දුන් සහනාධාර සහ සමෘද්ධිය ඇතුළු දේ දේශපාලනීකරණය වී තිබූ බවට චෝදනා එල්ල වෙනවා. ආණ්ඩුවේ මේ විෂය පිළිබඳ වගකියන රාජ්‍ය ඇමැතිවරයා විදිහට මේ චෝදනා ගැන ඔබේ මතය පැහැදිලි කළ හැකිද.?**

පසුගිය ආණ්ඩුව විසින් ඔවුනගේ ජනාධිපති අපේක්ෂකයා ජයග්‍රහණය කරවීමේ පසුබිමක් සකස් කරන්න තමන්ගේ දේශපාලන හිතවතුන්ට සමෘද්ධිය ලබා දීමට කටයුතු කළා. ඒ නිසා නිසි සුදුසුකම් සපිරූ විශාල පිරිසකට අසාධාරණයක් වුණා. මේ ගැන අප හඳුනාගෙන තිබෙනවා. අලුතින් සමෘද්ධි සහනය ලබා දුන් පිරිසෙන් ලක්ෂ ගණනක් මේ ආකාරයේ පාක්ෂිකයන් ට නුසුදුස්සන්ට දේශපාලනය නිසා සැලකීම ඉතාමත් වැරැදි දෙයක්. පසුගිය ආණ්ඩුව විසින් සහනාධාර ලබා දුන් අයගෙන් සියයට විසිපහක් මෙවැනි අය ඉන්නවා. මේ විදිහේ සහනාධාර ලබා දීම විධිමත් වෙන්න ඕනෑ. ඒ ගැන අප නිසි සමීක්ෂණයක් කරන්න ඕනෑ. එතැනදී නිසි සුදුස්සන් කවුද කියල හඳුනා ගන්න පුළුවන් කම ලැබෙනවා. මේ ගැන සොයා බලා සුදුස්සන්ට සහන ලබා දෙන වැඩපිළිවෙළක් ආරම්භ කරනවා.

**● ආණ්ඩුව ව්‍යවස්ථා සංශෝධන ඇතුළු දේ ගැන ලොකු අවධානයක් යොමු කරමින් කටයුතු කළත් අත්‍යාවශ්‍ය භාණ්ඩ මිල ඇතුළු විවිධ භාණ්ඩ මිල ගණන් ඉහළ යාම පාලනයට ආණ්ඩුව නිසි පිළිවෙතක් ක්‍රියාත්මක නොකරන බවට විපක්ෂය කියනවා. මේ ගැන ඔබේ අදහස කුමක් ද.?**

අත්‍යාවශ්‍ය භාණ්ඩ මිල පාලනය කරන්න ආණ්ඩුවට තනියෙන් කරන්න බැහැ. ලෝක තත්ත්වය ආර්ථික රටාව වගේ දේවල් ගොඩක් බලපානවා. ඒ නිසා මේ වගේ දේවල්වලට සිල්ලර විරෝධතා පළ කළාට හරි යන්නේ නැහැ.

පොල් මිල ගනිමු. පොල් මිල මේ දිනවල ඉහළයි. ඒකට හේතුව පොල් හිඟයි ඒ හිඟය නිසා තමයි පොල් මිල ඉහළ යන්නේ. රටේ වාතාවරණය පමණක් නොවෙයි ලෝක තත්ත්වය ද භාණ්ඩ මිල ඉහළ යාමට බලපානවා. ඒ නිසා බඩු මිල පාලනය කිරීමට ආණ්ඩුවට වගකීමක් ඇතත් ඇතිවන අභියෝගාත්මක තත්ත්වයන් නිසා ඇතැම් අවස්ථාවල බඩු මිල ඉහළ පහළ යන එක පාලනය කරන්න බැහැ.

අද විපක්ෂයේ ඉන්න අය අවුරුදු පහකට කිට්ටු කාලයක් ආණ්ඩු කළා. ඒ අයට පුළුවන් වුණා ද බඩු මිල පාලනය කරන්න. ඒ නිසා බඩු මිල ඉහළ යාම ගැන මේ විදිහේ චෝදනා හැමදාමත් එල්ල වුණා. ඒත් අපි ආණ්ඩුවක් විදිහට රට තුළ ආර්ථික ක්‍රියාකාරකම් ශක්තිමත් කිරීමත් දේශීය ආර්ථිකය සවිමත් කිරීමත් මගින් දීර්ඝ කාලීනව අත්‍යාවශ්‍ය භාණ්ඩ මිල පාලනය කිරීමට පුළුවන් කම ලැබෙනවා.

**‘ පසුගිය ආණ්ඩුව විසින් ඔවුනගේ ජනාධිපති අපේක්ෂකයා ජයග්‍රහණය කරවීමේ පසුබිමක් සකස් කරන්න තමන්ගේ දේශපාලන හිතවතුන්ට සමෘද්ධිය ලබා දීමට කටයුතු කළා. ඒ නිසා නිසි සුදුසුකම් සපිරූ විශාල පිරිසකට අසාධාරණයක් වුණා. මේ ගැන අප හඳුනාගෙන තිබෙනවා. අලුතින් සමෘද්ධි සහනය ලබා දුන් පිරිසෙන් ලක්ෂ ගණනක් මේ ආකාරයේ පාක්ෂිකයන් ට නුසුදුස්සන්ට දේශපාලනය නිසා සැලකීම ඉතාමත් වැරැදි දෙයක්. ’**



උදිත ගුණවර්ධන

# 20 ට එරෙහිව පුළුල් බලයක් ගොඩ නඟනවා

## පාර්ලිමේන්තු මන්ත්‍රී නලින් බණ්ඩාර

**● දහනව වැනි සංශෝධනය ගෙන ආව අයම දහනවය ප්ලස් කියලා වැඩසටහනක් ගේන්නේ ඇත්තටම එහි අඩුපාඩු හුඟක් තියෙන හින්දා නේද?**

අපි කියන්නේ අඩුපාඩු හුඟක් නෙවෙයි. 19 ව්‍යවස්ථා සංශෝධනය හොඳයි. නමුත්, අඩුපාඩු තියෙනවා කියන එකයි. දහනවය නරකයි කියලා ඒකෙන් කියන්නේ නෑ. දහනවයේ අඩුපාඩු නිවැරදි කරන්න තමයි දහනවය ප්ලස් ගේන්නේ. දහනව වැනි සංශෝධනයෙන් ඔබ්බට ගිය දහනවයේ තියෙන ප්‍රජාතන්ත්‍රවාදී වගේම යහපාලන ගති ලක්ෂණ තවදුරටත් පුළුල් වෙන වැඩසටහනක් තමයි දහනවය ප්ලස් කියන්නේ. ඒකෙන් කියන්නේ නෑ අඩුපාඩු තියෙනවා කියලා. අපි බලමු විගණන පනත, දහනවය ප්ලස් අදහසට අනුව විගණන පනත තවත් ශක්තිමත් කරනවා. ප්‍රසම්පාදන කොමිසම තවදුරටත් ශක්තිමත් කරනවා. ඒ වගේම අනෙකුත් කොමිෂන් සභාත් මේකෙන් ශක්තිමත් කරනවා. අපි හඳුනාගත් අඩුපාඩු නිවැරදි කරලා 19 වැනි සංශෝධනය ශක්තිමත් කරන වැඩසටහනක් තමයි දහනවය ප්ලස් කියන්නේ.

**● දහනවය ගේන කොට අඩුපාඩු තියෙන්න පුළුවන් කියලා හිතුනේ නැත්තේ ඇයි?**

සාමාන්‍යයෙන් ඔබ දන්නවා, 78 ව්‍යවස්ථාවත් අවස්ථා ගණනාවකදී සංශෝධනය වුණා. සමහර වේලාවලදී ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත් කරන්න ව්‍යවස්ථා සංශෝධන ගේන්න වෙනවා. ඒ වගේ දේවල් වෙලා තියෙනවා. සමහර සංශෝධන පවුල්වාදය, ඒකාධිපතිවාදය නැත්නම් තමන්ගේ පුද්ගලික අරමුණු වෙනුවෙන් සිදු වෙලා තියෙනවා. ඒ දෙකේ වෙනස ජනතාව අඳුරගන්න ඕන. ගිය වර අපේ ව්‍යවස්ථා සංශෝධනයට පාර්ලිමේන්තුවේ 224ක් අනුමැතිය දුන්නා. ඒත් අපේ ආණ්ඩුවට හිටියේ හතළිස් දෙකයි. ඉතින් විපක්ෂය අනුමැතිය දුන්නේ, ඒ සියලු දෙනාම මේකට එකඟ වුණ නිසා. හරි නම් ආණ්ඩුවට පුළුවන් වෙන්න ඕන මේ ව්‍යස්ථා සංශෝධනයට අපේ අනුමැතිය ගන්න. අපේ අනුමැතියත් එක්ක ව්‍යස්ථා සංශෝධනය පාර්ලිමේන්තුවේ සම්මත වුණොත් අන්න ඒක සමස්ත පාර්ලිමේන්තුවම සම්මත කරපු හොඳ ව්‍යවස්ථාවක් වෙනවා. ඇයි මේ අලුත් ව්‍යවස්ථාවට අපේ විරෝධය තියෙන්නේ? මේ තුළින් රටට දිනාගත්තු ජයග්‍රහණ ආපස්සට ගෙනියනවා. 18 වැනි සංශෝධනයෙන් තමයි මේ 20 වැනි සංශෝධනයට ආණ්ඩුව එන්නේ.

**● ඔබතුමාලා ගෙනාව දහනවයේ තිබෙන අඩුපාඩු මොනවද?**

අපි දකින අඩුපාඩු වෙන්නේ විශේෂයෙන් කොමිෂන් සභාවලදී රජයේ වැඩ කටයුතු, රජයේ ක්‍රියාදාමයන් එක්ක ගැටෙන තැන් තියෙනවා. ඒක සමහර වෙලාවට රජයේ ව්‍යාපෘති, ඉදිරි ගමනට බාධා වෙන අවස්ථා තිබෙනවා. ඒ වගේ ගැටුම් ලිහිල් කරගෙන රාජ්‍ය යාන්ත්‍රණය එක්ක බද්ධ වෙලා යන්න පුළුවන් වීමයි අපේ අපේක්ෂාව වෙන්නේ. ඒ වගේ අඩුපාඩු තමයි අපි දැනට හඳුනාගෙන තියෙන්නේ. විශේෂයෙන්ම පොලිස් කොමිසම. පොලිස් කොමිසමට පොලිස්පතිවරයා අයින් කරන්න බැරි තත්ත්වයක් තියෙනවා. පාර්ලිමේන්තු අනුමැතියෙන් තමයි ඒ පත් කිරීම කරන්නේ. ඒවාට විසඳුම් හොයා ගන්න ඕනේ.

**● ඇයි මේ ගැටලු කලින් මෙහෙම නොදැක්කේ?**

අපි යම් යම් කාරණා හොයා ගත්තේ 19 වැනි සංශෝධනය ගෙනාවාට පස්සේ. ඒවා ප්‍රායෝගික ගැටලු. ප්‍රායෝගික ගැටලු හඳුනාගන්න ප්‍රායෝගිකව ඒවාට මුහුණ දෙන්න ඕන. අපි අවුරුදු හතරක් හඳුනා ගත්තු ප්‍රායෝගික ගැටලුයි මේ තියෙන්නේ. සමහර වෙලාවට රටේ සංවර්ධනයට බාධා වෙනවා. සමහර කටයුතු කාලයත් එක්ක අවහිර වෙනවා. ඒවා නිරාකරණය කිරීම තමයි මේ 19 ප්ලස් වෙතින් සිදු වෙන්නේ.

**● නමුත් විගණන කොමිසම වගේ කොමිසම් සුදු අලින් කියලා කියන තරමට විශාල මුදලක් වැය වෙලා තියෙනවා නඩත්තුවට පමණක්?**

විගණනය කියන එක අනවශ්‍යයි කියනවා නම් ඒකට සුදු අලියෙක් කියනවා නම් ආණ්ඩුව ගැන ඉතින් කවර කතාද? එහෙම නම් අයින් කරන්න ඒවා ගොඩක් තියෙනවා. පාර්ලිමේන්තුවක් ඕනත් නෑ එහෙම නම්. පාර්ලිමේන්තුවේ බලය එක පුද්ගලයෙක් අතට යනවා නම් පාර්ලිමේන්තුවේත් වියදම් තියෙනවා. එහෙම නම් පාර්ලිමේන්තුවත් අයින් කරලා දාන්න ඕනේ.

**● මේ කියන විදිහට විසි වෙනි සංශෝධනයේ සාධනීය කිසිම දෙයක් නැද්ද?**

තවම විසිවැනි සංශෝධනයේ සියල්ලම අපි අධ්‍යයනය කළේ නැහැ. ඒ ගැන අපි අධ්‍යයනය කරමින් යනවා. ඉතින් අපිට එකින් එක අහන්න වෙනවා. ජනාධිපතිවරයාට අවුරුද්දකින් පාර්ලිමේන්තුව විසුරුවන්න තියෙන බලය ගැන අහන්න වෙනවා. මොනවටද ඒ බලය? මොකක්ද ඒකෙ සාධනීය ලක්ෂණය? එහෙම නම් ඒ අයට අහන්න පුළුවන් ජනාධිපතිවරයෙකු පත් වුණ වහාම අවශ්‍ය නම් පාර්ලිමේන්තුව විසුරු වන්න. එතකොට ප්‍රශ්නයක් නැහැ. ජනාධිපතිවරයාට අදාළ පක්ෂය නෙමෙයි නම් පාර්ලිමේන්තුවේ ඉන්නේ ජනාධිපතිවරයාට පුළුවන් පාර්ලිමේන්තුව විසුරුවලා පාර්ලිමේන්තු මැතිවරණයකට යන්න. ඉතින් ඒ වගේ සංශෝධන තිබුණා නම් අපිට කියන්න පුළුවන් ඒක සාධාරණයි කියලා. ඒත් අවුරුද්දෙන් අවුරුද්ද පාර්ලිමේන්තුව විසුරවන්න ඉඩ දෙන එක කොහෙත්ම සුදුසු නැහැ. මේ ව්‍යවස්ථාව හදන්නේ අදට විතරක් නෙමෙයි. සමහර විට අවුරුදු ගණනක් ඉදිරියට මේ ව්‍යවස්ථාව ආයෙ සංශෝධනය නොවෙන්න පුළුවන්. මේ තියෙන ව්‍යවස්ථාවට අවුරුදු හතළිස් දෙකක් නේ දැන්. අලුත් ව්‍යවස්ථාව අවුරුදු අසූ හතරක් වුණත් වුණත් යන්න පුළුවන්. ඒ නිසා මේ ව්‍යවස්ථාව අනාගතයට ගැලපෙන ව්‍යවස්ථාවක් වෙන්න ඕන.

**● විස්සට එරෙහිව ගන්න ඉදිරි ක්‍රියාමාර්ගවලදී කවුද දැන් සමගි ජන බලවේගය එක්ක ඉන්නේ?**

අපේ පක්ෂය හැරෙන්න අපිත් එක්ක සිවිල් සංවිධාන, නොයෙක් සමාජ ක්‍රියාකරුවන් ඉන්නවා. ඔවුන් එකතු කරගෙන අපි දැනුවත් කරමින් සිටිනවා. ආගමික නායකයෝ ඒකරාශී කරගනිමින් 20ට එරෙහිව අපි පුළුල් බලවේගයන් හදමින් ඉන්නවා.

**● එක්සත් ජාතික පක්ෂය එකතු වෙයිද මේ වැඩවලට?**

එක්සත් ජාතික පක්ෂයත් විස්සට විරුද්ධයි මම හිතන්නේ. ඒගොල්ලෝ අපිට ඒකරාශී කරගන්න පුළුවන් මේ බලවේගත් එක්ක. ඒත්, එක්සත් ජාතික පක්ෂයට දැන් ඊට වඩා පක්ෂය ඇතුළේ ප්‍රශ්න තියෙනවානේ. ඒවා විසඳමින් ඉන්න නිසා ඒගොල්ලන්ට රටේ ලෝකයේ දේවල් වෙනුවෙන් සමහරවිට වෙලාවක් නැතිව ඇති. විස්ස වඩාත් වැදගත් නිසා එක්සත් ජාතික පක්ෂයත් සම්බන්ධ කරගැනීමට පුළුවන් වෙයි.



**‘ හරි නම් ආණ්ඩුවට පුළුවන් වෙන්න ඕන මේ ව්‍යස්ථා සංශෝධනයට අපේ අනුමැතිය ගන්න. අපේ අනුමැතියත් එක්ක ව්‍යස්ථා සංශෝධනය පාර්ලිමේන්තුවේ සම්මත වුණොත් අන්න ඒක සමස්ත පාර්ලිමේන්තුවම සම්මත කරපු හොඳ ව්‍යවස්ථාවක් වෙනවා. ඇයි මේ අලුත් ව්‍යවස්ථාවට අපේ විරෝධය තියෙන්නේ? මේ තුළින් රටට දිනාගත්තු ජයග්‍රහණ ආපස්සට ගෙනියනවා. 18 වැනි සංශෝධනයෙන් තමයි මේ 20 වැනි සංශෝධනයට ආණ්ඩුව එන්නේ. ’**

ශිවන්ති ප්‍රනාන්දු



# එස්.ඩබ්ලිව්.ආර්.ඩී. බණ්ඩාරනායකයන් සමාජ - දේශපාලන - ආර්ථික - සංස්කෘතික අංශයෙන් ඓතිහාසික පරිවර්තනයක් කළ ශ්‍රේෂ්ඨ නායකයෙක්

## හිටපු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන

**චන්දිමා කරුණාරත්න**

මේ රටේ පුළුල් දේශපාලන, ආර්ථික, සමාජ, සංස්කෘතික අංශයෙන් ඓතිහාසික පරිවර්තනයක් කළ ශ්‍රේෂ්ඨ නායකයෙක් සහ මෙරට දේශපාලන පක්ෂවලට දේශපාලන දර්ශනයක් දුන් එකම නායකයා එස්. ඩබ්ලිව්. ආර්. ඩී බණ්ඩාරනායක මහතා බව ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සභාපති, හිටපු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතා පැවැසීය.

ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට පැහැදිලිවම අනාගතයක් තිබෙන බවත්, අතීතයේදී පක්ෂය යම් යම් අවස්ථාවල දුර්වල වුවද පක්ෂයක් ලෙස අප ශක්තිමත්ව ඉදිරියට ගමන් කරන බවත්, පැවැසූ මෛත්‍රීපාල සිරිසේන මහතා ඒ වෙනුවෙන් පක්ෂයේ ප්‍රතිසංවිධාන කටයුතු ආරම්භ කර තිබෙන බවත් කීවේය.

ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට කුමන අවලාද, චෝදනා නැගුවද පක්ෂයට අනාගතයක් තිබෙන බවත්, ඒ වෙනුවෙන් සියලු දෙනා එකට එකතු වී ගමන් කළ යුතු බවත් හෙතෙම පැහැදිලි කළේය.

හිටපු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතා මේ බව පැවැසුවේ කොළඹ ශ්‍රී ලංකා නිදහස් පක්ෂ මූලස්ථානයේදී පසුගියදා (25) පැවැති එස්.ඩබ්ලිව්. ආර්.ඩී බණ්ඩාරනායක ශ්‍රීමතාණන්ගේ 61වැනි ගුණ සැමරුමට සහභාගී වෙමිනි.

එහිදී එස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක මහතාගේ පිළිරුවට පුෂ්පෝපහාර දැක්වීම ජ්‍යෙෂ්ඨ සභාපති හිටපු ජනාධිපති, උප සභාපතිවරුන් ඇතුළු පිරිස සිදුකළ අතර, බණ්ඩාරනායක ප්‍රත්‍යාවලෝකනය ග්‍රන්ථය පිළි ගැන්වීම ද සිදුකෙරිණි.

එහිදී වැඩි දුරටත් අදහස් දැක්වූ හිටපු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතා මෙසේද ප්‍රකාශ කළේය.

බණ්ඩාරනායක මහතා ගෙවී ගිය දශක කිහිපය පුරාවටම අපේ රටට ගැළපෙන ආකාරයේ, ජාතිකත්වය, දේශීයත්වය, අපේ උරුමයන් අගයන ආකාරයේ දර්ශනයක් හඳුන්වා දුන් නායකයෙක්. ඊට පෙර මෙවන් දේශපාලන මත දැරූ දර්ශන තිබුණා. ඒවා බොහොමයක් මාක්ස්වාදී දර්ශනයන්.

බණ්ඩාරනායක මහතා පක්ෂය බිහිකර එහි ලේකම්වරු තුන්දෙනාව පත්කරන්නේ ජාතීන් වර්ග තුනම නියෝජනයවන ආකාරයටයි. ඒ කාලයේ සියලු ජන කොටස්වල ජනතාවට සාධාරණව ආගම දහම අදහන්න අවශ්‍ය වටපිටාව සකස් කර දුන්නා. බණ්ඩාරනායක මහතා ජාත්‍යන්තර බලපෑම්වලට යටත් නොවී සෘජුව තීන්දු තීරණ ගත්තා.

ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ජ්‍යෙෂ්ඨ උප සභාපති මහාචාර්ය රෝහණ ලක්ෂ්මන් පියදාස මහතා-

අද අප සන්ධාන දේශපාලනය ගැන කතා කරනවා. එහි පළමු අවස්ථාව නිර්මාණය කරන්නේ එස්. ඩබ්ලිව්. ආර්. ඩී බණ්ඩාරනායක මහතායි. එදා එතුමා මහජන එක්සත් පෙරමුණ හැදුවා. එ සමඟ තමන්ගේ සහෝදර පක්ෂවලට චෝදනා එල්ල කළේ නැහැ. ලංකා දේශපාලන ඉතිහාසයේ බණ්ඩාරනායක දේශපාලනය වඩාත් වර්ණවත්වන්නේ එතුමාගේ තුන්අවුරුදු පාලන කාලය අවසන්වීමත් සමඟ එතුමාගේ බිරිය පක්ෂයේ නායකත්වය ලබා ගැනීමත් සමගයි. සිරිමාවෝ බණ්ඩාරනායක මහත්මිය සමගි පෙරමුණ හැදුවා.





බණ්ඩාරනායක දර්ශනයේ තිබෙන සුවිශේෂත්වය වන්නේ දේශීයත්වය හා ජාතිකත්වයයි. නිෂ්පාදන ආර්ථිකයක් හරහා රට ගොඩනැඟීම ගැන අවධානය යොමු වුණා. හොඳ මතවාදයක් දර්ශනයක් හරහා ශ්‍රීලනිපය නැවත ගොඩනගන්නේ කෙසේද යන්න ගැන අප අවධානය යොමු කළ යුතුයි. ශක්තිමත් බලවේගයක් ලෙස අපි නැඟී සිටිය යුතුයි.

ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මහලේකම්, රාජ්‍ය අමාත්‍ය දයාසිරි ජයසේකර මහතා- සන්ධානයක් විදිහට වමේ ප්‍රගතිශීලි සන්ධානයක් ලෙස වර්තමානයේ අප රටේ පාලනයට දායක වී තිබෙනවා. එහිදී ශ්‍රී ලංකා නිදහස් පක්ෂය විදිහට රටේ ආර්ථික, දේශපාලන, අර්බුදවලට මුහුණ දෙන්න අවශ්‍ය ආකාරය ගැන අප නිරන්තරයෙන් සිතනවා. අපේ ගමන , අප කටයුතු ආකාරය පිළිබඳ සංවාදයක සිටිනවා. 20 වැනි ව්‍යවස්ථා සංශෝධනය සම්බන්ධව අපේ මතවාදය අප ප්‍රසිද්ධියේ කතාකරන්න අවශ්‍යවන්නේ නැහැ. ඒ ගැන අප පක්ෂයේ මධ්‍යම කාරක සභාවේදී සාකච්ඡා කර ජනාධිපතිවරයාට හා අග්‍රාමාත්‍යවරයාට දැනුම් දෙන්න කටයුතු කරනවා.

ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ භාණ්ඩාගාරික ලසන්ත අලගියවන්න, රංජිත් සියඹලාපිටිය, ජීවන් කුමාරතුංග , සරත් ඒකනායක, ශාන් විජයලාල්, අංගජන් රාමනාදන්, පාර්ලිමේන්තු මන්ත්‍රී සුරේන් රාඝවන් , හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී තිලංග සුමතිපාල යන මහත්වරුන් ඇතුළු ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන්, පාක්ෂිකයන් රැසක් මේ අවස්ථාවට සහභාගී වූහ.

ඡායාරූප - සරත් පීරිස්

### බණ්ඩාරනායක ශ්‍රීමතාණන්ගේ 61 වැනි ගුණ සැමරුව

### ශ්‍රීලනිපයට පැහැදිලි අනාගතයක් තිබෙනවා: යම් යම් අවස්ථාවල පක්ෂය දුර්වල වූවත් අප ශක්තිමත්ව ඉදිරියට ගමන් කරනවා

# දෙමළ මාධ්‍ය ගුරු හිඟය දැඩි අර්බුදයක්

## මන්ත්‍රී වීරසුමන වීරවංශ

**නුවන් කොඩිකාර**

සිංහල හා දෙමළ භාෂාව රාජ්‍ය භාෂාව බවට පත්ව තිබුණ ද දෙමළ මාධ්‍යයෙන් උගන්වන ගුරුවරුන්ගේ හිඟය නිසා සමස්ත පාසල් පද්ධතියම දැඩි අර්බුදයකට පත්ව ඇතැයි පාර්ලිමේන්තු මන්ත්‍රී වීරසුමන වීරවංශ මහතා පැවසීය.

මේ හේතුවෙන් සිංහල භාෂාවෙන් ඉගෙන ගන්නා දරුවන්ට දෙමළ භාෂාවත්, දෙමළ භාෂාවෙන් ඉගෙන ගන්නා දරුවන්ට සිංහල භාෂාවත් ඉගෙන ගැනීමට නොහැකි වී ඇති බව හෙතෙම කීවේය.

එම නිසා විශ්වවිද්‍යාලින්, විද්‍යා පීඨවලින් සුදුසුකම් සපුරා ඇති පිරිස් ගුරුවරුන් ලෙස බඳවා ගැනීමට අවශ්‍ය මැදිහත් වෙන්නැයි ඉල්ලා සිටින බව මාතර පැවැති ජනහමුවකදී වීරසිංහ මහතා කියා සිටියේය.

මන්ත්‍රීවරයා වැඩි දුරටත් මෙසේද පැවැසීය.

මාතර සහ ගාල්ල යන දිස්ත්‍රික්කවල දෙමළ මාධ්‍ය වතු පාසල් 10ක් තිබෙනවා. ඉතිහාසයේ හැමදාම එම දෙමළ පාසල් සඳහා සාධාරණයක් ඉටු වුණේ නැහැ. ඒ වගේම පළාත් සභාවලට තමයි එම පාසල් 10ය අයිති වන්නේ. එහෙත් එම පාසල් 10ටම පළාත් සභාවෙන් මිසක් මධ්‍යම රජයෙන් සාධාරණයක් ඉටු වුණේ නැහැ. එහෙත් යම් සාධාරණයක් වුණා නම් ඒ වුණේ ගුරු සහයකයන් බඳවා ගනිද්දී විතරයි. එම පාසල්වලට තිබෙන ප්‍රධානම ප්‍රශ්නය ගුරු හිඟයයි. ඒ ගුරු හිඟය පියවන්න පළාත් සභාවල තිබෙන ක්‍රමවේද ප්‍රමාණවත් නැහැ. උපාධිධාරීන් ගුරුවරු ලෙස බඳවා ගනිද්දී දෙමළ මාධ්‍යයෙන් උපාධිය හදාරූ සංඛ්‍යාව අඩුයි. බඳවා ගැනීම සඳහා පැවැත්වූ සම්මුඛ පරීක්ෂණවලට ආව අයත් ආවේ යාපනෙන්, වැල්විටතුරෙන් වැනි ප්‍රදේශවලින්. මම ඉගෙන ගත්තේ මාතර සාන්ත තෝමස් විද්‍යාලයේ. එහි වසර දෙකක සිට දෙමළ භාෂාව උගන්වන්න ගුරුවරයෙක් හිටියේ නැහැ.

# සියලු ගංගා සුරැකීමට ජනාධිපති කාර්ය සාධක බළකායක්

## කැබිනට් පත්‍රිකාව සකසන බව ඇමැති අමරවීර කියයි

**අමෝදා ජයමහ**

සුරකිමු ගංගා ව්‍යාපෘතිය යටතේ අපේ රටේ පවතින ගංගා ආරක්ෂාවට ජනාධිපතිවරයාගේ ප්‍රධානත්වයෙන් ජනාධිපති කාර්ය සාධක බළකායක් සකසන බව පරිසර අමාත්‍ය මහින්ද අමරවීර මහතා පැවසීය.

ශ්‍රී ලංකාවේ ගංගා එකසිය තුනක් තිබෙන බවත්, එම ගංගා ආරක්ෂා කර ගැනීමේ අරමුණින් ජනාධිපති කාර්ය සාධක බළකායක් පිහිටුවීමට මධ්‍යම පරිසර අධිකාරිය මේ වන විට කැබිනට් පත්‍රිකාවක් සකස් කරමින් සිටින බවද අමාත්‍යවරයා කියා සිටියේය.

මධ්‍යම පරිසර අධිකාරියේ ඉකුත්දා (25) පැවති මාධ්‍ය හමුවකට සහභාගී වෙමින් අමාත්‍යවරයා මේ බව පැවසීය.

පරිසරය ආරක්ෂා කරගැනීම අපගේ වගකීමක් බවත්, පසුගිය දවස් කීපයේ පරිසරයට සිදු වී තිබෙන කනගාටුදායක සිද්ධි අපට අසන්නට දකින්ට ලැබුණු බවත් ඇමැතිවරයා කීය. අපේ රටේ පමණක් නොව මුළු මහත් ලෝකයේම මේ අකාරයට පරිසර විනාශයන් සිදුවන අකාරය අපට සජීවීව දකින්නට ලැබෙන බව ද හෙතෙම පෙන්වා දුන්නේය.

පරිසර විනාශය පිළිබඳ අදවන විට වැඩිපුර කතාබහට ලක්වන බව කී ඇමැතිවරයා අපි මේ තත්ත්වයන්ට මුහුණදීම සඳහා ක්‍රමානුකූල වැඩපිළිවෙළක් සකස් කළ යුතු බව ද කීවේය .

# අප අඩු කළ අත්‍යවශ්‍ය භාණ්ඩ මිල පවත්වාගෙන යන්න ආණ්ඩුව අසමත් වෙලා

## මන්ත්‍රී රාජිත සේනාරත්න



**එස්.පී.උබේපාල , කැබිතිගොල්ලෑව සමූහ.**

අප අඩු කළ අත්‍යඅවශ්‍ය භාණ්ඩ මිල ඒ අයුරින් ඉදිරියට ගෙන යන්න බැරි වුණු, ඉතිහාසයේ පහළ වූ අසාර්තකම ආණ්ඩුව ශ්‍රීලපොපෙ බව, පාර්ලිමේන්තු මන්ත්‍රී දොස්තර රාජිත සේනාරත්න මහතා පැවසීය. වර්තමාන ජනාධිපති රට වටේ දුවනවා. එදා රණසිංහ ප්‍රේමදාස ජනාධිපතිතුමා රට වටේ දිව්වේ නෑ. නමුත් රටේ ජනතාවට වැඩ කළා. යැයි ද හෙතෙම කීවේය.

ඒ මහතා එසේ ප්‍රකාශ කළේ පසුගිය දා (26) මැදවච්චිය නගරයේ පූනෑව ප්‍රදේශයේ පැවති සමගි ජන බලවේගයේ ප්‍රතිසංවිධාන රැස්වීම් මාලාවේ ආරම්භක ජන හමුවේදීය.

මෙම ප්‍රතිසංවිධාන රැස්වීම් මාලාව මැදවච්චිය සමගි ජන බලවේගයේ ආසන සංවිධායක පාර්ලිමේන්තු මන්ත්‍රී රෝහණ බණ්ඩාර මහතාගේ උපදෙස් පරිදි මැදවච්චිය ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුජීව සෝමපාල මහතා සංවිධාන කර තිබුණි. එහිදී වැඩි දුරටත් අදහස් දැක් වූ පාර්ලිමේන්තු රාජිත සේනාරත්න මහතා- මා සෞඛ්‍ය ඇමැති ලෙස සිටිය කාලේ අත්‍ය අවශ්‍ය බෙහෙත් මිල අඩු කළා. අද මේ ආණ්ඩුවට අප අඩු කළ දේවල් පාලනය කරගෙන යන්න හැකියාවක් නෑ. මේ අණ්ඩුව දැන් පුපුරන්න ළඟයි. විස්ස ගෙනත් ආණ්ඩුවේ අය ආණ්ඩුව ඇතුලේ ඉද්දිම කා කොටා ගන්නවා. මාත් එක්ක ආණ්ඩුවේ මන්ත්‍රීවරුන් ඇමැතිවරුන් කිහිප දෙනෙක්ම කතා කළා. ඔවුන් විස්සට ගේනවට අකමැතියි කියා කිව්වා. අපට ඒකට දැඩිව විරුද්ධ වෙන්න කිව්වා. ඒ අයත් අවශ්‍ය වෙලාවේදී සහාය දෙන්නම් කිව්වා. මට නම් වශයෙන් කියන්න පුළුවන්. නමුත් ඒක කියන්න සුදුසු කාලය මේ නොවේ.

ජනාධිපතිතුමාට වැඩ කරන්න බලය මදිලු. වැඩ කරන අයට බලට අවශ්‍ය නෑ. සමගි ජන බල වේගය හැකි ඉක්මනින් මේ රාටේ බලය ලබා ගන්නවා කියන එක අපට ස්ථිරයි.

රනිල් වික්‍රමසිංහ හිටපු අගමැතිතුමා ඉන්න කාලේ අපේ අදහස් එක්ක වැඩ කරන්න අපට අවස්තාව ලැබුණේ නැහැ. දැන් අපට ඒ අවස්තාව සජිත් ප්‍රේමදාස මහතා ලබාදී තියෙනවා.

මෙම අවස්තාවට සමගි ජන බලවේගයේ මැදවච්චිය සමගි ජන බලවේගයේ ආසන සංවිධායක පාර්ලිමේන්තු මන්ත්‍රී රෝහණ බංඩාර මහතාගේ සම්බන්ධීකාරක නිසංසලා මංචනායක, මැදවච්චිය ප්‍රාදේශීය සභාවේ විපක්ෂනායක වසන්ත රණතුංග, මැදවච්චිය ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුජීව සෝමපාල යන මහත්ම මහත්මීහු සහභාගී වූහ.

# දැව ආශ්‍රිත කර්මාන්තකරුවන්ට රාජ්‍ය අනුග්‍රහය ලබා දෙනවා

## ඇමැති විමල් වීරවංශ



**රක්ෂණ ශ්‍රියන්ත**

දැව ආශ්‍රිත කර්මාන්තකරුවන්ට කඩිනමින් රාජ්‍ය අනුග්‍රාහකත්වය ලබා දීමට කැපවෙන බව කර්මාන්ත ඇමැති විමල් වීරවංශ මහතා පැවසීය.

දැව ආශ්‍රිත කර්මාන්තකරුවන්ගේ ගැටලුවලට කඩිනමින් විසඳුම් ලබාදීම සම්බන්ධව කටුබැද්ද ලංකා කාර්මික සංවර්ධන මණ්ඩල ශ්‍රවණාගාරයේ පැවති විශේෂ වැඩසටහනේදී අදහස් දක්වමින් ඒ මහතා මෙසේ පැවසීය.

එහි දී වැඩි දුරටත් අදහස් දැක්වූ අමාත්‍ය විමල් වීරවංශ මහතා මෙසේද කීවේය.

" ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමන් මේ රටේ සුවිශේෂී අවධානයට ලක් නොවුණු විවිධ කර්මාන්ත නිසි අවධානයට ගැනීම සඳහා කර්මාන්ත කැබිනට් අමාත්‍යාංශයක් හදනවා වගේම ඒ යටතේ රාජ්‍ය අමාත්‍යාංශ තුනකුත් නිර්මාණය කර තියෙනවා. එකක් මූලික වශයෙන් මේ රටේ රෙදිපිළි නිෂ්පාදකයන්ව ඉහළට ඔසවාලීමටයි. අනික ස්වර්ණාභරණ ක්ෂේත්‍රයේ උන්නතිය අත්කර දීමටයි. ඒ වගේම රාජ්‍ය අමාත්‍ය ප්‍රසන්න රණවීර මැතිතුමා යටතේ වඩු හා මැටි කර්මාන්තය ඇතුළු සුවිශේෂී කර්මාන්තවලට වැඩි අවධානය යොමු කර තිබෙනවා. එමඟින් කාලයක් තිස්සේ නිසි අවධානයට හා සැලකිල්ලකට ලක් නොවුණු දේශීය පාරම්පරික කර්මාන්ත වැඩිදියුණු කරන්න අපේ රජය ඉතා ඉහළ අවධානයක් යොමු කර තිබෙන බව කිව යුතුයි.

වෙනත් රටවල්වලින් මේ රටේ වෙළෙඳපොළ ආක්‍රමණය කළ බොහෝ නිෂ්පාදන අපට නිපදවන්න පුළුවන් ඒවා අඩපණ වුණ හේතුව තමයි චීනයෙන් හෝ වෙනත් රටකින් හෝ අඩු මිලට එන නිෂ්පාදන එක්ක අපට මේ වෙළෙඳපොළ තුළ තරග කරන්න බැරිවීම. ඒ ගැටලුවටත් අද එක්තරා ආකාරයකට පිළිතුරු ලැබී තිබෙනවා. නමුත් මේ තත්ත්වය දිගටම පවතින්නේ ලැබී තිබෙන වාසිදායක අවස්ථාව නියමානුකූලව යොදා ගත්තොත් පමණයි. නැත්නම් මේ රටේ පාරිභෝගික ජනතාවට 'පිටරට පුටුවත් නැහැ, ලංකාවේ පුටුවත් නැහැ' කියන වාතාවරණය නිර්මාණය වීමයි.

ඉදිරියේදී කාර්මික සංවර්ධන මණ්ඩලයත් එක්ව කටයුතු කරන මණ්ඩපයක් අප හැදුවාම මෙම ගැටලු ඉතාම කඩිනමින් විසඳගන්න පුළුවන්. මෙම අවස්ථාවට කාර්මික සංවර්ධන මණ්ඩලයේ සභාපති උපසේන දිසානායක, මොරටුව නගරාධිපති සමන්ලාල් ප්‍රනාන්දු, නාගරික මන්ත්‍රී සුරේෂ් ඉන්දික යන මහත්වරුන් ද, රාජ්‍ය දැව සංස්ථාව, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව, මධ්‍යම පරිසර අධිකාරිය, ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සහ ශ්‍රී ලංකා රේගුව නියෝජනය කරමින් පැමිණි නිලධාරීහු ද එක්ව සිටියහ.

# රටේ සම්පත් ආරක්ෂා කිරීමට ජනතාව පෙරමුණ ගත යුතුයි

## එජාප නියෝජ්‍ය නායක රුවන් විජයවර්ධන

**මැද කොළඹ සමූහ ආරියරත්න ගනේගොඩ**



වත්මන් රජය බලයට පත් වූ දා සිට දිනකට අක්කර 7 බැගින් රට විනාශ කර ඇති බවත්, පක්ෂ දේශපාලයෙන් ඔබ්බට ගොස් රටේ සම්පත් ආරක්ෂා කිරීමට සියලු පුරවැසියන් පෙරමුණ ගත යුතු බවත් එක්සත් ජාතික පක්ෂ නියෝජ්‍ය නායක රුවන් විජයවර්ධන මහතා පැවසීය.

ඒ මහතා මේ බව සඳහන් කළේ වර්තමානයේ සිදුවෙමින් පවතින මහා පරිමාණ වන විනාශය සහ පරිසර විනාශයට එරෙහිව තරුණ ප්‍රජාව බලමුළු ගැන්වීමේ අරමුණින් එක්සත් ජාතික පක්ෂ යොවුන් පෙරමුණ සංවිධානය කළ 'පරිසර හඬ' විශේෂ වැඩසටහන පසුගිය දා (26) කොළඹ දී පැවැත්වුණු අවස්ථාවේදීය.

එහිදී වැඩි දුරටත් අදහස් දැක්වූ රුවන් විජයවර්ධන මහතා- ඉවක් බවක් නැතිව කරන වන විනාශය හමුවේ වන්දි ගෙවීමට සිදුව ඇත්තේ රටේ පුරවැසියාටයි. පරිසරය විනාශ කරමින් සිදු කරන සංවර්ධනය විනාශකාරීයි. තරුණ පරපුර පරිසර විනාශයට එරෙහිව ඉදිරියට පැමිණීම සතුටු විය යුතුයි.

ජනාධිපතිවරයා පවා දැනුවත්ව ගෙන යන පරිසර විනාශයට එරෙහිව දේශපාලන භේදයෙන් තොරව සියලු පාර්ශ්ව එකට එක් වී කටයුතු කළ යුතුයි.

පරිසර විද්‍යාඥ ආචාර්ය අජන්තා පෙරේරා මහත්මිය ද මෙහිදී අදහස් දැක්වූවාය.

මෙම වැඩසටහනට හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වන මහාචාර්ය ආශු මාරසිංහ, සන්දිත් සමරසිංහ, ජාතික යොවුන් පෙරමුණේ ලේකම් දර්ශන බ්‍රාහ්මණ, භාණ්ඩාගාරික දුමින්ද ආටිගල යන මහත්වරුන්, පරිසරවේදීන්, ජාතික යොවුන් පෙරමුණේ සමාජික සාමාජිකාවන් ඇතුළු පිරිසක් එක්වූහ.

# බන්ධනාගාර නිල වෙබ් අඩවියට නව මුහුණුවරක්

**බුද්ධිකා ඉඹුලාන**

බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවිය වන www.prisons.gov.lk, නව මුහුණුවරකින් විවෘත කිරීම බන්ධනාගාරප්‍රතිසංස්කරණ හා සිරකරුවන් පුනරුත්ථාපන රාජ්‍ය ඇමැතිනී විශේෂඥ වෛද්‍ය සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය අතින් පසුගිය දා විවෘත විය. බන්ධනාගාර දෙපාර්තමේන්තුව යටතේ පවතින බන්ධනාගාර පද්ධතිය පිළිබඳවත්, ඒ සම්බන්ධ පුවත් තොරතුරු සහ සේවාවන් පිළිබඳවත් නිවැරදිව තොරතුරු ලබාගත හැකිවන පරිදි මෙම www.prisons.gov.lk වෙබ් අඩවිය නවීකරණය කර ඇත.

මේ ඔස්සේ මහජනතාවට සෘජුවම සම්බන්ධවීමට හැකිවන අතර බන්ධනාගාර සම්බන්ධව මහජනතාවට ඇති පැමිණිලි ද ඉදිරිපත් කිරීමට පහසුකම් සකසා ඇත.

බන්ධනාගාරප්‍රතිසංස්කරණ හා සිරකරුවන් පුනරුත්ථාපන රාජ්‍ය අමාත්‍යාංශයේ ශ්‍රවණාගාරයේ පැවැති මෙම වෙබ් අඩවිය එළිදැක්වීමේ අවස්ථාවට අමාත්‍යාංශයේ ලේකම් ගීතාමනී කරුණාරත්න, බන්ධනාගාර කොමසාරිස් ජනරාල් තුෂාර උපුල්දෙණිය, කොමසාරිස් (පුනරුත්ථාපන හා පාලන) චන්දන ඒකනායක, කොමසාරිස් (බුද්ධි හා මෙහෙයුම්)ටී.අයි උඩුවර මහත්ම මහත්මීන් ඇතුළු පිරිසක් සහභාගී වූහ.





# අධ්‍යාපනය නංවන්න ජපානයේ අත හිත

**සිතාරා සේනානි**

ජපන් රජයේ පූර්ණ සහාය ඇතිව මෙරට ඉගෙනුම් ක්‍රියාවලියෙහි සහකම්පන ගුණාංග ප්‍රචලිත කිරීමේ වැඩසටහනක් ඇරඹේ.

ශ්‍රී ලංකා යුනෙස්කෝ ජාතික කොමිෂන් සභාව හා නවදිල්ලි කලාප කාර්යාලය එක්ව ජපන් රජයේ පූර්ණ මූල්‍ය අනුග්‍රහය සහිත ව මෙරට පාසල් සිසුන් ගුරුභවතුන්, ගුරු උපදේශකවරුන්, විදුහල්පතිවරුන් සම්බන්ධ කරගනිමින් 'ඉගෙනුම් ක්‍රියාවලියේ සහකම්පනය' (Learning for empathy) නමින් වැඩසටහනක් ආරම්භ කර ඇති අතර, එම වැඩසටහනේ නිල සමාරම්භය අධ්‍යාපන ප්‍රතිසංස්කරණ, විවෘත විශ්වවිද්‍යාල ප්‍රවර්ධන හා දුරස්ථ අධ්‍යාපන රාජ්‍ය ඇමැති සුසිල් ප්‍රේම්ජයන්ත් මහතාගේ ප්‍රධානත්වයෙන් අධ්‍යාපන අමාත්‍යාංශයේ දී ඉකුත් දා (25) පැවැත්විණි.

පාසල් සිසුන්, ගුරුවරුන් සහ සමාජයේ ප්‍රතිපත්ති සකස්කරන්නන් මෙන්ම බංග්ලාදේශය, ඉන්දුනීසියාව, පකිස්තානය හා ශ්‍රී ලංකාවේ අධ්‍යාපනඥයන් ඒකාබද්ධ වෙමින් ක්‍රියාවට නංවනු ලබන මෙම වැඩසටහනෙහි ප්‍රමුඛ අරමුණ වන්නේ තිරසර අධ්‍යාපන අරමුණු සාක්ෂාත් කරගැනීම උදෙසා පාසල් පද්ධතියෙහි සහකම්පන ගුණාංග ප්‍රායෝගික ව ක්‍රියාවට නැංවීමයි.

නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ හා නව නිපැයුම් රාජ්‍ය ඇමැතිනී විශේෂඥ වෛද්‍ය සීතා අරඹෙපොළ මහත්මිය ද, මෙරට ජපාන තානාපති අකිරා සුගියාමා, අධ්‍යාපන ලේකම් මහාචාර්ය කපිල පෙරේරා, ශ්‍රී ලංකා යුනෙස්කෝ ජාතික කොමිෂන් සභාවේ මහලේකම් ආචාර්ය පී. එන්. මීගහවත්ත, අධ්‍යාපන ප්‍රතිසංස්කරණ, විවෘත විශ්වවිද්‍යාල ප්‍රවර්ධන හා දුරස්ථ අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යාංශයේ ලේකම් ආචාර්ය උපාලි සේදර මහත්වරු ද, අධ්‍යාපන අමාත්‍යාංශයේ අතිරේක ලේකම්වරු, කොමසාරිස්වරු ඇතුළු පිරිසක් ද මේ අවස්ථාවට එක්ව සිටියහ.

# මාලි සංක්‍රාන්ති ආණ්ඩුවට නව ජනාධිපතිවරයෙක්



**චන්න සංජීව මාලි සිට**

මාලි රාජ්‍යයේ මිලිටරි ජුන්ටාව, දේශපාලන පක්ෂ, සිවිල් සමාජය, සන්නද්ධ කණ්ඩායම්, සම්ප්‍රදායික නායකයන්, ආගමික සහ ඩයස් පෝරාවේ නායකයන් අතර මාසයකට වැඩි කාලයක් තිස්සේ පැවැති සාකච්ඡාවලින් අනතුරුව ඉදිරි මාස දහ අටක සංක්‍රාන්ති ආණ්ඩුවට ජනාධිපතිවරයකු පත් කරගැනීමට හැකි වී තිබේ. හිටපු ආරක්ෂක ඇමැති බහ් න්ඩාඕ සහ මහජනතාව ගලවා ගැනීමේ ජාතික කමිටුවේ සභාපති කර්නල් අස්සිමි ගොයිටා සංක්‍රාන්ති ආණ්ඩුවේ ජනාධිපති සහ උප ජනාධිපති ලෙස මේ අනුව පත් කර ගැනිණි. කර්නල් අස්සිමි ගොයිටා මේ බව සඳහන් නිවේදනය එරට ජාතික රූපවාහිනියෙන් ප්‍රකාශ කළේය.

මේ නිවේදනයට අනුව සංක්‍රාන්ති ආණ්ඩුවේ මේ තනතුරු සඳහා තෝරාගෙන ඇත්තේ සිවිල් නියෝජිතයන් සහ හමුදා නියෝජිතයන්ගෙන් සමන්විත කමිටුවක් මඟිනි.

නායකයන් දිවුරුම් දීම සැප්තැම්බර් 25 වැනි දා පැවැතිණි. මේ තීරණය ගනු ලැබුවේ රාජ්‍ය නායකයන් සහ බටහිර අප්‍රිකානු ආර්ථික හවුලේ රටවල්වල ආණ්ඩු නායකත්ව මණ්ඩලයේ ඉදිරි පෙළ තනතුරුවලට සිවිල් වැසියන් පත් කරන ලෙස ඉල්ලා සිටීම නිසාය.

මේ එකඟතාව ඇති වූයේ නයිජීරියාවේ හිටපු ජනාධිපති ගුඩ්ලක් ජොනතන්ගේ මැදිහත්වීමෙන් සියලු පාර්ශ්ව හමු වී ඇති කළ සාම වෑයමේ ප්‍රතිඵලයක් ලෙසයි. බටහිර අප්‍රිකානු ආර්ථික සංවිධානය මේ නව පත්වීම් ගැන තවමත් නිල වශයෙන් ප්‍රතිචාර දැක්වූයේ නැත.

මේ හිටපු නායක ඊබ්‍රහිම් බවුබකර් කෙයිටාගේ පුතා වන බවුබකර් කෙයිටා නිවාස අඩස්සියේ රඳවාගෙන සිටින මිලිටරි ජුන්ටාව මානව හිමිකම් උල්ලංඝනය කරන බව මානව හිමිකම් සංවිධාන පවසයි. ඔහු සිය පියා සමඟ මේ නිවසේ ජීවත්විය. මේ අර්ථයෙන් මානව හිමිකම් සංවිධාන මිලිටරි ජුන්ටාවට චෝදනා එල්ල කරයි.

හිටපු නායකයාට ඉල්ලා අස්වන ලෙස පවසමින් විරෝධතා දැක් වූ විපක්ෂය සමඟ ජුන්ටාවේ අදහස් පැහෙන්නේ නැත. කරුණු මේ ආකාරයෙන් සිදු වන විට ඒ සම්බන්ධයෙන් ප්‍රංස ජනාධිපති එමානුවෙල් මැක්‍රොන් එක්සත් ජාතීන්ගේ සමුළුව හමුවේ අදහස් දැක්වීය. ප්‍රංස නායකයා කීවේ මාලි ජුන්ටාව සම්පූර්ණයෙන්ම සිවිල් නියෝජිතයන්ට බලය පවරා ඉක්මනින්ම මැතිවරණයක් පැවැත් වීමට ඉඩ දිය යුතු බවයි.

**පරිවර්තනය - බුද්ධි කරුණාරත්න**




## පූර්ණ රාජ්‍ය ගෞරව ඇතිව මහා සංගීතවේදී එස්. පී. බාලසුබ්‍රමණියම් භාරතයෙන් සමු ගනියි







මහා සංගීතවේදී එස්. පී. බාලසුබ්‍රමණියම්ගේ අවසන් කටයුතු ඊයේ (27) පූර්ණ රාජ්‍ය ගෞරව සහිතව සිදු කෙරිණි. මේ එයි අවස්ථාවන් කීපයකි.



## එජා සංවිධානයට ප්‍රතිසංස්කරණ ඕනෑ

### අගමැති මෝදි කියයි

ගතවන පැයේ එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ප්‍රතිසංස්කරණ සිදුවිය යුතු බව ඉන්දීය අගමැති නරේන්ද්‍ර මෝදි 26 දා එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සැසිවාරය අමතමින් ප්‍රකාශ කළේය.

ඔහු මේ බව ප්‍රකාශ කළේ දුරස්ථ මාර්ගයෙන්, පටිගත කළ කතාවක් පවත්වමිනි. එක්සත් ජාතීන්ගේ තීරණ ගන්නා ආකෘතියෙන් ඉන්දියාව තවත් කෙතරම් කාලයක් ඈත් කොට තබන්නේ දැයි ඔහු මෙහිදී ප්‍රශ්න නැඟීය. කොවිඩ් වසංගතය හමුවේ එක්සත් ජාතීන්ගේ සංවිධානය ගෙන ගිය වැඩපිළිවෙළ කෙතරම් සාර්ථකත්වයක් ලබා ගත්තේ දැයි ඔහු තව දුරටත් ප්‍රශ්න කළේය.

කොවිඩ් වසංගතය තුරන් කිරීම සඳහා ඉන්දියාව සිය නිෂ්පාදන සහ බෙදාහැරීමේ හැකියාව ඉදිරියේ දී තව දුරටත් ලබා දෙන බවද මෝදි මේ අවස්ථාවේ කීවේය. ගෙවුණු මාස 8 සිට 9 දක්වා කාලයේ දී මුළු ලොවම කොවිඩ් 19 වසංගතයට එරෙහිව සටන් කරද්දී ඒකාබද්ධ ප්‍රයත්නය ජය ගැනීමට එක්සත් ජාතීන්ගේ සංවිධානය සිදු කළේ කුමක්දැයි සිය කථාවේ දී මෝදි ප්‍රශ්න කර ඇත.

## ඇමී අසමසම හැකියාවන් ඇති ජයග්‍රාහී කාන්තාවක්

### අමෙරිකාවේ නව ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවරියට සුබ පතමින් ට්‍රම්ප් කියයි



අමෙරිකාවේ ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිසුරුවරියක ලෙස ප්‍රකට, සමාජ කොන්සර්වේටිව් වාදිනියක වන ඇමී කොනී බැරට් ජනාධිපති ට්‍රම්ප් තෝරා ඉදිරිපත් කර තිබේ.

ධවල මන්දිරයේ රෝස උද්‍යානයේ දී ඇය ගැන ප්‍රශංසා මුඛයෙන් කතා කළ ට්‍රම්ප් පැවැසුවේ ඇමී අසමසම හැකියාවන් ඇති ජයග්‍රාහී කාන්තාවක් බවයි. සෙනෙට් සභාව මඟින් අනුමත කළහොත් මෑතකදී මිය ගිය ලිබරල්වාදී විනිසුරුවරිය දැරූ තනතුරට පත් කරනු ඇත. නොවැම්බරයේ පැවැත්වීමට නියමිත අමෙරිකානු මැතිවරණය හමුවේ ඇමීගේ පත්වීම විරුද්ධ පක්ෂයේ විවේචනයට ලක් වී ඇත.

## දිනුම් වාරය - 4257 නිල ප්‍රතිඵල

දිනය: 2020-09-26

50 මහජන සම්පත ජනාභිෂේක ස්වර්ණ ජයන්තිය

ජයග්‍රාහී අක්ෂරය **K** ජයග්‍රාහී අංක **5 2 7 6 9 6**

**ත්‍යාග රටාව - අග සිට මුලට**

| | | | | | | | | | | ජයග්‍රාහකයන් ගණන |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| සුපිරි ත්‍යාගය | K | 5 | 2 | 7 | 6 | 9 | 6 | රු | 14,088,353/- | — |
| 1 වැනි ත්‍යාගය | | 5 | 2 | 7 | 6 | 9 | 6 | රු | 2,000,000/ | ත්‍යාග 03 |
| 2 වැනි ත්‍යාගය | | | 2 | 7 | 6 | 9 | 6 | රු | 100,000/ | ත්‍යාග 28 |
| 3 වැනි ත්‍යාගය | | | | 7 | 6 | 9 | 6 | රු | 10,000/ | ත්‍යාග 273 |
| 4 වැනි ත්‍යාගය | | | | | 6 | 9 | 6 | රු | 1,000/ | ත්‍යාග 2,734 |
| 5 වැනි ත්‍යාගය | | | | | | 9 | 6 | රු | 100/ | ත්‍යාග 27,327 |
| 6 වැනි ත්‍යාගය | | | | | | | 6 | රු | 20/ | ත්‍යාග 271,030 |

**ත්‍යාග රටාව - මුල සිට අගට**

| | | | | | | | | | | ජයග්‍රාහකයන් ගණන |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| 7 වැනි ත්‍යාගය | | 5 | 2 | 7 | 6 | 9 | | රු | 10,000/- | ත්‍යාග 27 |
| 8 වැනි ත්‍යාගය | | 5 | 2 | 7 | 6 | | | රු | 1,000/- | ත්‍යාග 275 |
| 9 වැනි ත්‍යාගය | | 5 | 2 | 7 | | | | රු | 100/- | ත්‍යාග 2,728 |
| 10 වැනි ත්‍යාගය | | 5 | 2 | | | | | රු | 50/- | ත්‍යාග 27,131 |
| 11 වැනි ත්‍යාගය | K | | | | | | | රු | 20/- | ත්‍යාග 108,466 |

දිනා ඇති මුළු ත්‍යාග මුදල රු. 78,889,470.00

මීළඟ දිනුම් වාරයේ සුපිරි ත්‍යාගය රු. 15,611,904/-

ස්වර්ණ ජයන්ති ජයග්‍රාහී අංක — සුපිරි අංකය **47** ජයග්‍රාහී අංක **15 51 53**

**ස්වර්ණ ජයන්ති ත්‍යාග රටාව**

| | | | |
|---|---|---|---|
| සුපිරි ත්‍යාගය | සුපිරි අංකය සමග අංක 3ක් ගැළපීමෙන් | සුපිරි මෝටර් රථයක් | 01 |
| 1 ත්‍යාගය | සුපිරි අංකය හැර අංක 3ක් ගැළපීමෙන් | රු 500,000/- | ත්‍යාග 50 |
| 2 ත්‍යාගය | සුපිරි අංකය සමග අංක 2ක් ගැළපීමෙන් | රු.5,000/- | ත්‍යාග 207 |
| 3 ත්‍යාගය | සුපිරි අංකය හැර අංක 2ක් ගැළපීමෙන් | රු.500/- | ත්‍යාග 10,350 |
| 4 ත්‍යාගය | සුපිරි අංකය සමග එක් අංකයක් ගැළපීමෙන් | රු.100/- | ත්‍යාග 7,038 |
| 5 ත්‍යාගය | ඕනෑම අංකයක් ගැළපීමෙන් | රු.50/- | ත්‍යාග 351,900 |
| 6 ත්‍යාගය | සුපිරි අංකය ගැළපීමෙන් | රු.50/- | ත්‍යාග 52,394 |

**රන් කාසි වාසනා දිනුම් ඇදීම**

රන් කාසි වාසනා අංකය 12374

**විශේෂිත අංක ගැලපීම**

| | |
|---|---|
| TOYOTA WIGO (1000cc) මෝටර් රථය සඳහා විශේෂිත අංකය | 0148181 |
| Bajaj 4 Stroke ත්‍රීවීල් රථය සඳහා විශේෂිත අංකය | 0275243 |
| HONDA Hornet CB 160 cc යතුරු පැදිය සඳහා විශේෂිත අංකය | 1509649 |
| Apple iPhone 11Pro(64GB) ජංගම දුරකථනය සඳහා විශේෂිත අංක | 2522188 |
| Samsung Galaxy Note10 Lite ජංගම දුරකථන සඳහා විශේෂිත අංක | 2914213, 1426481, 2063124 |

**අංක 08 සිට අංක 57 දක්වා ලැප්ටොප් පරිගණක 50 ක් සඳහා වූ ජයග්‍රාහී අංක**

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 0672525 | 1649682 | 2217349 | 2008416 | 2364262 | 1684725 | 1710832 | 0768492 | 2723037 | 2910886 |
| 2694638 | 1063778 | 2545624 | 0854512 | 2024476 | 1990457 | 0436218 | 3022848 | 1455128 | 1003976 |
| 0330956 | 1361019 | 1330858 | 2238049 | 2848388 | 0999255 | 0431583 | 0956624 | 0915688 | 0843890 |
| 0177787 | 1876447 | 1087306 | 0561932 | 2007033 | 3005738 | 1269005 | 2071248 | 1600310 | 0923433 |
| 2435041 | 2243729 | 0804813 | 1918508 | 2683011 | 2579426 | 2289753 | 1187791 | 2671333 | 0513075 |

**අංක 58 සිට අංක 107 දක්වා මවුන්ටන් පාපැදි 50 ක් සඳහා වූ ජයග්‍රාහී අංක**

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 2010052 | 0041738 | 2065452 | 2660196 | 2163287 | 2295403 | 2634356 | 0244915 | 2971078 | 2112370 |
| 0428175 | 1375171 | 2784294 | 0615661 | 2861242 | 1837596 | 2453353 | 2455776 | 1381219 | 1793596 |
| 1132053 | 1876068 | 1885146 | 2662710 | 0526167 | 2958234 | 2092609 | 1426506 | 0925079 | 2331340 |
| 1402267 | 2941608 | 1416096 | 0488387 | 2496570 | 0537834 | 0100516 | 0044949 | 1173347 | 2207433 |
| 1966178 | 1272807 | 2183855 | 1932624 | 1831089 | 2714702 | 1395765 | 1056615 | 0798068 | 1722551 |

රුපියල් ලක්ෂ 5 වැඩි ත්‍යාග රජයේ බදු නීති රීතිවලට යටත් වේ.ත්‍යාග මුදල් ලබාගැනීමේදී ජාතික හැඳුනුම්පත අනිවාර්යය වේ. ජයග්‍රාහී ලොතරැයි පත් වලංගු වන්නේ දිනුම් අදින ලද දින සිට මාස 6කෙ කාල සීමාවකට පමණි.

ජාතික ලොතරැයි මණ්ඩලය | NLB ජීවිතයේ සිහිනයට - වාසනාවේ ආශිර්වාදය | www.nlb.lk

## දිනුම් වාරය - 4256 නිල ප්‍රතිඵල

**මහජන සම්පත**

දිනය: 2020-09-25

ජයග්‍රාහී අක්ෂරය **J** ජයග්‍රාහී අංක **7 2 8 9 5 6**

**ත්‍යාග රටාව - අග සිට මුලට**

| | | | | | | | | | | ජයග්‍රාහකයන් ගණන |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 වැනි ත්‍යාගය | | 7 | 2 | 8 | 9 | 5 | 6 | රු. | 2,000,000/- | 01 |
| 2 වැනි ත්‍යාගය | | | 2 | 8 | 9 | 5 | 6 | රු. | 100,000/- | 11 |
| 3 වැනි ත්‍යාගය | | | | 8 | 9 | 5 | 6 | රු. | 10,000/- | 115 |
| 4 වැනි ත්‍යාගය | | | | | 9 | 5 | 6 | රු. | 1,000/- | 1,144 |
| 5 වැනි ත්‍යාගය | | | | | | 5 | 6 | රු. | 100/- | 11,418 |
| 6 වැනි ත්‍යාගය | | | | | | | 6 | රු. | 20/- | 113,099 |

**ත්‍යාග රටාව - මුල සිට අගට**

| | | | | | | | | | | ජයග්‍රාහකයන් ගණන |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| 7 වැනි ත්‍යාගය | | 7 | 2 | 8 | 9 | 5 | | රු. | 10,000/- | 10 |
| 8 වැනි ත්‍යාගය | | 7 | 2 | 8 | 9 | | | රු. | 1,000/- | 111 |
| 9 වැනි ත්‍යාගය | | 7 | 2 | 8 | | | | රු. | 100/- | 1,208 |
| 10 වැනි ත්‍යාගය | | 7 | 2 | | | | | රු. | 50/- | 11,331 |
| 11 වැනි ත්‍යාගය | J | | | | | | | රු. | 20/- | 45,192 |

**දිනා ඇති මුළු ත්‍යාග මුදල - රු.10,599,970.00**

රුපියල් ලක්ෂ 5 හෝ ඊට වැඩි ත්‍යාග රජයේ බදු නීති රීතිවලට යටත් වේ. ත්‍යාග මුදල් ලබාගැනීමේදී ජාතික හැඳුනුම්පත අනිවාර්යය වේ. ජයග්‍රාහී ලොතරැයි පත් වලංගුවන්නේ දිනුම් අදින දින සිට මාස 06කෙ කාල සීමාවකට පමණි.

මීළඟ දිනුම් වාරයේ සුපිරි ත්‍යාගය රු.14,088,353.00

NLB ජීවිතයේ සිහිනයට - වාසනාවේ ආශිර්වාදය

ජාතික ලොතරැයි මණ්ඩලය
32, දේශමාන්‍ය N. W. J. මුදලිගේ මාවත, කොළඹ - 01
දුරකථන: 011-4607000, 011-2324324. Fax: 011-4669416.
www.nlb.lk

## දකුණු කොරියානු නිලධාරියාගේ ඝාතනයට කිම් ජොන් උන් සමාව ඉල්ලයි



දකුණු කොරියානු නිලධාරියකු ඝාතනය කොට සිරුර පුළුස්සා දැමීමේ සිද්ධිය ගැන උතුරු කොරියානු නායක කිම් ජොන් උන් සමාව ඉල්ලා තිබේ.

කිම් ජොන් උන් දකුණු කොරියානු නායක මූන් ජායි ගෙන් මේ සිද්ධිය සිදු නොවිය යුතුව තිබිණැයි සමාව ඉල්ලා ඇතැයි විදෙස් වාර්තා පවසයි.

දකුණු කොරියාව ප්‍රකාශ කරන්නේ 47 හැවිරිදි මිය ගිය තැනැත්තාගේ සිරුර මුර සංචාරයේ නිරත තම හමුදාවට සොයා ගැනීමට ලැබී ඇති බවයි.



## නගර්නෝ-කරබක් කලාපයේ දේශසීමා ආශ්‍රිත ගැටුම් අසර්බයිජාන හෙළිකොප්ටරයක් බිම හෙළයි

ආර්මේනියාව සහ අසර්බයිජානය අතර පිහිටා ඇති නගර්නෝ - කරබක් කලාපයේ දේශසීමා ආශ්‍රිත ගැටුමක් ඇති වී තිබෙන අතර මෙයින් අසර්බයිජාන හෙළිකොප්ටරයක් බිම හෙළා ඇතැයි ද වාර්තා වේ. අසර්බයිජානය ගුවනින් සහ කාලතුවක්කු ප්‍රහාර එල්ල කර ඇතැයි ආර්මේනියාව චෝදනා කරයි. අනතුරුව ප්‍රදේශයේ යුද නීතිය ප්‍රකාශයට පත් කර තිබේ. අසර්බයිජානය ප්‍රකාශ කරන්නේ තමන් ප්‍රහාර එල්ල කළේ පෙරමුණට එල්ල වූ ෂෙල් වෙඩි ප්‍රහාරවලට ප්‍රතිචාර වශයෙන් බවයි. දෙපැත්තෙන්ම සිවිල් ජීවිත හානි සිදු වී ඇතැයි විදෙස් වාර්තා පවසයි. මේ රටවල් දෙක අතර දීර්ඝ කාලයක් පැවැති ගැටුම් මෑත කාලයේ නැවත ඇවිලෙන බවක් පෙනේ යැයි විදෙස් වාර්තා වැඩි දුරටත් කියයි.

# දෙවියනි! ඔබට සමාව දිය නොහැකිය

## සුවහසක් සංගීත රසකාමීන් පිනවූ ගාන්ධර්වයකුගේ නික්ම යාම

කොවිඩ් වසංගතය ලොව පුරා පැතිර ගිය මුල් දවස්වල එය මිනිසා විසින් පරිසරය ඇතුළු ස්වාභාවික ලෝකයට කරන ලද එදිරිවාදිකම්වලට එරෙහිව දුන් දඬුවමකැයි කවුදෝ ලියා තිබිණ. එහෙත් ඒ උදෙසා පසුගිය සිකුරාදා දෙවියන් විසින් ලබාදෙන ලද අමරණීය හඬකින් යුත් ඉන්දියානු සිනමාවේ මහා ගායකයා ගේ ජීවිතය උදුරා ගත් ආකාරය ගැන නම් දෙවියන්ට කිසි කලෙකත් සමාව දිය නොහැකිය. එස්.(ශ්‍රීපති) පී.(පණ්ඩිතරාධ්‍යුලා) බාලසුබ්‍රමානියම් යනු පසුගිය දශක දෙකකට වැඩි කාලයක් ඉන්දියානු සිනමාවේ බොහෝ නළුවන්ගේ ගී හඬ වූයේය. උත්පත්තියෙන් දකුණු ඉන්දියාවේ ද්‍රවිඩ භාෂා කුලකයට අයත් තෙළිඟු වංශිකයකු වුවත් ඔහුගේ හඬ මවුබසට අමතරව භාෂා 16 කින් ඇසිණ. දකුණේ කමල් හසන්ට මෙන්ම උතුරේ සල්මන් ඛාන්ට ද මේ මිනිසා සිය හඬ මුසු කළේය.

ඔහු ගැයූ ගී සංඛ්‍යාව 40,000කට වඩා වැඩි වුවහොත් මිස අඩුවක් නැත. පැරණි දකුණු ඉන්දියානු ගායකයන් කිහිප දෙනෙකුම සිංහල චිත්‍රපට පසුබිම් ගී ගායනයෙහිලා සම්මාදම් වුව ද එස්.පී.බී. හෙවත් බාලසුබ්‍රමානියම් සිංහල චිත්‍රපට ගායනයට එක්වුණේ නැත. ඒ මෙරට චිත්‍රපට පසුබිම් ගායනයට ඉන්දියානු ගායකයන් යොදා ගැන්ම පනහ දශකයේදීම අවසන් වූ බැවින්ය. එහෙත් ඔහු තරම් අසූව දශකයේ පරම්පරාව වසඟ කළ වෙනත් දකුණු ඉන්දියානු ගායකයකු බිහි වූයේ නැත යන්න අතිශයෝක්තියක් නොවේ.

'කේලඩි කන්මනි' චිත්‍රපටයට ඔහු විසින් රඟපාමින් ගයන ලද 'මනිල් ඉන්ද කාදලන්දි' ගීතය වචනයෙන් වචනය හඬ උස් කරමින් ගැයිය යුත්තකි. එය ගයන්නට වැර දරා හුස්ම අතරමග නතර කළ මිතුරෝ අපට සිටියහ. මේ ගීතය වරෙක ඔහු කොළඹ බණ්ඩාරනායක සම්න්ත්‍රණ ශාලාවේ දී සජීවීව ගයන ලද්දේ එහි සිටි ප්‍රේක්ෂකයන් අමන්දානන්දයට පත් කරමිනි. එහිදී ඔහු ප්‍රවීණ මාධ්‍යවේදී අබ්දුල් හමීඩ් විසින් ක්ෂණිකව රචනා කරන ලද ලංකාව පිළිබඳ ගීතයක් ඒ මොහොතේම ගායනා කළේය. හැත්තෑව දශකයේ අග භාගයේ දකුණු ඉන්දියානු දෙමළ ජනාකර්ෂණීය සිනමාව ආසියාව පුරා ප්‍රචලිත වද්දී එයට එක් සාධකයක් වූයේ එස්.පී.බාලසුබ්‍රමානියම්ගේ අතිශය පෞරුෂයකින් යුතු ගීතයේ ඇති ආකර්ෂණයයි.

ඉන්දියාව හරහා දකුණු ආසියාකරයේ බොහෝ රටවලට බෝවුණු චිත්‍රපට විලාසයේ දී පසුබිම් ගායකයාට හෝ ගායිකාවට ලැබෙනුයේ ඉහළ තැනකි. ඔහු හෝ ඇය සිනමා කෘතියක කරන කාර්යය නළුවකුගේ භූමිකාවට දෙවැනි වනුයේ ගායකයාගේ හෝ ගායිකාවගේ රූපකාය තිරය මත දිස් නොවන හේතුවෙන් පමණකි. සිනමා නළුවා කවර විලම්බීතයකු වුව ඔහු හෝ ඇය පිළිබඳ අපට බොහෝ විට ඉතිරිව ඇත්තේ අදාළ ගායකයන් විසින් මවන ලද හඬ සහිත රූපකායන්ය. එමෙන්ම පාර්සි නාටක ඔස්සේ ඉපැදුණ මේ කලාපයේ කථානාද සිනමාව තුළ ගීතයට ඇත්තේ ඉහළ ස්ථානයකි. ආදරයේ උච්චස්ථානයේ ද විරහවේ ගැඹුරු පත්ලෙහිද නළුවාගේ හෝ නිළියගේ භාවයන් ප්‍රකාශ කරන්නට සිනමාකරුවන් යොදා ගත් මූලික අවිය වූයේ ගීතයයි. එමගින් බොහෝ නළු නිළියන් සිය දුබල හැඟීම් ප්‍රකාශනයේ ජාම බේරා ගත්ත ද ඇතැම් විශිෂ්ට නළු නිළියන්ට තම රංගනය ගායකයාගේ හඬ රංගනයෙහිලා ඇති සීමාවන් දිගේ නතර කරන්නට සිදු විය. රුක්මණී දේවියට තම සිනමා දිවියේ භාව ප්‍රකාශනයන් සීමා කරන්නට සිදුවූයේ චිත්‍රපටයකදී ඇයගේ ගීතයට වැඩි ඉඩක් ලැබුණ නිසාය. පාර්සි නාට්‍ය සඳහා ද මුල පිරුණු සංස්කෘත නාට්‍යයන්ගේ භාව ප්‍රකාශනයෙහිලා ගීතයට ලැබුණේ වැඩි ඉඩකි. එබැවින් මේ කලාපයේ සිනමා කෘතින්ගේ එබඳු ලක්ෂණ බිහි වීම පිළිබඳ කිසිදු සිනමාකරුවකු වෙත දොස් පැවරීමෙන් ද පළක් නොවේ.

1931 වසරේ ඇරඹෙන ඉන්දියානු කලාපයේ කථානාද සිනමාවේ මුල් අවදියේ එයට යොදා ගත් බොහෝ නළු නිළියෝ පාර්සි වේදිකාවෙන් බිහිවූවෝ වූහ. නිහඬ යුගයේ සිනමා තාරකාවන් එයින් විසි වී ගිය අතර අලුතෙන් සිනමාවට එක්වුණේ ගායක ගායිකාවන්ය. මුල් දශකය පුරාම චිත්‍රපට සඳහා පසුබිම් ගී ගයන ලද්දේ අදාළ නළු නිළියන්මය. එයට හේතුව ඔවුන් වේදිකාවේ රංගනය හා ගායනය ද එක ලෙස සිදු කර තිබීමයි. මේ යුගයේ චිත්‍රපට සඳහා ගායනය කෙතරම් අවශ්‍යවී ද යත් ඉන්ද්‍රසභා චිත්‍රපටයට ගීත 69ක් අඩංගුව තිබිණ. එහෙත් අනුක්‍රමයෙන් චිත්‍රපට ගායනය සඳහා වෙනම පසුබිම් ගායකයන් බිහිවන්නට පටන් ගත්තේය. එයට හේතුව ඇතැම් නළු නිළියන් ගායන කුසලතාව පළ කළ ද එය සිනමා රූපරාමුවේ ප්‍රබලත්වයට දක්වන්නා වූ දායකත්වයේ අඩු පාඩු ඉස්මතු වන්නට පටන් ගැනීමය. එමෙන්ම ගායන පෞරුෂය යනු වෙනම කාරණාවක් යැයි අවබෝධ වීමය.

එස්.පී.බාලසුබ්‍රමානියම්ගේ යුගයට එන විට චිත්‍රපට පසුබිම් ගායනය සහමුලින්ම නළුවාගේ කාර්යයෙන් වෙන් කොට තිබුණු අතර ඔහුට තිබුණේ චිත්‍රපටයේ නළුවාගේ භාව ප්‍රකාශයන් සඳහා සිය ගායනය ඉදිරිපත් කිරීමටය. එසේ වුවත් එස්.පී. බී. එය ඉක්මවා නළුවෙක් ද වූයේය. පුදුමය නම් ඔහුට හොඳින් රඟපාන්නට ද හැකියාව තිබීමය. ඉහත දැක්වූ 'කේලඩි කන්මනි' චිත්‍රපටයේ ඔහු තරුණ දියණියක සහිත වැන්දඹු පියෙකුගේ චරිතය ඉතා විශිෂ්ට අන්දමින් තිරයට ගෙනාවේය. කාදලන් චිත්‍රපටයේ ප්‍රභූ දේවාගේ පියා ලෙස ඔහු කළ රංගනය ද ඉතා අනුවේදනීය විය. නිතර ප්‍රිය සම්භාෂණයන්හි රස මුසු බස් දොඩන බාලසුබ්‍රමානියම් ඔහුගේ විනෝදකාමී බව සිය සිරුරේ ස්වරූපයෙන්ම පෙන්වා සිටියේය.

එස්.පී.බාලසුබ්‍රමානියම් උපන්නේ 1946 වසරේ ජූනි මස 4 වැනි දින එවකට බ්‍රිතාන්‍ය මදුරාසි ප්‍රාන්තයේ නෙල්ලූර් ගම්මානයේය. අද එය අන්ද්‍රා පෙදෙසට අයත්ය. සහෝදරයන් දෙදෙනෙකු හා සහෝදරියන් පස් දෙනෙකුගෙන් යුත් පවුලක සාමාජිකයකු වූ එස්.පී.බී ගේ පියා, සම්බමූර්ති 'හරිකත' කලාකරුවකු විය. හරිකත කලාකරුවන් යනු ආන්ද්‍රා, තෙළඟානා, මහාරාෂ්ට්‍ර හා කර්නාටකයේ ප්‍රචලිතව ඇති විෂ්ණු දෙවියන් පිළිබඳ ගායනා හා පුවත් පවසන සාම්ප්‍රදායික කලාකරුවන් පිරිසකි. සංගීතයෙන් ගායනයෙන් මිශ්‍ර පූර්ණ දේව කතාකරණයේ යෙදෙන මේ පිරිස බ්‍රාහ්මණ වංශිකයෝ වෙති. එස්.පී.බී ගේ මෑණියන් සකුන්තලාඅම්මාය. සුප්‍රකට චිත්‍රපට පසුබිම් ගායිකාවක වන එස්.පී. ශෛලජා, බාලසුබ්‍රමානියම් ගේ නැගණියකි.

ඉංජිනේරුවකු වන්නට ඉගෙන එය අතරමග අතහැර දමන එස්.පී.බී වඩාත් ඇලුම් කළ සංගීත ලෝකය සොයා ගියේය. 1964 වසරේදී මදුරාසිය කේන්ද්‍ර කොටගත් තෙළිඟු සංස්කෘතික සංවිධානයක් මගින් පවත්වන ලද ගායනා තරගයකින් ඔහු මුල් තැනට පත් විය. එය අධීක්ෂණය කරන ලද්දේ තෙළිඟු සිනමාවේ ජනප්‍රිය සංගීත අධ්‍යක්ෂ වරයෙකු හා ගායකයකු වූ එස්.පී.කොණ්ඩාපානිය. කොණ්ඩාපානි නොපැකිළව මෙම තරුණයාට සිනමා ලෝකයේ දොර විවර කර දුන්නේය. බාලසුබ්‍රමානියම් ගායනා තරගයේදී ගයන ලද්දේ ද කොණ්ඩාපානිගේ ගීතයකි. 'ශ්‍රී ශ්‍රී ශ්‍රී මරියාදා රාමන්නා' නම් තෙළිඟු භාෂිත චිත්‍රපටයෙන් එස්.පී.බී සිනමා ලෝකයට පිවිසියේය. මේ අවදියේම මදුරාසියේ දී ඔහු සංගිත කණ්ඩායමක් ගොඩනගාගෙන සිටියේය. එහි ගිටාර් හා හාමෝනියම් වාදනයෙන් දායක වූයේ පසුකලෙක දකුණු ඉන්දියානු සිනමා සංගීතය නව මගකට යොමු කළා වූ ඉලෙයරාජාය. ඉලෙයරාජාගේ සොහොයුරු ගංගෙයි අමරන් ද එහි ගිටාර් වාදකයකු විය.

මුල්ම තෙළිඟු චිත්‍රපට පසුබිම් ගායනයෙන් අට දිනක් ගතවන තැන එස්.පී.බී මුල්වරට කන්නඩ චිත්‍රපයක් උදෙසා ගී ගැයුවේය. ඒ 'නක්කරේ අඬේ ස්වර්ග' චිත්‍රපටය උදෙසාය. තව නොබෝ දිනකින් ඔහු එවකට ප්‍රවීණතම සංගීතඥයකු වූ එන්.එස්. විශ්වනාත්ගේ සංගීතයට 'හොටෙල් රම්බා' නම් දෙමළ චිත්‍රපටයට ගී ගැයුවේය. මේ චිත්‍රපටය තිරයට ආවේ නැත. එහෙත් එය එස්.පී.බී. ගේ ඉදිරි ගමනට බාධාවක් නොවිණ. කල් නොයවාම ඔහු සිනමාවේ සුපිරි තරු වූ එම්.ජී.රාමචන්ද්‍රන්ට, ජෙමිණි ගනේෂ්ට මෙන්ම ශිවාජි ගනේෂන්ට ද පසුබිම් ගී ගයන්නට වරම් සදා ගත්තේය. 'අඩිමයි පෙන්' චිත්‍රපටයට එම්.ජී.ආර් වෙනුවෙන් ඔහු විසින් ගයන ලද 'ආයිරම් නිලවේ වා' ගීතය එක රැයින් දෙමළ රසිකයන්ගේ සිත් දිනා ගත්තේය. ඒ වන තෙක් සෞන්දර්රාජන් වැනි ගායකයන්ගේ හඬට පමණක් සීමා වී සිටි එම්.ජී.ආර් වැන්නන් පවා මේ අලුත් ගායකයාගේ හඬ සමග නවතාවයෙන් බැඳෙන්නට විය. ද්‍රවිඩ කුලකයේ මලයාලම් මෙන්ම ඉංග්‍රීසි, සංස්කෘත, බෙංගාලි හින්දි ඇතුළු සියලු භාෂාවලින් ගී ගයන්නට ඔහු වරම් ලද්දේය. පී.සුසිලා, එස්.ජානකී, වානි ජයරාම්, වැනි එකල දකුණු ඉන්දියානු සිනමා අම්බරය පුරා පැතිර සිටි බොහෝ ගායිකාවෝ එස්.පී.බී. හා ගී ගයන්ට අවස්ථාව ලැබීමෙන් මහත් ආනන්දයට පත් වූහ. වරෙක කන්නඩ ගීත 21 ක් ඔහු එකවර පටිගත කළේය. තවත් වරෙක දෙමළ ගී 19 ක්ද හින්දි ගී 16 ක් ද එකම දිනයක පටිගත කළේය. මුම්බායේ දී එක් දිනකදී හින්දි චිත්‍රපට සඳහා ගීත ගණනාවක් ගයන ඔහු දිනය අවසාන වන්නට මත්තෙන් ගුවන් මගින් චෙන්නායි වෙත එන්නේ දෙමළ චිත්‍රපට පසුබිම් ගායනයටය.

1980 වසරේ දී කේ.විශ්වනාත් විසින් සිනමාවට නැංවූ 'සංකරාබරණම්' තෙළිඟු චිත්‍රපටයේ එස්.පී.බී ගේ ගායනා ඔහුට ජාතික සම්මානය දිනා දුන්නේය. තෙළිඟු සිනමාවේ බිහි වූ විශිෂ්ටතම චිත්‍රපටයක් වූ මෙය ( කොළඹ නිව් ඔලිම්පියා සිනමාහලේ ද ප්‍රදර්ශනය විය) කේ.වී. මහාදේවන්ගේ සංගීතයෙන් ඔපවත් විය. මේ අවදියේ නැඟී එන ඉලෙයරාජා සිය අපූර්ව සංගීත නිර්මාණ ජනතාව අතරට ගෙන ගිය ප්‍රධාන වාහකයා වූයේ බාලසුබ්‍රමානියම්ගේ මුධර ස්වරයයි. කමල්හසන්ට නැතුවම බැරි ගායකයා වූයේ ද ඔහු ය. බාලසුබ්‍රමානියම් මුල්වරට හින්දි ගීතයක් ගයන ලද්දේ ද කමල් හසන් වෙනුවෙන්ය. ඒ, කේ. බාලචන්දර් අධ්‍යක්ෂණය කරන ලද 'ඒක් දූජේ කේලියේ' චිත්‍රපටය සඳහාය.

1989 වසරේ දී 'මෛනේ ප්‍යාර් ක්‍යා' චිත්‍රපටය උදෙසා ඔහු ගී ගයන ලද්දේ සල්මන් ඛාන්ටය. මේ සමග ඒ වන තෙක් හින්දි සිනමාව පුරා අණසක පතුරා සිටි බොහෝ හින්දි ගායකයන් අබිබවා දකුණේ ගායකයා සිනමාවේ ඉඩ හදා ගත්තේය. ඔහු මුල් වරට ෆිල්ම්ෆෙයාර් සම්මානය දිනා ගත්තේ ඒ වෙනුවෙනි. 'හම් ආප්කේ හෛන් කෝන්' චිත්‍රපටය සඳහා ඔහු ලතා මංගේෂ්කාර් සමග ගැයූ ගී අද ද ඉන්දියානු සිනමාවේ අමරණීය ගී අතර ඇත්තේය. එපමණක් නොව ඒ සමග එස්.පී.බී හා සම කරන්නට ඉන්දියානු සිනමාවේ වෙනත් ගායකයකු නොවුණා යැයි පවසන්නට තරම් ඔහු නමක් දිනා ගත්තේ මේ අවදියේය. බොහෝ ගායකයන්ගේ ගායනා තම මවු බසට පමණක් සීමා වුව ද බාලසුබ්‍රමානියම්ට වූයේ විශ්වයටම පොදු හඬකි. මේ මධුර හඬ ඔහුට ඉන්දියානු ජාතික සම්මාන 6ක් ද, දකුණු ඉන්දියාවේ සියලු ප්‍රාන්තයන්ගේ සම්මාන ද, ෆිල්ම් ෆෙයාර් සම්මාන ද දිනා දුන්නේය. ඉන්දියානු අන්තර්ජාතික සිනමා උලෙළේ දී 2016 වසරේ දී ඔහුට විශේෂ රජත මයුර සම්මානයක් පුද කළ අතර ඉන්දියානුවකුට පිරිනමන ඉහළම සම්මාන අතර තෙවැන්න වූ පද්ම භූෂණ සම්මානයෙන් ද හෙතෙම 2011 වසරේදී පිදුම් ලද්දේය.

ස්වකීය චිත්‍රපට පසුබිම් ගායනයට අමතරව ඔහු බොහෝ චිතපට සඳහා හඬ නළුවකු ලෙස ද කටයතු කළේය. සුප්‍රකට ගාන්ධි චිත්‍රපටය තෙළිඟු බසින් දෙබස් කවද්දී එහි ගාන්ධිගේ චරිතයට හඬ දුන්නේ ඔහුය. කමල් හසන් රඟ පෑ බොහෝ චිත්‍රපට තෙළිඟු බසට පරිවර්තනය වද්දී කමල් හසන්ට හඬ නළුවා වූයේ ඔහුය. සල්මන් ඛාන්, අනිල් කපූර්, බාලසුබ්‍රමානියම්ගේ හඬින් සෙසු ප්‍රාන්තයන්හි දී පණ ලද නළුවෝ අතර වෙති.

සාවිත්‍රි ඔහුගේ භාර්යාවගේ නමය. චිත්‍රපට නිෂ්පාදකයකු මෙන්ම ගායකයකු හා නළුවකු වන එස්.පී.බී. චේරන් ඔහුගේ පුතණුවන්ය. දියණිය පල්ලවි නම් වන්නීය.

බාලසුබ්‍රමානියම් අසනීප වූ වහාම ඔහුගේ රසිකයෝ චෙන්නායිහි එම්.ජී.එම් රෝහල අවට සිට දෙවියන් යැද්දාහ. එහෙත් පුරා මාසයක් රෝහල්ගතව සිටි ඔහු එයින් පසු යළි ආවේ නැත. ඔහු අවසන් වරට ගයන ලද්දේ කොවිඩ් ආසාධිතයන් වෙනුවෙන් සේවය කරන වෛද්‍යවරුන්, හෙද හෙදියන් ඇතුළු පිරිසට උපහාර ගීයකි. එහෙත් ඒ ගීතය ගයා ටික දිනකින් ඔහු රෝහල් ගත කරන්නට සිදුවිය.

ඔහුගේ අවසන් කටයුතු සෞඛ්‍යාරක්ෂණ නියමයන්ට අනුව නොදන්නා තැනක සිදු කෙරුණ වග ආරංචි විය.

ඉන්දියාව කලාකරුවන් වෙන්ව ගිය පසු වසරින් වසර ඔහු වෙනුවෙන් ස්මරණ උත්සව පවත්වන රටක් නොවේ. කෙනෙකුගේ කාර්යය නිමකොට ගිය පසු තවකෙකු ඒ තැන ගන්නේ යැයි අදහන රටකි. එය දිනෙන් දින යාවත්කාලීන වන රටක්ව ඇත්තේ එබැවින්ය. බාලසුබ්‍රනියම් ට ද එය එසේමය. හෙට ඉන්දියාව චිත්‍රපට පසුබිම් ගායනයට තවත් කෙනෙකු සොයා ගන්නේය. පසුගිය වකවානුවේ වත් ජනප්‍රිය ගායකයෝ රාශියක් සිනමාවට පිවිසි වග අමතක කළ යුතු නැත. නූතන ඉලෙක්ට්‍රොනික් සංගීතය හමුවේ බාලසුබ්‍රමානියම් ගේ නිකැලැල් කටහඬට තාවකාලිකව හෝ යම්තාක් දුරට පසුබසින්නට සිදුව තිබිණ. එසේ වුව ද අසූව දශකයේ දී ඉන්දියානු දෙමළ සිනමාවට පෙම් බඳින්නට බාලසුබ්‍රමානියම් ගේ ගී හඬ ද අපට මහත් උපකාරයක් වූ වග කිසිකලෙකත් අමතක නොවනු ඇත. මේ ගී අප පමණක් නොව සියලු ශ්‍රාවකයන් ගේ මනදොළ තවත් ශත වර්ෂ ගණනාවක් සපුරා අප අතර පවතිනු ඇති වග ද අපගේ විශ්වාසයයි. ඒ ඔහුගේ භාෂාව අන් කිසිවක් නොව දෙවියන් විසින් දුන් මධුර ගීතයේ භාෂාවම වූ බැවින්ය.

**අරුණ ගුණරත්න**













biz.dinamina@lakehouse.lk





# ආයෝජන වැඩි කිරීමට පියවර රැසක්

## ආයෝජන මණ්ඩලයේ අධ්‍යක්ෂ ජනරාල් සංජය මොහොට්ටාල

මෙම වසරේ ගෙවුණු මාස 09තුළ ඩොලර් බිලියන1.5ක ආයෝජන අනුමත කර තිබේ. 2020 වසර සඳහා වන ආයෝජන මණ්ඩලයේ ඉලක්කය ඩොලර් බිලියන 2.25කි. එසේවුව COVID-19 වසංගතය ලෝක ආර්ථිකයට දැඩි ලෙස බලපා ඇති අවස්ථාවේ රටක් ලෙස මෙවැනි ආයෝජන මට්ටමක පැවතීම කැපී පෙනෙන කරුණක් බව ආයෝජන මණ්ඩලයේ අධ්‍යක්ෂ ජනරාල් සංජය මොහොට්ටාල මාධ්‍යවෙත පවසයි.

"දේශීය ආයෝජකයින් ශ්‍රී ලංකාව තුළ සිය ව්‍යාපාර පුළුල් කිරීමට කටයුතු කිරීම පුදුම සහගතයි. දියුණු ආර්ථිකයන් ඇති රටවල වුව ඔවුන්ගේ ආර්ථික ක්‍රියාකාරකම් හැකිලෙමින් පවතින අවස්ථාවක දේශීය ආයෝජකයින් වර්තමාන ලෝක වෙළෙඳපොළේ ඇති අවස්ථාවන් වෙත ප්‍රවේශවෙමින් සිටීම පැසසියයුතු කරුණක් ලෙසින් මොහොට්ටාල මහතා පවසා තිබේ.

ඉදිරි වසර දෙක තුළ විදේශ ආයෝජන සැලකිය යුතු ලෙස වර්ධනය වනු ඇතැයි අපේක්ෂා කරන අතර ඒ සඳහා වන මූලික අවශ්‍යතා දැනටමත් සකස් වෙමින් පවතින බවත්, එමෙන්ම නව ආයෝජන ආරම්භ කිරීම සඳහා විධිමත් යාන්ත්‍රණයක් සකස් කෙරෙමින් පවතින බවත්,

රටකට සෘජු විදේශීය ආයෝජන ආකර්ෂණය කර ගැනීමට බලපාන සාධක කීපයක් පිළිබඳ-වද හෙතෙම අවධාරණය කරයි.ස්ථාවර රජයක්, ස්ථාවර ප්‍රතිපත්ති, නිසි නෛතික රාමුවක් සහ නිදහස් වෙළෙඳ ගිවිසුම් , ස්ථාවර හා ශක්තිමත් රජයක් දැනටමත් ස්ථාපිත කර ඇති අතර වර්තමානයට සරිලන පරිදි අනෙකුත් අංශ යාවත්කාලීන කළ යුතු බවටද සංජය මොහොට්ටාල මහතා පවසා ඇත.

ශ්‍රී ලාංකික ශ්‍රම බළකාය සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කළ හැකි ක්ෂේත්‍ර පිළිබඳව ද අපි අවධානය යොමු කරනබවත් පවසා ඇති අතර, එරාවූර් රෙදි උද්‍යානය අපගේ සැලකිය යුතු මුලපිරීමක් වන අතර එමගින් විශාල විදේශ විනිමය ඉතිරියක් රටට ගෙන එනු ඇතැයි අපේක්ෂා කරයි. කොළඹ සහ ගම්පහ දිස්ත්‍රික්ක වලින් පිටත රබර් මත පදනම් වූ නිෂ්පාදන කලාපයක් ස්ථාපිත කිරීමට ආයෝජන මණ්ඩලයේ අපේක්ෂාව බව සඳහන්කර තිබේ. ධීවර හා ජලජ සම්පත් ව්‍යාපෘති ආයෝජන ප්‍රවර්ධන මණ්ඩලයෙහි මාර්ග සිතියමෙහි ද ඇති අතර මොහොට්ටාල මහතා පවසා ඇත්තේ මෙම ව්‍යාපෘති උතුරු, නැගෙනහිර සහ වයඹදිග වෙරළ තීරයන්හි ක්‍රියාත්මක කිරීම කෙරෙහි අවධානය යොමු කරඇති බවයි.

**බුද්ධිකා බ්‍රාහ්මණගේ**

## නවලෝක රෝහලෙන් ඔන්ලයින් රසායනාගාර වෙබ් අඩවියක්

මෙරට පුද්ගලික රෝහල් ක්ෂේත්‍රයේ පුරෝගාමී නවලෝක රෝහල, රසායනාගාර ක්ෂේත්‍රයේ නව මානයක් සනිටුහන් කරමින්, සිය 35 වැනි සංවත්සරයට සමගාමීව ශ්‍රී ලංකාවේ ප්‍රථම ඔන්ලයින් (LAB TESTS ONLINE) රසායනාගාර වෙබ් අඩවිය පසුගිය 18 වැනි දින, නවලෝක රෝහල් සමූහයේ සභාපති ආචාර්ය ජයන්ත ධර්මදාස, නියෝජ්‍ය සභාපති හර්ෂිත් ධර්මදාස සහ අධ්‍යක්ෂ රසායනාගාර සේවා මහාචාර්ය ලාල් චන්ද්‍රසේන යන මහත්වරුන්ගේ ප්‍රධානත්වයෙන් ආරම්භ කරනු ලැබීය.

නවලෝක රෝහල මගින් හඳුන්වා දෙන මේ නවතම සංකල්පයට අනුව, වෙබ් Nawaloka Lab Tests Online අඩවියට පිවිස, වෛද්‍යවරයා ලබාදෙන රෝග පරීක්ෂණ නිර්දේශ පත්‍රිකාව (Precription) වෙබ් අඩවියට ඇතුළත් කළ යුතුය.

මේ ක්‍රමවේදය මගින්, වෛද්‍ය නිර්දේශය පරිදි කළයුතු පරීක්ෂණයට අදාළව රෝගියා ලබා දිය යුතු රුධිර සාම්පල, නවලෝක රෝහල මගින් රෝගියාගේ නිවෙස වෙත ගොස් ලබා ගන්නා අතර, පරීක්ෂණ වාර්තාවද නිවෙස වෙත ගෙන්වා ගත හැකි බැවින්, රෝගී පුද්ගලයාට විවේක සුවයෙන් නිවෙසටම වී සිටිය හැකිය.

**ඉරෝෂිණී දීපිකා**

## Firstlight වැඩසටහනින් කුඩා රබර් වතු හිමියන්ට පොහොර




DPL සමාගමේ නියෝජ්‍ය කළමනාකාර අධ්‍යක්ෂ, පුෂ්පික ජනාධීර ආර්. ඉන්ද්‍රාවතී මහත්මියට පොහොර මිටියක් ලබා දෙමින්

DPL සමාගම සමඟ අඛණ්ඩව කටයුතු කරන රබර් කිරි ගොවි සමිති සාමාජිකයින්ගේ ජීවනෝපායන් අඛණ්ඩව සවිබල ගැන්වීමට හා නගා සිටුවීමට Dipped Products සමාගම එහි ප්‍රධාන තිරසාර වැඩසටහන වන DPL Firstlight යටතේ මොණරාගල දිස්ත්‍රික්යේ කුඩා රබර් වතු හිමියන් 1500 දෙනෙකුට පොහොර බෙදා දීම සඳහා රුපියල් මිලියන 2.1 ක් වැය කර ඇත.

අඛණ්ඩව නව වැනි වරටත් පවත්වනු ලබන මෙම වැඩසටහන මගින් මොණරාගල දිස්ත්‍රික්ය පුරා සිටින DPL සමාගමට අනුබද්ධ රබර් කිරි ගොවි සමිති හතරක කිරි ගොවීන් අතර පොහොර කිලෝ ග්‍රෑම් 90,000 ක් බෙදා දෙන ලදී.මෙම වැඩසටහන සම්බන්ධව අප සමඟ අදහස් දැක් වූ DPL සමාගමේ නියෝජ්‍ය කළමනාකාර අධ්‍යක්ෂ, පුෂ්පික ජනාධීර මහතා "වසර 12කට වැඩි කාලයක් පුරාවට මොණරාගල දිස්ත්‍රික්කයේ කුඩා රබර් වතු හිමියන් නගා සිටුවීම සඳහා DPL Firstlight වැඩසටහන කටයුතු කර තිබෙනවා. ආරම්භයේ සිටම, ක්ෂේත්‍රයේ රබර් කිරි සඳහා සාධාරණ මිලක් සහතික කරන අතරම ජාතික රබර් නිෂ්පාදනයට වටිනාකම් එකතු කිරීමට හා ඔවුන් ලබා දුන් නොමසුරු දායකත්වය සඳහා අප සහයෝගය ලබා දුන්නා.

## Atlas Skills Factory'මඟින් සතුටින් ඉගෙනීමට පාඩමක්



ශ්‍රී ලංකාවේ ලිපිද්‍රව්‍ය අලෙවිකරණ ක්ෂේත්‍රයේ ප්‍රමුඛයා වන ඇට්ලස් ඇක්සිලියා සමාගම, කොළඹ ජාත්‍යන්තර පොත් ප්‍රදර්ශනය පැවැත්වෙන බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලා පරිශ්‍රයේ Atlas Skills Factory අත්දැකීම් කුටිය හරහා දරුවන්ට සතුටින් ඉගෙනීමේ නිරතවිය හැකි ආකාරය ප්‍රායෝගික ප්‍රවේශයකින් යුතුව පෙන්වා දීමට කටයුතු කළේය. අත්දැකීම් ක්‍රියාකාරකම් ආශ්‍රයෙන් දරුවන්ගේ පරිකල්පනය දියුණුවන ආකාරයේ ඉගෙනුම් ක්‍රම පිළිබඳ අපූර්ව මගපෙන්වීමක් වූ මෙම කුටිය වෙත දරුවන්ගේත්, මාපියන්ගේත් නොමඳ ආකර්ෂණය හිමි විය.

ඇට්ලස් සමාගම මෙම Atlas Skills Factory කුටිය හරහා දරුවන් සමග පවතින සිය සවිමත් සබඳතාව තවදුරටත් වර්ධනය කර ගැනීමට කටයුතු කළේය. දරුවන්ගේ නිර්මාණශීලී හැකියා වර්ධනය වන චිත්‍ර හා අත්කම් නිර්මාණ, 'විස්මිත විශ්වය', 'ගෙදරට වැඩක්-රටට වැඩක්', රූකඩ වැඩසටහන, දෙමාපියන්ගේ රුව සිතුවමට නගන 'Face to Face' සහ මෝටර් ආශ්‍රයෙන් විවිධ නිර්මාණ සිදුකිරීම ඇතුළු අපූර්ව ක්‍රියාකාරකම් රැසක් මෙහිදී සංවිධාන කර තිබිණි.

මේ එහි සුවිශේෂී අවස්ථා කිහිපයකි.

## ඊ-ෆියුචර් ටෙක් සිස්ටම්ස් තෙවැනි සංවත්සරය සමරයි




කෝවිඩ් 19 ගෝලීය වසංගතය හේතුකොටගෙන ඇතිවූ නව වාතාවරණයට මුහුණදීමට ශ්‍රී ලාංකීය ව්‍යාපාර ආරක්ෂිත හා සෞඛ්‍ය සම්පන්න සේවා පරිසරයක් සහතික කරලීමට අමතරව, ව්‍යාපාර නව්‍යකරණය හා සේවා ස්ථාන සහමුලින්ම පරිවර්තනයක් කළ යුතු බව work.lk, jobpal.lk සහ rubik.lk නිර්මාතෘ අංජන රත්නායක මහතා පවසා සිටී.

"කෝවිඩ් 19 ගෝලීය වසංගතය විධිමත් හා අවිධිමත් සේවකයන් බිලියන ගණනකට සෘජුව හා වක්‍රව බලපෑම් එල්ල කර ඇත. පූර්ව අර්බුද මට්ටම්, එනම් 2019 සිවු වන කාර්තුව හා සසඳන විට, කෝවිඩ් 19 ගෝලීය වසංගතය හේතුකොටගෙන ලෝකයේ රැකියා නියුක්තිකයන්ගෙන් සියයට 10.5කගේ රැකියා අහිමිවීමක් අනුමාන කරන අතර, ඒ අනුව මිලියන 305කගේ පූර්ණ කාලීන රැකියා අහිමිවීමට ඉඩ කඩ ඇති බව ජාත්‍යන්තර කම්කරු සංවිධානය අනතුරු අඟවා තිබේ. මෙය ශ්‍රී ලංකාවේ ජනගහනය මෙන් 14 ගුණයක් වන අතර, එය ලොව පුරා අගුලු දැමීමේ පියවරයන් දීර්ඝ කිරීමේ හා ඇඳිරි නීතිය ව්‍යාප්ත කිරීමේ ප්‍රතිඵලයක් ලෙස මුල් ප්‍රක්ෂේපනවලට වඩා බෙහෙවින් ඉහළ අගයක් ගනී. ශ්‍රී ලංකා රජයේ දුර දක්නා බව කරණ කොටගෙන ශ්‍රී ලංකාව මේ දක්වා ආරක්ෂිතව පැවතුනද, කොවිඩ් 19 විසින් බිහි කරන ලද 'නව සාමාන්‍ය තත්ත්වයන්ට' (New Normal) අප කැමති වුවත් නැතත් හැඩගැසිය යුතුයි," යැයි සිය තෙවැනි සංවත්සරය පසුගිය දා සමරනු ලැබූ ඊ-ෆියුචර් ටෙක් සිස්ටම්ස් පුද්ගලික සමාගමේ අධ්‍යක්ෂ / ප්‍රධාන විධායක නිලධාරී රත්නායක මහතා පැවසීය.

## ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් අම්බලන්ගොඩ ශාඛාව නව නිවහනකට



ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් අම්බලන්ගොඩ ශාඛාව නව නිවහනක පසුගියදා විවෘත කරන ලදි. මෙසේ විවෘත කරන ලද අම්බලන්ගොඩ ශාඛාව අංක 299, ගාලු පාර, අම්බලන්ගොඩ යන ස්ථානයේ පිහිටා තිබෙන අතර, අම්බලන්ගොඩ අවට ප්‍රදේශවල පාරිභෝගිකයන්ට සියලු රක්ෂණ අවශ්‍යතා එකම වහලක් යටදී සම්පූර්ණ කර ගැනීමේ හැකියාව සලසා දි තිබේ.

ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් ආයතනයේ ඉහළ කළමනාකාරිත්වය, සේවක මණ්ඩලය හා පාරිභෝගික මහත්ම මහත්මීන් රැසක්ද මේ අවස්ථාවට සහභාගී වූහ.

1962 තම ව්‍යාපාර කටයුතු ආරම්භ කළ ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් ආයතනය මෙරට විශාලතම රාජ්‍ය රක්ෂණ ආයතනයයි. මේ වන විට රුපියල් බිලියන 211කට අධික වත්කම් සම්භාරයකින් සහ රුපියල් බිලියන 116කට අධික ජීවිත රක්ෂණ අරමුදලක් හිමි ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් මෙරට ස්ථාවරම රක්ෂණ ආයතනයයි. එමෙන්ම මෙරට ප්‍රමුඛතම මූල්‍ය රක්ෂණ සමාගම වන ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් AAA(lka) ෆිට්ච් ශ්‍රේණිගත කිරීමට හිමිකම් කියන එකම දේශීය රක්ෂණ සමාගමයි. එමෙන්ම බ්‍රෑන්ඩ් ෆයිනෑන්ස් මගින් නම් කරනු ලබන 2020 වසරේ ශ්‍රී ලංකාවේ පාරිභෝගිකයන් අතර වඩාත්ම ජනප්‍රිය සන්නාමවල මුල් සන්නාම තුන අතර රැඳෙමින් ශ්‍රී ලංකාවේ ජනප්‍රියම රක්ෂණ සන්නාමය බවට පත්වීමට ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් සමත්ව තිබෙන අතර, දිවයින පුරා විහිදී ඇති 158ක් වන සිය පුළුල් ශාඛා ජාලයෙන් පාරිභෝගිකයන්ට සේවා සපයයි.

## Business Street

# මහනුවර හැඩ කළ INNEX 2020....













මධ්‍යම පළාත් කර්මාන්ත කරුවන්ගේ නිෂ්පාදන අළෙවි කිරීම සඳහා දේශීය හා විදේශීය නව වෙළෙඳ පොළ අවස්ථා ඇති කිරීමත් ව්‍යාපාරිකයින් හා ගැනුම් කරුවන් අතර අන්තර් සම්බන්ධතාව දියුණු කිරීම ඇතුළු කරුණු ගණනාවක් අරමුණු කරගනිමින් මධ්‍යම පළාත් කර්මාන්ත අමාත්‍යාංශය සංවිධානය කළ INNEX 2020 නමින් වෙළෙඳපොළ ප්‍රදර්ශනයක් මෙම මස 25,26 හා 27 තෙදින තුළ මහනුවර කැන්ඩි සිටි සෙන්ටර් හිදී පැවැත්විණි.

මෙම ප්‍රදර්ශනයට සමගාමීව ලෝක සංචාරක දින උත්සවයද ඊයේ (27) මහනුවරදී සංචාරක අමාත්‍ය ප්‍රසන්න රණතුංග මහතාගේ ප්‍රධානත්වයෙන් පැවැත්වුණේ සංචාරක කර්මාන්තය හා ග්‍රාමීය ආර්ථිකය යන්න තේමාකර ගනිමිනි.

කොවිඩ් වසංගත තත්ත්වයත් සමඟ ව්‍යාපාර කටයුතු අඩපණවී අසීරුතාවට පත්ව සිටින මධ්‍යම පළාතේ සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන්ට දිරියක් ලබාදීමේ අරමුණින් මෙය සංවිධානයකර තිබූ අතර ඊට මධ්‍යම පළාතේ පාරම්පරික කර්මාන්තවල නියුක්තව සිටින කලාකරුවන් මෙන්ම ව්‍යවසායකයින් නිර්මාණ ඉදිරිපත්කර තිබිණි.

කොවිඩ් වසංගත තත්ත්වයත් සමඟ සංචාරකයින් මෙරටට නොපැමිණීම නිසා තම නිර්මාණ වෙළෙඳපොළ කඩා වැටුණු බවත් මෙම ප්‍රදර්ශනය මගින් දේශිය ගැනුම්කරුවන් හඳුනා ගැනීම ඔස්සේ නව වෙළෙඳපොළ අවස්ථා ඇතිවූ බව පාරම්පරික කැටයම් ශිල්පි ඇම්බැක්කේ සතිස් කුමාර මහතා කීය.

පල්ලේකැලේ එළිමහන් සිරකඳවුරේ නේවාසිකයින්ගේ නිර්මාණ අළෙවි කුටියක්ද මෙහි ස්ථාපිතකර තිබිණි.මෙරට පදිංචිව සිටින Diana Adagamova නැමැති රුසියානු කාන්තාව හා ඇගේ සැමියා මෙරට අත්කම් නිර්මාණ කුටියක් පවත්වාගෙන යාම මෙහි දක්නට ලැබුණු තවත් සුවිශේෂත්වයකි.

**සටහන -**
**අසේල කුරුළුවංශ**
**ඡායාරූප-**
**රුවන් මීගම්මන**



ඇම්බැක්කේ සතිස් කුමාර

# විදුලි ජනනය දෙගුණයක් කිරීමේ අභියෝගය මා නොබියව භාර ගන්නවා

## ඇමැති ඩලස් අලහප්පෙරුම

තිහගොඩ සමූහ,
ජී. ජී. පී සුගතදාස



විදුලි ජනනය දෙගුණයක් කිරීමේ ජාතික අවශ්‍යතාව අභියෝගයක් සේ භාර ගන්නා බව ශ්‍රී ලංකාවේ ප්‍රථම මයික්‍රෝග්‍රිඩ් විදුලි ව්‍යාපෘතිය එළිදක්වමින් විදුලිබල අමාත්‍ය ඩලස් අලහප්පෙරුම මහතා පැවැසීය.

වසර 2030 වන විට පුනර්ජනනීය සහ හරිත විදුලිය 70% ක් බවට පත් කරවීමේ ඉලක්කය හඹායාමට මෙම මයික්‍රෝගිඩ් තාක්ෂණය වැදගත් බවද හෙතෙම පෙන්වා දුන්නේය.

අමාත්‍යවරයා මෙම අදහස් පළ කළේ, කිංස්බරි හෝටලයේ දී පෙරේදා (24) පැවති ලංකා විදුලි පුද්ගලික සමාගම, මොරටුව විශ්වවිද්‍යාලය හා එක්ව ශ්‍රී ලංකාවේ ප්‍රථම මයික්‍රෝග්‍රිඩ් නියමු ව්‍යාපෘතිය දියත් කිරීමේ අවස්ථාවට සහභාගි වෙමිනි.

මෙම ව්‍යාපෘතිය සඳහා ආසියානු සංවර්ධන බැංකුව අමෙරිකානු ඩොලර් මිලියන 1.8ක මූල්‍යාධාර ලබාදී ඇති අතර ඩීමෝ සමාගම, ජර්මානු බලශක්ති ප්‍රමුඛයකු වන DHYBRID හා එක්ව බලශක්ති උත්පාදනය හා ගබඩා කිරීම ඇතුළත් පුළුල් පුනර්ජනනීය මයික්‍රෝග්‍රිඩ් බලශක්ති විසඳුමක් ලබාදීමට නියමිතය. මයික්‍රෝග්‍රිඩ් බලශක්ති ක්‍රමවේදය මේ වනවිටත් රට පුරා පාරිභෝගිකයන් සඳහා අඛණ්ඩව විදුලි බෙදාහැරීම සඳහා යෝජිත ආකෘතියකි.

එහිදී වැඩිදුරටත් අදහස් දැක්වූ ඒ මහතා මෙසේද කීවේ ය.

විදුලි බලයට අදාළ තාක්ෂණය නව්‍යකරණය පිළිබඳ ශ්‍රී ලාංකීය අධ්‍යාපන ක්‍රමවේදය සකස් කළ යුතුයි. මේ රටේ බැංකු ක්ෂේත්‍රය සීමාමායිම්, බෙදීම් නොමැතිව විදුලිය සම්බන්ධ කාර්යයන්හිදි ප්‍රමුඛත්වය ලබාදිය යුතුයි. ඒ වගේම විදුලිබලය රටේ සියලු ක්ෂේත්‍රයන්හි නාභිගත කරුණ ලෙස අපේ න්‍යාය පත්‍රවලට එක්කර ගත යුතුයි. රටක් වශයෙන් අපට ඉදිරි ගමනක් තිබෙන්නේ මේ කාරණා පිළිබද නිවැරදි විද්‍යාත්මක හැදෑරීමකින් අනතුරුව එළැඹෙන තීරණවලදී පමණයි. රාජ්‍ය අංශය, පෞද්ගලික අංශය කියා වෙන් කරගැනීම අපේ ඉතිහාසයට වැරදුන තැනක්. අපේ රාජය ඉදිරිපිට දැන් තිබෙන මෙම අභියෝග ඒ ආකාරයෙන් බෙදී වෙන් වී, බලකොටු ගත වී විසඳා ගත නොහැකි බව අප තේරුම් ගත යුතුයි.

ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා රටට ඉලක්කයක් දී තිබෙනවා. ඒ 2030 වනවිට පුනර්ජනනීය සහ හරිත විදුලිය 70% ක් බවට පත් කරවීමයි. මේ ඉලක්කය හඹාගෙන යාමේදී ඉලක්ක දෙකක් ජයගත යුතුයි. ඉන් එකක් තමයි 2023 වනවිට දැනට ජනනය වන විදුලිය දෙගුණයක් විය යුතුයි. අනෙක් ඉලක්කය තමයි 2023 වන විට ඩීසල් මත යැපෙන, අපේ ආර්ථිකය දහනය වන විදුලි දායකත්වය 5% කට වඩා අවම කරගත යුතුයි. මේ ඉලක්ක හඹාගෙන යාමේදී අද හඳුන්වාදෙන මයික්‍රෝගිඩ් තාක්ෂණය තුළින් ඉතාම වැදගත් මැදිහත්වීමක් ලබා දෙනවා.

අධ්‍යාපන අමාත්‍ය මහාචාර්ය ජී. එල්. පීරිස්, විදුලිබල අමාත්‍යාංශ ලේකම් වසන්තා පෙරේරා, ඩීමෝ ආයතනයේ සභාපති රංජිත් පණ්ඩිතගේ, විදුලි පුද්ගලික සමාගමේ සභාපති නීතිඥ අතුල ප්‍රියදර්ශන ද සිල්වා, ලංකා විදුලිබල මණ්ඩලයේ සභාපති විජිත හේරත්, ආසියානු සංවර්ධන බැංකුවේ දකුණු ආසියානු කලාප අධ්‍යක්ෂ සමඟ මොරටුව විශ්වවිද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් විශාල පිරිසක් මේ අවස්ථාවට සහභාගී වූහ.

# වැව් 5000ක් සංවර්ධනය කඩිනමින් කරනවා

## රාජ්‍ය ඇමැති අනුරාධ ජයරත්න



නුවන් කොඩිකාර

පානීය ජලය මෙන්ම ගොවිතැනට හා භෝග වගාවන්ට අවශ්‍ය ජලය ලබාදීම අරමුණු කරගනිමින් රජය වැව් 5000ක් සංවර්ධනය කිරීම ආරම්භ කර ඇතැයි ග්‍රාමීය, කුඹුරු හා ආශ්‍රිත වැව්, ජලාශ හා වාරිමාර්ග රාජ්‍ය ඇමැති අනුරාධ ජයරත්න මහතා පැවසීය.

ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතාගේ උපදෙස් මත මෙය ආරම්භ කළ බවත් මේ වන විට එය කඩිනම් ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කරමින් තිබෙන බවත් හෙතෙම කීවේය.

සංවර්ධනය කළ දික්වෙල බුලන වැව ගොවී ජනතාවට බාරදීම නිමිත්තෙන් එම පරිශ්‍ර යේ පැවැති වයඹ පළාත් වප් මඟුල හා රන්දියවර නිකුත් කිරීමේ මංගල්‍යයට එක්වෙමින් රාජ්‍ය ඇමැතිවරයා එසේ ප්‍රකාශ කළේය.

ශ්‍රී ලංකාවේ පළමු වතාවට බුලන් වාරි ක්‍රමය රටට හඳුන්වා දීමේ අවස්ථාවට සහභාගිවීමට හැකිවීම ගැන සතුටු වන බව පැවැසූ රාජ්‍ය ඇමැතිවරයා ගොවි සංගම්, සරසවි කලා සංගම්, සහ ගම්වැසියන් එකතු වී ඔවුන්ගේ ස්වෝත්සහයෙන් සංවර්ධනය කළ වැවක් ජනතාවට බාරදීම සඳහා එක්වීමට ලැබීම භාග්‍යයක් බව කියා සිටියේය.

රජ පුරා පුරන් වී ඇති කුඹුරු අස්වැද්දීමටත්, වැව් හා ජලාශ ප්‍රතිසංස්කරණය කිරීමටත් සිය අමාත්‍යාංශය යටතේ පූර්ණ ශක්තිය හා සහයෝගය ලබාදෙන බවද ජයරත්න මහතා පැවැසීය.

මේ අවස්ථාවට රාජ්‍ය ඇමැති අරුන්දික ප්‍රනාන්දු මහතා ද සහභාගි වී සිටියේය.


## Litro Gas - Price List

ලිට්රෝ ගෑස් - මිල ලැයිස්තුව

லிற்ரோ எரிவாயு - விலைப்பட்டியல்

RETAIL / COMMERCIAL / INDUSTRIAL

| Litro | Pack | Maximum Retail Price<br>උපරිම සිල්ලර මිල அதிகபட்ச சில்லறை விலை<br>(Western province - Colombo/Kalutara/Gampaha) |
|---|---|---|
|  12.5kg | Litro Regular<br>ලිට්රෝ රෙගියුලර්<br>லிற்ரோ ரெகுலர் | Rs. 1,493/- |
|  5kg | Litro Budget<br>ලිට්රෝ බජට්<br>லிற்ரோ பட்ஜெட் | Rs. 598/- |
|  2.3kg | Litro Buddy<br>ලිට්රෝ බඩී<br>லிற்ரோ ப(b)டி | Rs. 289/- |
|  37.5kg | Litro Mega<br>ලිට්රෝ මෙගා<br>லிற்ரோ மெகா | Rs. 4,970/- |
|  1 METRIC TONNE | Litro Bulk<br>ලිට්රෝ බල්ක්<br>லிற்ரோ ப(b)ல்க் | Rs. 104,560/- |

Download the App
on IOS or Android
Google play App Store

1311 litrogas.com
Litro Gas Lanka Ltd,
No 267, Union Place, Colombo 02, Sri Lanka



# තරුණ ව්‍යවසායකයින්ට ඉඩම් කැබලි 100000ක් සඳහා | අයෝජන අවස්ථා ලබාදීම

## පරමාර්ථය

සෞභාග්‍යයේ දැක්මෙන් බලගැන්වෙන,

ශ්‍රී ලංකාව තුළ මේ වන විට කෘෂි කාර්මික අංශය වාණිජමය, සංචාරක හා වෙනත් සේවා, නිෂ්පාදන අංශ නියෝජනය කරමින් විවිධ නිෂ්පාදනයන්හි නියලී සිටින එමෙන්ම එවැනි ව්‍යවසායකත්ව හැකියාව ඇතත් ඒ සඳහා මූලික සම්පත් රාජ්‍ය සහය තවමත් ලැබී නොමැති තරුණයින් තෝරා ගෙන ඔවුන්ගේ ඉඩම් හිමිකම් ලබා දීම සහ තහවුරු කිරීම මගින් එම කණ්ඩායම් වල ව්‍යවසායකත්ව ශක්තිය වර්ධනය කිරීම ඒ මගින් දේශීය නිෂ්පාදනය දිරිගැන්වීම සහ ඊට අවශ්‍ය ආයතනික සහය ලබා දීමේ කටයුතු සම්බන්ධීකරණය.

වාර්ෂික ඉලක්කය - ඉඩම් කැබලි 20,000 ක් | සමස්ත ඉලක්කය - ඉඩම් කැබලි 100,000 ක්

## අපේක්ෂිත අරමුණ

- දැනට ඌන සංවර්ධිත තත්වයට පත්ව ඇති ඉඩම් සංවර්ධනය කිරීම.
- දේශීය වශයෙන් නිෂ්පාදනය කළ හැකි අත්‍යාවශ්‍ය බෝග වගා කිරීමට අවශ්‍ය ඉඩම් සම්පත් ලබා දීම.
- දැනටමත් තරුණ ව්‍යවසායකයන් සතුව ඇති ඉඩම් වල අයිතිවාසිකම් තහවුරු කිරීම සහ ඒවා බැංකු ආයෝජන සඳහා සුරැකුම් ලෙස වර්ධනය කිරීම.
- නව ඉඩම් ලබා දීම මඟින් තරුණ ව්‍යවසායකත්වය ශක්තිමත් කිරීම.
- මූල්‍ය ආයතනයද ඇතුළුව අනෙකුත් පහසුකම් සම්බන්ධීකරණය.
- ශ්‍රී ලංකාව තුළ නිෂ්පාදනය කළ හැකි ආහාර බෝග රෙදිපිළි වෙනත් නිෂ්පාදන සේවා, සංචාරක කටයුතු දිරිගැන්වීම සඳහා සහාය ලබා දීම.

ඔබ,

- ස්ව ශක්තියෙන් නැගී සිටීමට කැමති, උද්‍යෝගිමත්, අභියෝග භාර ගැනීමට කැමති අයෙකු නම්,
- වයස අවුරුදු 18-45 අතර ශ්‍රී ලාංකික පුරවැසියකු නම් (ව්‍යවසායකත්ව හැකියාව අනුව වයස් සීමාව වෙනස් කර තෝරා ගැනීමට ඉඩ තිබේ.)
- දැනටමත් එවැනි නිෂ්පාදන ක්ෂේත්‍ර කටයුත්තක නියැලී සිටින අයකු වීම සහ තවදුරටත් එය සංවර්ධනය කර ගැනීමට බලාපොරොත්තු වන අයකු නම්,
- දේශීය වෙළඳපල හෝ විදේශීය වෙළඳපල ඉලක්ක කර නිෂ්පාදනයේ යෙදී සිටින අයකු නම්,
- කණ්ඩායමක් සමඟ එක්වී සමූහ ගොවිපල ක්‍රමය/සමඟ නිෂ්පාදන ක්‍රමයක කටයුතු කිරීමට කැමති අයෙකු නම්,
- දැනට ඉඩමක් තිබෙන නමුත් එම ඉඩම නිරවුල් නොවීම නිසා ගැටලු තිබෙන අයෙකු නම්,
- දැනට කරගෙන යමින් පවතින ව්‍යාපෘතීන් දියුණු කර ගැනීම සඳහා ඉඩමක් අවශ්‍ය අයෙකු නම්,

ඔබටත් ඉල්ලුම් කරන්න පුළුවන්.

ආදර්ශ අයදුම්පත්‍ර
ග්‍රාම නිලධාරි, ප්‍රාදේශීය ලේකම්, ඉඩම් පරිහරණ නිලධාරිගෙන් සහ ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැළසුම් දෙපාර්තමේන්තුවෙන් ලබාගත හැක.

වැඩි විස්තර
ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව
31, පතිභා පාර, නාරාහේන්පිට, කොළඹ 05.
සම්පූර්ණ කරන ලද අයදුම්පත් අදාළ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ලියාපදිංචි තැපෑලෙන් හෝ ගෙනවිත් භාරදිය හැක.

දුරකතන (අධ්‍යක්ෂ) - +94 11 2 500 338 - +94 11 2 369 719
ෆැක්ස් - +94 11 2 368 718
විද්‍යුත් තැපැල - luppddpt@gmail.com
වෙබ් අඩවිය - www.luppd.gov.lk

ඉල්ලුම් පත්‍ර භාරගන්නා අවසන් දිනය 2020 ඔක්තෝබර් 31

ප්‍රතිපත්ති සම්පාදනය ඉඩම් අමාත්‍යංශය | වැඩසටහන ක්‍රියාවට නැංවීම ඉඩම් කළමනාකරණ කටයුතු රාජ්‍ය ව්‍යාපාර ඉඩම් හා දේපල සංවර්ධන රාජ්‍ය අමාත්‍යංශය

# රළ මත ලිස්සා යෑමේ ජාතික ශූරයා ලක්ෂිත මධුෂාන්

**අසංක සංජීව විවෘත තරගය ජය ගනී: ශූරිය දකුණු අප්‍රිකාවෙන්**

**ෆවුස් මොහොමඩ් ආරුගම්බේ සිට...**

මෙරට සංචාරක ව්‍යාපාරයේ නව පිබිදීමකට කදිම ආරම්භයක් ලබා දෙමින් ආරුගම්බේ මුහුදු තීරයේ ඊයේ නිමාවට පත්වූ රළ මත ලිස්සා යෑමේ තරගාවලියේ දී වැලිගම සර්ෆර්ස් ක්‍රීඩා සමාජයේ ලක්ෂිත මධුෂාන් ජාතික ශූරයා ලෙස අභිෂේක ලැබුවේය. තරගාවලියට ඉදිරිපත් වන විට රළ මත ලිස්සා යෑමේ ජාතික ශ්‍රේණිගත කිරීම්වල පෙරමුණේ පසු වූ මේ යොවුන් ක්‍රීඩකයා ඊයේ ලැබූ ජයග්‍රහණයත් සමඟ සිය සමස්ත ලකුණු 3000ක් ලබා සිය ස්ථානය රැක ගැනීමට ද සමත් විය.

තරගකරුවන් 64 දෙනකු සහභාගි වූ ජාතික ශූරතාවලියේ අවසන් තරගයේදී ආරුගම්බේ සර්ෆින් ක්‍රීඩා සමාජයේ ප්‍රබලතම ක්‍රීඩකයන් වන ප්‍රනීත් සඳරුවන්, අසංක සංජීව සහ 2018 වසරේ ජාතික සර්ෆින් ශූරතාව දිනූ ලසිත් ප්‍රභාත් අබිබවා යෑමට සමත් වූ 21 හැවිරිදි ලක්ෂිත ආරුගම්බේ රළ මත ඉතා අලංකාර පිම් කිහිපයක් පනිමින් රළ පහර අතර එක දිගට ආකර්ෂණීය ලෙස ලිස්සා යමින් රළ පහර මත සිය සර්ෆින් පුවරුව (Serfing Board) ඉතා සාර්ථකව සමබර කරගත්තේය.

පළමු වරට 2018දී පැවැති රළ මත ලිස්සා යෑමේ ජාතික ශූරතාවලියේ අනුශූරයා ද වන ලක්ෂිත මේ වසරේ ජනවාරියේ මාතර මඩිහේ පැවැති තරගාවලියත් මාර්තු මාසයේ හික්කඩුවේ පැවැති තරගාවලියත් ජයගත් ක්‍රීඩකයාද වේ.

ජාතික ශූරතාවලියේ දෙවැනි ස්ථානය හිමිවූයේ විවෘත ශූරතාව දිනා ගත් අසංක සංජීවටය. ලසිත් ප්‍රභාත් තුන්වැනි ස්ථානයටත් ප්‍රනීත් සඳරුවන් සිව්වැනි ස්ථානයටත් පත්වූහ.

රළ මත ලිස්සා යෑමේ සංගමය සමඟ එක්ව ශ්‍රී ලංකා ස්පෝර්ට්ස්රයිසින් ආයතනය විසින් සංවිධාන කරනු ලැබූ ශ්‍රී ලංකා රළ මත ලිස්සා යෑමේ ජාතික ශූරතාවලිය සහ විවෘත තරගාවලිය 'සර්ෆින් පැරඩයිස්' ලෙස හඳුන්වන ආරුගම්බේ සුන්දර මුහුදු තීරයේ පැවැත්වූයේ දෙස් විදෙස් ක්‍රීඩාලෝලීන් විශාල පිරිසකගේ සහභාගිත්වයෙනි.

ජාතික ශූරතාවලියට සමගාමීව පැවැති විවෘත තරගාවලියට විදෙස් තරගකරුවන් විශාල පිරිසක් එක් වී සිටි අතර, කොරෝනා වසංගතය හේතුවෙන් විදෙස් තරගකරුවන්ට මේ සඳහා සහභාගි වීමට නොහැකි වුවත් දැනට රට තුළ සිටින විදේශිකයෝ විශාල පිරිසක් විවෘත තරගාවලියට එක් වී සිටියහ.

විදෙස් ක්‍රීඩකයන් සහභාගි වූ විවෘත තරගාවලියේ පළමු ස්ථානය දිනා ගැනීමට අසංක සංජීව සමත්වූ අතර, දෙවැනි ස්ථානය ඊශ්‍රාලයේ බාර්ට හිමි විය. තුන්වැනි ස්ථානයට පත් වූයේ ඔස්ට්‍රේලියාවේ ලියාම් මුරාඩ්ටය. දකුණු අප්‍රිකාවේ නිකිටා රොබ් විවෘත කාන්තා තරගය ජයගත් අතර, එස්ටෝනියාවේ කෑට් ලීසන් දෙවැනි ස්ථානයටත්, ශ්‍රී ලංකාවේ ඈන් සුනාරා ජයමාන්න තුන්වැනි ස්ථානයටත් පත් වූහ.

ආරුගම්බේ මුහුදු තීරය අවට පදිංචි ජනතාව අතර දැඩි උනන්දුවක් සහ අවධානයක් යොමු වූ මේ තරගාවලිය නැරඹීමට දෙස් විදෙස් සංචාරකයෝ අතිවිශාල සංඛ්‍යාවක් රැස්ව සිටියහ.





ලක්ෂිත මධුෂාන් තරගය අතරතුර.



විවෘත තරගය ජයගත් අසංක සංජීව



විවෘත කාන්තා තරගය දිනූ නිකිටා රොබ්

*ඡායාරූප - සුලෝචන ගමගේ*

## අයිසීසී මූලස්ථානයෙත් කොරෝනා

ඩුබායිහි පිහිටි ජාත්‍යන්තර ක්‍රිකට් කවුන්සිල මූලස්ථානයට කොරෝනා වසංගතයෙන් බලපෑම් එල්ල වී තිබේ.

එහි කාර්ය මණ්ඩලයේ කිහිපදෙනකුට කොරෝනා වයිරසය ආසාදනය වී ඇති බවට තහවුරු වීම හේතුවෙන් එම මූලස්ථානය දින කිහිපයකට වසා දැමීමට කටයුතු කර ඇති අතර මේ කාර්ය මණ්ඩලයට නිවෙසේ සිට රාජකාරි සිදු කිරීමට ඉඩ සලසා තිබේ.

## සුසන්තිකා ජයසිංහගේ පිළිරුවකට අද මුල්ගල්

**ජයසිරි මුණසිංහ**

ශ්‍රී ලංකාවෙන් බිහි වූ විශිෂ්ටතම ක්‍රීඩිකාව ලෙස අබිසෙස් ලබන ඔලිම්පික් රිදී පදක්කම් දිනූ සුසන්තිකා ජයසිංහ අධ්‍යාපනය ලැබූ වරකාපොළ ඇත්නාවල පාසලේ ප්‍රවේශ මාර්ගය අබියස එම ක්‍රීඩිකාවගේ පිළිරුවක් ඉදිකිරීමට අද (28) මුල්ගල් තැබීමට නියමිතය.

ශ්‍රී ලංකා ක්‍රීඩා ඉතිහාසයේ සදානුස්මරණීය සටහනක් තබමින් ලක්මවගේ ගෙලෙහි ඔලිම්පික් පදක්කම් පලඳා අදට හරියටම වසර 20ක් සම්පූර්ණ වේ. එවන් හපන්කමක් කළ මෙරටින් බිහි වූ විශිෂ්ටතම ක්‍රීඩිකාවට උපහාරයක් ලෙස පිළිරුව ඉදිකෙරෙන අතර, මෙය සිදු කෙරෙනුයේ ලබන වසරේ මාර්තු මාසයට යෙදෙන ඇත්නාවල මහ විදුහලේ සියවස් සැමරුම් උළෙලෙහි පෙරටුගාමී වැඩසටහනක් ලෙස බව විදුහල්පතිනී බී.පී.කේ.ජී. පතිරාජ මහත්මිය ප්‍රකාශ කළාය. මීට අමතරව විදුහලේ ශිෂ්‍ය නායක නිල ලාංඡන පැලඳවීමේ උත්සවය ද අද පෙරවරු 11.30ට විද්‍යාලයීය ප්‍රධාන ශාලාවේදී පැවැත්වේ.

## කබඩි පුහුණුකරුවන් දෙදෙනකුට වසර 5ක ක්‍රීඩා තහනමක්

**ප්‍රින්ස් ගුණසේකර**

දකුණු ආසියා ක්‍රීඩා උලෙළ වෙනුවෙන් ටොරින්ටන් ක්‍රීඩා සංකීර්ණයේ නේවාසිකව පුහුණුවීම්වල නිරතව සිටි කණ්ඩායම් භාර ජාතික කබඩි පුහුණුකරුවන් දෙදෙනකු අලුයම් කාලයේ බීමතින් පැමිණ තාක්ෂණික පුහුණුකරු බියවද්දා පහරදීමට තැත් කිරීමේ චෝදනා මත වසර 5ක ක්‍රීඩා තහනමක් පැන වෙයි.

මේ චෝදනා සම්බන්ධව විනය පරීක්ෂණයක් පවත්වා ඇති අතර, එම විනය පරීක්ෂණ වාර්තා පෙරේදා පැවැති කබඩි මහා සභාව වෙත ඉදිරිපත් කොට මේ තහනම සම්බන්ධ තීරණය ගෙන ඇත. ඒ අනුව චෝදනාවට තාවකාලික තහනම පැනවී 2019.10.10 දින සිට 2024.10.19 වන කාලය තුළදී දෙස් - විදෙස් කබඩි ක්‍රීඩාවේ කිසිඳු කටයුත්තකට සෘජුව හෝ වක්‍රව සම්බන්ධ විය නොහැකි බවට කබඩි මහා සභාව එම පුහුණුකරුවන්ට දැනුම්දී ඇත.

සිද්ධිය ඇති වූ දිනට පසු දින චෝදනාලත් ජාතික කබඩි පුහුණුකරුවන් දෙදෙනාගේ රුධිර සාම්පල පරීක්ෂා කිරීමෙන් අනතුරුව වහාම ක්‍රියාත්මකවන පරිදි තාවකාලික ක්‍රීඩා තහනමක් පැනවීමට ශ්‍රී ලංකා කබඩි සංගමය කටයුතු කළ අතර, ඒ පිළිබඳ වාර්තාවක් ක්‍රීඩා අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත ඉදිරිපත් කොට තිබිණි.

දකුණු ආසියා ක්‍රීඩා උලෙළට සහභාගිවන ශ්‍රී ලංකා කබඩි කණ්ඩායම් දෙකේ අවසන් තේරීම් පරීක්ෂණ සිදු කිරීමට නියමිත දින අලුයම් කාලයේදී මේ සිදු වීම වාර්තා විය. ක්‍රීඩා තහනමට ලක් වූ කබඩි පුහුණුකරුවන් දෙදෙනා මෙයට පෙර ද විනය විරෝධී කටයුතු සම්බන්ධව චෝදනා ලැබූ අය වන බව ක්‍රීඩා අමාත්‍යාංශ ආරංචි මාර්ග පවසයි. එයින් එක් අයකු පුහුණුකරුවකු ලෙස වැටුප් ලබමින් සිටියදී ක්‍රීඩා භාණ්ඩ අලෙවි කිරීම සම්බන්ධ චෝදනා ලැබූ අයකු වන අතර, අනෙක් පුහුණුකරු කබඩි තාක්ෂණික අධ්‍යක්ෂවරයාට පහරදීමට උත්සාහ කිරීම සම්බන්ධ චෝදනා ලැබූවෙකි. කබඩි පුහුණුකරුවන් දෙදෙනා බීමතින් නේවාසිකාගාරයට පැමිණීම සම්බන්ධ පරීක්ෂණ උදෙසා ක්‍රීඩා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ත්‍රිපුද්ගල කමිටුවක් පත්කළ අතර, ටොරින්ටන් නේවාසිකාගාරයට අවේලාවේ ඇතුළුවීම් හා පිටවීම් ආරක්ෂිත කැමරා පද්ධතිය ඔස්සේ (CCTV) තහවුරු කර ගැනීමට ද කටයුතු යොදා තිබිණි.

## පිටරට යන්න ක්‍රීඩකයන් තේරීමේ පරණ සෙල්ලම වෙනස් කරයි

### ජාතික ක්‍රීඩා තේරීම් කමිටුවට බලතල රැසක්

**ප්‍රින්ස් ගුණසේකර**

ජාතික ක්‍රීඩා තේරීම් කමිටුවේ අනුමැතිය ලබා ගැනීමට පෙර කිසිඳු ජාත්‍යන්තර තරගාවලියක් සඳහා නාම යෝජනා ඉදිරිපත් කිරීමෙන් වළකින ලෙස ක්‍රීඩා අමාත්‍යාංශයේ ලියාපදිංචි සියලු ක්‍රීඩා සංගම් වෙත දැනුම් දෙයි. ශ්‍රී ලංකාව නියෝජනය කරමින් ක්‍රීඩාවලට සහභාගිවන්නන් පාලනය කිරීමේ නියෝග සංශෝධනය කරමින් නිකුත් කළ අති විශේෂ ගැසට් නිවේදනයක මේ බව දක්වා ඇත.

පුහුණුකරුවන්, කළමනාකරුවන්, සහායක පුහුණුකරුවන්, ක්‍රීඩා අභ්‍යාසක, සම්බාහකවරුන් ජාත්‍යන්තර තරගාවලි සඳහා නිර්දේශ කිරීමේදී නිසි ක්‍රමවේදයක් ජාතික ක්‍රීඩා සංගම් අනුගමනය කළ යුතු අතර, ඒ සඳහා කල් ඇතිව නිර්ණායක සකස් කොට ජාතික ක්‍රීඩා තේරීම් කමිටුවේ එකඟතාව ලබාගත යුතු වේ.

මේ දක්වා ක්‍රීඩා ක්ෂේත්‍රයට ලබාදී ඇති දායකත්වය, ක්‍රීඩා ක්ෂේත්‍රයේ ඔවුන්ගේ වත්මන් ක්‍රියාකාරීත්වය, අදාළ ක්‍රීඩාව පිළිබඳ දැනුම, අවබෝධය සහ අත්දැකීම් හා ක්‍රීඩකයකු හෝ පුහුණුකරුවකු ලෙස දක්වන ලද දක්ෂතා සැලකිල්ලට ගැනීම අනිවාර්ය වේ.

සියලු ජාතික ක්‍රීඩා සංගම්හි තේරීම් කමිටුව පත් කිරීම සම්බන්ධයෙන් නිර්දේශ ඉදිරිපත් කිරීමේ බලය ජාතික ක්‍රීඩා තේරීම් කමිටුවෙන් පමණක් සිදු විය යුතු අතර, තේරීම් තරග පවත්වන දිනයන්, ස්ථානයන්, අදාළ විස්තර සහ තේරීම් නිර්ණායකයන් පිළිබඳ තොරතුරු දින 14කට ප්‍රථම ක්‍රීඩක ක්‍රීඩිකාවන් වෙත දැනුම් දිය යුතුය. එම සියලු පිටපත් ලිඛිතව එදිනම ජාතික ක්‍රීඩා තේරීම් කමිටුව වෙත ද ඉදිරිපත් කළ යුතු අතර, එසේ ඉදිරිපත් නොකරන ජාතික ක්‍රීඩා සංගම්වල තේරීම් තරග සහ ජාතික ක්‍රීඩා සංගම්හි සභාපති, ලේකම් හා පුහුණුකරුවන්ගේ පෞද්ගලික අභිමතය පරිදි පවත්වන ලද තේරීම් තරග සහ තෝරා ගැනීම් ද අහෝසි කිරීමේ බලය ජාතික ක්‍රීඩා තේරීම් කමිටු සතු කර ඇත.

ජාතික ක්‍රීඩා සංගම් විසින් තේරීම් තරග පැවැත්වීමට දින 28කට පෙර තේරීම් නිර්ණායකයන් ජාතික ක්‍රීඩා තේරීම් කමිටුවට ඉදිරිපත් කොට පූර්ව අනුමැතිය ලබා ගැනීමෙන් අනතුරුව ක්‍රීඩා සංගමයේ හා නිල වෙබ් අඩවියේ හා ක්‍රීඩා අමාත්‍යාංශයේ වෙබ් අඩවියේ පළ කළ යුතුය. ඒ ආකාරයෙන්ම තේරීම් තරග අවසානයේ තේරීම් තරග ප්‍රතිඵල එම නිල වෙබ් අඩවියේ පළ කළ යුතුය. තෝරාගනු ලැබූ ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ නිවැරදි නාම ලේඛනය ජාතික ක්‍රීඩා තේරීම් කමිටුවේ නිර්දේශයට ඉදිරිපත් කළ යුතු බවත් කිසියම් විරෝධතාවක් ඇත්නම් එම විරෝධතා සෘජුවම ජාතික ක්‍රීඩා තේරීම් කමිටුවට ඉදිරිපත් කළ යුතු බවත් දක්වා තිබේ.

තේරීම් තරග පරීක්ෂණ පැවැත්වෙද්දී ක්‍රීඩා අමාත්‍යාංශයේ අදාළ ජාතික ක්‍රීඩාව භාර ව්‍යාපෘති නිලධාරියා සහභාගී කර ගත යුතු අතර, ඒ පිළිබඳව ජාතික ක්‍රීඩා තේරීම් කමිටුව දැනුම්වත් කළ යුතුය.

තේරීම් තරග පරීක්ෂණ අවසානයේ එදිනම හෝ පසු දින ජාතික ක්‍රීඩා සංගමයේ සභාපති හෝ ලේකම් විසින් සහතික කර තේරීම් තරග සඳහා සහභාගි වූ තේරීම් කමිටු සාමාජිකයන්ගේ පැමිණීමේ අත්සන් නාම ලේඛනය, තේරීම් තරග සඳහා සහභාගි වූ, ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ නාම ලේඛනය, ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ තේරීම් සිදු කළ ආකාරය සහ ඔවුන්ට ලකුණු ලබා දී ඇති ආකාරය පිළිබඳ ලකුණු සටහන් පත්‍රය, තෝරා ගනු ලැබූ ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ ඉසව්, ස්ථාන සහ අතිරේක ක්‍රීඩක ක්‍රීඩිකාවන් ද ඇතුළුව ඔවුන්ගේ නිවැරදි නාම ලේඛනය ජාතික තේරීම් කමිටුව වෙත දිය යුතු වේ. තවද ජාතික ක්‍රීඩා තේරීම් කමිටුව විසින් සියලු ජාතික සංචිත ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ තොරතුරු ඇතුළත් දත්ත ගබඩාවක් සකස් කොට යාවත්කාලීනව පවත්වාගෙන යා යුතු අතර, සංචිතගත සියලු ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ දක්ෂතා සහ ජීව දත්ත තොරතුරු ජාතික ක්‍රීඩා තේරීම් කමිටුව වෙත යොමු කළ යුතුය. මෙතෙක් භාවිත කළ තේරීම් කමිටුව යන වචනය වෙනුවට ජාතික ක්‍රීඩා තේරීම් කමිටුව යන වචනය අති විශේෂ ගැසට් නිවේදනයේ දක්වා ඇත.

## ශ්‍රී ලංකාවේ රග්බි කණ්ඩායමක ප්‍රථම කාන්තා කළමනාකාරිනිය

**ප්‍රින්ස් ගුණසේකර**



සී.එච්. ඇන්ඩ් එෆ්.සී රග්බි කණ්ඩායමේ කළමනාකාරිනිය ලෙස පත් වූ උදානි එදිරිසිංහ මහත්මිය ක්‍රීඩා සමාජයේ ලේකම් ටනේෂ් ඩයස් හා පුහුණුකරු රෝහිත රාජපක්ෂ මහතා සමඟ

පුරුෂයන් විසින් ආධිපත්‍ය දරන ලෝකයක, විශේෂයෙන්ම රග්බි ක්‍රීඩාවේදී කාන්තාවකගේ භූමිකාව පහසු එකක් නොවනු ඇත. එහෙත් ඒ සියලු අභියෝගවලට මුහුණ දීමේ එඩිතර බව පෙරදැරිව ශ්‍රී ලංකාවේ ප්‍රධාන රග්බි කණ්ඩායමක ප්‍රථම කාන්තා කළමනාකාරිනිය ලෙස උදානී එදිරිසිංහ මහත්මිය පත් වෙයි. සී.එච්. ඇන්ඩ් එෆ්.සී රග්බි කණ්ඩායමේ කළමනාකාරිනිය ලෙස පත් වූ 32 හැවිරිදි උදානී එදිරිසිංහ මහත්මිය මියුසියස් විදුහලේ ආදි ශිෂ්‍යාවකි.

සී.එච්. ඇන්ඩ් එෆ්.සී රග්බි කණ්ඩායමේ ප්‍රධාන පුහුණුකරු රෝහිත රාජපක්ෂ මහතා පවසන්නේ උදානිගේ පත්වීම කණ්ඩායමේ ඉදිරි දියුණුවට විශාල රුකුලක් වන බවය. එමෙන්ම උදානිගේ පත්වීම ශ්‍රී ලංකා රග්බි ක්‍රීඩාවේ අලුත් ආකර්ෂණයක් වනු ඇතැයි ද විශ්වාසය පළ කළේය.

"අපේ ක්‍රීඩා සමාජයේ බොහෝ රග්බි ක්‍රීඩකයන්ට ඇය මවක් වැනි චරිතයක්. ගොඩක් අය දන්නේ නෑ ඇය පසුගිය වසර පහ තුළ අපේ ක්‍රීඩා සමාජයට විශාල සේවයක් කර තිබෙන බව. රගබි ක්‍රීඩාවේ යෙදෙන යෞවනයන් බොහෝ දෙනකුට ඇගේ සැමියා සමඟ එක්ව කොළඹ නවාතැන් පහසුකම් සහ රැකවරණය සපයා විශාල සේවයක් පසුගිය කාලයේ සිදු කළා. ඇය අපගේ බොහෝ ක්‍රීඩකයන්ට මඟ පෙන්වන ආලෝකයක් වැනියි. ඒ නිසා අප සියලු දෙනා කල්පනා කළා උදානිගේ සමාජශීලීත්වයට හා ක්‍රීඩාව සම්බන්ධව ඇති දැනුමට සුදුසු ප්‍රතිලාභය ලබා දිය යුතුයි කියලා. ඒ ගමන් මඟ ඔස්සේ තමයි ඇය ශ්‍රී ලංකාවේ පළමු කාන්තා කළමනාකාරිනිය බවට පත් වන්නේ " රෝහිත රාජපක්ෂ මහතා පැවැසීය.



ශුබ්මන් ගිල්

## කොල්කටා පිලට කඩුලු 7ක ජයක්

ඉන්දීය ප්‍රිමියර් ලීග් ක්‍රිකට් තරගාවලියේ 8 වැනි තරගයෙන් සන්රයිසස් හයිද්‍රාබාද් පිල පරදවා කඩුලු 7ක ජයක් අත්කර ගැනීමට කොල්කටා නයිට් රයිඩර්ස් කණ්ඩායම සමත් විය. අබුඩාබිහිදී පැවැති තරගයේ පළමුව පන්දුවට පහර දුන් හයිද්‍රාබාද් ඉනිම ලකුණු 142කට සීමා කළ කොල්කටා ක්‍රීඩකයෝ පන්දු 12ක් ඉතිරිව තිබියදී ජය හිමි කර ගත්තේ කඩුලු 3ක් පමණක් අහිමි කර ගනිමිනි.

කොල්කටා පිලට සාර්ථක ආරම්භයක් දුන් ශුබ්මන් ගිල් නොදැවී ලකුණු 70ක් රැස් කළ අතර, ඔයින් මෝගන් ලකුණු 42ක් ඉනිමට එක් කළේය.

ලකුණු 53කට කඩුලු 3ක් අහිමිව තිබියදී පිටියට පිවිසි මෝගන්, ගිල් සමඟ එක්ව සිව්වැනි කඩුල්ලට ලකුණු 92ක් එක් කළේ පන්දු 70ක් පමණක් වැය කරමිනි.

තරගයේ වීරයා වූ ගිල් හතරේ පහර 5ක් සහ හයේ පහර 2ක් සමගින් පන්දු 62කට මුහුණ දුන් අතර, හතරේ පහර 3ක් සහ හයේ පහර 2ක් එල්ල කළ මෝගන් වැය කළේ පන්දු 29ක් පමණි.

පන්දු 38කින් ලකුණු 51ක් රැස් කරමින් මනීෂ් පාණ්ඩ්‍යා හයිද්‍රාබාද් ඉනිමේ වැඩිම ලකුණුලාභියා වෙද්දී, නායක ඩේවිඩ් වෝනර් ලකුණු 36ක් සහ විර්දිමාන් ෂාහ් ලකුණු 30ක් ඉනිමට එක් කළහ.

**දිල්ලි පිලට දෙවැනි ජය**

මේ අතර, තරගාවලියේ 7 වැනි තරගය ජය ගනිමින් මෙවර තරගාවලියේ දෙවැනි ජයග්‍රහණය අත්කර ගැනීමට දිල්ලි කැපිටල්ස් පිල සමත් වූයේ චෙන්නායි සුපර් කිංග්ස් පිල ලකුණු 44කින් පරාජය කරමිනි.

## ජනාධිපති රන් කුසලාන වොලිබෝල් ශූරතා

### සියනෑ තරු - ගෝල්ඩන් බර්ඩ්ස් දිනා ගනී

ශ්‍රී ලංකා වොලිබෝල් සම්මේලනය ඩයලොග් සමාගම සමඟ එක්ව සංවිධාන කළ 'ඩයලොග් ජනාධිපති රන් කුසලාන' වොලිබෝල් තරගාවලියේ ජ්‍යෙෂ්ඨ පිරිමි ශූරතාව දිනා ගැනීමට ගම්පහ සියනෑ තරු ක්‍රීඩා සමාජය සමත් වූ අතර, කාන්තා ශූරතාව රදාවාන ගෝල්ඩන් බර්ඩ්ස් ක්‍රීඩා සමාජයට හිමි විය.

මහරගම ජාතික තරුණ සේවා සභා ගෘහස්ථ ක්‍රීඩාංගණයේ පැවැති තරගාවලියේ රන් කුසලාන පිරිමි අවසන් තරගයේදී සියනෑ තරු හමුවේ දෙබෑගම රන්තරු ක්‍රීඩා සමාජය වට 3-2ක් ලෙස පරාජයට පත් විය. තරගයේ මුල් වට දෙක ලකුණු 25-23, 25-16ක් ලෙස සියනෑ තරු ජයගත් අතර, තෙවැනි සහ සිව්වැනි වටයන් ජය ගැනීමට (21-25, 19-25) රන්තරු ක්‍රීඩකයෝ සමත් වූහ. තීරණාත්මක 5 වැනි වටයෙන් ජය හිමි කර ගැනීමට සියනෑ තරු පිල සමත් වූයේ ලකුණු 15-12ක් ලෙසිනි. කාන්තා රන් කුසලාන අවසන් තරගයේදී මහඋස්වැව රතනපාල ක්‍රීඩා සමාජය පරාජය කිරීමට ගෝල්ඩන් බර්ට්ස් කණ්ඩායමට හැකි විය.

එම තරගාවලියේ වටිනාම ක්‍රීඩකයා ලෙස චාමර මිහිරාන් (සියනෑ තරු) සහ වටිනාම ක්‍රීඩිකාව ලෙස නිලන්තිකා සංජීවනී සම්මාන දිනා ගත්හ.

මේ තරගාවලියේ අභියෝග කුසලාන ඉසව්වේ පිරිමි ශූරතාව දිනා ගැනීමට නාත්තණ්ඩිය යුනයිටඩ් පිල පරාජය කළ පොතුපිටිය ලකී සික්ස් කණ්ඩායම සමත් වූ අතර, කොස්වාඩිය විජය ක්‍රීඩා සමාජය කාන්තා ශූරතාව දිනා ගත්තේය. අනුශූරතාව කෑගල්ල හයිඩ්‍රාමනී පිලට හිමි විය. එම කාණ්ඩයේ දක්ෂතම ක්‍රීඩකයා ලෙස අංජන සන්දීපන (ලකී සික්ස්) සහ ක්‍රීඩිකාව ලෙස චතුරිකා රණසිංහ (විජය) සම්මාන දිනා ගත්හ. නාත්තණ්ඩිය යුනයිටඩ් ක්‍රීඩා සමාජය අවුරුදු 23න් පහළ පිරිමි ඉසව්වේ ශූරතාවත් හිමි කර ගත් අතර, එහි කාන්තා ශූරතාව කෑගල්ල හයිඩ්‍රාමනී ක්‍රීඩිකාවන් සතු වූහ. එහි අනුශූරතා පිළිවෙළින් වෙන්නප්පුව ජෝසප් වාස් සහ මහඋස්වැව රතනපාල ක්‍රීඩා සමාජවලට හිමි විය. චම්පත් ඩිල්ෂාන් (ජෝසප් වාස්) දක්ෂතම ක්‍රීඩකයා ලෙසත්, නිමේෂිකා සෙව්වන්දි (හයිඩ්‍රාමනී) දක්ෂතම ක්‍රීඩිකාව ලෙසත් සම්මාන දිනා ගත්හ. ජය සංකේත ප්‍රදානය නියෝජ්‍ය කතානායක ශ්‍රී ලංකා වොලිබෝල් සම්මේලනයේ සභාපති රංජිත් සියඹලාපිටිය, ලේකම් ඒ.එස්. නාලක සහ ඩයලොග් ආසියාටා සමාගමේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී හර්ෂ සමරනායක මහත්වරු අතින් සිදු කෙරිණි.







Dialog
ජනාධිපති
රන් කුසලාන

2020 සැප්තැම්බර් 28 සඳුදා කොළඹ ඩී. ආර්. විජයවර්ධන මාවතේ අංක 35 දරණ ස්ථානයේ පිහිටි ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම විසින් මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.



අමිල ප්‍රභාත් වනසිංහ - අනුරාධපුර අතිරේක

# පරිගණක විද්‍යාගාරය හෙද සිසු සිසුවියන්ගේ අයිතියට





රුපියල් ලක්ෂ දහ අටක වියදමින් අනුරාධපුර හෙද විදුහලේ ඉදිකළ නවීන පරිගණක විද්‍යාගාරය හෙද සිසු සිසුවියන්ගේ අයිතියට ඉකුත්දා පත් කෙරුණි.

කොමර්ෂල් බැංකුව මඟින් මෙම නවීන පහසුකම් සහිත පරිගණක ඒකකය ඉදි කරන ලදී.

මෙම හෙදි විදුහලට අවශ්‍ය අනෙකුත් පහසුකම් ලැබුණත් පරිගණක විද්‍යාගාරයක අවශ්‍යතාව ඉටුවී තිබුණේ නැහැ.එවන් පසුබිමකදි තමයි අපේ ඉල්ලීමට ප්‍රතිචාර දක්වමින් කොමර්ෂල් බැංකුව අපට මේ පරිගණක විද්‍යාගාරය ලබාදුන්නේ.ඒ අනුව මේවන විට අංග සම්පූර්ණ පරිගණක විද්‍යාගාරයක් අපට ලැබී තිබෙනවා යැයි මෙහිදී අදහස් දැක්වූ හෙද විදුහලේ විදුහල්පති සුනිල් ශාන්ත මහතා පැවසීය.

රාගම සමූහ

# හොර කච්චේරියකින් නිරෝධායන සහතික

සහතිකපත් ව්‍යාජ අන්දමින් මුද්‍රණය කිරීමට යොදාගන්නා මුද්‍රණ යන්ත්‍රයක් ඇතුළු භාණ්ඩ සමඟ බලපත්‍ර නොමැතිව පවත්වාගෙන ගිය ව්‍යාජ මුද්‍රණාලයක් වැටලූ කැලණිය කොට්ඨාස අපරාධ විමර්ශන කාර්‍යාංශය එම ස්ථානයේ සිටි එක් සැකකරුවකු අත් අඩංගුවට ගෙන ඇත.

කොට්ඨාස අපරාධ විමර්ශන කාර්‍යාංශයේ බුද්ධි අංශයට ලද තොරතුරක් මත 25 වැනිදා සිදුකළ මෙම වැටලීමෙන් විදෙස් ගමන් බලපත්‍ර 297ක් ජාතික හැඳුනුම් පත් 9ක් රබර් මුද්‍රා 220ක් ඩෙල් වර්ගයේ ලැප්ටොප් පරිගණකයක්, එච් පී ප්‍රින්ටරයක්,කැනෝන් වර්ගයේ ස්කෑනර් යන්ත්‍රයක් සැම්සුන් ඒ9 දුරකථනයක්ද සමග 40 හැවිරිදි මුස්ලිම් ජාතිකයකු මෙලෙස අත් අඩංගුවට ගෙන ඇත.

පුද්ගල ජීවිතයට අවශ්‍ය කරන උප්පැන්න විවාහ මරණ අධ්‍යාපන වෛද්‍ය ඇතුළු සියලුම සහතිකපත් ව්‍යාජ ලෙස මුද්‍රණය කිරීමට අවශ්‍ය කරන ලිපිලේඛන රබර් මුද්‍රා මොහු සන්තකයේ තිබී ඇති අතර ශ්‍රීලංකා රජයෙන් නිකුත් කරනු ලබන නිරෝධායන මුද්‍රාව පවා මෙම ස්ථානයේ තිබී පොලිස් අත් අඩංගුවට ගෙන ඇත.



මෙරට මෙන්ම විදෙස් රටවල ආගමන විගමන කාර්‍යාල මුද්‍රා කීපයක් ශ්‍රීලංකාවේ විදේශ සේවා නියුක්ති කාර්‍යාංශයේ මුද්‍රාව සහ කොළඹ අලුත්කඩේ මහේස්ත්‍රාත් ඉඩම් රෙජිස්ට්‍රාර් වරු විදුහල්පති හා නියෝජ්‍ය විදුහල්පතිවරු මවුලවීලා විවිධ ප්‍රදේශවල වෛද්‍යවරු පොලිස් ස්ථානාධිපතිවරු ප්‍රාදේශීය ලේකම් විවාහ රෙජිස්ට්‍රාර් මුස්ලිම් විවාහ නීතියට අදාළ ලිපිලේඛන,වෛද්‍ය සහතික සාමවිනිසුරු ග්‍රාමනිලධාරී වරු මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් වරයාගේ මුද්‍රාව කුරුණෑගල ප්‍රදේශයේ ප්‍රධාන පාසලක අපොස සාපෙළ විභාග ප්‍රතිඵල නිකුත් කිරීමේ ආකෘති පත්‍රයක් සැකකරුවකු අත් අඩංගුවට ගැනීම සඳහා අධිකරණය මඟින් නිකුත් කරන වරෙන්තු පිටපතේ ආකෘති පත්‍රය,මුස්ලිම් විවාහ ලේකම් වරුන්ගේ රබර් මුද්‍රා ඇතුළු ව්‍යාජ ලිපිලේඛන රාශියක් මෙහි තිබී ඇත.

මෙම කාර්යාලය විදේශ රැකියා ආයතනයක් නොවන බවත් ඒ සඳහා ලියාපදිංචියක් නොතිබුණු බවත් දැනට අත් අඩංගුවට ගෙන ඇති විවිධ රබර් මුද්‍රා ඇතුළු භාණ්ඩ වලට අනුව මෙය රහසිගතව පවත්වාගෙන ගිය ව්‍යාජ සහතික නිකුත් කිරීමේ ස්ථානයක් ලෙස හැඳින්විය හැකියැයි පොලීසිය පැවසීය.සැකකරු සහ අත් අඩංගුවට ගත් භාණ්ඩ තොගය 25 වැනිදා කොළඹ වංචා විමර්ශන අංශය වෙත භාර දෙන බව වැටලීම සිදුකළ නිලධාරීහු පැවසූහ.

එස්. දීයගහගේ - දකුණු පළාත් සංචාරක සහ කරන්දෙණිය අනුරාධ ප්‍රියදර්ශන

# තෙලිකඩ මිතුරු සාදයක් වටලා ලක්ෂ 5ක මත්ද්‍රව්‍ය සමඟ 9ක් අත්අඩංගුවට

තෙලිකඩ හොරගම්පිට ප්‍රදේශයේ නිවෙසක (26) පැවති මිතුරු සාදයක් වටලා රුපියල් ලක්ෂ පහක් පමණ වටිනා විවිධ මත්ද්‍රව්‍ය තොගයක් සමග සැකකරුවන් නව දෙනෙක් අත්අඩංගුවට ගත් බව තෙලිකඩ පොලිසිය පවසයි.



තෙලිකඩ පොලිස් ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරික්ෂක කේ. එම්. එල්. ජනකප්‍රිය මහතාට ලැබුණ තොරතුරක් මත මෙම සාදය වටලා රුපියල් 160000ක් පමණ වටිනා දිව යට තබා ගන්නා මත් මුද්දර 45ක්, රුපියල් 150000ක් පමණ වටිනා මත්පෙති 20ක් රුපියල් 200000 ක් වටිනා හෑෂ් හා එම් ඩී එම් නැමැති මත් කුඩු තොගයක් සහ කේරළ ගංජා ග්‍රෑම් 10 ක් සොයා ගෙන තිබේ.

මෑතකදී විවාහ වූ යුවළක් විසින් ඔවුන්ගේ හිතවතුන් සඳහා මෙම මිතුරු සාදය සංවිධාන කර තිබූ බව මූලික පොලිස් පරීක්ෂණවලදී අනාවරණයවී තිබේ.පොලිසිය විසින් අත්අඩංගුවට ගත් සියලුදෙනාම පිරිමි පුද්ගලයන් බවද වාර්තාවේ.

පොලීසිය විසින් මෙම වැටලීම කරන අවස්ථාවේ අත්අඩංගුවට ගත් සියලුමදෙනා මත්ද්‍රව්‍ය පානය කර සිටි බවද පොලීසිය සඳහන් කළේය.

අත්අඩංගුවට ගත් පිරිස කොළඹ සහ මහනුවර ප්‍රදේශවල පදිංචි අවුරුදු 25ත් 35ත් අතර වයසේ අය බවද අනාවරණය වී ඇත. සැකකරුවන් අධිකරණය වෙත ඉදිරිපත් කිරීමට නියමිතව තිබුණි.

ඇල්පිටිය පොලිස් අධිකාරී සතිස් ගමගේ සහ සහකාර පොලිස් අධිකාරි ජගත් සමරසිංහ යන මහත්වරුන්ගේ උපදෙස් පරිදි තෙලිකඩ පොලිස් ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරික්ෂක කේ එම් එල් ජනකප්‍රිය, පොලිස් පරීක්ෂක ප්‍රේමලාල්, උප පොලිස් පරීක්ෂක මලික් ගුණසේකර,සැරයන්වරුන්වන ආනන්ද (35557) නිශ්ශංක (58434) කොස්තාපල්වරුන්වන ප්‍රනාන්දු (561) විජේසිංහ (74171) විජේතුංග (40367) සංජීව (86251) සංජීව (16923) කාන්තා පොලිස් සැරයන් බුද්ධිකා (5915) කාන්තා පොලිස් කොස්තාපල් ශ්‍රීමති (8862) යන නිලධාරීන් විසින් මෙම වැටලීම කර ඇත.

ඡායා- කරන්දෙණිය සමූහ

අම්බලන්ගොඩ සමූහ - කරන්දෙණිය සමූහ

## අහුන්ගල්ල වෙරළේ කුඩු පාර්සලයක්

අහුන්ගල්ල, එගොඩමුල්ල ප්‍රදේශයේ මුහුදු වෙරළට පෙරේදා සවස් වරුවේ ගොඩගසා තිබූ පාර්සලයක් ගැන අහුන්ගල්ල පොලීසියට ලැබුණු තොරතුරක් අනුව පොලිස් නිලධාරීන් එම ස්ථානයට ගොස් පරීක්ෂා කිරීමේදී මත් කුඩු බවට සැකකරන කිලෝවක් බරැති පාර්සලයක් හමු වූ බව පොලීසිය පැවසුවේය.

මෙම පාර්සලයයේ තිබෙන කුඩු වර්ගය මත් කුඩු නම් එය රුපියල් කෝටියක් පමණ වටිනා කමින් යුක්ත වන බව ද පොලීසිය සඳහන් කළේය. මෙම කුඩු වර්ගය නිසැකින්ම මත් කුඩු දැයි පරීක්ෂා කර බැලීමට ඒවා රජයේ රස පරීක්ෂක වෙත යවා වාර්තාවක් ලබා ගැනීමට කටයුතු කරන බව අහුන්ගල්ල පොලීසිය වැඩි දුරටත් පැවසුවේය.

එම්.පී. කුමාර - කොටදෙනියාව සමූහ

## මේ කහ කෑවොත් පිළිකා



මාගම්පුර කහ කුඩු යන නාමයෙන් පැකට් කළ කෘතිමව නිපදවන ලද කහ කුඩු ජාවාරමක් අනාවරණය කරගත් ගම්පහ පොලිසිය එසේ පැකට් කළ කිලෝ 200 ක ප්‍රමාණයක් හා සැකකරුවන් දෙදෙනකු සමඟ අත්අඩංගුවට ගනු ලැබීය.

රාජ්‍ය බුද්ධි අංශයේ ගම්පහ කාර්යාලයට ලත් තොරතුරක් අනුව මෙම වැටලීම කරනු ලැබූ අතර මෙසේ අත්අඩංගුවට ගෙන ඇත්තේ මුදුන්ගොඩ හා වැරැල්ලවත්ත පෙදෙස්වල පදිංචිකරුවන් දෙදෙනකි.

විවිධ ද්‍රව්‍ය මුසු කර කෘතිමව සකස්කර ඇති කහකුඩු තොගය ප්‍රවාහනය කළ ලොරි රථයක් පොලීසිය බාරයට ගෙන ඇත. වැල්ලම්පිටිය ප්‍රදේශයේ පුද්ගලයකු මඟින් පිටකොටුව තොග වෙළෙඳුන්ට කහ කුඩු තොග ලැබෙන බවත් ගම්පහ, වැරැල්ලවත්ත ප්‍රදේශයේ නිවෙසකදී කිලෝවේ පැකට් ලෙස අසුරා වෙළෙඳ පොළට යවන බවද මෙම සැකකරුවන්ගෙන් ප්‍රශ්න කිරීමේදී අනාවරණය වී ඇතැයි පොලීසිය කියයි.

ගම්පහ කොට්ඨාස භාර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී ඉන්දික ද සිල්වා මහතාගේ උපදෙස් පරිදි සහකාර පොලිස් අධිකාරී තුසිත කුමාර මහතාගේ අධීක්ෂණය යටතේ ගම්පහ මූලස්ථාන ප්‍රධාන පොලිස් පරීක්ෂක සමන් ජයසිංහ මහතාගේ මෙහෙයවීමෙන් වැඩි දුර පරීක්ෂණ සිදු කෙරෙන අතර කහකුඩු සාම්පල රජයේ රස පරීක්ෂක වෙත ඉදිරිපත් කර වාර්තාවක් ලබා ගැනීමට පොලිසිය පියවර ගෙන ඇත.

සෙනෙවිරත්න කහටපිටිය - බොරලැස්ගමුව සමූහ

## ඩ්‍රෝන කැමරා 5ක් පොලිස් දැලේ



රත්මලාන ප්‍රධාන පාතාල සාමාජිකයකු වූ කොච්චිකඩේ ප්‍රදේශයේදී පොලිස් වෙඩි පහරින් ඝාතනයට ලක් වූ රොහා යන අයගේ මරණය සම්බන්ධයෙන් සතුට සැමරීමට කටයුතු කළ කුඩු අංජුගේ සහෝදරිය සමඟ ඉකුත් 25 වැනි දින ගල්කිස්ස නිසල අරණ සුසානයේ දී ඩ්‍රෝනා යන්ත්‍ර සමඟ අත්අඩංගුවට ගෙන ඇති ඩ්‍රෝනා කැමරා හිමිකරු ගෙන් ප්‍රශ්න කිරීමේ දී රුපියල් 20 ලක්ෂයකට අධික වටිනා ඩ්‍රෝනා කැමරා 5ක් ඇතුළු උපකරණ තොගයක් කඩුවෙල ප්‍රධාන සැකකරුගේ නිවෙසේ තිබී 26 දින සවස දෙහිවල පොලීසිය මඟින් අත්අඩංගුවට ගෙන ඇත.

සැකකරු කඩුවෙල පදිංචි වයස 38 ක් වන අතර කිසිදු බලපත්‍රයක් නොමැතිව ඩ්‍රෝනා යන්ත්‍ර ආයතනයක් පවත්වාගෙන යනු ලැබ. ඇති බවත් .භාණ්ඩ ප්‍රවාහනය සඳහා යොදා ගන්නා විශාල ඩ්‍රෝනා යන්ත්‍ර 2ක් හා කැමරා කරනය කරන ඩ්‍රෝනා කැමරා 3ක්ද සමඟ උපකරණ තොගයක් අත්අඩංගුවට ගෙන ඇත.

මෙම යන්ත්‍ර යොදාගන සැකකරු විවිධ අපරාධ සිදුකර ඇද්ද යන්නත් පිළිබඳව වැඩිදුරටත් විමර්ශන සිදු කරගන යනු ලබයි. සැකකරු විසින් ඉකුත් 25 දින ගල්කිස්ස නිසල අරණ සුසානයේදී රත්මලාන රොහා විසින් ඝාතනය කළ කුඩු අංජුගේ සහෝදරයා වන සුරේෂ් අසංක නොහොත් (ලංසියා ) යන අයගේ සොහොන් කොත අසලදී රෝහා ඝාතනය වූ සතුටට කේක් කපා ගුවනින් මල් ඉසීම සඳහා කුඩු අංජුගේ සහෝදරිය වෙත කුලියට ලබාදී තිබූ භාණ්ඩ ප්‍රවාහන ඩ්‍රෝනා කැමරාවක් සමඟ දෙහිවල පොලීසිය මඟින් අත්අඩංගුවට ගෙන ඇතැයි පොලීසිය කියයි.

යක්කලමුල්ල විශේෂ

## මැනුම් සේවක සංවත්සරය 29 දා

මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ මැනුම් සේවක සංගමයේ 34 වැනි සංවත්සර මහා සභාව ඉඩම් අමාත්‍ය එස්.එම් .චන්ද්‍රසේන මහතාගේ ප්‍රධානත්වයෙන් 29 දින පෙ.ව 9ට දෙපාර්තමේන්තු නව ශ්‍රවණාගාරයේදී පැවැත්වේ.

වජිර පූජිත ගුණවර්ධන - තෙලිජ්ජවිල සමූහ

## රාහුල පාරේ වැසි වතුර



මාතර නගරයේ ඇති ප්‍රධාන පාසල් තුනක්වූ රාහුල, සුජතා සහ මාතර මැදි විදුහල ඉදිරිපසින් වැටී ඇති මාතර, අකුරැස්ස මාර්ගය සහ මාතර හක්මන මාර්ගය යා කෙරෙන රාහුල මාවතේ මාතර මධ්‍ය මහා විද්‍යාලය ඉදිරිපිට දසුනකි මේ .මාතර රාහුල විදුහල, සුජාතා විදුහල,මාතර මධ්‍ය විද්‍යාලයේ දරුවෝ දහස් ගණනක් උදේ හවා මෙතැනින් යති,එති. මෙම වැසි ජලය පාරේ එක්රැස් වීම වළක්වා ක්‍රමවත්ව බැස යාමේ වැඩ පිළවෙළක් සැකසීම කඩිනමින් සිදු කළ යුතුව ඇත.

දේව දෙවිනිස් ද සිල්වා - බූස්ස සමූහ

## මාළු වෙළෙඳසලේ වහල ගසන්නේ කවදාද?



රත්ගම ප්‍රාදේශීය සභාව මඟින් රත්ගම සතිපොළේ ඉදිකරන කඩ කාමර නමයකින් යුත් මාළු වෙළෙඳසලේ ඉදිකිරීම් වහල මට්ටම දක්වා අවසන් කොට වසර හතරකට වැඩි කාලයක් ගත වී ඇතත්, වහලය ගැසීමට මෙතෙක් පියවර ගෙන නැතැයි මාළු වෙළෙන්දෝ මැසිවිලි නගති. එහි අවට ද වල්බිහිවී කසළ ගොඩ ගැසී ඇත. දැනට මාළු වෙළෙඳාම එළිමහනේ සිදුකිරීම නිසා පාරිභෝගික ජනතාවට ද මහත් හිරිහැරයක් වී ඇත.

මේ නිසා ගොඩනැඟිල්ලේ වහල ගසා මාළු වෙළෙඳාමට සුදුසු පරිසරයක් සකසන මෙන් ඔවුහු බලධාරීන්ගෙන් ඉල්ලා සිටිති.

දසත - දස අත ම එක තැන

■ හැටන් මධ්‍යම විශේෂ

# ඇමැති රමේෂ් තේ බොයි







තේ මණ්ඩලය විසින් පසුගිය කාලය තුළ හඳුනාගත්, "සිලෝන් ටී " නාමය පළුදු කිරීමට කටයුතු කළ තේ කර්මාන්ත ශාලා විසිතුනක් මේ වනවිට තහනම් කොට තිබෙනවා.මූලික අවස්ථාවේදී එම කර්මාන්ත ශාලාවල ක්‍රියාකාරීත්වය මාස හතරකට නවතා දමා තිබෙනවා.මා ඇමතිවරයා හැටියට ඒ එකම කර්මාන්ත ශාලාවකවත් ඒ තහනම ඉවත් කිරීමට අප කටයුතු කර නැහැ.තහනම කෙටි කරලත් නැහැ.කරන්නෙත් නැහැ.පසුගිය රජය කාලයේ එසේ දඩුවම් ලැබූ කර්මාන්තශාලාවල ඒ තහනම ඉතා කෙටි කාලයකින් ඉවත් කිරීමට එදා සිටි වැවිලි කර්මාන්ත අමාත්‍යවරයා කටයුතු කර තිබෙනවා.

වැවිලි කර්මාන්ත අමාත්‍ය රමේෂ් පතිරණ මහතා මේ අදහස් පළකළේ මෙවර තේ වෙන්දේසියේදී වැඩිම මිලක් ලබාගත් ,තේ නිෂ්පාදනය කළ පිටිගල අතුකෝරළ සමූහ ව්‍යාපාරයට අයත් පිටිගල අතුකෝරළ තේ කර්මාන්තශාලාවේ නිරීක්ෂණ චාරිකාවකට සහභාගීවීමෙන් අනතුරුව මාධ්‍යට අදහස් දක්වමිනි.

එහිදී ඇමතිවරයා වැඩිදුරටත් කියා සිටියේ දැනට තහනමට ලක්වී තිබෙන තේ කර්මාන්තශාලා දෙවෙනි වතාවටත් ඒ වැරැද්දටම හසුවුවහොත් අනිවාර්යයෙන්ම ඒ කර්මාන්තශාලාවේ බලපත්‍රය සම්පූර්ණයෙන්ම ඉවත් කිරීමට කටයුතු කරන බවය.ඒ සඳහා රජයක් හැටියට මෙන්ම,වැවිලි කර්මාන්ත අමාත්‍යවරයා හැටියට අපි පැකිලෙන්නේ නැතැයිද ඇමතිවරයා පැවසීය.

පසුගිය කාලයතුල සිලෝන් ටී නාමය පළුදු කිරීමට කටයුතු කළ තේ කර්මාන්තශාලා තේ මණ්ඩලය විසින් හඳුනාගෙන දඩුවම් කරන ලද තේ කර්මාන්තශාලා සියල්ලේම දඩුවම් ඉතාම කෙටි කාලයකින් ඉවත් කිරීමට හිටපු අමාත්‍යවරයා විසින්ම කටයුතු කරනු ලැබුවා. ඉතිහාසය ඒකට සාක්ෂි දරනවා.මේ වතාවෙදි අපේ රජය බලයට පත්වීමෙන් පසුව දැනට කර්මාන්තශාලා විසිතුනක් (23) මෙම අපද්‍රව්‍ය එකතු කිරීම පිළිබඳව දැනට තහනම් කොට තිබෙනවා.එහි මූලික අවස්ථාවෙදි ඒ කර්මාන්තශාලාවල ක්‍රියාකාරීත්වය මාස හතරකට නවතා දමා තිබෙනවා.මා ඇමතිවරයා වශයෙන් පත්වීමෙන් පසුව ඒ එකම කර්මාන්තශාලාවකවත් ඒ තහනම ඉවත් කිරීමට අප කටයුතු කර නැහැ. තහනම ඉවත් කරලත් නැහැ.කෙටි කරලත් නැහැ.කරන්නෙත් නැහැ.

දෙවෙනි වතාවටත් ඒ වැරැද්දටම හසුවුවහොත් අනිවාර්යයෙන්ම ඒ කර්මාන්තශාලාවේ බලපත්‍රය සම්පූර්ණයෙන්ම ඉවත් කරනවා.මම වැවිලි කර්මාන්ත අමාත්‍යවරයා හැටියටත් අපි රජයක් හැටියටත් ඒ තීන්දුව ගන්න පැකිලෙන්නේත් නැහැ.

■ හැටන් මධ්‍යම විශේෂ

# වැස්සත් එක්ක කඳුකරයට බඹර ප්‍රහාර

මධ්‍යම කඳුකරයට මේ දිනවල පවතින වැසි හා සුළං තත්ත්වයන් හමුවේ වතු කරයේ බඹර ප්‍රහාරයන් වැඩිවීමත් සමඟ වතු කම්කරුවන් විවිධ දුෂ්කරතාවට පත්ව ඇත.මේ ප්‍රදේශයේ පවතින වැසි හා සුළං තත්ත්වයන් සමඟ පසුගිය දින කිහිපය තුළ ආගරපතන,බගවන්තලාව, නෝර්වුඩ් වැනි වතුකරය තුළ සිදුව ඇති බඹර ප්‍රහාර හේතුවෙන් වතු කම්කරුවන් කිප දෙනකුම තුවාල ලබා රෝහල් ගත කර ඇත. මේ පිළිබඳ වතු කම්කරුවන් පවසන්නේ මේ දිනවල පවතින වැසි හා සුළං තත්ත්වයන් නිසා වතුකරයේ එල්ල වන බඹර ප්‍රහාරයන් වර්ධනය වී ඇති බවය. පවතින වැසි සුළං හේතුවෙන් වතුකරයේ ගස් මත බැඳ ඇති බඹර කූඩු කඩා වැටීමෙන් එහි සිටින බඹරු වතුවල සේවය කරන පිරිසට ප්‍රහාර එල්ල කිරීමත් සමඟ වතුකරයේ සේවය කරන තමන් දැඩි දුෂ්කරතාවට පත්ව ඇති බවත්ය. වතුකරය තුළ පවතින මේ බඹර ප්‍රහාර හේතුවෙන් තම ජීවිතද අවදානම් තත්ත්වයන්ට පත්ව ඇති බවත් දිර්ඝ කාලයක් පුරාවට වතුකරය තුළ සිදුවන මේ බඹර ප්‍රහාර පිළිබඳ අදාළ බලධාරින්ගේ නිසි අවධානයක් යොමු නොවීම දැඩි කනගාටුවට කරුණක් බවද ඔවුහු වැඩි දුරටත් කීහ.

■ විජිත එදිරිසිංහ

# ජාතික සාරධර්ම තරගාවලියට නිවෙසේ සිටම සහභාගි වෙන්න

සියලු මවුපියන්ට සහ ගුරුවරුන් හට තම දරුවන් සහ සිසුන් ජාතික සාරධර්ම තරගාවලිය සඳහා සහභාගී කරවමින් නිවෙසින් බැහැරට යෑමෙන් තොරවම අගනා ත්‍යාග හිමි කර දීමේ අවස්ථාව උදාවී ඇත.

පාසල්, පෙරපාසල්, ළමා නිවාස, ආගමික ආයතන සහ වෙනත් ළමා සංවිධානවලට සිය දරුවන් කණ්ඩායම් කාණ්ඩය යටතේ මේ තරගාවලිය සඳහා සහභාගී කරවිය හැකි අතර, වෙනත් ඕනෑම දරුවකුට හෝ දෙදෙනකුට කේවල කාණ්ඩය යටතේ සහභාගී වෙමින් මාසයකට වරක් ආකර්ෂණීය ත්‍යාග දිනා ගැනීමටත්, ජනප්‍රියම වීඩියෝව සඳහා අමතර ත්‍යාගය හිමි කර ගැනීමටත් හැකිය. ශ්‍රී ලංකාවේ රොටරි සමාජය වසර පුරාම රු. 500,000ක වටිනාකමින් යුතු ත්‍යාග පිරිනැමීමට කටයුතු යොදා ඇති අතර, දිවයින පුරා ක්‍රියාත්මක වන වාර්ෂික ආචාර ධර්ම සහ අගනාකම් තරගාවලිය සඳහා තම දරුවන් සහභාගී කරවන ලෙස එම සමාජය මවුපියන්ගෙන් සහ ගුරුවරුන්ගෙන් ඉල්ලා සිටිති. තරගාවලිය සඳහා සහභාගී වන ප්‍රථම කණ්ඩායම් 100 සඳහා සහභාගීත්වය වෙනුවෙන් නොමිලේ DVD තැටිය බැගින් ද පිරිනැමේ. දරුවන්ගේ ජීවිතයේ ආරම්භක අවධියේදීම ඔවුන් තුළ ආචාරධර්ම සහ යහපත් ගතිගුණ රෝපණය කිරීමේ අරමුණ පෙරදැරිව ජනප්‍රිය සංගීත රචකයකු, ගායකයකු සහ කොළඹ මෙට්‍රොපොලිටන් රොටරි සමාජයේ හිටපු සභාපතිවරයා ද වන රුක්ෂාන් පෙරේරාගේ මූලිකත්වයෙන් රොටරි සමාජය විසින් Little Minds Strong Values වැඩසටහන ආරම්භ කරන ලදි. එම යහපත් චර්යා සංගීත චිකිත්සාව භාවිත කරමින් නිර්මාණය කරන ලද සිංහල වීඩියෝ 20ක් ද ද්‍රවිඩ වීඩියෝ 10ක් ද ආශ්‍රයෙන් ගොඩනැඟීම එම වැඩසටහනේ අරමුණයි. වෙනත් ආගම් සහ ජාතිවලට ගරු කිරීම, මවුපියන්ට සහ වැඩිහිටියන්ට ගරු කිරීම,අනෙකාට කරුණාව දැක්වීම,අවංකවීම, සොරකම් කිරීමෙන් වැළකීම, බොරු කීමෙන් වැළකීම,සමාව ගැනීමට නොපැකිළිවීම, ස්තූති කිරීම, පරිසරය සංරක්ෂණය කිරීම, වගකීම් සහගත ලෙස කැළිකසළ බැහැර කිරීම, වෙලාවට වැඩ කිරීම, නීතිගරුක වීම, මාර්ග නීති පිළිපැදීම, යහපත් සෞඛ්‍ය පුරුදු ආදී යහපත් ගුණාංග 40ක් මේ වීඩියෝ මඟින් ඉදිරිපත් කෙරේ. වීඩියෝවල එන ගීතවල පද දරුවන්ට අවබෝධ කර ගැනීමට පහසු වන පරිදි සරලව රචනා කර ඇති අතර, යහපත් ගුණාංග ආශ්‍රයෙන් ජීවිතයට මුහුණ දීමේ වැදගත්කම පිළිබඳ පණිවිඩය ද එමගින් ප්‍රබල ලෙස ඉදිරිපත් කර ඇත. වීඩියෝවල සංගීතය දරුවන්ගේ සිත් දිනා ගන්නා පරිදි රිද්මයානුකූල සහ ගීතවත් ලෙස ඉදිරිපත් කර ඇත. තවද, වීඩියෝවල වර්ණ සහ මෙරට සියලු ජාතීන් නියෝජනය කරන දරුවන්ගේ අලංකාර රූප ද එම වීඩියෝවල සුවිශේෂී බව තවත් ඉස්මතු කරයි.



ජූලි මස ජයග්‍රාහකයා

දරුවන් වෙනුවෙන්ම සකස් කරන ලද සංගීත වීඩියෝ සම්පූර්ණ පෙළ මෙන්ම 'සාරධර්ම' තරගාවලිය සඳහා සහභාගිවීමේ ක්‍රමවේදය සහ නිතර අසන ප්‍රශ්න ද https://www.rotarycolombometro.org/lmsv/ වෙත පිවිසීමෙන් දැක ගත හැකිය. එම යොමුවට පිවිසීමෙන් වට්ස්ඇප් වීඩියෝ, ගීත පද සහ සංගීතය ද බාගත කරගත හැකි අතර, මෙරට මෙන්ම විදේශවල වෙසෙන ශ්‍රී ලාංකේය දරුවන්ට ද විවෘත 'සාරධර්ම' තරගාවලියට ඇතුළත්වීමට ද හැකිය.

■ මහානාම විතානගේ - මල්වාන සමුහ

# මාකොළ සෙනෙහස සවිය පදනමෙන් සිසු දරුවන් 85කට උපකරණ

පුරා වසර පහක් තුළ දී දිවයිනේ පාසල් සිසු දරුවන් හාර දහසකට පිහිට වු "සෙනෙහස සවිය" ප්‍රජා සත්කාර පදනම සිසු දිරිය 2020 වසර වැඩ සටහනේදී තවත් පාසල් සිසු දරුවන් 85 දෙනෙකුට පොත් හා අධ්‍යාපන උපකරණ කට්ටල ප්‍රදානය කිරීමක් පසුගියදා මාකොළ සෙනෙහස සවිය අධ්‍යාපන ආයතනයේදී සිදු කරන ලදී. පමුණුවිල සිරි කාරියප්පෙරුම විහාරාධිපති මොරටුවෙ නන්දසිරි හිමියන්ගේ ප්‍රධානත්වයෙන් පවත්වනු ලැබු මේ උත්සවයේදී සෙනෙහස සවිය අධ්‍යාපන ආයතනයේ සිංහල විෂය භාර ආචාර්ය ප්‍රසංග යු . නාරායන මහතා විසින් විශේෂ දේශනයක් ද පවත්වන ලදි.



සෙනෙහස සවිය පදනමෙ නිර්මාතෘ හා එහි ප්‍රධාන සංවිධායක, මාකොළ සිංහ සවිය ක්‍රීඩා සමාජයේ සභාපති සචිත්ත නේරංජන ඇල්වලගේ මහතාගේ සංකල්පයකට අනුව එම සිසු දිරිය වැඩ සටහන ක්‍රීයාත්මක වේ.

■ සේන වේරගම - කලවාන සමූහ

## හෙරොයින් ළඟ: 5ක් දැලේ

හෙරොයින් ග්‍රෑම් තුනක් ළඟ තබාගත් පුද්ගලයන් පස්දෙනකු අයගම පොලීසිය මඟින් අත්අඩංගුවට ගෙන තිබේ. මෙලෙස අත්අඩංගුවට ගෙන ඇත්තේ අයගම පිඹුර ,පරගල,කලවාන දොළහේන ප්‍රදේශයේ පදිංචි පුද්ගලයන්ය. මොවුන් අතරින් කලවාන ප්‍රදේශයේ දෙදෙනා හෙරොයින් ජාවාරමට සම්බන්ධ පුද්ගලයන් දෙදෙනෙක් බව අයගම පොලීසිය පැවැසීය.සිද්ධිය සම්බන්ධයෙන් අයගම පොලීසියේ පොලිස් ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක චාමින්ද මහතාගේ ප්‍රධානත්වයෙන් විමර්ශන ආරම්භ කර තිබේ .

■ එන්. නවරත්න - මීගහකිවුල සමූහ

## කන්දකැටියේ මෙහෙයුමකින් 3ක් අත්අඩංගුවට

කන්දකැටිය හා ඒ අවට ප්‍රදේශයන්හි සිදු කළ විශේෂ මෙහෙයුමකදී කාන්තාවකට පහර දුන් පුද්ගලයකු සහ නීති විරෝධී මත්පැන් තබාගත් පුද්ගලයෙකු , උසාවිය මග හරිමින් සිටි වරෙන්තුකරුවකු අත්අඩංගුවට ගත් බව කන්දකැටිය පොලීසිය පවසයි .මෙලෙස අත්අඩංගුවට ගෙන ඇත්තේ කන්දකැටිය හා ඒ අවට ප්‍රදේශයන්හි පුද්ගලයන් පිරිසකි. අත්අඩංගුවට ගත් පිරිස වයස අවුරුදු 31-46 ත් අතර වන බව පොලීසිය පවසයි . අත්අඩංගුවට ගත් සැකකරුවන් පොලිස් ඇප මත මුදා හළ අතර වරෙන්තුකරු බදුල්ල අධිකරණය වෙත ඉදිරිපත් කිරීමට නියමිතව තිබිණි.

■ චන්ද්‍රදාස මලවරආරච්චි - මිහින්තලේ විශේෂ

## අනුරාධපුරයේ කන්න රැස්වීම් මේ දිනවල

අනුරාධපුර දිස්ත්‍රික්කයේ මෙවර 2020/21 මහ කන්නයේ කෘෂිකර්ම වගා සැලසුමට අනුව මහා වාරිමාර්ග වැව් යටතේ සිදුකිරීමට යෝජිත වගාවන් සම්බන්ධ තීරණ ගැනීමේ කන්න රැස්වීම් මේ දිනවල පවත්වාගෙන යන බව අනුරාධපුර වාරිමාර්ග අධ්‍යක්ෂ කිත්සිරි වැලිගෙපොලගේ මහතා පැවැසීය. නුවරවැව ,තිසාවැව , අභයවැව ,නාච්චදූව , තුරුවිල හා හුරුළුවැව ගොවි ව්‍යාපාරයන්හි ගොවි නියෝජිතවරුන් නේවාසික ව්‍යාපාර කළමනාකරුවන් හා සෙසු නිලධාරීන් සමග අදහස් හුවමාරු කරගෙන වී හා අතිරේක බෝග වගාකිරීම සම්බන්ධයෙන් මේ පෙර කන්න රැස්වීම්වල දී තීන්දු තීරණ ගෙන ඇති බවද වාරිමාර්ග අධ්‍යක්ෂවරයා කීවේය. මහකනදරාවැව,මහවිලච්චිය ,රාජාංගණය හා අංගමුව මහවැව් යටතේ පෙර කන්න රැස්වීම් ඉදිරියේ දී පැවැත්වීමට තීරණය කර ඇත.

■ සම්පත් ප්‍රියනන්දන - බලන්ගොඩ විශේෂ

## නිවිතිගල ඉඩමකින් ජීව අත්බෝම්බයක්

නිවිතිගල කොළොම්බුගම ප්‍රදේශයේ පෞද්ගලික ඉඩමක තිබී ජීව අත්බෝම්බයක් පොලිස් විශේෂ කාර්ය බළකායේ නිලධාරින් විසින් සොයාගෙන තිබේ. පොලිසි විශේෂ කාර්ය බළකායේ නිලධාරින්ට ලද තොරතුරකට අනුව එම නිලධාරින් විසින් එම ජීව අත්බෝම්බ සොයාගෙන තිබේ. ඒ සමග කැබැල්ලකැටිය, කොළොම්බුගම, නිවිතිගල ලිපිනයේ පදිංචි 35 හැවිරිදි පුද්ගලයෙකු සැකපිට අත්අඩංගුවට ගෙන තිබේ. මේ සම්බන්ධයෙන් වැඩිදුර පරික්ෂණ පැවැත්විම සඳහා නිවිතිගල පොලීසිය වෙත භාර දී ඇත.

■ මිහිර විජේසේකර - මාරවිල සමූහ



# බරුදැල්පොළ ධීවර ගමට තොටුපළක් දෙනවද?

මාරවිල සිට හලාවත දක්වා වෙරළ තීරයේ ධීවර කර්මාන්තයේ නියැළෙන ධීවර ජනතාව සිය කර්මාන්තය පවත්වාගෙන යන්නේ දුෂ්කරතා රැසක් මධ්‍යයේය. ඉන් ප්‍රධානම ගැටලුව වන්නේ මුහුදට ගොස් මත්ස්‍ය සම්පත රැගෙන එන ධීවර යාත්‍රා වෙරළට ගොඩ ගැසීමේ දී ඇතිවන බාධාවන් ය . පවතින මේ ගැටලුවට දැඩි ලෙස මුහුණ පා සිටින්නේ බරුදැල්පොළ ධීවර ජනතාවයි. මහවැව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් බරුදැල්පොළ ගම්මානයේ ජීවත්වන පවුල් සංඛ්‍යාව 400කි. ගම්මානයේ ජීවත් වන ජනතාවගේ ප්‍රධාන ජීවනෝපාය ධීවර කර්මාන්තයයි. බරුදැල්පොළ ධීවර තොටුපොළේ රැකියාවේ නිරත වූ ධීවර යාත්‍රා ගණන පනහකට ආසන්නය.දීර්ඝ කාලයක් තිස්සේ එම ධීවර ජනතාව නිසි පහසුකම් සහිත ධීවර තොටුපොළක් නොමැතිවීම හේතුවෙන් ගැටලු රැසකට මුහුණ පා සිටිති. මහ සයුර සමඟ පොරබදා අපමණ දුක් ගැහැට විඳගනිමින් නෙළාගන්නා මත්ස්‍ය සම්පත ගොඩට රැගෙන ඒමේ දී ඇතිවන පීඩාව මෙතකැයි කියා කිව නොහැක. මුහුදු ඛාදනය වළක්වා ලීම සඳහා මීට වසර ගණනාවකට පෙර මුහුද දෙසට තිරස් ලෙස ඉදිකරන ලද දෙපස ගල් වැටිවල මත්ස්‍ය සම්පත නෙළා ගෙන පැමිණෙන ධීවර යාත්‍රා ගොඩට ඒමේදී නිරන්තරයෙන් ගැටෙන බවයි ධීවර ජනතාව පෙන්වා දෙන්නේ. මීට විසඳුමක් ලෙස වෙරළේ සිට එම ස්ථානයේ මීටර් 200ක් පමණ දුරින් සිරස් අතට ගල්වැටියක් ඉදිකිරීම පවතින්නා වු මේ ගැටලුවට විසඳුම බව ධීවර ජනතාව පෙන්වා දෙති. දීර්ඝ කාලයක් තිස්සේ පවතින ගැටලුවෙන් හෙම්බත්ව සිටින බරුදැල්පොළ ධීවර ජනතාව ඔවුන්ගේ දුක් ගැනවිල්ල ඉදිරිපත් කර සිටින්නේ මෙලෙසයි.

නිව්ටන් සිරිල්- මම ධීවර වෘත්තියෙ යෙදිලා අවුරුදු තිහකට වැඩියි.බරුදැල්පොළ තිබුණ අපේ තොටුපොළ විශාල ජනතාවක් රැකියා කරපු ස්ථානයක්. දැන් අපිට තැනින් තැනට යන්නයි වෙලා තියෙන්නේ. එතනත් අපිට රැකියාවක් කර ගන්න අවස්ථාවක් දෙන්නෙ නෑ. ඒගොල්ලො ටිකක් අපිත් එක්ක අදි මදි කරනවා. එතැන මාලු විකුණ ගන්න විදිහක් නැහැ.

බියට්‍රිස් පිරිස්- අපේ මේ බරුදැල්පොළ ගම්මානයේ පවුල් 400කට වැඩිය ඉන්නවා. ඒ අයගෙන් පනහකට ආසන්න සංඛ්‍යාවකට ධීවර බෝට්ටු තියෙනවා. 150ක් විතර රැකියාවේ යෙදෙනවා. අපේ අය ඒ කාලේ රැකියාව කළේ මේ ස්ථානයෙ. දැන් පාළු සුසාන භූමියක් වගේ ධීවර වාඩි කඩාගෙන ගිහිල්ලා, ධීවර බෝට්ටු තැන් තැන්වල, ධීවර දැල් ආම්පන්න හැම හැමතැනම. උදේ පාන්දර නැගිටලා අපේ අය යනවා අර එහා පැත්තේ තිබෙන තල්විල වෙරළට. එතන ඒගොල්ලො මුහුදට ගිහිල්ලා එන වෙලාව කියන්න බෑ.

රන්ජන්- අපි ඉන්නේ බරුදැල්පොළ සීමාවෙ. මෙතන රස්සාව කරන්න බෑ. මෙතන රස්සාව කරනවා කියන්නේ හරියට ජීවිතයත් මරණයත් අතර සටනක් කරන එක. මෙතන රස්සාව කරලා කකුල් අත පය කඩාගෙන ඉන්න අයත් දැන් ගෙවල්වලට වෙලා ඉන්නවා.

රංජනී - ගොඩක් කල් ඉඳන් අපට තොටුපොළක් නෑ. මෝය කැපුවොත් එක පැත්තකින් කරදරයක් හැම පැත්තෙන්ම ඒ හින්ද අපිට තොටුපළක් හදලා දෙන්න කියන එක තමයි අපි කියන්නේ.

ජීවන්- අපිට මේ රැකියාව කරන්න තොටුපොළක් නෑ. ධීවරයෝ බොහොම අසරණ වෙලා ඉන්නේ. මාළු ටික විකුණගන්න නෑ. ඉතින් අපි මේ පිට තැනක ඇවිල්ල රස්සා කරන්නේ. මෙතන ප්‍රශ්න ගොඩයි. අපි කිලෝ මීටර හතරක් පහක් එන්න ඕන.අනිත් එක මේක පිට තැනක්. මේ අය කැමති නෑ අපි මෙතන රස්සාව කරනවට.

■ ප්‍රසන්න පත්මසිරි
ඌව පළාත් සමූහ

## අම්බලමට ආ පිඹුරා වනජීවියට

ලුණුගල හොප්ටන් වත්තේ දලු කිරණ අම්බලමට පැමිණ සිටි විශාල පිඹුරකු අල්ලා වන ජීවියට භාරදුන් බව වතුකම්කරුවෝ කියති. මෙ පිඹුරා දැක බලා ගැනීමට වතු ගම්මානයේම ජනතාව පැමිණ සිටි බවත් පිඹුරා අඩි දහයක දිගකින් හා කිලෝ 20ක බරකින් යුතු වන බව වතු කම්කරුවෝ කීහ. වනයේ සිට වතු ගම්මානයට පැමිණ සිටි පිඹුරා සුනඛයන්,බළලුන්,කුකුළන් ඇතුළු සතුන් ආහාරයට ගෙන තිබේ.



■ විජිත සල්ගාදු - අකුරැස්ස මධ්‍යම විශේෂ

# අකුරැස්සේ පුරන් වෙල්යායක් අස්වද්දයි





එළැඹෙන මහ කන්නයේදී අකුරැස්සේ තවත් පුරන්වූ කුඹුරු යායක් අස්වැද්දීමට මූලික වැඩ කටයුතු 24 වෙනි දින පෙරවරුවේ යෙදුන සුබ මොහොතින් ආරම්භ කෙරින.

වසර 15 කට වැඩි කාලයක් ගොවීන් විසින් අතහැර දමා තිබුන අකුරැස්ස , යාකබැද්ද කැරැන්දෙනිය කුඹුරු යාය අක්කර 25 කින් සමන්විත වේ. ගොවි මහතුන් 26 දෙනෙකු පමණ සිටිති. මෙම කුඹුරු යායට ඉහළින් ඇති ඉඩම් ගොඩ කිරීමේ හේතුවෙන් කුඹුරු යායට ජලය සැපයූ ඇළ මාර්ගය සම්පූර්ණයෙන්ම පස් වලින් ගොඩවී ඇත. සන කැලෑ රොදකින් ඇළ මාර්ගය මෙන්ම කුඹුරු යායද වෙළාගෙන ඇත.

අකුරැස්ස දස මහා බෝධි සෙනසුනේ විහාරාධිපති , මාතර දිස්ත්‍රික් බෞද්ධ කටයුතු පිළිබඳ සමායෝජක පූජ්‍ය දිද්දෙනිපොත නන්දරතන හිමියන්ගේ අනුශාසනා සහ අනුග්‍රහය මත යාකබැද්ද එකමුතු ගොවි සමාජයේ නිලධාරීන්ගේ මෙන්ම ගොවි මහතුන්ගේ උපරිම ශක්තිය යොදවමින් පුරන් කුඹුරු යාය අස්වැද්දීමට කටයුතු යෙදිණි.

■ සුමිත්‍රා කුමාරිහාමි - කන්තලේ සමූහ

# සමුද්‍ර සම්පත් සුරැකීමේ සතිය සමරා වෙරළ තීරයට නව පෙනුමක් දෙයි






දිනමිණ දසත — දස අත ම එක තැන

පසුගිය 14 සිට 25 දක්වා යෙදී ඇති ජාතික සමුද්‍ර සම්පත් සුරැකීමේ සතිය නිමිත්තෙන් ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ පළමු වැඩසටහන ඊසාන දිග පළාත් සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරියේ සහකාර කළමනාකාර ටී.ශ්‍රීපති මහතා හා එහි කාර්යමණ්ඩලය, දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සංවිධායකත්වයෙන් පැවැත්විණි.

මෙම කාර්යයේදී කරදිය වෙරළ තීරය කිලෝමීටර් 7 ක දුරක් ශුද්ධ පවිත්‍ර කිරීමට පිරිස සහභාගි වූහ. නැගෙනහිර පළාත් ආණ්ඩුකාර අනුරාධා යහම්පත් , දිසාපති අසංක අබේවර්ධන යන මහත්ම මහත්මීන්ගේ පුරෝගාමිත්වයෙන් වැඩසටහන ක්‍රියාත්මක විය.

මෙහිදී ආණ්ඩුකාරවරිය කියා සිටියේ වෙරළබඩ කලාපය වඩාත්ම ආර්ථික වශයෙන් වටිනාකමක් ඇති බිමක් හැටියට සලකන හෙයින් එහි සුන්දරත්වය හා පිරිසිදුකම සම්බන්ධයෙන් මෙහි ජීවත්වන සෑම පුරවැසියෙක් තුළම හැඟීමක් තිබිය යුතු බවයි.

මෙම පිරිසිදු කිරීමේ ශ්‍රමදානයට ඊසාන දිග පළාත් සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරියේ සහකාර කළමනාකාර ටී.ශ්‍රීපති මහතා ගේ මූලිකත්වයෙන් යුධ, ගුවන්, නාවික,පොලිස් නිලධාරීන් , අධ්‍යයන කාර්ය මණ්ඩලය , නගරසභා නිලධාරීන් , ප්‍රාදේශීය ලේකම්වරුන් ඇතුළු විශාල පිරිසක් සහභාගි වූහ.

■ රත්තෝට සමූහ කිංස්ලි රිචඩ් ද සිල්වා

# වසා දැමූ ගොඩනැඟිලි නිසි දෙයකට යොදා ගනිමු

පසුගිය යහපාලන රජය සමයේ පෞද්ගලික ආයතනයකට බදු දුන් මාතලේ කොටුවේගෙදර වී ගබඩාව යළි රජයට පවරාගෙන පොදු කාර්යයකට යොදවන ලෙස කොටුවේගෙදර ජනතාව රජයෙන් ඉල්ලා සිටිති.

මාතලේ නාගරික බල ප්‍රදේශයේ පිහිටි මෙම වී ගබඩාව වසර කීපයක් වසා දමා තිබී ඇති අතර 2016 අග භාගයේ එය පෞද්ගලික ආයතනයකට පැවරුවත් එම ආයතනය ද ඉන් නිසි ප්‍රයෝජනයක් නොගත් බව පවසන අදාළ ගමේ ජනතාව මේ හේතුවෙන් එකී ගබඩා සංකීර්ණයේ ප්‍රධාන ගොඩනැඟිල්ල හැර අනෙක් ගොඩනැඟිලි කීපයම විනාශ වූ බව පවසති.

කෝටි ගණනක් වටිනා මෙම ගොඩනැඟිලි සංකීර්ණය යළි රජයට ගෙන ඵලදායී කාර්යයකට යොදවන ලෙස ගම්වාසීහු ඉල්ලා සිටිති.

■ පරාක්‍රම ගුණසේකර - සූරියවැව සමූහ

# හම්බන්තොට හේන් ගොවිතැනට ඉඩම්

හම්බන්තොට දිස්ත්‍රික්කයේ ගොවීන්ට හේන් ගොවිතැන් සඳහා රජයේ සහ වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයත් ලඳු කැලෑබිම් ලබා දීමට කටයුතු කරගෙන යන බව හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් ඩබ්ලිව්. එච්. කරුණාරත්න මහතා පැවසීය.

රජය මගින් ක්‍රියාත්මක කරගෙන යන සෞභාග්‍යයේ දැක්ම වඩාත් සාක්ෂාත් කර ගනිමින් වැඩි වැඩියෙන් ආහාර බෝග වගා ව්‍යාප්ත කිරීමට හේන් ගොවිතැනට නව ජීවනයක් ලබාදීම මෙමගින් සිදු කෙරේ.

මේ අනුව රජයට අයත් ඉඩම් සහ වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයත් ලඳු කැළෑබිම් හේන් ගොවිතැන් සඳහා ගොවීන්ට ලබා දීම සිදු කෙරේ. මෙම ඉඩම්වල බහුවාර්ෂික වගා සිදු නොකළ යුතුය. තාවකාලික වගාවන් යටතේ ආහාර බෝග වගා සිදුකිරීමට පමණක් යොදා ගන්නා ලෙස උපදෙස් දී ඇත.

■ එස්.පී.විජේරත්න - කටුගස්තොට සමූහ

# මතට ඇබ්බැහිවූ තරුණයන් මුදා ගන්න කඳවුරක්



කටුගස්තොට පොලිස් වසමේ මැණික්කුඹුර වත්ත ප්‍රදේශයේ පදිංචිව සිටි මතට ඇබ්බැහිවූ තරුණයන් වෙනුවෙන් පැවැත් වු ප්‍රජා ප්‍රතිකාර කඳවුර පසුගියදා සාර්ථකව අවසන් කෙරිණි. හාරිස්පත්තුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ අනුග්‍රහය යටතේ අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ මෙහෙය වීමෙන් කටුගස්තොට බෞද්ධ බල මණ්ඩල ශාලාවේදී පසුගිය 11 වැනිදා සිට 21 වැනිදා දක්වා මෙම ප්‍රජා ප්‍රතිකාර කඳවුර පැවැත්විණි. මත්ද්‍රව්‍ය වලට ඇබ්බැහිව සිටි 16 දෙනකුගෙන් යුත් මෙම තරුණ පිරිස කඳවුරට සිය කැමැත්තේම සහභාගිවීම විශේෂත්වයකි.

■ පරාක්‍රම ගුණසේකර - සූරියවැව සමූහ

# බුන්දල විල්මැන්න ගොවි සහ වනජීවි ගැටලුවලට විසඳුම් සොයන්න කමිටුවක්

බුන්දල විල්මැන්න අභය භූමිය ප්‍රදේශයේ කලක පටන් ගොවි ජනතාව සහ වනජීවි නිලධාරීන් අතර පවතින ගැටලුවට සාධාරණ විසඳුමක් සොයා ගැනීමට කමිටුවක් පත් කිරීමට හම්බන්තොට දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටුව තීරණය කර ඇත.

හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් ඩබ්ලිව්. එච්. කරුණාරත්න මහතාගේ ප්‍රධානත්වයෙන් පැවැති හම්බන්තොට දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටු රැස්වීමේදී මෙම තීරණය ගෙන ඇත. මේ අනුව එම කමිටුවට දකුණු පළාත් වනජීවි සහකාර අධ්‍යක්ෂ දිස්ත්‍රික් සහකාර ඉඩම් කොමසාරිස් දිස්ත්‍රික් කෘෂිකර්ම අධ්‍යක්ෂ සහ පළාත් වාරිමාර්ග ඉංජිනේරු යන සිව්දෙනා පත් කිරීමට තීරණය විය.

බුන්දල විල්මැන්න ජාතික අභය භූමිය රජය මගින් ප්‍රකාශයට පත්කර ඇත්තේ 2006 ජුනි මස 30 දාය. එහි විශාලත්වය හෙක්ටයාර් 3339 .38 කි. එම ප්‍රදේශයේ පාරම්පරිකව ගොවිතැන් සිදුකරන පාරම්පරික ගොවීන්ට නිදහසේ ගොවිතැන් කිරීමේ අයිතිය ඉල්ලා ගොවීන් සහ වනජීවි නිලධාරීන් අතර මෙම අරගලය හටගෙන ඇත.

මේ පිළිබඳ සොයා බලා ගොවි ජනතාවගේත්, මෙම ප්‍රදේශයේ සැරිසරමින් සිටින වනජීවින්ගේත් තෙත් බිම් කලාපයට හානියක් නොවන පරිදි සාධාරණයක් ඉටුකිරීම සඳහා ගතයුතු ක්‍රියාමාර්ග මෙම කමිටුව මගින් දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටුවට ඉදිරිපත් කිරීමට නියමිතය.

■ විශේෂ රසුල දිල්හාර ගමගේ - උතුරු පළාත්



# මරවන්පුලන් ආරූ ඔය සිඳෙයි

## කිඹුලන් ගම් වදින හැඩක්

කිළිනොච්චියේ ස්කන්ධපුරම් මරවන්පුලන් ආරූ ඔය මේ දිනවල සිඳී යාමත් සමගම එම ඔයේ ජීවත් වූ කිඹුලන් ගම් වදින්නට පටන් ගෙන තිබේ.

කිළිනොච්චියේ ස්කන්ධපුරම් ප්‍රදේශයේ ජනතාව කිඹුලන් සිය නිවෙස් වලට බඩගාගෙන විත් කොතැනක හෝ සැඟවේ යැයි යන බියෙන් යුතුව ජීවත් වෙති.

මේ කිඹුලන් අතර හැලි කිඹුලන් සුදු කිඹුලන් මෙන්ම ගැට කිඹුලන්ද සිටින අතර ඔවුන් දහවල් කාලයට ඔයේ ජලය සිඳුණු ස්ථාන වලට වී ඉර අව්ව තපින අයුරු මේ දිනවල දැකිය හැකිය.

රාත්‍රී කාලයට ඔවුන් ඔය දිගේ පැමිණ කාගේ හෝ නිවසක් තුළට රිංගා ගන්නේ වතුර ප්‍රශ්නය කිළිනොච්චියේ වැසියන්ට වඩා කිඹුලන්ට වඩා තදින් දැනී ඇති නිසාය.

■ රූපිකා කේ .බණ්ඩාර - කුරුවිට සමූහ





# කුරුවිට නගරය දෙවන අදියරෙන් සංවර්ධනය වන හැඩක්

කුරුවිට එදා සිරිපා වන්දනාකරුවන්ට කෝපි සැපයූ කඩමණ්ඩියක් අද වනවිට සැලකිය යුතු සංවර්ධනයක් සිදුවී තිබුණත් ඒ ක්‍රමවත්ව නොවේ. දෛනික සංසරණ ජනගහනය විසිදහසක් පමණ වන කුරුවිට නගරය විවේකී නගරයක් ලෙස සංවර්ධනය කිරීමේ දෙවන අදියර ඉකුත්දා ආරම්භ කෙරිණි.

මේ යටතේ ප්‍රාදේශීය සභාව මගින් දහසකට පමණ රැස්විය හැකි සම්මන්ත්‍රණ ශාලාවක් ඉදිකිරීමට මුල්ගල තැබීම, සෞඛ්‍ය අමාත්‍ය පවිත්‍රා වන්නිආරච්චි, සබරගමු පළාත් හිටපු අමාත්‍ය රංජිත් බණ්ඩාර, කුරුවිට ප්‍රාදේශීය සභා සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහත්ම මහත්මින්ගේ ප්‍රධානත්වයෙන් සිදු කෙරිණි. අවිස්සාවේල්ලේ සිට රත්නපුරයට යනතුරු දහසකට පමණ රැස්විය හැකි ස්ථානයක් නැති බැවින් මෙය ඉතා කාලෝචිත ක්‍රියාවක් බව ජනතාව පවසති.

දිනක් තුළ නැරඹීමට ඓතිහාසික, ආගමික ස්ථාන තිබෙන බැවින් නගරය සංවර්ධනය වනුයේ සංචාරක කර්මාන්තය කේන්ද්‍ර කර ගනිමිනි.ඓතිහාසික දෙල්ගමුව රජමහා විහාරය, බටතොට ලෙන, බටදොඹ ලෙන, බෝපත් ඇල්ල ඇතුළුව සංචාරක කර්මාන්තයට යොදාගත හැකි තවත් ස්ථානද වෙයි. එසේම සභා බලප්‍රදේශය තුළ අප්‍රකටව පවතින තවත් දියඇලි දහතුනක් හඳුනාගෙන ඒවා සංරක්ෂණය කරමින් සංවර්ධනය කොට ප්‍රසිද්ධියක් ලබාදීමට ප්‍රාදේශීය සභාව කටයුතු කරයි.

පළමු අදියරේදී ඉවත් කෙරුණු කඩ හිමියන්ට විකල්ප ස්ථාන ලබාදී තිබෙන අතර ඉතිරි පිරිසෙන් කොටසකට ලබාදීම සඳහා ප්‍රාදේශීය සභාව මගින් ඉදිකළ තවත් කඩකාමර දහසයක් ජල සැපයුම් ලබාගැනීමෙන් පසු ඔවුන්ට ලබාදීමට නියමිතය. නගරයට අභිමානයක් එක්කරන මෙම පැරණි ගොඩනැඟිලි කීපය අවට නවීන පන්නයේ කුඩා වෙළෙඳකුටි ඉදිකොට දේශීය ආහාර හා දේශීය නිෂ්පාදන අලෙවි කිරීමේ වැඩපිළිවෙළක්ද ක්‍රියාවට නංවයි.

නගර සංවර්ධනයට සමගාමීව නගරය මැදින් ගලාබස්නා කුරු ගඟේ සුන්දරත්වය නැරඹීම සඳහා නැරඹුම් කුටිද ඉදිකරනු ලබයි. දැනට තාවකාලික ස්ථානයක පවත්වන සතිපොළ සඳහා වාණිජ ගොඩනැඟිල්ලක්ද සභාව මගින් ඉදිකිරීමට කටයුතු කෙරේ.

■ අනුරාධපුර මධ්‍යම විශේෂ-ඩී.එම්.විජේසූරිය

# පුරාවිද්‍යා මැණික් මුට්ටියක් ගොඩ ගත් හිටපු කොස්තාපල් ඇතුළු 4කට දඩ

රජ සමයේ වළදැමූ බව කියන මැණික් මුට්ටියක් ගොඩගැනීම සඳහා පුරාවිද්‍යා බිමක් ලෙස පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නම්කළ ස්ථානයක කැණීමක් සිදුකළ බවට අධිකරණය හමුවේ වරද පිළිගත් පොලිස් විශේෂ කාර් ය බළකායේ හිටපු කොස්තාපල්වරයෙකු ඇතුළු සිවුදෙනෙකුට රුපියල් ලක්ෂ හතරක දඩ මුදලක් ගෙවන ලෙස අනුරාධපුර ප්‍රධාන මහේස්ත්‍රාත් අතිරේක දිසා විනිසුරු ජනක ප්‍රසන්න සමරසිංහ මහතා (23දා) නියෝග කළේය.

පොලිස් අත්අඩංගුවට පත්වීමෙන් අනතුරුව රක්ෂිත බන්ධනාගාර ගතව සිටි පොලිස් කොස්තාපල්වරයා ඇතුළු දෙදෙනාට අමතරව පෙරේදා (23දා) දිනයේ නීතිඥවරුන් දෙදෙනෙකු මගින් අධිකරණයට බාරවූ පොලිස් වැටලීම අවස්ථාවේ පළාගිය සැකකරුවන් දෙදෙනා ඇතුළු සිවුදෙනාට රුපියල් ලක්ෂය බැගින් රුපියල් ලක්ෂ හතරක දඩ මුදලක් ගෙවන ලෙස විනිසුරුවරයා නියෝග කළේය.

දඩ නියමවූයේ කසමඩුව මිහින්තලය පදිංචි පියවර් ධනගේ ලලිත් සේනානායක කටුනේරිය නිට්ටඹුව පදිංචි විජේවර්ධන කුලසූරිය බූසා මධු ප්‍රගීත් කනිෂ්ක පොතාන ඉහලගම මිහින්තලය පදිංචි අමිල සුගත් ගුණතිලක කටුනේරිය නිට්ටඹුව පදිංචි තුරණ පටබැඳිගේ මුරුන් අසංක පෙරේරා යන විත්තිකරුවන්ටය.

පසුගිය මස (22දා)අනුරාධපුර කොට්ඨාසයේ පිහිටි පුරාවස්තු ආරක්ෂණ විශේෂ පොලිස් ඒකකයට ලැබුණු තොරතුරකට අනුව මිහින්තලය පොලිස් වසමේ කසමඩුව කන්නි මඩුව ප්‍රදේශයේ සිදුකල වැටලීමේදී සැකකරුවන් දෙදෙනෙකු පොලිස් අත්අඩංගුවට පත්වී තිබුණු අතර එම කැණීමට සමබන්ධවී සිටි තවත් දෙදෙනෙකු පොලිස් කණ්ඩායම වැටලීම සිදුකරද්දී පලාගොස් තිබුණි.

සැකකරුවන් අධිකරණයට ඉදිරිපත් කළ පොලිස් සැරයන් සෙනරත් විජේකෝන් මහතා ඇතුළු නිලධාරින් කියා සිටියේ මීට වසර කිහිපයක සිටම පුරාවිද්‍යා ස්ථානයේ මැණික් මුට්ටියක් ඇති බවට පැවත යන ජනප්‍රවාදය අනුව විවිධ පුද්ගලයන් එය ගොඩගැනීම සඳහා උත්සහ දරා තිබෙන බවයි.සැකකරුවන් අතර සිටිනා පොලිස් විශේෂ කාර් ය බලකායෙන් පලාවිත් සිටින ප්‍රධාන සැකකරු පුරාවිද්‍යා ස්ථානය නැවත හාරා මැණික් මුට්ටිය ලබාගැනීමට උත්සහ දරා ඇති බව නඩු මෙහෙයුම් නිලධාරින් අධිකරණයට දැන්වූහ.

වැටලු ස්ථානය කසමඩුව හේන් යායක් ආසන්නයේ තිබෙනා බවත් එම ස්ථානය පුරාවිද්‍යා ස්ථානයක් බවට පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල් වරයා විසින් තහවුරු කර තිබෙන බවත් එම ස්ථානයේ තිබි අඩි පහ හා හය බැගින් වන පුරාණ ගල්කණු කිහිපයක් පොලිසියට හමුවූ බවත් කැනීම් සිදුකිරීම නිසා පුරාවිද්‍යා ස්මාරකයන්ට හානි සිදුව තිබෙනා බවත් පොලිසිය අධිකරණයට දැන්වූවේය.

සැකකරුවන් අඩි 17ක් ගැඹුර පළල අඩි පහක් හා දිග අඩි අටක් වන ලෙස ස්ථානය හාරා තිබු බවත් අත්අඩංගුවටගත් ප්‍රධාන සැකකරු වන පොලිස් විශේෂ කාර්ය බළකා සෙබළා වසර 11කට පෙර සේවයෙන් පළාවිත් සිටින්නෙකු බව පොලිසිය මීට පෙර අධිකරණයට දැන්වුවේය.

පුරාවිද්‍යා ස්මාරක පිහිටි ස්ථානයක නිසි බලධාරියෙකු විසින් නිකුත් කල බලපත්‍රයක් නොමැතිව කැනීම් සිදුකිරිම හා පුරාවිද්‍යා ස්මාරකයන්ට හානි සිදුකිරිම යන චෝදනාවන්ට සැකකරුවන් සිවුදෙනා අධිකරණය හමුවේ වරද පිළිගැනිමෙන් පසුව විනිසුරුවරයා දඩ නියම කළ අතර ඔවුන් දඩ මුදල් ඒ අවස්ථාවේ ගෙවා දැමූහ.

අනුරාධපුර කොට්ඨාසභාර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි කේ.එල් ගීගනගේ මහතාගේ උපදෙස්මත අනුරාධපුර කොට්ඨාශ අපරාධ විමර්ශන අංශයේ ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක බණ්ඩාර විජේකෝන් මහතාගේ මෙහෙයවීමෙන් පොලිස් සැරයන් වීරකෝන් 36446 පොලිස් කොස්තාපල් 23118 පෙරේරා යන මහත්වරුන් සැකකරුවන් අධිකරණයට ඉදිරිපත් කරමින් කරුණු දැක්වූහ.

සුනිල් ශාන්ත - කළුතර මධ්‍යම විශේෂ

# මොරොන්තුඩුව නගරය සංවර්ධනයට ව්‍යාපෘති රැසක්



මොරොන්තුඩුව නගරය නවීන පහසුකම්වලින් යුක්ත වූ සංවර්ධිත හා පහසුකම්වලින් සමන්විත වූ අංග සම්පූර්ණ නගරයක් බවට පත් කිරීමට නාගරික සංවර්ධන අධිකාරියෙන් සංවර්ධන ව්‍යාපෘති රැසක් ක්‍රියාත්මක කරන බව කළුතර දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී හා ගුදම් පහසුකම්, බහලුම් අංගණ, වරාය පහසුකම්,බෝට්ටු හා නැව් කර්මාන්ත රාජ්‍ය ඇමැති ජයන්ත සමරවීර මහතා පැවැසීය.

රාජ්‍ය ඇමැතිවරයා එසේ පැවැසුවේ පසුගිය දින (18) මොරොන්තුඩුව ශ්‍රී මහා බෝධි විහාරස්ථානයේ පැවැති මොරොන්තුඩුව නගර සංවර්ධන ව්‍යාපෘති මහජන රැස්වීමට සහභාගි වෙමිනි.

රාජ්‍ය ඇමැති ජයන්ත සමරවීර මහතා මෙසේ කීය. අපි මොරොන්තුඩුව නගරය සංවර්ධනය කොට එය ඉතා ලස්සන නගරයක් බවට පත් කිරීමට යෝජනා කරල ඒ සඳහා හොඳ සැලැස්මක් සකස් කළේ ගරු දිනේෂ් ගුණවර්ධන මහතා නාගරික සංවර්ධන ඇමතිවරයා වශයෙන් හිටපු කාලෙමයි. ඒත් ඒ යෝජනාවට ආණ්ඩු වෙනස් වීමත් සමගම ඒ ඒ දේශපාලනකයන්ගේ තිබූ නොසැලකිල්ල හා අඩු උනන්දුව නිසා යට ගියා. ජනාධිපතිවරයාගේ සහ අගමැතිවරයාගේ උපදෙස් මත ගෙන ඇති මේ සුබදායක තීන්දුව නුදුරු අනාගතයේදී ම ක්‍රියාත්මක කිරීමට නියමිතයි.

බස්නාහිර පළාත් නාගරික සංවර්ධන අධිකාරියේ නගර සැලැසුම් අංශයේ අධ්‍යක්ෂ වයි.ඒ.පී.කේ. ගුණතිලක මහතා - මේක නාගරික සංවර්ධන අධිකාරියේම සැලැස්මක් නොව ඔබේ සැලැස්මක් කියල හිතන්න. අපි සකස් කරන සැලැස්ම ඔබට අපි මෙතනදී ඉදිරිපත් කරනවා. ඔබේ අදහස් යෝජනා හා අවශ්‍යතාත් අපි සලකා බලා ඒ අනුව අවශ්‍ය වෙනස්කම් කරන්න පුලුවන්.

ඒ අනුව බස් නැවතුම් පොළක්, ආර්ථික මධ්‍යස්ථානයක්, ළමා උද්‍යානයක්, පරිපාලන ගොඩනැගිල්ලක්, ඇවිදීමේ මංතීරු, දිවා සුරැකුම් මධ්‍යස්ථානයක්, මහජන පුස්තකාලයක්, රථ ගාලක් ඉදි කිරීමට යෝජනා වී ඇති අතර මොරොන්තුඩුව පොලිස් ස්ථානය, මොරොන්තුඩුව ධම්මානන්ද මහා විද්‍යාලය සහ ගෝනදුව රෝහල දියුණු කරන ලෙස බස්නාහිර පළාත් ප්‍රධාන සංඝනායක සමස්ත ලංකා ශාසනාරක්ෂක බල මණ්ඩලයේ ලේකම් ගෝනදුවේ ගුණානන්ද නාහිමියෝ මේ සාකච්ඡාවේ දී ඉල්ලීමක් කළහ.

සීගිරිය විශේෂ

# නාවුල අසරණ පවුලකට ඔබේ උදව් ඕනෑ



## පවුලේ හය දෙනාගෙන් තුන් දෙනෙක් වකුගඩු රෝගයෙන්

දැඩිව රෝගාතුරවී ජීවත් වන පවුලක හය දෙනෙක් පිළිබඳ දුක්මුසු පුවතක් නාවුල අඹන සේනාගම ප්‍රදේශයෙන් වාර්තා විය.

මේ හය දෙනකුගෙන් යුත් පවුලේ තුන් දෙනකුට වකුගඩු රෝගය වැලඳී දැඩි අසාධ්‍ය තත්ත්වයේ පසුවේ. මුළු පවුලෙම බර කරට ගෙන ඔවුන් ජීවත් කරවූ 52 හැවිරිදි මව මේ වන විට උගුරේ ආබාධයකට ලක්ව ප්‍රතිකාර ගනිමින් සිටින්නීය.

ශානක නුවන් නැමැති 23 හැවිරිදි වැඩිමහලු දරුවා මේ වනවිට දරුණු වකුගඩු රෝගයකට ලක්ව සතියකට තුන්වරක් ලේ පිරිසුදු කිරීම සඳහා මහනුවර රෝහලට රැගෙන යා යුතුය. එමෙන්ම වයස අවුරුදු නවයක් වූ කුඩා දරුවා පාසල් අධ්‍යාපනයකින් තොරව ආබාධිත තත්ත්වයේ පසුවේ. යම් මට්ටමකින් හෝ නිරෝගී තත්ත්වයකින් සිටින දහතුන් හැවිරිදි දරුවකු අධ්‍යාපනය ලබන අතර රුපියල් 2000ක මුදලක් පාසලට ගෙවීමට නොහැකිවීම නිසා ඔහු ද පාසල් ගමන අතරමග නවතා දැමීමට යයි.

කෝන්ගහවෙල අම්බන ප්‍රදේශයේ පිහිටි සේනාගම නම් වූ ඇති දුෂ්කර ග්‍රාමීය ප්‍රදේශයේ පදිංචිව සිටින කේ.ජී.ජී. කපිලරත්නගේ පවුලේ උදවිය මෙසේ දැඩි රෝගාබාධවලට ලක්ව ජීවත් වෙති.

මේ පවුලේ වැඩිමහලුම පුද්ගලයා බවට පත්ව ඇත්තේ අසූ තුන් හැවිරිදි යූ.ජී. හීන්බණ්ඩාය. ඔහු මේ වන විට වකුගඩු රෝගියෙකි. ප්‍රතිකාර ලබමින් ජීවිතයත් මරණයත් අතර සටනක සිටියි. කේ.ජී.ජී. කපිලරත්න වයස අවුරුදු 56කි. මේ පවුලේ දරුවන්ගේ පියා ය. ඔහු ද වකුගඩු රෝගයකට ලක්ව ප්‍රතිකාර ලබන අතරතුර දී ම සතියකට වරක් කුලී වැඩකට ගොස් දරුවන් පෝෂණය කරයි.

අඹන සේනාගම සිට මහනුවර රෝහලට දිනකට ප්‍රවාහන ගාස්තු සඳහා රුපියල් 3500ක මුදලක් ඔවුන්ට වියදම් වෙන බව කියයි. ඇතැම් දිනවල එම මුදල සොයා ගැනීමට නොහැකි බවද ඔවුහු හඬා වැටෙමින් කියති.

මේ අසරණ පවුලට යම්කිසි හෝ අයකු උපකාරයක් කිරීමට කැමැති නම් ඔවුන්ගේ ලිපිනය යූ .ජී. රන්මැණිකා අංක 06, සේනාගම, අඹාන, කෝන්ගහවෙල ලිපිනයෙන් හෝ 0774582436 දුරකථන අංකයෙන් විමසිය හැකි අතර නාඋල ලංකා බැංකුවේ ගිණුම් අංක 4991746 යූ .ජී. රන්මැණිකා යන නමින් විවෘත කොට තිබේ.

එන්. නවරත්න - මීගහකිවුල සමූහ

# උමා ඔය රක්ෂිතයේ වැලි ගොඩදැමූ අයෙක් කොටුවෙයි

බලපත්‍රයක් නොමැතිව උමා ඔය රක්ෂිතයේ වැලි ගොඩදැමූ බව කියන පුද්ගලයකු ඔහු සතුව තිබූ වැලි ගොඩ දැමීමට යොදා ගන්නා බාල්දි, සවල් ඇතුළු උපකරණ තොගයක්ද සමඟ පසුගියදා (22) අත්අඩංගුවට ගත් බව කන්දකැටිය පොලීසිය පවසයි.

මෙලෙස අත්අඩංගුවට ගෙන ඇත්තේ කන්දකැටිය වාසනාගම ගලඋඩ පදිංචි වයස අවුරුදු 33ක පුද්ගලයෙකි. පොලීසිය වෙත ලද තොරතුරක් මත සිදුකළ වැටලීමකදී සැකකරු අත්අඩංගුවට ගැනීමට හැකි විය.

දිසත - දස අත ම එක තැන

එන්. නවරත්න - මීගහකිවුල සමූහ

## බිරියට පහර දුන් අයට වැඩ වරදී

තම බිරියට පහරදුන් බව කියන කන්දකැටිය 22 කණුව ප්‍රදේශයේ පුද්ගලයකු පසුගියදා (22) සැකපිට අත්අඩංගුවට ගත් බව කන්දකැටිය පොලීසිය පවසයි.

මෙලෙස අත්අඩංගුවට ගෙන ඇත්තේ කන්දකැටිය 22 කණුව ප්‍රදේශයේ පදිංචි වයස අවුරුදු 32ක පුද්ගලයෙකි.

සිය සැමියා විසින් පහර දුන් බව පවසමින් මෙම කාන්තාව තම සැමියාට එරෙහිව කරන ලද පැමිණිල්ලක් මත සැකකරු මෙලෙස කන්දකැටිය පොලීසිය මගින් අත්අඩංගුවට ගෙන ඇත. අත්අඩංගුවට ගත් සැකකරුට එරෙහිව ගෘහස්ථ හිංසනය යටතේ නඩු පැවරීමට කටයුතු කරන බව ද පොලීසිය පැවැසීය.

එස්.ජී. විජේරත්න - කටුගස්තොට සමූහ

## රන්මාල කොල්ල කෑ දෙදෙනෙක් අත්අඩංගුවට

අලවතුගොඩ, මැණික්හින්න හා වත්තේගම යන පොලිස් බල ප්‍රදේශවල රන්මාල කොල්ල කෑ පුද්ගලයන් දෙදෙනකු අලවතුගොඩ පොලීසියේ නිලධාරීන් පිරිසක් විසින් අත්අඩංගුවට ගෙන තිබේ.

මෙසේ අත්අඩංගුවට ගත් පුද්ගලයින් දෙදෙනා කටුගස්තොට හා පොල්ගොල්ල ප්‍රදේශවල පදිංචිකරුවන් බවත් ඔවුන් දෙදෙනා මත්ද්‍රව්‍යවලට ඇබ්බැහිවූ අයවලුන් බව ද පොලීසිය විසින් අනාවරණය කරගෙන ඇත.

සැකකරුවන් විසින් සොරාගන්නා ලද බව පැවැසෙන රන්මාලයක් මහනුවර පිහිටි රන්භාණ්ඩ උකස් මධ්‍යස්ථානයකට උකස් කර තිබියදී පොලීසිය සොයාගෙන තිබේ.

අයි.එම්.වී.සී. ගුණසේකර - ඇල්පිටිය සමූහ

# ජනතාවත් නැති කලාවත් නැති බෙන්තර ජනකලා කේන්ද්‍රය

## දකුණු පළාත් සභාවේ ඇස් කන් වැහිල ද?



සංචාරක කර්මාන්තයේ තෝතැන්නක් ලෙස ප්‍රචලිත බෙන්තොට ප්‍රදේශයේ පිහිටි දේශීය, විදේශීය සංචාරකයන්ගේ සිත්ගන්නා සුළු ආයතන අද දිනෙන් දින පරිහානියට යන ස්ථාන බවට පත්වෙමින් තිබෙන බව ප්‍රදේශවාසිහු පවසති.

බෙන්තොට සංචාරක පුරවරය කේන්ද්‍ර කර ගනිමින් ඉදුරුව වරාහේන ප්‍රදේශයේ ස්ථාපිත කර ඇති ජනකලා කේන්ද්‍රය මෙසේ පරිහානියට පත්වෙමින් පවතින ආයතන අතරින් එකකි.

දකුණු පළාත් සභාව විසින් මේ ජනකලා කේන්ද්‍රය මේ ස්ථානයේ පිහිටුවා ඇත්තේ 1991 වසරේදීය.

මෙහි විවිධ කලා ශිල්ප පුහුණු කිරීම සඳහා ඉදිකර තිබූ ගොඩනැගිලි අතරින් ගොඩනැගිලි දහයකට අධික සංඛ්‍යාවක් මේ වන විට කිසිදු ප්‍රයෝජනයකට නොගෙන අතහැර දමා ඇතැයි ප්‍රදේශවාසීහු පවසති.

කොළඹ ගාල්ල ප්‍රධාන මාර්ගයේ අක්කර තුනක පමණ වූ භූමියක ඉතා අලංකාර ලෙස ඉදිකෙරුණු මෙහි ගොඩනැගිලිවල අත් යන්ත්‍ර, රෙදිපිළි, සම් භාණ්ඩ, දැව කැටයම්, අත්කම්, බතික්, පිත්තල භාණ්ඩ, කම්මල් භාණ්ඩ,වෙනත් විසිතුරු භාණ්ඩ, පන් හා බටපතුරු, චිත්‍ර, කළාල ඇතුළු අංග ගණනාවක් ප්‍රගුණ කිරීමේ පාඨමාලා පවත්වා ඇත. මෙහි නිෂ්පාදනය කරන එම නිර්මාණ හා වෙළෙඳ භාණ්ඩ අලෙවියෙන් විශාල විදේශ විනිමයක්ද ලබා දී ඇති අතර එමගින් රැකියා විරහිත තරුණ තරුණියන් සැහෙන පිරිසකට පුහුණුවක් මෙන්ම ආදායමක්ද ලැබී තිබේ.

උකුස්ස ඇස

ukusuase@lakehouse.lk

මේ වන විට එම ගොඩනැගිලිවල බිත්ති පුපුරා වහල සෙවිළි තහඩුද ගැලවී යාමෙන් වැස්සෙන් හා අව්වෙන් එම ගොඩනැගිලි විනාශමුඛයට පත්ව ඇත.



එසේම මේ ගොඩනැගිලිවල වූ සරනේරු, යතුරු තහඩු , විදුලි උපාංග ඇතුළු වටිනා දේවල් රාත්‍රී කාලයට හොරු ගලවාගෙන ගොස් ඇති බවද සමහර විට මේ ස්ථානය නොයකුත් සමාජ විරෝධී වැඩ සඳහා යොදාගන්නා තැනක් බවට ද පත්ව ඇතැයි ප්‍රදේශවාසීහු පවසති.



මෙහි ළමා ක්‍රීඩාංගණයක් ද ඇති අතර එයද කිසිදු ප්‍රයෝජනයකට නොගෙන වල්වදිමින් පවතින බව ජනතාව කියති. එම උද්‍යානයේ වූ ක්‍රීඩා භාණ්ඩද මළකඩ කමින් දිරාපත්වෙමින් පවතී. ඉතා අලංකාර ලෙස නිර්මාණය කර තිබූ මත්ස්‍ය තටාකයද අතහැර දැමූ ස්ථානයකි. එය ප්‍රදේශයේ සෞඛ්‍යටද තර්ජනයක් වන ලෙසින් මැසි මදුරුවන් බෝවන ස්ථානයක් බවට පත්වී ඇත.

දෙස් විදෙස් සංචාරකයන්ගේ සිත් ඇදගන්නා ලෙස මෙහි ඉදිකර තිබූ සෙක්කුව,වී බිස්ස,ඇතුළු නිර්මාණ රාශියක් මෙහි ස්ථාපිත කර තිබුණද අද දකින්නට ඇත්තේ ඒවායේ නටබුන් පමණි.

ලියාපදිංචි අංක : PV 00227710,
ලියාපදිංචි ලිපිනය : නො. 155ඒ, විලියම් ගොපල්ලව මාවත, මහනුවර.
ලියාපදිංචි දිනය : 21.09.2020
සමාගම් ලේකම්.

---

## දැන්වීමයි

වර්ෂ 2007 අංක 07 දරන සමාගම් ආඥා පනතේ 9(1) ඡේදය යටතේ පහත සඳහන් සමාගම සංස්ථාගත කළ බව දැනුම් දෙමු.

සමාගමේ නම :
**සන්ෂියා ඕස්- ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්**
ලියාපදිංචි දිනය : 2017 ජූලි 21
සමාගමේ අංකය : පීවී 124098
ලියාපදිංචි ලිපිනය :
40/8 ජේ (J), හීල්පැන්කඳුර මාවත, මහනුවර.
දිනය : 2020 සැප්තැම්බර් 25
**අධ්‍යක්ෂක මණ්ඩලය හා ලේකම්**

---

හම්බන්තොට දිස්ත්‍රික්කයේ ඕකෙවෙල ප්‍රා.ලේකම් කොට්ඨාශයේ විදුමිණි, ඕලුආර, වලස්මුල්ල ලිපිනයේ පදිංචි **විජමුණි ආරච්චිගේ අමරවීර** වන මම මෙතැන් සිට **විජයමුණි ආරච්චිගේ අමරවීර** යනුවෙන් භාවිත කරනු ලබන බව ලංකාවාසී සියලු දෙනාටම මෙයින් දන්වා සිටිමි.

**මෙයට,**
**විජයමුණි ආරච්චිගේ අමරවීර**

---

# ලංසු සඳහා ආරාධනයයි

**කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග, ධීවර, සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සහ ගොවිජන සංවර්ධන පිළිබඳ අමාත්‍යාංශය**

## බස්නාහිර පළාත

බස්නාහිර පළාත් කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග, ධීවර, සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සහ ගොවිජන සංවර්ධන පිළිබඳ අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන විශේෂ ව්‍යාපෘති හා සම්බන්ධ පහත දැක්වෙන කාරණාවලට අදාළව අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් මුද්‍රා තබන ලද ලංසුපත් කැඳවනු ලැබේ.

**භාණ්ඩ -**

**(අ) හෝමාගම කෘෂිකර්ම පුහුණු මධ්‍යස්ථානයේ ඉදිකරන කොම්පෝස්ට් නිෂ්පාදන ව්‍යාපෘතිය සඳහා අවශ්‍ය යන්ත්‍රෝපකරණ මිලදී ගැනීම.**

| # | යන්ත්‍රෝපකරණයේ නම | ආපසු නොගෙවන ගාස්තුව | ලංසු සුරක්ෂණයේ වටිනාකම |
|---|---|---|---|
| 1 | Double Shaft Shredder Machine | රු. 3,500.00 | රු. 110,000.00 |
| 2 | Material Mixing Machine | | |
| 3 | Compost Crushing Machine | | |
| 4 | Compost Sieving Machine | | |
| 5 | Skid Steer Loader | | |
| 6 | Conveyers (2 Nos) | | |
| 7 | Compost Pile Turning Machine | | |

**(ආ) පොහොර පර්යේෂණාගාරය සඳහා අවශ්‍ය විද්‍යාගාර උපකරණ මිල දී ගැනීම**

| # | උපකරණයේ නම | ආපසු නොගෙවන ගාස්තුව | ලංසු සුරක්ෂණයේ වටිනාකම |
|---|---|---|---|
| 1 | Analytical Balance with four Decimals | රු. 4,000.00 | රු. 190,000.00 |
| 2 | Microwave Digestion System | | |
| 3 | Inductively Coupled Plasma - Optical Emission Spectrometer (ICP-OES) | | |
| 4 | Bio safety cabinet Class II Type A2 | | |
| 5 | Fume hood | | |
| 6 | Flame Photometer | | |
| 7 | UV Visible Spectrophotometer | | |
| 8 | Kjeldahl Analyzer | | |

**(ඇ) පළතුරු හා එළවළුවලින් අගය එකතු කළ නිෂ්පාදන සැකසීම (ටින් කිරීම, විජලනය කිරීම හා ඇසුරුම්කරණය)**

| # | උපකරණයේ නම | ආපසු නොගෙවන ගාස්තුව | ලංසු සුරක්ෂණයේ වටිනාකම |
|---|---|---|---|
| 1 | Slicing/ Cutting Machine | රු. 3,500.00 | රු. 150,000.00 |
| 2 | Chunk Cutter | | |
| 3 | Juice Extractor | | |
| 4 | Semi Auto Lug Capper | | |
| 5 | Steam Jacketed Pan | | |
| 6 | Steam Generator (Boiler) and the Utility supply | | |
| 7 | Sterilizer | | |
| 8 | Kerosene Hot Air Dryer | | |
| 9 | SS Washing Tank 6ft x 4ft x 3 1/2ft (LxWxH) | | |
| 10 | Vacuum Packing Machine | | |
| 11 | Fruit Pulper | | |
| 12 | Double Head Filling Machine | | |
| 13 | Air Compressor | | |
| 14 | Continuous Sealing Machine | | |
| 15 | 2 Ton Chiller for Fruits & Vegetables | | |
| 16 | SS Table | | |

**(ඈ) වල්පිට දිස්ත්‍රික් කෘෂිකර්ම පුහුණු මධ්‍යස්ථානයේ පැරණි ගොඩනැගිල්ල අලුත්වැඩියා කිරීම**

| ව්‍යාපෘතියේ නම | ආපසු නොගෙවන ගාස්තුව | ICTAD ලියාපදිංචිය | ලංසු සුරක්ෂණයේ වටිනාකම |
|---|---|---|---|
| පළතුරු හා එළවළුවලින් අගය එකතු කළ නිෂ්පාදන සැකසීමේ ව්‍යාපෘතිය සඳහා වල්පිට දිස්ත්‍රික් කෘෂිකර්ම පුහුණු මධ්‍යස්ථානයේ පැරණි ගොඩනැගිල්ල අලුත්වැඩියා කිරීම | රු. 4,000.00 | C6 හෝ ඉහළ | රු. 200,000.00 |

1. ජාතික තරගකාරී ලංසු ඇගයීමේ කාර්ය පටිපාටිය අනුව මෙම ප්‍රසම්පාදන ක්‍රියාවලිය සිදුකරනු ලැබේ.
2. මෙම (අ), (ආ), (ඇ) සහ (ඈ) ව්‍යාපෘති එකිනෙකින් වෙන් ව ක්‍රියාත්මක කරනු ලබන අතර ඒ සඳහා වෙන වෙනම ලංසු ලේඛන මිලට ගෙන ඉදිරිපත් කළ යුතුය.
3. (අ), (ආ) සහ (ඇ) ව්‍යාපෘතිවලට අදාළව සමස්ත විසඳුම් ලබා දෙන ලංසුකරුවන් වෙත වැඩි අවධානය යොමු කරනු ලැබේ.
4. අමාත්‍යාංශ ලේකම් වෙත ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත් කර ආපසු නොගෙවනු ලබන ලංසු ගාස්තුව මුදලින් ගෙවා ලංසු ලියවිලි කට්ටල 2020.09.30 දින සිට 2020.10.13 දින තෙක් රජයේ වැඩ කරන දිනවලදී පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා පහත සඳහන් ලිපිනයෙහි පිහිටා ඇති බස්නාහිර පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශයේ ආයතන අංශය වෙතින් ලබා ගත හැකිය.
5. ලියාපදිංචි තැපෑලෙන් හෝ අමාත්‍යාංශයේ ගිණුම් අංශයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලීමෙන් හෝ ලංසු ඉදිරිපත් කළ හැකි අතර 2020.10.14 දින පහත දැක්වෙන වේලාවන් දක්වා ලංසු භාරගනු ලැබේ. භාරගන්නා වේලාව අවසන් වූ වහාම අමාත්‍යාංශ ශ්‍රවණාගාරයේදී එම ලංසු විවෘත කරනු ලැබේ.
   (අ) ව්‍යාපෘතිය - පෙ.ව. 10.00
   (ආ) ව්‍යාපෘතිය - පෙ.ව. 10.45
   (ඇ) ව්‍යාපෘතිය - පෙ.ව. 11.30
   (ඈ) ව්‍යාපෘතිය - ප.ව. 12.15
6. එම අවස්ථාව සඳහා ලංසුකරුට හෝ ලිඛිත අවසරයක් ලත් ඔහුගේ බලයලත් නියෝජිතයෙකුට සහභාගි විය හැකිය.
   ප්‍රමාද වී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ.
7. මහ බැංකුවේ ලියාපදිංචි මූල්‍ය ආයතනයකින්, **"ලේකම්, කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග, ධීවර, සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සහ ගොවිජන සංවර්ධන පිළිබඳ අමාත්‍යාංශය (බස්නාහිර පළාත)"** නමින් ලබාගත්, ඉහත සඳහන් ආකාරයේ ලංසු සුරක්ෂණයක් ඉදිරිපත් කළ යුතුය.
8. (අ), (ආ) සහ (ඇ) ව්‍යාපෘතිවලට අදාළ ලංසු මිල ගණන් 2020.12.31 දින තෙක් වලංගු විය යුතුය.
9. මෙම ප්‍රසම්පාදනය සම්බන්ධයෙන් බස්නාහිර පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශයේ ප්‍රසම්පාදන කමිටුවේ සභාපතිගේ තීරණය අවසන් තීරණය වේ.
10. වැඩිදුර විස්තර අවශ්‍යවන්නේ නම් දුරකථන අංක 011-2092660 මගින් බස්නාහිර පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශයේ සහකාර ලේකම් ඇමතීමෙන් ලබාගත හැකිය.

**සභාපති,**
**අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව,**
**කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග, ධීවර, සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සහ ගොවිජන සංවර්ධන පිළිබඳ අමාත්‍යාංශය - බස්නාහිර පළාත**
**7වන මහල, 204, බස්නාහිර පළාත් සභාව,**
**ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.**

---

# ආයුර්වේද දෙපාර්තමේන්තුව - සබරගමුව පළාත

## 2021 වර්ෂය සඳහා ආරක්ෂක, සනීපාරක්ෂක, කිළිටි රෙදි සේදීමේ සේවාවන් හා වියළි දර, වියළි ඖෂධ සැපයුම් සඳහා වන ලංසු ආරාධනයයි

සබරගමුව පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුවට අයත් පහත සඳහන් ආයුර්වේද රෝහල් සඳහා 2021 වර්ෂයට ඉහත සඳහන් සැපයුම් හා සේවාවන් සැපයීම සඳහා ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් හා ආයතන වෙතින් සබරගමුව පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුවේ ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් ලංසු කැඳවනු ලැබේ.

| | සැපයුම් හා සේවාවන් | ආයතන | ආපසු නෙගෙවන ලංසු පෝරම ගාස්තුව | ලංසු බැඳුම්කර ගාස්තු රුපියල් | වත්කම් සහතික වටිනාකම |
|---|---|---|---|---|---|
| 01 | ආරක්ෂක සේවා සැපයීම | කොමසාරිස් කාර්යාලය, රත්නපුර, කෑගල්ල, පුස්සැල්ල, රක්වාන, වරකාපොල, ඇඹිලිපිටිය, වල්ගම, මොල්ලිගොඩ, මකුද්දල, මල්වත්ත, මැදබැද්ද, පනාවල හා පින්නවල පංචකර්ම ඒකකය යන ආයතන සඳහා | 3,000.00 | 58,000.00 | 500,000.00 |
| 02 | සනීපාරක්ෂක සේවා සැපයීම | කොමසාරිස් කාර්යාලය, රත්නපුර, කෑගල්ල, පුස්සැල්ල, ඇඹිලිපිටිය, පනාවල, වරකාපොළ, රක්වාන, මකුද්දල, වල්ගම, මැදබැද්ද, මල්වත්ත යන රෝහල් හා පින්නවල පංචකර්ම ඒකකය යන ආයතන සඳහා | 3,000.00 | 60,000.00 | 600,000.00 |
| 03 | ඖෂධ නිෂ්පාදනය සහ ආහාර පිසීම සඳහා වියළි දර සැපයීම | රත්නපුර, කෑගල්ල, රක්වාන, පුස්සැල්ල, ඇඹිලිපිටිය, පනාවල, මකුද්දල, මල්වත්ත, වරකාපොල, මොල්ලිගොඩ, මැදබැද්ද රෝහල් සඳහා. | 1,000.00 (එක් ආයතනයකට) | 5,000.00 (එක් ආයතනයකට) | 20,000.00 (එක් ආයතනයකට) |
| 04 | වියළි ඖෂධ සැපයීම | දෙපාර්තමේන්තු මධ්‍යම ගබඩාව, රත්නපුර. | 3,000.00 | 120,000.00 | 300,000.00 |
| 05. | කිළිටි රෙදි සේදීම | රත්නපුර, කෑගල්ල, රක්වාන, පුස්සැල්ල, ඇඹිලිපිටිය, පනාවල, මකුද්දල, මල්වත්ත, වරකාපොල, වල්ගම. මැදබැද්ද යන රෝහල් සඳහා. | 500.00 (එක් ආයතනයකට) | 1500.00 (එක් ආයතනයකට) | - |

01. ලංසු පෝරම 2020.09.28 දින සිට 2020.10.22 දින දක්වා රජයේ වැඩකරන දිනවල පෙ.ව.9.00 සිට ප.ව. 3. 00 දක්වා පළාත් ආයුර්වේද කොමසාරිස් කාර්යාලයෙන් ලබාගත හැක.
02. පහත සඳහන් ලියවිලි ඉදිරිපත් කරන කොන්ත්‍රාත්කරුවන් සඳහා පමණක් ලංසු පෝරම නිකුත් කරනු ලැබේ.
    - ජාතික හැඳුනුම්පත.
    - 2020.09.20 දින හෝ ඊට පසු ලබාගත් ප්‍රාදේශීය ලේකම්ගේ අනු අත්සනින් යුතු පොදු 170 ආකෘති පත්‍රයේ වත්කම් සහතිකය.
    - **රජයේ අනුමත සමිති** විසින් ලංසු පෝරම ලබාගැනීම සඳහා අදාළ ආයතනය තම බල ප්‍රදේශය තුළ පිහිටි බවටත් හා පැවරුවහොත් එය නියමිත පරිදි අඛණ්ඩව කර ගෙන යාමට හැකියාවක් ඇති බවටත් අදාළ ප්‍රාදේශයේ ප්‍රදේශීය ලේකම් වෙතින් ලබාගත් සහතිකය.
    - ඉහත පරිදි ලංසු පෝරම ගාස්තු පළාත් ආයුර්වේද කොමසාරිස් වෙත ගෙවා ලබාගත් රිසිට්පත.
03. ලංසු ඉදිරිපත් කිරීමේදී අප විසින් ලබා දෙන ලංසු පෝරම හොඳින් කියවා බලා ඊට අනුකූල ලෙස ලංසු ඉදිරිපත් කළ යුතුය.
04. මුද්‍රා තබන ලද ලංසු, ලේඛන පිටපත් දෙකකින් යුක්තව 2020.10.23 දින පෙ.ව. 10.00 ට පෙර ලැබෙන සේ පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ දෙපාර්තමේන්තු ටෙන්ඩර් පෙට්ටියට බහාලීම කළ හැක. ප්‍රමාද වී ලැබෙන ලංසුපත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ලංසු විවෘත කිරීම එදින පෙ.ව. 10.30 ට සිදුකරන අතර ඒ සඳහා ලංසුකරු හෝ ඔහුගේ නියෝජිතයෙකුට සහභාගී විය හැක.

**සභාපති,**
**විශේෂඥ වෛද්‍ය ඩග්ලස් පතිරගේ,**
**දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව,**
**පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුව - සබරගමුව,**
**බණ්ඩාරනායක මාවත, රත්නපුර.**
**දුරකථන අංකය: 045 - 2223147**

# ලංසු ආරාධනාවයි !

## දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - පුත්තලම

**පුත්තලම දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මගින් පහත ව්‍යාපෘති සඳහා විවෘත ලංසු කැඳවනු ලැබේ.**

| අ. අං. | ලංසු අංකය | ව්‍යාපෘතියේ නම | සීඩා ලියාපදිංචි අංකය | ආපසු නොගෙවන ලංසු තැන්පත් මුදල (රු.) | ලංසු ඇපකරය මුදල (රු.) සහ වලංගු කාලය |
|---|---|---|---|---|---|
| 01 | PU/PR/ CO/20/05 | මුන්දලම ප්‍රාදේශීය ලේකම් කාර්යාල නව ගොඩනැගිල්ල ඉදිකිරීම (2 – අදියර) (බිම් මහලෙහි වැඩ අවසන් කිරීම) | C - 5 හෝ C - 6 පමණි (ගොඩනැගිලි) | රු. 3,000.00 | රු. 135,000.00 2021.01.31 |

02. ලංසු පත්‍රිකා 2020.09.25 වන සිකුරාදා සිට 2020.10.16 වන සිකුරාදා දක්වා පෙ.ව. 9.00 සිට ප.ව. 2.30 දක්වා ඉහත සඳහන් පරිදි ගාස්තු පුත්තලම දිස්ත්‍රික් ලේකම් කාර්යාල පරිශ්‍රයේ පිහිටි ලංකා බැංකු ශාඛාව වෙත ගෙවීමෙන් පසු ලංසු ලියවිලි ප්‍රසම්පාදන ඒකකයෙන් ලබාගත හැක.

03. ලංසු පත්‍රිකා ලංසු උපදෙස් සංග්‍රහයේ 19 ඡේදයේ සඳහන් පරිදි කට්ටල දෙකකින් යුතුව සම්පූර්ණ කර මුද්‍රා තබන ලද කවරවල වෙන වෙනම බහා ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ අදාළ ලංසු අංකය සහ වැඩ විෂය සඳහන් කර 2020.10.19 වන සඳුදා ප.ව. 2.30 ට පෙර ලැබෙනසේ දිස්ත්‍රික් ලේකම් / සභාපති, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන මණ්ඩලය, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, පුත්තලම යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවන ලෙසට හෝ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ප්‍රසම්පාදන ඒකකයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ බහාලන ලෙසට දන්වමි. ප.ව. 2.30 වේලාව ඉක්ම වූ වහාම ලංසු විවෘත කිරීම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයීය ප්‍රසම්පාදන ඒකකයේ දී සිදු කරනු ලැබේ.

04. සුදුසු ආයතනයක් තෝරා ගැනීමේදී ආයතනයේ ලියාපදිංචිය, පළපුරුද්ද ඇතුළු සියලුම කරුණු පිළිබඳව සැලකිලිමත් වන බැවින් ඔබගේ පළපුරුද්ද සනාථ කිරීම සඳහා අවශ්‍ය සියලු ලියවිලිවල සහතික පිටපත් ඉදිරිපත් කිරීම අනිවාර්ය වේ.

05. ලංසු ඇගයීමේ දී පළාතේ ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවන් වෙත 5% ක ප්‍රමුඛතාවයක් ලබා දෙනු ඇත.

06. ලංසු විවෘත කරනු ලබන අවස්ථාවට ලංසුකරුට හෝ ඔහුගේ බලයලත් නියෝජිතයකුට සහභාගී වීමට අවසර ඇත.

07. ලංසු ඇපකරය බැංකු ඇපකරයක්ම විය යුතුය.

08. වැඩි විස්තර පුත්තලම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ www.puttalam.dist.gov.lk වෙබ් අඩවියෙන් සහ 032-2265233 හා 2265335 දුරකථන අංක මගින් ලබාගත හැක.

**(එල්.ජේ.එම්.ජී. චන්ද්‍රසිරි බණ්ඩාර)**
**සභාපති / දිස්ත්‍රික් ලේකම්,**
**දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන ඒකකය,**
**දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, පුත්තලම.**

**2020.09.23**

---

**1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන පනතින්) සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය)**

**7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි**

**මගේ අංකය : KOT/LND/ACQVI/01/81**

**ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංක : LD/05/2019/FR/202**

මෙහි පහත සඳහන් උප ලේඛනයේ විස්තර කරන ඉඩම රජයට අත්කර ගැනීමට බලාපොරොත්තු වේ. වැඩි විස්තර සඳහා අංක 2193/50 හා 2020.09.18 දිනැති ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රය බලන්න.

**උපලේඛනය**

| | | |
|---|---|---|
| දිස්ත්‍රික්කය | : | මාතර |
| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | : | කොටපොල |
| ග්‍රාම නිලධාරි වසම | : | කන්දිල්පාන |
| ගම | : | කිරිවැල්දොල |
| ඉඩමේ නම | : | මාණික්කවත්ත |
| සැලසුම් අංකය | : | අ.ග.පි. 125, පත්‍ර අංක 12, අතිරේක අංක 12 |
| කැබලි අංකය | : | 86 |
| ප්‍රමාණය | : | හෙක්ටයාර් 11.4960 |

**ගණේෂ අමරසිංහ**
**ප්‍රාදේශීය ලේකම්,**
**කොටපොල.**

**ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, කොටපොල.**
**2020.09.23**

---

# ප්‍රසම්පාදන දැන්වීමයි!

**පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරිය**
**(බස්නාහිර පළාත)**

**(පළාත් මාර්ග, ප්‍රවාහන, සමුපකාර, වෙළඳ, නිවාස හා ඉදිකිරීම්, වතු යටිතල පහසුකම්, කර්මාන්ත හා ග්‍රාම සංවර්ධන අමාත්‍යාංශය - බස්නාහිර පළාත)**

## සෙල්ෆ් ලෝඩර් ට්‍රක් රථ (Self Loader Truck With Winch) කුලී පදනම මත ලබාගැනීම

**ලංසු අංකය : PRDA/WP/SUP/2020/45**

මෙම අධිකාරියේ කාපට් ඇතිරීම් යන්ත්‍ර කට්ටල ප්‍රවාහනයට යොදා ගැනීම වෙනුවෙන් ඉහත සඳහන් ට්‍රක් රථ කුලී පදනම මත ලබාගැනීමට මෙවැනි සේවා සපයන්නන් වෙතින් ලංසු කැඳවනු ලැබේ. මෙම යන්ත්‍ර ප්‍රවාහන කටයුතු බස්නාහිර පළාත තුළ සිදු කිරීමට යෝජිතව ඇත.

මේ සඳහා වන ප්‍රසම්පාදන ලියවිලි කට්ටලය 2020/9/28 සිට 2020/10/08 දින පෙ.ව. 9.00 සිට ප.ව. 2.45 දක්වා මෙම අධිකාරියේ ප්‍රසම්පාදන අංශයෙන් පරීක්ෂා කර බැලිය හැකි අතර, එම ලියවිලි කට්ටලය ආපසු නොගෙවන රු. 1,080.00 ක පෝරම ගාස්තුවකට යටත්ව මෙම කාර්යාලයෙන් ලබාගත හැක.

ලංසු විවෘත කිරීම 2020/10/09 දින ප.ව. 2.30 ට අංක 59, ශාන්ත සෙබස්තියන් කන්ද, කොළඹ 12 හි පිහිටි පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරියේ ප්‍රධාන කාර්යාලයේදී සිදු කරනු ලැබේ. එම අවස්ථාවට ලංසුකරුට හෝ ඔහුගේ බලයලත් නියෝජිතයෙකුට සහභාගි විය හැකිය.

**සභාපති,**
**ප්‍රසම්පාදන කමිටුව,**
**පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරිය (බ.ප.),**
**අංක 59, ශාන්ත සෙබස්තියන් කන්ද, කොළඹ 12.**
**දුරකථන අංකය : 011-5670903**

---

# ශ්‍රී ලංකා පොලිසිය

## විශේෂ කාර්ය බළකාය

## විශේෂ කාර්ය බළකායේ භාවිතයෙන් ඉවත් කරන ලද අබලි භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

විශේෂ කාර්ය බළකායේ භාවිතයෙන් ඉවත් කරන ලද පහත අබලි භාණ්ඩ විශේෂ කාර්ය බළකාය කිරිදිවැල උප කඳවුර (මාලිගාවත්ත උපාලි ගුණරත්න ක්‍රීඩාංගණය පාර) යන ස්ථානයේදී **2020.09.30 වන දින පැය 1000 ට** ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට කටයුතු සිදු කරනු ලැබේ. විකිණීමට නියමිත අබලි භාණ්ඩ එම අවස්ථාවේදීම (2020.09.30 වන දින පැය 0830 සිට පැය 0930 දක්වා) පරීක්ෂා කර බැලිය හැකි අතර, වෙන්දේසි භූමියට ඇතුළු වීම සඳහා තම අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කළ යුතුය.

වෙන්දේසි භූමියට ඇතුළුවීම සඳහා එක් අයෙකුගෙන් ආපසු නොගෙවන රු: 300.00 ක මුදලක් අයකරනු ලැබේ. වෙන්දේසියට භාණ්ඩ ඉදිරිපත් කිරීම, ලංසු තැබීම, විකිණීම සහ ඇවර කිරීම යන සියලුම තීරණ වෙන්දේසි මණ්ඩලය විසින් ගනු ලැබේ. වෙන්දේසි මණ්ඩලයේ තීරණය අවසන් තීරණය වේ.

මිල කැඳවූ වහාම මිලට ගත් සෑම භාණ්ඩයක් සඳහාම අත්පිට මුදල් ගෙවිය යුතු අතර, චෙක්පත් භාරගනු නොලැබේ. මිලට ගත් භාණ්ඩ **2020.09.30 වන දින පැය 1700 ට** ප්‍රථම වෙන්දේසි භූමියෙන් ඉවත් කරගත යුතු අතර, එසේ ඉවත් කර නොගත්නා කිසිදු භාණ්ඩයක් සඳහා විශේෂ කාර්ය බළකාය වගකියනු නොලැබේ.

**මෙම ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණන ලබන අබලි භාණ්ඩ විස්තර සම්බන්ධ වාර්තාව පහත පරිදි වේ.**

### ලොට් අංක 01 - යකඩ වර්ග

1. විවිධ ඇඳන්
2. ලඹකැට
3. යකඩ රාක්ක
4. විවිධ පුටු වර්ග
5. අත් හිරමනා
6. ගිණි නිවන උපකරණ
7. විවිධ යකඩ බාල්දි අගල්
8. විවිධ කියත්
9. යකඩ බඳුම තාච්චි
10. වැට කපන කතුරු
11. මේසන් හැඳි
12. කල්ත්‍රොප්
13. මට්ටන් ලී
14. පිකස්
15. වීල්බැරෝ
16. සවල්
17. බර ඉසිලීමේ කට්ටල
18. රේක්ක
19. විවිධ ටියුබ් ලයිට්
20. විවිධ මේස වර්ග
21. විදුලි ඉස්ත්‍රික්ක
22. විවිධ ලාම්පු වර්ග
23. ලොකු පීරි
24. මේස තරාදි
25. ගෑස් සිලින්ඩර් කූඩා
26. උදලු තල
27. ලන්තෑරුම්
28. පොට් හැඳි
29. පෙට්‍රල් ලාම්පු
30. වාහන ජැක්
31. මේස ගෑස් ලිප්
32. පිඟන් රාක්ක
33. අඩි 4 පොඩර්
34. ගැබ්ලින් හුක්
35. විවිධ පිහි වර්ග
36. විවිධ කැති වර්ග
37. අත් මුල්ලු
38. පොරෝ තල
39. අලවංගු
40. කපන කටු
41. විවිධ මිටි වර්ග
42. වයර් කටර්
43. විවිධ ටකරන්
44. විවිධ වර්ග ඉබි යතුරු
45. GI පයිප්ප අඩි 12
46. මෙගා ෆෝන්
47. වාහන පරීක්ෂා කිරීමේ කණ්ණාඩි
48. කතුරු
49. ෆ්ලැට් තියත්
50. ඔයිල් ෆිල්ටර්
51. විවිධ යතුරු වර්ග/ රින්ච්/ ස්පැනර්
52. විවිධ කටින් තොසෙල්
53. වෙල්ඩින් ටෝච්
54. විවිධ ජැක් ට්‍රොලි වර්ග
55. පොප් රිවට් ගන්
56. විවිධ තෙල් කරඩි
57. බැරල් පම්ප් සිරිනජර්
58. චේන්ජ් ඕවර් ස්විච්
59. දැඩු අඩු
60. යකඩ බැරල්
61. රූම් හීටර්
62. රයිස් කුකර්
63. හොට් ප්ලේට්
64. ඇඩින් මැෂින්

### ලොට් අංක 02 - ඇළුමිනියම් වර්ග

1. විවිධ සාස්පාන් වර්ග
2. විවිධ තෙල් තාච්චි/ හැඳි වර්ග
3. විවිධ හැඳි වර්ග
4. මෙස් ටින්
5. විදුලි කේතල
6. ඇළුමිනියම් කිරි ගොටු
7. ඇළුමිනියම් කේතල
8. SS එනමල් පිඟන්
9. නැඹිලි
10. කොරහ
11. ඇළුමිනියම් කෝප්ප
12. ඇමිනියම් බත්දේසි
13. ඇළුමිනියම් ඉතිමන්
14. ඇන්ටනා
15. විවිධ ප්‍රමාණයේ හැලජන් ලාම්පු
16. බොයිලේරු
17. මල්ටිපොට්
18. වතුර ෆිල්ටර්
19. තෙල් ඉසින යන්ත්‍ර

### ලොට් අංක 03 - ප්ලාස්ටික් වර්ග

1. විවිධ ප්ලාස්ටික්ස් පුටු වර්ග
2. කොල කපන යන්ත්‍ර
3. මල් බාල්දි
4. ප්ලාස්ටික් ටුල්
5. විවිධ ප්ලාස්ටික් බේසම් වර්ග
6. ප්ලාස්ටික් බාල්දි
7. විවිධ ප්‍රමාණයේ බාල්දි වර්ග
8. විවිධ ප්‍රමාණයේ බැරල් වර්ග
9. විවිධ ප්‍රමාණයේ කුණු කුඩ වර්ග
10. පියුරිට් වතුර පිල්ටර්
11. ප්ලාස්ටික් බකට් කූඩා
12. එළවළු රැගෙන යන කූඩ
13. කෑම රැගෙන යන කූඩ
14. ජේලි කෑන්

### ලොට් අංක 04 - විදුලි උපකරණ වර්ග

1. කැසට් රේඩියෝ
2. විවිධ ප්‍රමාණයේ රූපවාහිනී යන්ත්‍ර
3. විවිධ ශීතකරණ වර්ග
4. ෆැක්ස් මැෂින්
5. වීඩියෝ කැමරා
6. ඡායා පිටපත් යන්ත්‍ර
7. වායු සමීකරණ යන්ත්‍ර
8. රෝනියෝ මැෂින්
9. ග්‍රිල් මැෂින්
10. තණකොළ කපන යන්ත්‍ර
11. බත් උඳුන්
12. මහන මැෂින්
13. ඇන්ගල් ගයින්ඩර්
14. වෙල්ඩින් ප්ලාන්ට්
15. විවිධ යතුරු ලියන වර්ග

### ලොට් අංක 05 - මෝටර් වර්ග

1. විදුලි හිරමන
2. විවිධ වතුර මෝටර
3. විවිධ විදුලි පංකා
4. හයි ප්‍රෙෂර් ක්ලීනර්
5. දම්වැල් කියත්
6. සෝලා පැනල්
7. උඳු අඹරන මැෂින්

### ලොට් අංක 06 - පාපැදි වර්ග

1. විවිධ පාපැදි වර්ග

### ලොට් අංක 07 - ගෑස්ලිප්/ වානේ ෆයිල් කබඩ්

1. වානේ ෆයිල් කබඩ්
2. වානේ අල්මාරි
3. වීදුරු සහිත වානේ අල්මාරි
4. විවිධ ගෑස් ලිප් වර්ග

### ලොට් අංක 08 - බැටරි වර්ග

1. විවිධ ඇම්පියර් ප්‍රමාණයේ බැටරි වර්ග
2. යතුරුපැදි බැටරි
3. ටොයොටා කොරොල්ලා වර්ගයේ නව අමතර කොටස්

### ලොට් අංක 09 - වාහන හා යතුරුපැදිවලින් ගලවා ඉවත් කරන ලද අබලි අමතර කොටස්

1. විවිධ වාහන හා යතුරුපැදිවලින් ගලවා ඉවත් කරන ලද අබලි අමතර කොටස්

### ලොට් අංක 10 - විවිධ ටයර්

1. විවිධ ප්‍රමාණයේ ටයර් වර්ග
2. යතුරුපැදි ටයර් වර්ග
3. ටියුබ් වර්ග

වැඩි විස්තර සඳහා 2020.09.25 වන දින රජයේ ගැසට් පත්‍රයේ I කොටස (II ආ) ඡේදය සඳහා කාරුණික අවධානය යොමු කරමි.

**වරුණ ජයසුන්දර (එල්එල්),**
**නීතීඥ,**
**නියෝජ්‍ය පොලිස්පති,**
**අණදෙන නිලධාරී, විශේෂ කාර්ය බළකාය.**

---

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය**

**වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍යාංශය**

## වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව

# ලංසු ආරාධනයයි

01. වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ ප්‍රසම්පාදන මණ්ඩලයේ සභාපති විසින් පහත දැක්වෙන කාර්යයන් සඳහා පූර්ව සුදුසුකම්ලත් ලංසුකරුවන් වෙතින් මුද්‍රා තබන ලද ලංසු කැඳවනු ලැබේ.

| ලංසු අංකය | ප්‍රසම්පාදන අංකය | කාර්යයේ නම | ඉංජිනේරු ඇස්තමේන්තු වටිනාකම (වැට් රහිත) (රු. මිලියන) | ICTAD ආයතනයේ ලියාපදිංචිය | ආපසු නොගෙවන ලංසු අයදුම්පත්‍ර ගාස්තුව (රු.) | ලංසු සුරක්ෂණ වටිනාකම (රු.) |
|---|---|---|---|---|---|---|
| 01 | WL/02/20-B-19-2020 | රන්දෙණිගල Tree Center පුහුණු මධ්‍යස්ථානය සංවර්ධනය කිරීම | 28.5 | C 5 හෝ ඊට ඉහළ (ගොඩනැගිලි) | 7,500/- | 423,000/- 2021.02.04 දින දක්වා වලංගු විය යුතුය |

02. ලංසු කැඳවීම ජාතික තරගකාරී ලංසු කැඳවීම යටතේ සිදු කරනු ලැබේ.

03. මේ සඳහා උනන්දුවක් දක්වන ලංසුකරුවන්ට ලංසු ලියවිලි 2020.10.21 දින දක්වා රජයේ වැඩ කරන කාර්යාල දිනයන්හිදී පෙ.ව. 9.00 සිට ප.ව. 2.30 දක්වා බත්තරමුල්ල, වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ ගිණුම් අංශයේදී නොමිලේ පරීක්ෂා කළ හැක.

04. 2020.10.14 දින ප.ව.1.30 ට පූර්ව ලංසු රැස්වීමක් රන්දෙණිගල ට්‍රී සෙන්ටර්හිදී පැවැත්වෙන අතර ගොඩනැගිලි පරිශ්‍රයද නිරීක්ෂණය කළ හැක.

05. ලංසු ලියවිලි ඉංග්‍රීසි මාධ්‍යයෙන් පිළියෙල කර ඇති අතර, පෙ.ව. 9.00 සිට ප.ව. 2.30 දක්වා 2020.10.21 දින වන තෙක් **වනජීවී අධ්‍යක්ෂ ජනරාල්, වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව** නමින්, කරන ලද ලිඛිත ඉල්ලීම් හා ICTAD ලියාපදිංචි පොතෙහි මුල්පිටපත, ආපසු නොගෙවන ලද තැන්පත් මුදල දෙපාර්තමේන්තුවේ සරප් වෙත ගෙවීමෙන් පසු ලබාගත හැක.

06. මේ සඳහා උනන්දුවක් දක්වන ලංසුකරුවන් අදාළ ව්‍යාපෘති පරිශ්‍රය පරීක්ෂා කර බලා ලංසු ඉදිරිපත් කිරීම කළ යුතුය.

07. ඉහත සඳහන් ලංසු සුරක්ෂණය බැංකුවක් මගින් ඉදිරිපත් කරන්නේ නම් දක්වා ඇති වටිනාකම දක්වා ඇති දින තෙක් වලංගු වන සේ රජයේ පිළිගත් වාණිජ බැංකුවක් මගින් ඉදිරිපත් කළ යුතුය. එය මුදලින් ගෙවන්නේ නම් දෙපාර්තමේන්තුවේ සරප් වෙත ගෙවා ලබාගත් රිසිට්පතේ පිටපතක් ඇමිණිය යුතුය. ලංසු ලියවිලි සමග ලංසු සුරක්ෂණය ඉදිරිපත් කර නොමැති ලංසුපත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. 1987 අංක 03 දරන පොදු කොන්ත්‍රාත් පනත යටතේ සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වී PCA 03 සහතිකය ලංසු ලියවිලි සමග ඉදිරිපත් කර තිබිය යුතු අතර, එසේ නොවන ලංසුපත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

08. සම්පූර්ණ කරන ලද ලංසු ලියවිලි මුල්පිටපත හා අනු පිටපත ලෙස වෙන් වෙන් වශයෙන් ලියුම් කවරවල බහා මුද්‍රා තබා නැවත එක් කවරයක බහා මුද්‍රා තබා කවරයේ වම්පස ඉහළ කෙළවරේ අදාළ කොන්ත්‍රාත්තුවේ නම සහ අංකය සඳහන් කර 2020.10.22 ප.ව. 2.30 ට ප්‍රථම පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ මුදල් අංශයේ තබා ඇති ලංසු බහාලුම් පෙට්ටියට බහාලිය හැකි අතර, ප්‍රමාද වී ලැබෙන ලංසුපත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ලංසු විවෘත කිරීම එදිනම (2020.10.22) ප.ව. 2.30 ට සිදු කරනු ලබන අතර, ඒ සඳහා ඔබට හෝ ඔබගේ බලයලත් නියෝජිතයෙකුට සහභාගී විය හැක.

09. ලංසුපත් පිළිබඳ වැඩිමනත් විස්තර 0112-871537 දුරකථනය මගින් දෙපාර්තමේන්තු නියෝජ්‍ය අධ්‍යක්ෂ (මුදල්) ඇමතීමෙන් ලබාගත හැක. ලංසුපත් පිළිබඳව තීරණ ගැනීමේ අයිතිය දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන මණ්ඩලය සතු වන අතර, මෙම නිවේදනයේ හෝ ලංසු ආකෘතීන් හි සඳහන් වන හෝ සඳහන් නොවන මෙම ප්‍රසම්පාදන කාර්යයන්ට අදාළ කිසියම් කාරණයක් පිළිබඳ තීරණයක් ලබා දීමේ බලය වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් සතුවේ.

10. ලංසු පත් පිළියෙල කිරීම සම්බන්ධයෙන් වැය වන කිසිදු පිරිවැයක් සඳහා සභාපති දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව වගකියනු නොලැබේ.

**සභාපති,**
**දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව,**
**වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව,**
**අංක 811/ඒ, ජයන්තිපුර පාර,**
**බත්තරමුල්ල.**

40 වන වර්ෂය

# ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

## සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම - 2021

2020 වර්ෂය සඳහා පහත සඳහන් සැපයුම් හා වැඩ, සේවාවන් සැපයීම සඳහා ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ ලියාපදිංචි වීමට කැමැත්තක් දක්වන රජයට පවරාගත් ව්‍යාපාරික ආයතන, රාජ්‍ය සංස්ථා, පිළිගත් සැපයුම්කරුවන්, දේශීය නියෝජිතයන්, අලෙවිකරුවන්, ව්‍යාපාරික සංවිධාන හා කොන්ත්‍රාත්කරුවන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ.

එක් එක් සැපයුම් හා වැඩ, සේවා කාණ්ඩය සඳහා වෙන වෙනම අයදුම්පත් සකස් කළ යුතුයි. එක් එක් කාණ්ඩයෙහි ලියාපදිංචි කිරීම සඳහා ආපසු නොගෙවනු ලබන රු.3000/=ක ගාස්තුවක් ගෙවිය යුතුය.

රාජකාරි දිනයන්හි පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය සැපයුම් අංශය වෙතින් අයදුම්පත් නොමිලේ ලබාගත හැක. අයදුම්පත සහ පුවත්පත් දැන්වීම විශ්වවිද්‍යාලයීය වෙබ් අඩවියෙන් (http://www.ou.ac.lk/home/index.php/procurement-notices) බාගත කළ හැක.

අයදුම්පත සමඟ ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ සරප් වෙත ආපසු නොගෙවනු ලබන රු.3000/=ක ගාස්තුවක් ගෙවා ලබාගත් ලදුපත එවීම හෝ මහජන බැංකුවේ, නුගේගොඩ ශාඛාවේ ගිණුම් අංක.174-1001-7-0350215 වෙත මුදල් තැන්පත් කිරීමෙන් පසු ලබාගත් තැන්පතු පත්‍රිකාව ඉදිරිපත් කළ යුතුය. බැංකු අණකර, චෙක්පත් හෝ මුදල් ඇණවුම් ලියාපදිංචිය සඳහා බාරගනු නොලැබේ.

එක් එක් සැපයුම් හා වැඩ, සේවා කාණ්ඩය සඳහා වන නිසි ලෙස සම්පූර්ණ කරන ලද අයදුම්පත් සමග ව්‍යාපාර ලියාපදිංචි සහතිකයේ පිටපතක්, සමාගම් පරමාර්ථ ප්‍රකාශය සහ සමාගම් ව්‍යවස්ථාව (සීමිත වගකීම් සහිත සමාගම් සඳහා), සමාගම සංස්ථාපිත සහතිකයේ පිටපත් හා සමාන භාණ්ඩ සැපයීමේ හැකියාවේ වසර පහක (03) පළපුරුද්දක් ඇති බවට ලිඛිත සාක්ෂි (කොන්ත්‍රාත් ප්‍රදානයන්, මිලදී ගැනීමේ ඇණවුම් වැනි) 2020 ඔක්තෝබර් 29 වැනි දින හෝ ඊට පෙර ලැබෙන පරිදි ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ "සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම සඳහා අයදුම්පත් - 2021" යනුවෙන් සඳහන් කර සහකාර මූල්‍යාධිකාරී, සැපයුම් අංශය, ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය, නාවල, නුගේගොඩ යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් යොමු කිරීම හෝ අතින් ගෙනවිත් බාර දිය යුතුයි. අවසන් දිනයෙන් පසු කිසිදු අයදුම්පතක් බාරගනු නොලැබේ. ඉල්ලා ඇති සියලුම ලිපිලේඛන ඉදිරිපත් කිරීමට අපොහොසත් වන සැපයුම්කරුවන් ලියාපදිංචිය සඳහා නොසලකා හරිනු ලැබේ. ලබා දී ඇති ආකෘතියට අනුව අයදුම්පත් සම්පූර්ණ කළ යුතු වේ.

ඕනෑම අයදුම්පතක් පිළිගැනීම හෝ ප්‍රතික්ෂේප කිරීමේ සම්පූර්ණ අයිතිය විශ්වවිද්‍යාලය සතුවේ.
සාමාන්‍යයෙන් භාණ්ඩ හා වැඩ, සේවා සඳහා මිල ගණන් ලියාපදිංචි සැපයුම්කරුවන් වෙතින් කැඳවනු ලබන නමුත් තරගකාරී මිල ගණන් ලබා ගැනීමට අනෙකුත් සැපයුම්කරුවන් වෙතින් මිල ගණන් කැඳවීමේ අයිතිය විශ්වවිද්‍යාලය සතුය.

විශ්වවිද්‍යාලයේ ලියාපදිංචි වීමට අපේක්ෂා කරන කොන්ත්‍රාත්කරු/සැපයුම්කරු අවම දින 30ක ණය කාලයක් ලබා දිය යුතුය.

වැඩිදුර තොරතුරු රාජකාරි දිනවල සහකාර මූල්‍යාධිකාරී/ සැපයුම්, ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය වෙතින් ලබා ගත හැක. (දුරකථන අංක.0112881212 )

### 01. සැපයුම් අංශය

| | |
|---|---|
| **1.1 කාණ්ඩය** | **ගෘහ භාණ්ඩ** |
| 1.1.1 | කාර්යාල ගෘහභාණ්ඩ / පන්ති කාමර ගෘහභාණ්ඩ / පුස්තකාල ගෘහභාණ්ඩ (ලී) |
| 1.1.2 | කාර්යාල ගෘහභාණ්ඩ (වානේ) |
| 1.1.3 | ෆයිබර් ග්ලාස් නිෂ්පාදන සහ ප්ලාස්ටික් නිෂ්පාදන |
| 1.1.4 | රූපවාහිනී ධාරකය (TV Stand), ඉස්තිරික්ක කිරීමේ මේසය Ironing Table , බහු මාධ්‍ය ගබඩා කැබිනට් (Multi- Media Storage Cabinet), යතුරු කැබිනට් (Key Cabinet) … ආදිය |
| 1.1.5 | සියලුම වර්ගයේ පුස්තකාල ගෘහභාණ්ඩ (රාක්ක, ට්‍රොලි, කවුන්ටර්, පැති දෙකේ පුවත්පත් රාක්ක, සඟරා සංදර්ශකය, මාධ්‍ය සංදර්ශකය, අධ්‍යයන මේසය, පුටුව, අධ්‍යයන කුටි, පොත් ආධාරක (Book Supports), වාර සඟරා ධාරක (Periodical Holders), පත්‍රිකා පෙට්ටි (Pamphlet Boxes) |
| **1.2 කාණ්ඩය** | **උපකරණ [I කාණ්ඩය]** |
| 1.2.1 | ඡායා පිටපත් |
| 1.2.2 | ඩිජිටල් අනුපිටපත් යන්ත්‍ර |
| 1.2.3 | අධි - ශීතන, ශීතකරණ |
| 1.2.4 | වීඩියෝ කට්ටල, ශ්‍රව්‍ය උපකරණ |
| 1.2.5 | ඡායාරූප උපකරණ, අඳුරු කාමර උපකරණ සහ රෝල් |
| 1.2.6 | බහු මාධ්‍ය ප්‍රක්ෂේපන යන්ත්‍ර, ඕ.එච්.පී (OHP), ස්මාර්ට් පන්ති කාමර උපකරණ |
| 1.2.7 | ගිනි නිවන උපකරණ, ගිනි ආරක්ෂණ උපකරණ සහ ගිනි අනතුරු ඇඟවීමේ පද්ධති |
| 1.2.8 | කඩදාසි තීරු ඉරන යන්ත්‍ර (Paper Shedder), බහු මාධ්‍ය තිර (Multi – Media Screen) |
| 1.2.9 | වෝල්ටීයතා ස්ථායීකාරක (Voltage Stabilizer) |
| 1.2.10 | විදුලි සංරචක |
| **1.3 කාණ්ඩය** | **උපකරණ [II කාණ්ඩය]** |
| 1.3.1 | සන්නිවේදන උපකරණ, දුරකථන සහ ඉන්ටර්කොම් පද්ධති, පී.ඒ.බී.එක්ස් පද්ධති (PABX) |
| 1.3.2 | ඉලෙක්ට්‍රොනික සහ අතින් යතුරු ලියනය (Electronic and Manual Typewriters) |
| 1.3.3 | පොත් බැඳීමේ උපකරණ, ඔප දැමීමේ යකඩ (Polishing Iron), සංරක්ෂණ උපකරණ (Conservation Equipment)…. ආදිය |
| 1.3.4 | රූපවාහිනී |
| 1.3.5 | උදුන් සහ වැකුම් ක්ලීනර් |
| 1.3.6 | පිඟන් කෝප්ප, හැඳි ගෑරුප්පු, මුළුතැන්ගේ භාජන, මුළුතැන්ගේ උපකරණ |
| 1.3.7 | පෙරන යන්ත්‍ර / බොයිලේරු / කේතල් |
| **1.4 කාණ්ඩය** | **පරිගණක** |
| 1.4.1 | පරිගණක |
| 1.4.2 | මුද්‍රණ යන්ත්‍ර, පරිලෝකකය (Scanners), ෆැක්ස් යන්ත්‍ර |
| 1.4.3 | පරිගණක උපාංග |
| 1.4.4 | අඛණ්ඩ බල සැපයුම් ඒකක (Uninterruptable Power Supply Unit) |
| 1.4.5 | පරිගණක මෘදුකාංග |
| 1.4.6 | පරිගණක දෘඩාංග සහ ජාලා |
| 1.4.7 | සර්වර් (Servers) |
| 1.4.8 | ජාල ස්විචයන් (Network Switches) |
| **1.5 කාණ්ඩය** | **ලිපි ද්‍රව්‍ය** |
| 1.5.1 | රතු ටේප්, ඇලෙන ටේප් (Stick Tape), ගම් ටේප්, සෙලෝ ටේප්, ද්විත්ව පැති ටේපි, අල්පෙනිති, කඩදාසි ක්ලිප්, ස්ටේප්ලර් කටු, ස්ටේප්ලර් (Booklet Stapler, Heavy Duty Staplers) පන්චර්, ගණක යන්ත්‍ර, අල්පෙනිති, කඩදාසි ක්ලිප්, ස්ටේප්ලර් කටු, ස්ටේප්ලර් (Booklet Stapler, Heavy Duty Staplers) පන්චර්, ගණක යන්ත්‍ර, පෑන් (බෝල් - පොයින්ට්), පැන්සල්, හුනු, මාකර් (White Board Marker), කඩදාසි බරුව (Paper Weight), මැලියම් (Gum, glue), තීන්ත, තීන්ත පෑඩ්, CR නාම ලේබන, CR පොත්, (Clear Bags), ලිපි ගොනු කවර, ලියුම් කවර, ලිපි ගොනු ටැග් (File Tags)…. ආදිය |
| 1.5.2 | ලෙජර් බැඳීම් (Ledger Binders) |
| 1.5.3 | රබර් මුද්‍රාව / දින මුද්‍රාව, ටෝකන සහ ඉටි මුද්‍රා තීන්ත, තීන්ත පෑඩ් |
| 1.5.4 | කාබනිකෘත හා තාප ඇතුළු කඩදාසි රෝල් (Paper Rolls Including Carbonized and Thermal), යතුරු ලියනය (Typewriter Ribbons and Daisy Wheels) (විද්‍යුත් යතුරු ලියනය), කාබන් කඩදාසි, ස්ටෙන්සිල් හා විද්‍යුත් ස්ටෙන්සිල් |
| 1.5.5 | A4 ඡායා පිටපත් කඩදාසි, අනු පිටපත් කඩදාසි (Duplicating Paper), ටයිප් කිරීමේ කඩදාසි (Typing Sheets) |
| 1.5.6 | ඇසුරුම් කිරීම - Packing Cartoons (කාඩ්බෝඩ්), රෝල් (Strapping Roll) |
| 1.5.7 | ප්ලාස්ටික් වාර්තා පොත් කවර, සටහන් පත්‍ර ගොනු කිරීම (Filing Dockets) |
| 1.5.8 | ඡායා පිටපත්/ මුද්‍රණ යන්ත්‍ර/ රිසෝ යන්ත්‍ර සඳහා ටෝනර් |
| 1.5.9 | පරිගණක ලිපි ද්‍රව්‍ය හිස් හා පෙර මුද්‍රිත කඩදාසි |
| 1.5.10 | ලියුම් කවර |
| 1.5.11 | ලිවිය හැකි, නැවත ලිවිය හැකි සී.ඩී හා ඩී.වී.ඩී, පෙන් ඩ්‍රයිව් |
| 1.5.12 | ඔරලෝසු |
| 1.5.13 | සුදු ලෑලි, කොළ ලෑලි, කළු ලෑලි … ආදිය (White Board, Green Board, Black Board) |
| **1.6 කාණ්ඩය** | **රෙදිපිළි සහ සම් නිෂ්පාදන** |
| 1.6.1 | නිල ඇඳුම් සහ තිර රෙදි වර්ග, පිස්නාව (Dusters) |
| 1.6.2 | ජාතික සහ වෙනත් වර්ගවල ධජ සහ බැනර් |
| 1.6.3 | සියලු වර්ගවල බුමුතුරුණු |
| 1.6.4 | සපත්තු හා මේස් |
| 1.6.5 | බෑග් (Bags, Briefcase) |
| 1.6.6 | වැහි කබා, පටි, තොප්පි (Caps, Hats), කුඩ |
| 1.6.7 | සම් කඩදාසි (Leather Papers) |
| 1.6.8 | බඳින රෙදි (Binding Cloth), නයිලෝන් නූල්, බඳින ඉඳිකටු (Binding Needle), |
| 1.6.9 | කැන්වස් නිෂ්පාදන |
| 1.6.10 | ඩමි (Dummies) |
| 1.6.11 | උපාධි ලෝගු, තොප්පි, මාල (Garland), උපාධි ලේඛ්‍ය පත්‍රය (Graduation Scroll) |
| 1.6.12 | ඇඳ ඇතිරිලි, කොට්ට උර, කොට්ට, මදුරු දැල්, මෙට්ට කවර |
| 1.6.13 | රබර් හා කෙඳි මෙට්ට … ආදිය |
| **1.7 කාණ්ඩය** | **විද්‍යාගාර අයිතම හා සේවා** |
| 1.7.1 | විද්‍යාගාර උපකරණ හා මෙවලම් |
| 1.7.2 | රසායන ද්‍රව්‍ය |
| 1.7.3 | වීදුරු භාණ්ඩ |
| 1.7.4 | DNA අනුක්‍රමික සේවාව |
| **1.8 කාණ්ඩය** | **ක්‍රීඩා** |
| 1.8.1 | ක්‍රීඩා අයිතම |
| 1.8.2 | සුහසාධක භාණ්ඩ |
| **1.9 කාණ්ඩය** | **වෛද්‍ය අයිතම** |
| 1.9.1 | ඖෂධ අයිතම (Pharmaceuticals) |
| 1.9.2 | ඖෂධ (Medicines and Drugs) |
| 1.9.3 | වෛද්‍ය හා දන්ත මෙවලම් හා උපකරණ |
| 1.9.4 | සනීපාරක්ෂක අයිතම, මුහුණු ආවරණ (Face Shield, Masks), ශල්‍ය අත්වැසුම් |
| **1.10 කාණ්ඩය** | **පොත් හා වාර සඟරා** |
| 1.10.1 | වාර සඟරා, පොත්, සඟරා |
| **1.11 කාණ්ඩය** | **වෙනත් සේවා** |
| 1.11.1 | පිටත පුහුණු වැඩසටහන් සේවා |
| **1.12 කාණ්ඩය** | **විවිධ** |
| 1.12.1 | ලාංඡන, පුවරු, කුසලාන, පලිහ, පදක්කම්, සිහිවටන සකස් කිරීම |

### 02. මූලධන අංශය

| | |
|---|---|
| **2.1 කාණ්ඩය** | **වැඩ** |
| 2.1.1 | ඉදිකිරීම් (සිවිල්) |
| 2.1.2 | ඇලුමිනියම්/ වීදුරු කොටස් කිරීම සහ සහායක වැඩ |
| 2.1.3 | ඇතුළත විදුලි රැහැන් ඇදීම ඇතුලුව අලුත්වැඩියා කටයුතු |
| 2.1.4 | අනතර්ජාල/ ජාල රැහැන් ඇදීම |
| 2.1.5 | ජලනල වැඩ |
| 2.1.6 | උද්‍යාන නඩත්තුව |
| 2.1.7 | වෙල්ඩින් සහ සහායක වැඩ ඇතුළුව ලෝහ සහ සෙවිලි වැඩ |
| 2.1.8 | අභ්‍යන්තර සැරසිලි |
| 2.1.9 | භූමි අලංකරණ කටයුතු |
| 2.1.10 | පෙදරේරු වැඩ |
| 2.1.11 | වඩු වැඩ |
| 2.1.12 | ගෑස් සැපයුම සහ ස්ථාපනය |
| 2.1.13 | පින්තාරු කිරීම සහ සහායක වැඩ |
| 2.1.14 | නාම පුවරු/ දර්ශන පුවරු/ දිශා පුවරු/ මල නොබැඳෙන වානේ පුවරු සැපයීම සහ සවි කිරීම |
| 2.1.15 | අභ්‍යන්තර දුරකථන පද්ධති කේබල් කිරීම හා අළුත්වැඩියා කිරීම |
| 2.1.16 | ලියවන පට්ටල් වැඩ, හැඩගැස්වීමේ වැඩ, ගෑස් වෙල්ඩින්, චාප වෙල්ඩින් වැඩ |
| 2.1.17 | වායු සමීකරණ සැපයුම් සැපයීම, ස්ථාපනය කිරීම හා ක්‍රියාත්මක කිරීම |
| 2.1.18 | CCTV කැමරා සවි කිරීම හා අළුත්වැඩියා කිරීම |
| 2.1.19 | LCD තිර/ LED තිර/ ඩිජිටල් තිර සැපයීම |
| **2.2 කාණ්ඩය** | **සේවා** |
| 2.2.1 | ඉදිකිරීම් උපකරණ කුලියට ගැනීම (ජේ.සී.බී, බනින යන්ත්‍ර - Excavator, Compressor,Loader, Roller compactor …ආදිය ) |
| 2.2.2 | උපකරණ (event instruments) කුළියට දීම (වියන්, මේස/ පුටු, ආදිය......) |
| 2.2.3 | ගස් කැපීම |
| 2.2.4 | වාස්තුවිද්‍යාත්මක සේවා, සැලසුම් ගොන්ඩනැගිලි සඳහා උපදේශනය, ප්‍රමාණ මැනුම් සේවාව, ඉඩම් මැනීම..... ආදිය |
| 2.2.5 | ලංසු ලේඛන සකස් කිරීම සඳහා උපදේශනය |
| 2.2.6 | පුහුණු හා නුපුහුණු කම්කරුවන් කුලියට ගැනීම, උද්‍යාන පිරිසිදු කිරීම නඩත්තු සේවා …ආදිය |
| 2.2.7 | ග්‍රැෆික් සැලසුම් සහ නිදර්ශන සේවා |

### 03. සාමාන්‍ය පරිපාලන අංශය

| | |
|---|---|
| **3.1 කාණ්ඩය** | **සේවා සහ අළුත්වැඩියාකිරීම්** |
| 3.1.1 | පුද්ගලික ආරක්ෂක සේවා |
| 3.1.2 | ඡායා පිටපත් සේවා/ ස්කෑන් සේවා |
| 3.1.3 | ගලි ඉවත් කිරීම (Removal of Gully) හා ගලි බවුසර් සේවා |
| 3.1.4 | ගිනි නිවීමේ සේවා |
| 3.1.5 | යතුරු ලියනය අළුත්වැඩියා කිරීම (අතින් ක්‍රියා කරවන /ඉලෙක්ට්‍රොනික) |
| 3.1.6 | ගණක යන්ත්‍ර අළුත්වැඩියාව |
| 3.1.7 | යන්ත්‍ර සේවා/ අළුත්වැඩියාව (Lathe Machine) |
| 3.1.8 | මුද්‍රණ යන්ත්‍ර සේවා/ අළුත්වැඩියාව |
| 3.1.9 | විද්‍යාගාර උපකරණ යන්ත්‍ර සේවා/ අළුත්වැඩියාව |
| 3.1.10 | ශීතකරණ අළුත්වැඩියා කිරීම |
| 3.1.11 | විදුලි ජනන යන්ත්‍ර සේවා/ අළුත්වැඩියාව |
| 3.1.12 | විද්‍යුත් පරිමාණ සේවා කටයුතු කිරීම |
| 3.1.13 | පැලට් ට්‍රක් සේවා කටයුතු කිරීම (Servicing of Pallet Truck) |
| 3.1.14 | ගුවන් ඇණවුම් පිකර් සේවා කටයුතු කිරීම |
| 3.1.15 | පටිගත කිරීමේ යන්ත්‍ර සේවා කටයුතු කිරීම |
| 3.1.16 | ඡායාරූප මුද්‍රණය කිරීම |
| 3.1.17 | රසායන ක්ෂේත්‍රයේ සේවයේ නියුතු කාර්ය මණ්ඩලය සඳහා විශේෂ පරීක්ෂණ සේවා කටයුතු කිරීම |
| 3.1.18 | කාර්ය මණ්ඩල හැඳුනුම්පත් කවර හා පටි |
| 3.1.19 | රහස්‍ය ලිපි හා රහස්‍ය නොවන ලිපි බැහැර කිරීම |
| 3.1.20 | ආහාර හා බීම වර්ග, ආහාරපාන සේවා, කෑම බීම හා දිවා ආහාරය/ රාත්‍රී ආහාරය |
| 3.1.21 | පරිගණක/ මුද්‍රණ යන්ත්‍ර/ බහු මාධ්‍ය හා වෙනත් විද්‍යුත් අයිතම අළුත්වැඩියා කිරීම |
| 3.1.22 | වෛද්‍ය උපකරණ අළුත්වැඩියා කිරීම |
| 3.1.23 | කුෂන් පුටු අළුත්වැඩියා කිරීම හා කුෂන් කවර සවි කිරීම |
| 3.1.24 | පා පැදි අළුත්වැඩියා කිරීම |
| 3.1.25 | ගෘහ භාණ්ඩ අළුත්වැඩියා කිරීම |
| 3.1.26 | කැමරා සහ වීඩියෝ කැමරා අළුත්වැඩියා කිරීම හා සේවා |
| 3.1.27 | කාර්යාල තිර රෙදි සේදීම/ පිරිසිදු කිරීමේ සේවා |
| 3.1.28 | සෝදුපත් කියවීම, සංස්කරණය කිරීමේ සේවා හා පරිවර්තන සේවා |
| 3.1.29 | සාමාන්‍ය පළිබෝධ පාලනය (වේයන්, කෘමීන් සහ මීයන් පාලනය) |
| 3.1.30 | ඔප දැමීම සහ ටෙරා-කොටා |
| 3.1.31 | පුටු විවීම |
| 3.1.32 | වායු සමීකරණ සේවා සහ අළුත්වැඩියාව |
| 3.1.33 | ගෑස් ටර්බයින අළුත්වැඩියාව සහ සේවා |
| 3.1.34 | පැස්සීමේ ස්ථාන අළුත්වැඩියා කිරීම |
| 3.1.35 | තණකොළ කැපීමේ සේවා |
| 3.1.36 | පිරිසිදු කිරීමේ සේවා |
| **3.2 කාණ්ඩය** | **උපකරණ කුලියට ගැනීම** |
| 3.2.1 | අතේ ගෙන යා හැකි වායු සමීකරණ යන්ත්‍ර කුලියට ගැනීම |
| 3.2.2 | බහු මාධ්‍ය ප්‍රක්ෂේපන යන්ත්‍ර, ප්‍රක්ෂේපන යන්ත්‍ර හා ශබ්ද පද්ධති |
| 3.2.3 | ඡායාරූප / වීඩියෝ උපකරණ කුලියට ගැනීම |
| 3.2.4 | බල සැපයුම් විදුලි ජනක යන්ත්‍ර කුලියට ගැනීම |

### 04. ප්‍රවාහන හා තැපැල් සේවා අංශය

| | |
|---|---|
| **4.1 කාණ්ඩය** | **සේවා/ අළුත්වැඩියා/ වාහන කුලියට ගැනීම්** |
| 4.1.1 | වාහන කුලියට ගැනීම (බස් /ලොරි/වෑන් /මෝටර් රථ/ගලි වාහන/ ට්‍රක් රථ/ ට්‍රැක්ටර්/ කන්ටේනර්…ආදිය ) |
| 4.1.2 | සියලුම වර්ගයේ මෝටර් වාහන සඳහා අමතර කොටස් |
| 4.1.3 | වාහන අළුත්වැඩියා කිරීම |
| 4.1.4 | මෝටර් වාහනවල වායු සමීකරණ අළුත්වැඩියා කිරීම |
| 4.1.5 | වාහන බැටරි සැපයීම |
| 4.1.6 | ආසන කවර, කුෂන්, වඩු වැඩ හා මෝටර් වාහනවල වෙනත් අවශ්‍යතා |
| 4.1.7 | ටයර්, ටියුබ් සැපයීම හා අළුත්වැඩියා කිරීම |
| 4.1.8 | වාහන අවසර පත් මුද්‍රණය කිරීම |
| 4.1.9 | වාහන සේවා |
| 4.1.10 | කුරියර් සේවා (දේශීය හා විදේශීය) |
| 4.1.11 | භාණ්ඩ සේවා |

### 05. විශ්වවිද්‍යාල මුද්‍රණාලය

| | |
|---|---|
| **5.1 කාණ්ඩය** | **මුද්‍රණ ද්‍රව්‍ය** |
| 5.1.1 | පත්‍රිකා සහ පුවරු(White Bank Papers, A3 ඡායා පිටපත් පත්‍රිකා, බ්‍රිස්ටල් බෝඩ්, චිත්‍ර පුවරු, පුවරු (Chip Boards), බඳින රෙදි, ස්ටිකර්පත්‍රිකා, රෙක්සින්….ආදිය) |
| 5.1.2 | වෙනත් මුද්‍රණ ද්‍රව්‍ය (මුද්‍රණ තහඩු, මැලියම් (Hot Melt Gum), ස්පොන්ජ්, සකර් (Suckers), තහඩු පිරිසිදු කිරීමේ උපකරණ, වෙනත් මුද්‍රණ රසායන ද්‍රව්‍ය) |
| 5.1.3 | මුද්‍රණ තීන්ත- ඕෆ්සෙට් |
| 5.1.4 | කපු අපද්‍රව්‍ය (Cotton Waste and Cotton Stripe) |
| **5.2 කාණ්ඩය** | **මුද්‍රණ සේවා** |
| 5.2.1 | වර්ණ හතරක් වෙන් කිරීම ( Four Colour Separation) |
| 5.2.2 | පටය (Positive Films, Line & Tone, Half Tone, Dual Tone …..ආදිය) |
| 5.2.3 | ලැමිනේට් කිරීම (Hot-Matt, Gloss/Cold-Matt, Gloss/UV Varnish) |
| 5.2.4 | ඕෆ්සෙට් මුද්‍රණය |
| 5.2.5 | සී.ටී.පී තහඩු සෑදීම (Kord/Komori) |
| 5.2.6 | නැවීම (Folding) |
| 5.2.7 | රැස් කිරීම (Gathering) |
| 5.2.8 | පොත් බැඳීම සඳහා කොටස් මැසීම |
| 5.2.9 | කම්බි මැසීම |
| 5.2.10 | පොත් බැඳීම (Spiral Binding) |
| 5.2.11 | ගිලටින් (Guillotine) |
| 5.2.12 | පොත් බැඳීම (Perfect Binding) |
| 5.2.13 | අච්චු කැපීම (Die Cutting), සිදුරු කිරීම සහ මැසීම (Perforation and Creasing) |
| 5.2.14 | තිර මුද්‍රණය (Screen Printing) |
| 5.2.15 | පිටු අංකනය (Manual Page Numbering) |
| 5.2.16 | රන් තීරු හා නෙරුවම් මුද්‍රණය (Gold Foiling and Embossing) |
| 5.2.17 | පූර්ව මුද්‍රණාල, මුද්‍රණාල හා පසු යන්ත්‍ර අළුත්වැඩියාව හා සේවාව (Repairs & Services of Pre-Press, Press Machines) (යාන්ත්‍රික, විද්‍යුත් …ආදිය) |

### 06. ඉඩම් හා ගොඩනැගිලි අංශය

| | |
|---|---|
| **6.1 කාණ්ඩය** | **ගොඩනැගිලි ද්‍රව්‍ය** |
| 6.1.1 | දැව, වැලි, පස්, රළු ගල්, කැබලි ගල් හා පොහොර (Metal & Manure), සිමෙන්ති බෑග් …ආදිය |
| 6.1.2 | දැව (Timber & Sawn Timber) … ආදිය |
| 6.1.3 | දෘඩාංග අයිතම (වානේ, ජී.අයි පයිප්ප, යකඩ, ජී.අයි තහඩු, කම්බි, ඇණ, අගුල් හා මුරිච්චි, (Mammootty tool), ගල් කටු, ඇළුමිනියම් කසළ බඳුන්, ඇළුමිනියම් ඉනි මග, වීල් බැරෝ, සිමෙන්ති ටයිල්, සිමෙන්ති බෑග්, ඇස්බැස්ටෝස් තහඩු, පී.වී.සී පයිප්ප හා උපාංග (Fittings), ජල කරාම හා වැල්ව … ආදිය |
| 6.1.4 | තීන්ත, පොලිෂ්, ලාකඩ (Wax), වාර්නිෂ්, තිනර් හා ටර්පන්ටයින් … ආදිය |
| 6.1.5 | පින්සල්, කොසු හා ගෘහස්ථ පිරිසිදු කිරීමේ කට්ටල … ආදිය |
| 6.1.6 | නාන කාමර උපාංග (Bathroom Fittings) හා සනීපාරක්ෂක භාණ්ඩ … ආදිය |
| 6.1.7 | තුනී ලෑලි පී.වී.සී දොරවල්, ජනෙල් … ආදිය |
| 6.1.8 | පොලිතීන්, කළු පොලිතීන් … ආදිය |
| 6.1.9 | ශීතකාරක ගෑස් සිලින්ඩර්… ආදිය |
| 6.1.10 | සියලුම වර්ගයේ විදුලි පංකා … ආදිය |
| 6.1.11 | විදුලි පන්දම් හා බැටරි … ආදිය |
| 6.1.12 | විදුලි බුබුළු, කම්බි, මීටර්, රැහැන්, ස්විච, ජේනු, ධාරක (Holders), හා වෙනත් විදුලි උපකරණ … ආදිය |
| **6.2 කාණ්ඩය** | **පෙර වාත්තු අයිතම Pre-Cast Items (කොන්ක්‍රීට් අයිතම)** |
| 6.2.1 | පෙර වාත්තු කරන ලද කොන්ක්‍රීට් කණු, ගල් Kerb Stones), කොන්ක්‍රීට් ලෑලි ඇතිරීම, කොන්ක්‍රීට් භාජන, සිමෙන්ති භාජන, ටැංකි (Septic Tank), උද්‍යාන මේස හා බංකු, කොන්ක්‍රීට් සිලින්ඩර් හා සියළුම වර්ගයේ කොන්ක්‍රීට් පාදක නිෂ්පාදන… ආදිය |
| **6.3 කාණ්ඩය** | **බිම් සැකසුම් අයිතම** |
| 6.3.1 | මල් පැල සිටවීම, ගස්, වතුර මල්, පොහොර, පළිබෝධ නාශක, කෘමි නාශක, වල් නාශක, උද්‍යාන මෙවලම්, කොහු (Coir Dust), ගොම, තණ කොළ/තාර, කොන්ක්‍රීට් ආරුක්කු කසළ කරත්ත, රතු පස් … ආදිය |
| **6.4 කාණ්ඩය** | **ආරක්ෂිත අයිතම** |
| 6.4.1 | අත් මේස්, බූට්ස්, ආරක්ෂිත බූට්ස්, මුඛආවරණ, වැහි කබා, ආරක්ෂිත තොප්පි, ආරක්ෂිත කණ්නාඩි (Goggles), හිස් වැසුම් (Helmets), ආරක්ෂිත සපත්තු … ආදිය |

වැඩිදුර තොරතුරු සහකාර මූල්‍යාධිකාරී/ සැපයුම් අංශය, ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය වෙතින් ලබා ගත හැක. (දුරකථන: 0112881212, 0112881348, ෆැක්ස්: 0112853687)

දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව
සැපයුම් අංශය
ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
තැ.පෙ. 21
නාවල, නුගේගොඩ.

# රැකියා ඇබෑර්තු



## ගබඩා කාර්යාල සහායක - පිරිමි

**අවශ්‍ය සුදුසුකම්**

- වයස අවුරුදු 25 – 35 අතර
- අවම වශයෙන් අපොස සා/ පෙළ සුදුසුකම්
- සමාන තනතුරක අවම වශයෙන් වසර 1 ක පළපුරුද්ද
- සිංහල ලිවීමේ සහ කියවීමේ මනා සන්නිවේදන හැකියාව
- මූලික ඉංග්‍රීසි/ දෙමළ දැනුම අමතර සුදුසුකමක් වේ.
- කාර්යශූර, වේලාවට වැඩ කරන සහ විශ්වාසවන්තවීම
- මනා අන්තර් පුද්ගල හැකියාව සමග ප්‍රියමනාප පෞරුෂයක් තිබීම
- වලංගු රියදුරු යතුරු පැදි බලපත්‍රයක් තිබිය යුතුය.

**කරුණාකර ඔබගේ ජීවදත්ත ඥාතීන් නොවන නිර්දේශකයන් දෙදෙනෙකුගේ විස්තර සමග මෙම දැන්වීමෙන් දින 14 ක් ඇතුළත යොමු කරන්න.**

**කළමනාකරු**

**මානව සම්පත් හා පරිපාලන නෙට්සිස් සොලුෂන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්**

**නො. 44A, ලියනගේ මාවත, විජිතපුර, පැලවත්ත, බත්තරමුල්ල. දුරකථන : 0112787300**
**ඊමේල් : careers@netsys.lk**

---

මහනුවර දිස්ත්‍රික්කයේ ගඟ ඉහළ කෝරළේ ප්‍රා.ලේ. කොට්ඨාසයේ මාලිගා පුරණ – 1078 ග්‍රා.සේවා වසමේ, 265/4, සාලියාවත්ත, ගම්පොලවෙල පාර, ගම්පොළ ලිපිනයෙහි පදිංචි **සන්දනම් පත්තිර්සෙල්වම් පිරගාස්** වන මම මෙතැන් පටන් **සන්දනම් පත්තිර් සෙල්වම් ප්‍රගාෂ්** ලෙස භාවිත කරන බවට ශ්‍රී ලංකා ජනරජයටත්, මහජනතාවටත් මෙයින් දැනුම් දෙමි.

---

**ප්‍රසිද්ධ දැන්වීමයි**

2007 අංක 07 දරන සමාගම් පනතේ 9(1) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම, 2020 ජූනි 02 වන දින සංස්ථාගත කොට ඇති බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

සමාගමේ නාමය :
**ටෙක්නො ඩිසයින් එච් කේ ලිමිටඩ්**
සමාගමේ ලියාපදිංචි අංකය :
FC 00222414
ලියාපදිංචි කළ දිනය :
2020.06.02
ලිපිනය : අංක 616, මීගමු පාර, මාබෝල, වත්තල.
ලේකමවරු.

---

# දැන්වීමයි

## දකුණු පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය

### දකුණු පළාත් සභා පාසල්වල පවතින ඉංග්‍රීසි ගුරු පුරප්පාඩු සඳහා උසස් ජාතික ඉංග්‍රීසි ඩිප්ලෝමාධාරීන් බඳවා ගැනීම - 2020

දකුණු පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයේ නිල වෙබ් අඩවියේ (www.edumin.sp.gov.lk) ඉංග්‍රීසි විෂයය ගුරු පුරප්පාඩු සඳහා උසස් ජාතික ඉංග්‍රීසි ඩිප්ලෝමාධාරීන් බඳවා ගැනීමට පළකර ඇති නිවේදනය ප්‍රකාරව අයදුම්පත් යොමුකිරීමට 2020-07-15 දින සිට 2020-08-10 දින දක්වා අවස්ථාව ලබා දී තිබුණි. එම කාලසීමාව තුළ අයදුම්කිරීමට නොහැකි වූ උසස් ජාතික ඉංග්‍රීසි ඩිප්ලෝමාධාරීන්ට 2020-09-28 දින සිට 2020-10-12 දින දක්වා වූ කාලසීමාව තුළ පමණක් අයදුම්පත් යොමුකිරීමට අවස්ථාව ලබාදෙන බව කාරුණිකව දන්වා සිටිමි. 2020.08.10 දිනට ප්‍රථම අයදුම්කළ ඩිප්ලෝමාධාරීන් නැවත අයදුම්කිරීම අවශ්‍ය නොවන බව ද දන්වා සිටිමි. (වැඩි විස්තර සඳහා ඉහත සඳහන් වෙබ් අඩවියට පිවිසෙන්න)

**ලේකම්,**
**දකුණු පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය,**
**දක්ෂිණපාය, ලබුදූව.**
**2020.09.28**

---

## වැවිලි අමාත්‍යාංශය

## පොල් සංවර්ධන අධිකාරිය

පොල් සංවර්ධන අධිකාරියේ දැනට පුරප්පාඩුව පවත්නා පහත සඳහන් තනතුර සඳහා සුදුසුකම් හා පළපුරුද්දලත් ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් මෙයින් කැඳවනු ලැබේ.

### තනතුර - රසායනාගාර කාර්මික ශිල්පී - තනතුරු සංඛ්‍යාව - 08

**සේවා ශ්‍රේණය** : කළමනාකරණ සහකාර (තාක්ෂණ) (MA 2-2)

**වැටුප් ක්‍රමය** : රු. 30,310/-10X300/-7X350/-4X600/-20X710/= රු.52,360/- (MA 2-2-2016) (මාසික)+රජයේ අනුමත දීමනා.

**සුදුසුකම් (බාහිර)**

**1. අධ්‍යාපන:**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් සිංහල භාෂාව/දෙමළ භාෂාව, ගණිතය, විද්‍යාව, ඉංග්‍රීසි යන විෂයයන් හතරකට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයන් හයකින් (06) සමත්ව තිබීම

**සහ**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී විද්‍යා විෂය ධාරාවෙන් සියලුම විෂයන්ගෙන් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) එකවර සමත්ව තිබීම.

**සමඟ**

**2. තාක්ෂණික නිපුණතා/ ප්‍රවීණතා:**

අදාළ තනතුරට නියමිත කාර්මික නිපුණතාව තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිගමනය කරනු ලැබ ඇති පරිදි ජාතික වෘත්තීය කුසලතාවයන්හි (NVQ-05) පස්වන මට්ටමට සරිලන පරිදි ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය, රජයේ කාර්මික පුහුණු ආයතනයක හෝ වෙනත් රජයේ හෝ පෞද්ගලික ආයතනයක් විසින් මෙහෙයවනු ලබන වසරකට නොඅඩු විද්‍යාගාර තාක්ෂණය පිළිබඳ ඩිප්ලෝමාවක් හෝ සහතික පත්‍ර පාඨමාලාවක් හදාරා තිබීම.

අදාළ ක්ෂේත්‍රයේ වසරකට (01) නොඅඩු පළපුරුද්දක් ලබා තිබීම අමතර සුදුසුකමක් ලෙස සැලකේ.

**සුදුසුකම් (අභ්‍යන්තර)**

තනතුරෙහි කාර්යභාරයට අදාළව තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතා (NVQ) පහ (5) වැනි මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

**වයස** : අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි අය විය යුතුය. රජයේ දෙපාර්තමේන්තු, පළාත් රාජ්‍ය) සේවය, රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩලවල දැනට සේවයේ නියුතු අයදුම්කරුවන්ට හා පොල් සංවර්ධන අධිකාරියේ ස්ථිර සේවයේ නියුතු අයදුම්කරුවන්ට මෙම උපරිම වයස් සීමාව බලපානු නොලැබේ.

**බඳවා ගැනීමේ ක්‍රමය :** ලිඛිත තරඟ විභාගයකින් හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින්

**ප්‍රතිලාභ**

1. 1983 අංක 12 දරන පාරිතෝෂික පනත යටතේ පාරිතෝෂික දීමනා
2. සේවක වෛද්‍ය රක්ෂණය හා පුද්ගල අනතුරු රක්ෂණාවරණය
3. සේවක අර්ථසාධක අරමුදල : සේවකයා 10% සේව්‍යයා 15% සේවා නියුක්තියන්ගේ භාරකාර අරමුදල සේව්‍යයා 3%
4. අධිකාරියේ සේවකයින්ට දෙනු ලබන අනිකුත් ප්‍රතිලාභ

අයදුම්කරුවන්ගේ වර්තමාන රැකියාව, වැටුප් විස්තර, කලින් දරන ලද තනතුරු, සේවය කරන ලද කාලසීමාව සමඟ අයදුම්කරු පිළිබඳ තොරතුරු ලබාගත හැකි ඥාති සම්බන්ධතාවයක් නොමැති පුද්ගලයන් දෙදෙනෙකුගේ නම් සහ ලිපිනයන් ඇතුළත්ව අයදුම්කරුගේ සම්පූර්ණ විස්තර සහිතව පිළියෙල කරන ලද අයදුම්පත උප්පැන්න සහතිකය, අධ්‍යාපන වෘත්තීය සුදුසුකම් සහ පළපුරුද්ද පිළිබඳ සහතිකවල පිටපත් ද සමග ලියාපදිංචි තැපෑලෙන් පහත සඳහන් ලිපිනයට 2020.10.22 දින හෝ ඊට පෙර එවිය යුතුය. (අයදුම්පත් බහා එවනු ලබන කවරයේ වම්පස ඉහළ කෙළවරේ අදාළ තනතුර සඳහන් කළ යුතුය.)

රජයේ දෙපාර්තමේන්තු/පළාත් රාජ්‍ය සේවය/රාජ්‍ය සංස්ථා / ව්‍යවස්ථාපිත මණ්ඩලවල දැනට සේවයේ නියුතු අයදුම්කරුවන් සිය අයදුම්පත් ආයතන ප්‍රධානීන් මගින්ද, පොල් සංවර්ධන අධිකාරියේ ස්ථිර සේවයේ නියුතු අයදුම්කරුවන් සිය අයදුම්පත් අංශ ප්‍රධානීන් මගින්ද එවිය යුතුය.

අයදුම්පත් එවිය යුතු අවසාන දිනට පසුව ලැබෙන අයදුම්පත්, ඉහත සඳහන් සුදුසුකම් සහ සහතික පත් නොමැති හා දෙපාර්තමේන්තු/ ආයතන ප්‍රධානීන් මගින් යොමු කරනු නොලබන අයදුම්පත් ප්‍රතික්ක්ෂේප කරනු ලැබේ.

මෙම දැන්වීම පොල් සංවර්ධන අධිකාරියේ වෙබ් අඩවියෙන්ද ලබාගත හැක. **www.cda.gov.lk**

**සභාපති,**
**පොල් සංවර්ධන අධිකාරිය,**
**අංක 54, නාවල පාර, නාරාහේන්පිට,**
**කොළඹ 05.**

---

මධ්‍යම පරිසර අධිකාරිය
Central Environmental Authority

## මධ්‍යම පරිසර අධිකාරිය (CEA)

## පරිසර අමාත්‍යාංශය

### ලංසු සඳහා ආරාධනයයි (IFB)

**මධ්‍යම පරිසර අධිකාරියේ (CEA) හි, ස්වභාවධර්ම ක්ෂේත්‍ර මධ්‍යස්ථානයන් හා එම අධිකාරිය, ප්‍රධාන කාර්යාලය හා ප්‍රාදේශීය කාර්යාලයන් සහ ස්වභාව ක්ෂේත්‍ර මධ්‍යස්ථානයන් (NFC) සඳහා පවිත්‍රතා සහ ජැනිටෝරියල් සේවා සැපයීම - 2020/2021**

CEA/AD/PROC/RE/32/2020

01. මධ්‍යම පරිසර අධිකාරිය වෙනුවෙන්, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ හි, සභාපති විසින් මධ්‍යම පරිසර අධිකාරිය, ප්‍රධාන කාර්යාලය, හා ප්‍රාදේශීය කාර්යාල 17 සහ ස්වභාවධාර්මික කාර්යාල 17, සහ ස්වභාවධාර්මික ක්ෂේත්‍ර මධ්‍යස්ථාන 03 සඳහා ජැනිටෝරියල් සහ පවිත්‍රතා සේවා සැපයීම අරභයා යෝග්‍යතාපූර්ණ හා සුදුසුකම්ලත් ලංසුකරුවන් වෙතින් මුද්‍රා තබන ලද ලංසු දැන් කැඳවනු ලැබේ. මධ්‍යම පරිසර අධිකාරියේ ප්‍රධාන කාර්යාලය, බත්තරමුල්ලේ පිහිටා ඇති අතර, සෑම දිස්ත්‍රික්කයකටම ප්‍රාදේශීය කාර්යාලය බැගින් පිහිටා ඇත. අපේක්ෂිත සේවා කාලය එක් වසරක් සඳහා වනු ඇත.
02. ලංසුකරණය, ජාතික තරකාරී ලංසුකරණ (NCB) පටිපාටිය යටතේ පැවැත්වේ.
03. අභිලාෂී, යෝග්‍යතාපූර්ණ ලංසුකරුවන්හට, වැඩිදුර තොරතුරු, බත්තරමුල්ල "පරිසර පියස" හි, අංක 104 හි, මධ්‍යම පරිසර අධිකාරියේ අධ්‍යක්ෂක (පරිපාලන) වෙතින් (දුරකථන අංක : 0112-872278, 0112-873477 සහ 0112-873448) මගින් විමසා ලබා ගත හැකි වන අතර, අදාළ අවශ්‍ය ලංසු ලිපිලේඛන බත්තරමුල්ල, "පරිසර පියස" හි අංක 104, මධ්‍යම පරිසර අධිකාරියේ පරිපාලන ඒකකයේදී, 2020.09.28 වන දින සිට 2020.10.16 වන දින දක්වා රාජකාරී දිනවලදී, පෙ.ව. 09.00 සිට ප.ව. 03.00 දක්වා අතරතුර නොමිලේ ගාස්තු ගෙවීමකින් තොරව පරීක්ෂා කර බැලිය හැකිය.
04. අභිලාෂී ලංසුකරුවන්හට, ඉංග්‍රීසි භාෂාවෙන් සකස් කරන ලද අංගසම්පූර්ණ ලංසු ලිපිලේඛන කට්ටලයක් මධ්‍යම පරිසර අධිකාරියේ මූල්‍ය ඒකකයේ සරප් තැන වෙත, ආපසු ගෙවනු නොලබන රුපියල් 3,500.00 ක ගාස්තුවක් මුදලින් ගෙවීමෙන් හා බත්තරමුල්ල ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවතේ, අංක 104 හි, මධ්‍යම පරිසර අධිකාරියේ, අධ්‍යක්ෂක (පරිපාලන) වෙත ලිඛිත අයදුම්පතක් ඉදිරිපත් කිරීමෙන් අනතුරුව 2020.10.16 වන දින දක්වා සාමාන්‍ය රාජකාරී දිනවලදී පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා අතරතුර මිලදී ලබාගත හැකිය.
05. පූර්ව ලංසු හමුවක් ඉහත සඳහන් ප්‍රසම්පාදනය සඳහා මධ්‍යම පරිසර අධිකාරියේ 01 වන මහලේ, සම්මන්ත්‍රණ කාමරයේදී, 2020.10.09 වන දින පෙ.ව. 10.00 ට ආරම්භව පැවැත්වේ.
06. මුද්‍රා තබන ලද ලංසු නිසි පරිදි සම්පූර්ණ කරන ලද අනෙකුත් ලිපිලේඛන ද ඇතුළත්ව 2020.10.19 වන දින ප.ව. 2.00 ට හෝ ඊට පෙර ලැබෙන සේ, පහත දැක්වෙන ලිපිනයට, ලියාපදිංචි කළ තැපෑලෙන් එවීම හෝ කුරියර් දූත සේවා මගින් එවීම හෝ බත්තරමුල්ල, "පරිසර පියස" හි අංක 104 හි, මධ්‍යම පරිසර අධිකාරියේ පරිපාලන ඒකකයේ මේ සඳහා තබා ඇති, ටෙන්ඩර් පෙට්ටියට බහාලීම හෝ කළ යුතු වන අතර, ලිපිකවරවල වම්පස ඉහළ කෙළවරේ "මධ්‍යම පරිසර අධිකාරියේ ප්‍රධාන කාර්යාලය, ප්‍රාදේශීය කාර්යාලයන් හා ස්වභාව ධාර්මික ක්ෂේත්‍ර මධ්‍යස්ථාන සඳහා පවිත්‍රතා සහ ජැනිටෝරියල් සේවා සැපයීම -2020/2021 CEA/AD/PROC/RE/32/2020" යනුවෙන් පැහැදිලිව සටහන් කරන ලෙස ලංසුකරුවන්හට මෙයින් උපදෙස් දෙනු ලැබේ. ලංසු පහත දැක්වෙන ලිපිනයේදී පැමිණ සිටින ලංසුකරුවන් හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයින් ඉදිරියේදී එම ලංසු භාරගන්නා අවසන් වේලාව ඉක්මවූ වහාම විවෘත කරනු ලැබේ. ප්‍රමාදවී ලැබෙන ලංසු විවෘත නොකරම භාරගැනීම ප්‍රතික්ෂේප කරනු ලැබේ.
07. සියලුම ලංසු සමග 2021.02.01 වන දින දක්වා වලංගුව පවතින රුපියල් අසූදහසක (රු. 80,000.00) ක වටිනාකමින් යුත් ලංසු සුරක්ෂණ ඇපකරයක් ද ඉදිරිපත් කළ යුතුය. අවශ්‍ය නම් ලංසු සුරක්ෂණ ඇපකර වලංගු කාල සීමාව දීර්ඝ කළ හැකි බව ලංසුකරුවන්හට දන්වා සිටිනු ලැබේ.

**සභාපති,**
**දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව,**
**මධ්‍යම පරිසර අධිකාරිය,**
**"පරිසර පියස",බත්තරමුල්ල.**
**2020.09.28**

---

# ඇබෑර්තු

## ගණකාධිකරණ සහකාර

**සී/ස. ශ්‍රී ලංකා පොල් නිදවන්නන්ගේ සමූපකාර සමිති සංගමයේ ගණකාධිකරණ සහකාර - III (විධායක ශ්‍රේණිය - E.3.3.) තනතුර සඳහා මෙයින් අයදුම්පත් කැඳවනු ලැබේ.**

**සුදුසුකම් :**

1. ශ්‍රී ලංකා කාර්මික විද්‍යාලයේ හෝ උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයක ගණකාධිකරණ ඩිප්ලෝමාව සමත්වීම,
හෝ
2. ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනයේ AAT සම්පූර්ණ කිරීම සමග පිළිගත් වාණිජ කාර්මික ආයතනයක ගිණුම්කරණ ක්ෂේත්‍රයේ වසර 02 ක පළපුරුද්ද,
හෝ
3. ජාතික සමූපකාර සංවර්ධන ආයතනයේ ගණකාධිකරණය පිළිබඳ ඩිප්ලෝමාව සමඟ පිළිගත් වාණිජ කාර්මික ආයතනයක ගිණුම්කරණ ක්ෂේත්‍රයේ වසර 03ක පළපුරුද්ද,
හෝ
4. ශ්‍රී ලංකා ජාතික සමූපකාර මණ්ඩලයේ සමූපකාර සංවර්ධන උ/පෙළ සමග පිළිගත් වාණිජ/කාර්මික ආයතනයක ගිණුම්කරණ ක්ෂේත්‍රයේ වසර 05ක පළපුරුද්ද,

**වයස් සීමාව :** අවුරුදු 18-45
(දැනට සමූපකාර සේවයේ නියුතුවූවන්ට උපරිම වයස් සීමාව බලපානු නොලැබේ.)

**වැටුප් පරිමාණය: 23400 - 270 × 10 - 290 × 10 - 29000**

**වෙනත් දීමනා හා වරප්‍රසාද :**

- රු. 7800/- ක මාසික ජීවන අංක දීමනාවක් හිමිවේ.
- ආහාර දීමනාවක් හා සමූපකාර සේවක කොමිෂන් සභාව අනුමත කරන වෙනත් දීමනාවක් හිමිවේ.
- සේවක අර්ථසාධක අරමුදලේ හා සේවා නියුක්තයන්ගේ භාර අරමුදලේ දායකත්වය හිමිවේ.
- මෙම තනතුර ස්ථිරය.

තමා විසින් පිළියෙල කරගත් අයදුම්පතක් 2020.10.12 දින හෝ ඊට පෙර පහත ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවීමට කටයුතු කරන්න.

ගරු සභාපති,
සී/ස. ශ්‍රී ලංකා පොල් නිපදවන්නන්ගේ සමූපකාර සමිති සංගමය
127, ග්‍රෑන්ඩ්පාස් පාර, කොළඹ 14.
දුර.අ. 0114899234 / 0702348003

---

## ලංසු සඳහා ආරාධනයයි (IFB)

# විභාග දෙපාර්තමේන්තුව

## 2020 / 2021 වර්ෂය සඳහා ජැනිටෝරියල් සේවා සැපයීම

**ලංසු අංකය : (4/6/1/2-2020)**

01. විභාග දෙපාර්තමේන්තුවේ විභාග කොමසාරිස් ජනරාල් වෙනුවෙන් දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව හි, සභාපති විසින් සමාන සේවා සැපයීම සඳහා අවම වශයෙන් වසර 03 ක පළපුරුද්දක්ද සහිත යෝග්‍යතාපූර්ණ හා සුදුසුකම්ලත් ලංසුකරුවන් වෙතින් විභාග දෙපාර්තමේන්තුව සඳහා එක් වර්ෂයක කාල සීමාවක් තුළ ජැනිටෝරියල් (පවිත්‍රතා) සේවා සැපයීම අරභයා, මුද්‍රා තබන ලද ලංසු මිලගණන් දැන් කැඳවනු ලැබේ.
02. ලංසුකරණය, ජාතික තරඟකාරී ලංසුකරණ (NCB) පටිපාටිය යටතේ මෙහෙයවනු ලැබේ.
03. අභිලාෂී යෝග්‍යතාපූර්ණ ලංසුකරුවන් හට, වැඩිදුර තොරතුරු විස්තර, බත්තරමුල්ල, පැලවත්ත, විභාග දෙපාර්තමේන්තුවේ 3 වන මහලේ, සැපයුම් ශාඛාවේ, සහකාර කොමසාරිස් (සැපයුම්) වෙතින් දුරකථන අංක : 011-2784393 මගින් විමසීමෙන් ලබාගත හැකිය.
04. අභිලාෂී ලංසුකරුවන් හට, ඉංග්‍රීසි භාෂාවෙන් සකස් කරන ලද අංගසම්පූර්ණ ලංසු ලිපි ලේඛන කට්ටලයක් විභාග දෙපාර්තමේන්තුවේ සරප් තැන වෙත ආපසු ගෙවනු නොලබන රු. 4,200/- ක ගාස්තුවක් රාජකාරී දිනවල පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා අතරතුර ගෙවීමෙන් හා ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ සහතිකයේ / ලිපියේ පිටපතක්ද සමග බත්තරමුල්ල, පැලවත්ත විභාග දෙපාර්තමේන්තුවේ 3 වන මහලේ, සහකාර කොමසාරිස් (සැපයුම්) වෙත ලිඛිත අයදුම්පතක්ද ඉදිරිපත් කිරීමෙන් අනතුරුව 2020.09.28 වන දින සිට 2020.10.16 වන දින දක්වා (එම දෙදින ඇතුළුව), සැපයුම් අංශ වෙතින් මිලදී ලබාගත හැකිය.
05. පූර්ව ලංසු හමුවක් විභාග දෙපාර්තමේන්තුවේදී 2020.10.12 වන දින පෙ.ව. 10.30 ට පැවැත්වේ.
06. ලංසු දින 90 ක් දක්වා (2021.01.17) වන දින දක්වා වලංගුව පැවතිය යුතුය.
07. සියලුම ලංසුකරුවන් විසින් සියලුම ලංසු සමග එම ලංසු භාරගන්නා / ඉදිරිපත් කළ යුතු අවසාන දින සිට දින 120 ක් දක්වා (එනම් 2021.02.16 වන දින දක්වා) වලංගුව පවතින සහ ලංසු ලිපිලේඛන වලට අමුණා ඇති ආකෘතියට අනුව සකස් කරන ලද ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මකව පවතින, පිළිගත් වාණිජ බැංකුවකින් ලබාගත් කොන්දේසි විරහිත බැංකු ඇපකරයක් ආකාරයෙන් වන රු. 130,000/- ක වටිනාකමින් යුත් ලංසු සුරක්ෂණ ඇපකරයක්ද ඉදිරිපත් කළ යුතුය.
08. නිසි පරිදි සකස් කරන ලද මුද්‍රා තැබූ ලංසු 2020.10.19 වන දින ප.ව. 2.30 ට හෝ ඊට පෙර ලැබෙන සේ, බත්තරමුල්ල පැලවත්ත, විභාග දෙපාර්තමේන්තුවේ, 03 වන මහලේ, සැපයුම් අංශයට ගෙනැවිත් භාර දිය යුතුය. ප්‍රමාදව ලැබෙන ලංසු විවෘත නොකරම ප්‍රතික්ෂේප කරනු ලැබේ. ලංසු, එම ලංසු භාර ගන්නා අවසාන වේලාව ඉක්මවූ වහාම, ඉහත සඳහන් ලිපිනයේදී පැමිණ සිටින ලංසුකරුවන්ගේ නියෝජිතයින් ඉදිරියේදී විවෘත කරනු ලැබේ.
09. නිසි පරිදි සම්පූර්ණ කර මුද්‍රා තබන ලද ලංසු එම ලංසු අඩංගු ලිපිකවරයේ වම්පස ඉහළ කෙළවරේ "**ජැනිටෝරියල් සේවා සැපයීම - 2020 / 2021**" **කොන්ත්‍රාත් අංකය** : 4/6/1/2 - 2020 යනුවෙන් පැහැදිලිව සටහන් කර ඉදිරිපත් කළ යුතුය.
10. දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව සතුව ප්‍රසම්පාදන කමිටුවේ තීරණයන් හෝ ක්‍රියාවන් ගැන ලංසුකරුවන්ට හෝ ලංසුකරුට බලපාන එම තීන්දු තීරණ ගැන ඔහුට / ඔවුන්ට දැනුම් දීමට බැඳීමකින් තොරව හෝ ඒ සඳහා එම තීන්දු තීරණ බලපාන ලංසුකරුට හෝ ලංසුකරුවන්ට ඒ හා සම්බන්ධව වගකීමක් දැරීමකින් තොරව කොන්ත්‍රාත්තු ප්‍රදානය හි, ඕනෑම අවස්ථාවකට පෙරාතුව, සියලුම ලංසු ප්‍රතික්ෂේප කිරීමේ හෝ ලංසු ක්‍රියාවලිය අවලංගුකර, නිශේධ කිරීම සහ ඕනෑම ලංසුවක් ප්‍රතික්ෂේප කිරීමේ හෝ භාර ගැනීමේ අයිතිය ඇත.

**විභාග කොමසාරිස් ජනරාල්,**
**විභාග දෙපාර්තමේන්තුව,**
**පැලවත්ත,**
**බත්තරමුල්ල.**
**2020.09.28**

---


ලෝක ළමා දිනය වෙනුවෙන්
මිහිර HDFC BANK ඔබේ නිවසේ බැංකුවයි
එක්ව පවත්වන
ලෝක ළමා දින ප්‍රහේලිකාව



පළමු ත්‍යාගය මවුන්ටන් බයිසිකලයක්
දෙවැනි ත්‍යාගය මධ්‍යම ප්‍රමාණයේ බයිසිකලයක්
තුන්වැනි ත්‍යාගය විදුලි ඕගනයක් සහ සෙල්ලම් පිහිනුම් තටාකයක්
සැනසිලි තෑගි පාසල් උපකරණ කට්ටල සහ ළමා කුඩ 10ක්
ඔබ කළ යුත්තේ මිහිර පුවත්පතේ පළවන ප්‍රහේලිකාව පුරවා පහත ලිපිනයට යොමු කිරීමයි
මිහිර - HDFC ලෝක ළමා දින ප්‍රහේලිකාව
මිහිර කර්තෘ මණ්ඩලය, ලේක්හවුස්, කොළඹ - 10

සිළුමිණ The Silumina වටපිට පල දරන්න - පළ කරන්න
මංගල යෝජනා
දශක ගණනාවක විශ්වසනීය සේවාව...
SUNDAY OBSERVER Marriage Proposals
දැන් වචන 15ක් රු. 560ක් පමණයි...
චාමර - 0777 270 067 / අනුෂා - 0777 278 948

# රැකියා ඇබෑර්තු



# ඌව පළාත් සභා රාජ්‍ය සේවයේ තනතුරු පුරප්පාඩු සඳහා බඳවාගැනීම - 2020

01. ඌව පළාත් සභා රාජ්‍ය සේවයේ පවතින පහත සඳහන් තනතුරු පුරප්පාඩු පිරවීම සඳහා සුදුසුකම් ලත් අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. කළමනාකරණ සේවා නිලධාරී තනතුර සඳහා ඌව පළාතේ පදිංචි අයදුම්කරුවන්ගෙන් පමණක් හා සත්ව සංවර්ධන උපදේශක තනතුර සඳහා දිවයිනේ ඕනෑම ප්‍රදේශයක පදිංචි අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවන අතර, අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය 2020.10.29 දින වේ.

**1. කළමනාකරණ සේවා නිලධාරී III ශ්‍රේණිය**

**2. සත්ව සංවර්ධන උපදේශක III ශ්‍රේණිය - ඌව පළාත් සත්ව නිෂ්පාදන දෙපාර්තමේන්තුව**

